INSURANCE BOARD OF SRI LANKA

# නියාමනයේ පරිසමාප්තිය...

වාර්ෂික වාර්තාව 2013

# පටුන


| | |
|---|---|
| වර්ෂය තුල වැදගත් සිදුවීම් | 2 |
| සභාපතිනියගේ පණිවුඩය | 4 |
| මණ්ඩලයේ සාමාජිකයන් | 6 |
| මණ්ඩල සාමාජිකයන් පිළිබඳව | 7 |
| ජ්‍යේෂ්ඨ කළමනාකරණ කණ්ඩායම | 9 |
| කාර්ය මණ්ඩලය | 10 |
| පොදු සමාලෝචනය | 14 |
| සංඛ්‍යානමය සමාලෝචනය | 19 |
| මෙහෙයුම් කටයුතු සමාලෝචනය | 50 |
| මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය | 70 |
| විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය | 71 |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශනය | 72 |
| රක්ෂණ ඔප්පුහිමියන්ගේ ආරක්ෂණ අරමුදල මුදල් ප්‍රවාහ ප්‍රකාශනය | 73 |
| ගිණුම්කරණ ප්‍රතිපත්ති | 74 |
| මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් | 76 |
| විගණකාධිපති වාර්තාව | 83 |
| විගණකාධිපති විසින් මතුකළ කරුණුවලට මණ්ඩලයේ ප්‍රතිචාර දැක්වීම | 87 |
| පරිශිෂ්ඨය I | 92 |
| පරිශිෂ්ඨය II | 93 |
| පාරිභාෂික ශබ්ද මාලාව | 95 |

# නියාමනයේ පරිසමාප්තිය...

කර්මාන්තයේ ප්‍රවර්ධනයන් හා අනුකූලවීමේ නියාමන අවශ්‍යතාවයන් සඳහා විපරිණාමයන් සිදුකරන අතරම, ආසියාවෙහි රක්ෂණ නියාමනයේ මිණුම් සලකුණ බවට පත්වීමේ අරමුණ කරා ප්‍රවේශ වීම වන අපේ දැක්ම පිළිබඳව අප අඛණ්ඩවම අවධානය යොමු කළෙමු.

නීති පාදක ප්‍රාග්ධන පාලන ක්‍රමයේ සිට අවදානම් පාදක ප්‍රාග්ධන පාලන ක්‍රමයක් වෙත සංක්‍රමණය වීමත් සමඟම රක්ෂණ නියාමනයේ නව දිශානතියක් සනිටුහන් කිරීමට 2013 වසර තුළ අපට හැකිවිය.

සහෝපකාරී සාර්ව ආර්ථික වටපිටාව සහ සුසංවිධිත නියාමන ප්‍රවේශය, රක්ෂණ ක්ෂේත්‍රයේ චිරස්ථායී වර්ධන ගම්‍යතාවය සඳහා පිටිවහල්විය.

ඒ අනුව, අපේ ඉදිරි වර්ෂයන් සඳහා වන මාර්ග සිතියම ප්‍රත්‍යක්ෂ බැවින් අපේ ඉලක්කයන් කරා වේගවත්ව ඉදිරියට ගමන් කිරීම පිළිබඳ නිසැක විශ්වාසය අප තුළ පවතී.

## දැක්ම

ආසියාවේ රක්ෂණ නියාමනයේ
මිනුම් ලකුණ බවට පත්වීම.

## මෙහෙවර

රක්ෂණ කර්මාන්තයේ අභිවෘද්ධිය නියාමනය කිරීම, අධීක්ෂණය කිරීම සහ ඒ සඳහා
පහසුකම් සැලසීම සිදුකරලමින්, රක්ෂණ ඔප්පු හිමියන්ගේ යහපත සුරැකීම.

# වර්ෂය තුළ වැදගත් සිදුවීම්

- රක්ෂණ සමාගම් 21
- රක්ෂණ තැරැව්කාර සමාගම් 59
- රක්ෂණ නියෝජිතයන් 38,896
- ග්‍රාම නිලධාරි වසම් 690 ක් වෙත රක්ෂණය දැනුවත් කිරීම් ළඟා කරදීම
- අවදානම් පාදක ප්‍රාග්ධන රාමුව සහ මාර්ග පරීක්ෂාව සම්පූර්ණ කිරීම
- වෙන්කර තැබීමේ ක්‍රියාවලිය ඇරඹීම

## රක්ෂණ කර්මාන්තයේ කාර්ය සාධනය

| | 2013 | 2012 | වෙනස % |
|---|---|---|---|
| දළ ලිඛිත වාරිකය (රුපියල් මිලියන) | 94.48 | 87.17 | 8.39 |
| මුළු වත්කම් (රුපියල් බිලියන) | 356.56 | 315.82 | 12.90 |
| රක්ෂණය සඳහා ග්‍රහණය වීම | 1.09 | 1.15 | (5.22) |
| රක්ෂණ ඝණත්වය (රුපියල්) | 4,612.76 | 4,288.23 | 7.57 |

## මණ්ඩලයේ කාර්ය සාධනය

| | 2013 | 2012 | වෙනස % |
|---|---|---|---|
| රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල (රුපියල් බිලියන) | 1.78 | 1.62 | 9.9 |
| සෙස් ආදායම (රුපියල් මිලියන) | 245.74 | 236.53 | 3.9 |
| වාර්ෂික ගාස්තු (රුපියල් මිලියන) | 70.08 | 61.04 | 14.8 |

## රුපියල් බිලියන 356.56

**රක්ෂණ කර්මාන්තයේ සමස්ත වත්කම් ප්‍රමාණය**

## රුපියල් බිලියන 94.48

**රක්ෂණ කර්මාන්තයේ දළ ලිඛිත වාරිකය**

# සභාපතිනියගේ පණිවුඩය

> "නීති හෝ නියමයන් පාදක අධීක්ෂණ ක්‍රමයේ (Rules Based Supervision) සිට අවදානම් පාදක ප්‍රාග්ධන ක්‍රමය (Risked Based Capital) වෙත පරිවර්තනය වීම ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය විසින් පසුගිය වසර තුළ දායක වන ලද ඉතා වැදගත් නියාමන පියවරකි."



ඕනෑම රටක රක්ෂණ කර්මාන්තයක් සාධාරණව, සුරක්ෂිතව සහ ශක්තිමත් ලෙස පවත්වාගෙන යාම, එම කර්මාන්තයේ වර්ධනයට සහ දිගුකාලීන ස්ථාවරත්වයට ධනාත්මක ලෙස බලපානු ලැබේ. එවන් කර්මාන්තයක් ඵලදායී අයුරින් පවත්වාගෙන යාම සඳහා මනා අධීක්ෂණ සහ නියාමන ක්‍රමයක්ද අත්‍යවශ්‍ය වේ. ශ්‍රී ලංකාවේ රක්ෂණ කර්මාන්තයේ නියාමන ආයතනය වන ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය එහි උපායමාර්ගික පරමාර්ථයන් ඉටුකර ගැනීමේ අරමුණින් කටයුතු කරන අතර ආයතනයේ දැක්ම වන, දකුණු ආසියාවේ රක්ෂණ නියාමන ක්ෂේත්‍රයේ මිණුම් ලකුණ බවට පත්වීම කෙරෙහි විශේෂ අවධානය යොමු කර ඇත. 2013 වර්ෂය තුළ රක්ෂණ කර්මාන්තය ලැබූ ප්‍රගතිය පිළිබඳව අපට සතුටු විය හැකිය. රක්ෂණ කර්මාන්තයේ නියාමන ආයතනය වශයෙන් අපි, මෙම කර්මාන්තයේ ඵලදායී සංවර්ධනය සඳහා මෙන්ම රක්ෂණ ඔප්පු හිමියන් ආරක්ෂා කිරීම සඳහාත් ඇප කැපවී සිටින්නෙමු.

## යහපත් ආර්ථික පරිසරයක් හා ක්ෂේත්‍රයේ කාර්යසාධනය

රක්ෂණ කර්මාන්තය පමණක් නොව වෙනත් ඕනෑම ව්‍යාපාරයක් ඵලදායී ලෙස ක්‍රියාත්මක වීමට නම් එහි නියැලෙන්නන්ට රටෙහි ආර්ථිකය හා ආර්ථික මූලධර්ම පිළිබඳ මනා දැනීමක් හා අවබෝධයක් තිබීම ඉතා වැදගත් වේ. ශ්‍රී ලංකාවේ ආර්ථිකය වර්ෂ 2013 තුළ 7.2% කින් වර්ධනය වූ බවත් එමගින් ශ්‍රී ලංකාව සංවර්ධන මංපෙතෙහි ඉහළ ස්ථානයක රැඳී ඇති බවත් වාර්තා වේ. එමෙන්ම මෙම ආර්ථික වර්ධනය මීලඟ වසර 2 - 3 තුළ විශේෂයෙන් ශ්‍රී ලංකාව පුරා ක්‍රියාත්මක වන කඩිනම් සංවර්ධන ව්‍යාපෘතීන් හේතුවෙන් තවදුරටත් ඉහළ ප්‍රතිශතයක් කරා වර්ධනය වේ යැයි අපේක්ෂා කෙරේ. මෙම තත්ත්වය රක්ෂණ කර්මාන්තයට සුභවාදී පෙර නිමිත්තකි.

එමෙන්ම පසුගිය අවුරුදු 5 තුළ රටෙහි උද්ධමනය බොහෝ දුරට අඩුවී තිබීමද විශේෂයෙන් සඳහන් කළයුතු වේ. වර්ෂ 2013 හි දෙසැම්බර් මසදී උද්ධමනය 4.2% වැනි මට්ටමක තිබුණි. මෙම තත්ත්වය, සාමාන්‍ය ප්‍රජාවගේ වැයකළ හැකි මුළු ආදායමෙහි වර්ධනයක් පෙන්නුම් කරන අතර එයද රක්ෂණ කර්මාන්තයට යහපත් ලෙස බලපෑ බව කිව හැක. මීට අමතරව අදාල වර්ෂය තුළ රටෙහි ඒක පුද්ගල ආදායම ඇමෙරිකානු ඩොලර් 3,280 ක් දක්වා වර්ධනය වීමද කර්මාන්තයට සෘජුව බලපෑ සුභ කරුණක් විය.

වර්ෂ 2013 දී රක්ෂණ සමාගම් විසින් ජීවිත හා ජීවිත නොවන රක්ෂණ ව්‍යාපාරයන්ගෙන් ලැබූ සමස්ථ දළ ලිඛිත වාරික ආදායම (GWP) රුපියල් මිලියන 94,485 ක් (ඇ.ඩො.මිලි. 730 ක් පමණ) ලෙසට වාර්තා කර ඇත. මෙය මීට පෙර වසරට වඩා රුපියල් මිලියන 7,312 ක වර්ධනයක් පෙන්නුම් කිරීමකි.

එමෙන්ම රක්ෂණ සමාගම් හි මුළු වත්කම් ප්‍රමාණයේද සැළකිය යුතු වර්ධනයක් මෙම වර්ෂය තුළ දක්නට ලැබුණි. එනම් පෙර වසරට වඩා රුපියල් මිලියන 40,749 කින් රක්ෂණ සමාගම් වල මුළු වත්කම් ප්‍රමාණය වර්ධනය වී තිබීමය.

## අරමුණු ඉටුකරගැනීම

නීති හෝ නියමයන් පාදක අධීක්ෂණ ක්‍රමයේ (Rules Based Supervision) සිට අවදානම් පාදක ප්‍රාග්ධන ක්‍රමය (Risked Based Capital) වෙත පරිවර්තනය වීම ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය විසින් පසුගිය වසර තුළ දායක වන ලද ඉතා වැදගත් නියාමන පියවරකි. වර්ෂ 2012 සැප්තැම්බර් මාසයේදී සියළු රක්ෂණ සමාගම්වල සහභාගිත්වයෙන්

# සභාපතිනියගේ පණිවුඩය

ආරම්භ කරන ලද, අවදානම් පාදක ප්‍රාග්ධන ආකෘතියෙහි ක්‍රියාත්මක රාමුව අත්හදා බැලීමක් (Road Test) වශයෙන් සමාගම්වල ක්‍රියාත්මක වූ අතර එම අත්හදා බැලීමේ කටයුතු 2013 වර්ෂය මැද වන විට මණ්ඩලයට නිමකළ හැකි විය. මේ අතරතුර මෙම නව ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා රක්ෂණ සමාගම් වල නිලධාරීන්ගේ කුසලතා වර්ධනය කිරීමේ අරමුණින් මෙන්ම අපගේ නියාමන හැකියාවනුත් වර්ධනය කිරීමේ අරමුණින් Asia Insurance Review ආයතනයේ සහයෝගය ඇතුළුව අදාළ විෂය සම්බන්ධයෙන් ජාත්‍යන්තර සම්මන්ත්‍රණයක්ද අප විසින් සංවිධානය කරනු ලැබීය. මෙම අවදානම් පාදක ආකෘතිය (Risked Based Capital Framework) අත්හදා බැලීමේ ක්‍රියාවලිය අවසන් වූ පසු ඒ පිළිබඳව විශේෂඥ සහාය ඇතිව කරන ලද විශ්ලේෂණයකින් පසු මෙම නව ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා රක්ෂණ සමාගම් වෙත නිකුත් කිරීමට අපට හැකිවිය. මේ සම්බන්ධයෙන්ද, ලෝක බැංකුවේ විශේෂඥ සහාය ඇතිව පුහුණු සම්මන්ත්‍රණයක්ද පවත්වන ලදී. මේ අනුව, ඉදිරි වසර 2 තුළ දී රක්ෂණ සමාගම්වලට ඔවුන් මෙතෙක් ක්‍රියාත්මක කරන ලද නියමයන් පාදක අධීක්ෂණ ක්‍රමයද අලුතින් හඳුන්වාදුන් අවදානම් පාදක ප්‍රාග්ධන ක්‍රමයද සමගාමීව ක්‍රියාත්මක කිරීමට අවස්ථාවක් ලබාදී ඇත.

දැනට ක්‍රියාත්මක වන සංයුක්ත (Composite) රක්ෂණ සමාගම් 12 විසින් එම සමාගම් ජීවිත හා සාමාන්‍ය රක්ෂණ සමාගම් ලෙස බෙදා වෙන්කිරීමේ නීතිමය අවශ්‍යතාවය ඉටුකිරීමේ කාර්යයෙහිද අදාල වර්ෂය තුළ මනා ප්‍රගතියක් ලබා තිබුණි. මෙම කාර්යය සම්බන්ධයෙන් රක්ෂණ මණ්ඩලය විසින් අදාළ සමාගම්වල නියෝජිතයන්ගේද සහභාගිත්වයෙන් සකස්කරන ලද මාර්ගෝපදේශයන්ද උපකාරී කරගනිමින් අදාළ සමාගම් 12 විසින් ඔවුන්ගේ යෝජිත ආකෘතීන් වසර අවසානය වන විට මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදී. මෙම ආකෘතීන් විශ්ලේෂණය කිරීමේ කාර්යය අප විසින් දැනටමත් ආරම්භ කර ඇති අතර මෙහිදී විශේෂයෙන් රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂාව සහ අලුතින් ලියාපදිංචි කරන රක්ෂණ සමාගම් හා එහි විනිවිදභාවය කෙරෙහිද විශේෂ අවධානයක් යොමු කෙරෙනු ඇත. නව සමාගම්, ජීවිත හා ජීවිත නොවන වශයෙන් බෙදා වෙන්කිරීමේදී වෙන් වෙන්ව බදු ගෙවීමට සිදුවේයැයි ද ඒ තුළින් අයහපත් මූල්‍ය බලපෑමක් සිදුවේයැයි ද රක්ෂණ සමාගම් අපේක්ෂා කරන ලදී. එහෙත් රක්ෂණ සමාගම්වල ඉල්ලීමද සලකා බලා අප විසින් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යංශයේ ලේකම් වෙත කරන ලද ඉල්ලීමකට අනුව අදාළ රක්ෂණ සමාගම් වලට බදු සහන ලබාදීමට අප විසින් කරන ලද යෝජනාව 2014 අය වැය යෝජනාවලට ඇතුලත් කරගැනීමට හැකිවීම අප ලද ජයග්‍රහණයක් විය. නිසැකවම මෙය අදාළ රක්ෂණ සමාගම්වලට විශාල සහනයක් විය.

රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය විශාල අවධානයක් යොමුකර ඇත. මණ්ඩලය වෙත ලැබෙන විවිධ පැමිණිලි වලට අපගේ විශේෂ අවධානය යොමුකරන අතර ඒ පිළිබඳ පරීක්ෂණ පවත්වා හැකි සෑම අවස්ථාවකදීම සහනයක් ලබාදීමට උත්සාහ කරනු ලැබේ. මෙම පැමිණිලි විමර්ශනය කිරීමේ ක්‍රියාවලිය වඩා විධිමත් කිරීම සඳහා අදාළ වර්ෂය තුළ, පැමිණිලි විමර්ශනය කිරීමේ මාර්ගෝපදේශ අත්පොතක්, ද සකස්කර හඳුන්වා දෙන ලදී.

එමෙන්ම රක්ෂණ මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරනු ලබන වෙළඳපොළ ප්‍රවර්ධනය සහ දැනුවත්භාවය වර්ධනය කිරීමේ වැඩසටහන්, එමගින් ආවරණය කෙරෙන ජන පදනම සහ භූගෝලීය පදනමද පුළුල් කරමින් එම වැඩසටහන් ක්‍රියාත්මක කෙරෙන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සංඛ්‍යාව වඩාත් පුළුල් කරන ලදී. මෙම ප්‍රාදේශීය මට්ටමේ වැඩසටහන් බෙහෙවින් සාර්ථක වූ අතර ඒ සඳහා ප්‍රාදේශීය ලේකම්වරුන්ගෙන් සහ එම කොට්ඨාශවල ග්‍රාමීය මට්ටමේ නිලධාරීන්ගෙන් ලැබුණු විශාල සහයෝගය එම සාර්ථකත්වයට හේතු වූ බව විශේෂයෙන් සඳහන් කළ යුතුය. තවද, රක්ෂණ මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරනු ලබන විවිධ කාර්යයන්හි උපරිම ප්‍රතිඵල ලබාගැනීමට මෙන්ම කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීමේ අරමුණින් ආයතනයේ අභ්‍යන්තර පරිපාලනයද ඇතුළුව මුළු සංවිධාන ව්‍යුහයම 2013 දී ප්‍රතිනිර්මාණය කරන ලදී.

## අභියෝග හා ඉදිරි මග

ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයක් ඇති රටවල් වල රක්ෂණ කටයුතු ව්‍යාප්ත කිරීම හෙවත් ජනතාව ඒ සඳහා ග්‍රහණය කරවාගැනීම විශාල අභියෝගයකි. ශ්‍රී ලංකාවේ රක්ෂණ කර්මාන්තයෙහි දළ ලිඛිත වාරික ආදායමෙහි හා සමාගම් වත්කම්හි වර්ධනයක් පැවතියද රක්ෂණයේ ව්‍යාප්ත වීම (දළ ජාතික නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස) 1.10% වැනි ඉතා අඩුමට්ටමක පවතී. දළ වශයෙන් ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් රක්ෂණ ආවරණය ලබාගෙන ඇත්තේ ජනගහනයෙන් 12% පමණ පිරිසක් බව වාර්තා වේ. මේ අනුව පෙනීයන්නේ මිලියන 20කට අධික වූ රටේ ජනගහනය තුළ රක්ෂණය ව්‍යාප්ත කිරීම සඳහා විභවයක් (සංවර්ධනය සඳහා හැකියාවක්) පවතින බවය. ශ්‍රී ලංකාවේ ජනගනයෙන් 75% ක් පමණ ජනතාව ජීවත්වන්නේ ගම් මට්ටමේ හා අර්ධ නාගරික ප්‍රදේශ වලය. විවිධ ජන කොට්ඨාශ ඉලක්ක කොට ගත් සුදුසු රක්ෂණ ක්‍රමයන් හා ඵලදායී බෙදාහැරීමේ ක්‍රමයන් හරහා රක්ෂණ සමාගම් විසින් මෙම බහුතර ජන කොට්ඨාශයනට සමීපවීමට කටයුතු කිරීම අවශ්‍ය වේ.

සුළු පරිමාණ රක්ෂණය (Micro Insurance) විධිමත් කිරීම හා ව්‍යාප්ත කිරීම ද අපගේ අවධානයට යොමු වී ඇති තවත් කරුණක් වේ. මෙය රක්ෂණ කර්මාන්තයේ වර්ධනයට රුකුලක් විය හැකි සේම රක්ෂණ ආවරණයක් ඉතාමත් අවශ්‍ය වන ප්‍රජාවන්ට ආරක්ෂාවක් සැලසීම ද සිදුකළ හැකි කාර්යයකි. දැනටමත් මෙම සුළු පරිමාණ රක්ෂණ ආවරණ සපයන සමාගම් කීපයක් ඇතත් සියළුම ජන කොට්ඨාශයන් ආවරණය කිරීම සඳහා එය ප්‍රමාණවත් නොවේ. රක්ෂණ මණ්ඩලය දැනටමත් මේ සම්බන්ධයෙන් තොරතුරු එක්රැස් කොටගෙන ඇත. දැනට රක්ෂණ වෙළඳපොලෙහි ඇති සුළු පරිමාණ රක්ෂණ සේවාවන් හා එම සේවාවන් සපයන විධිමත් සහ නොවිධිමත් ආයතන පිළිබඳවද අනෙක් රටවල තොරතුරු ද එක්රැස් කොට ඇත. මේ සියළු කණ්ඩායම් වල සහභාගිත්වයෙන් ඒ අයගේ අදහස් හා ප්‍රතිචාර ලබාගැනීම සඳහා වැඩමුළුවක් පැවැත්වීමට අප විසින් දැනටමත් තීරණය කොට ඇත. මෙයින් අපේක්ෂා කෙරෙනුයේ ඉදිරියේදී සුළු පරිමාණ රක්ෂණ ක්ෂේත්‍රය විධිමත් කිරීම සඳහා ප්‍රතිපත්තියක් සහ ක්‍රියාකාරී සැලැස්මක් සම්පාදනය කිරීමය.

දැනට අප විසින් සාර්ථකව ක්‍රියාත්මක කරනු ලබන රක්ෂණය හා රක්ෂණ මණ්ඩලය පිළිබඳ දැනුවත්භාවය නංවාලීමේ වැඩසටහන් අඛණ්ඩව පවත්වාගෙන යාමටත් දීප ව්‍යාප්තව පුළුල් කිරීමටත් අපි අපේක්ෂා කරන්නෙමු. රක්ෂණ ඔප්පුවක් ලබාගැනීමට පෙර එහි සඳහන් කොන්දේසි කියවා බැලීම හෝ ඒ පිළිබඳව දැනුවත්වීම ඉතාමත් වැදගත්බව එම ඔප්පුහිමිකරුවන්ට ඒත්තු ගැන්වීම විශාලතම අභියෝගයකි. මේ සම්බන්ධයෙන් අපට නිතර ලැබෙන පැමිණිලි වල සඳහන් වනුයේ රක්ෂණ ඔප්පුවේ පිටපතක් තමාට නොලැබුණු හෙයින් එහි සඳහන් කොන්දේසි නුදුටු බවය. මේ නිසාම සෑම රක්ෂණ ඔප්පුවක්ම සහ ඊට අදාළ අනෙකුත් ලියවිලි එම හිමිකරුවන්ට අනිවාර්යයෙන්ම ලැබෙන්නට සලස්වා, සතියක් ඇතුළත එය ලැබුණු බව දන්වන ප්‍රකාශයක් රක්ෂිතයාගෙන් ලබාගත යුතු බවට රක්ෂණ මණ්ඩලය විසින් අංක 2/2013 දරණ විධානය මගින් රක්ෂණ සමාගම්වලට දැනුම්දෙන ලදී.

කෙසේ වෙතත් මේ සියළුම කරුණු සපයා තිබුණද රක්ෂණ ඔප්පුහිමිකරුවන් විසින් අදාළ ලියකියවිලි හොඳින් කියවා බලන බවට කිසිදු සහතිකයක් නොමැත. ඔප්පුවේ කොන්දේසි පිළිබඳ ඔවුන් අවධානය යොමුකරනුයේ හිමිකම් පිළිබඳ ගැටලුවක් පැන නැගුණු අවස්ථාවක පමණි. අපගේ ඉදිරි වැඩසටහන් වලදී මෙම කරුණ සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමුකෙරෙනු ඇත.

2013 වසර සාර්ථක වසරක් විය. 2014 වසර මීටත් වඩා සාර්ථක වනු ඇති බව අප විශ්වාස කරන්නෙමු. අපගේ ඉලක්ක සහ ඉදිරි වසර සඳහා වූ සැලසුම් ඉතා පැහැදිලිය. වසර තුළදී මණ්ඩලයේ සියළු කාර්යයන් සඳහා නිසි මඟ පෙන්වූ මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යංශයේ ලේකම්තුමාටද වටිනා දායකත්වයක් ලබාදෙන මණ්ඩල සාමාජිකයින්ට ද මගේ කෘතවේදීත්වය පුදකර සිටින්නෙමි.

එමෙන්ම මණ්ඩලයේ කටයුතු වලට නිරතුරුව සහයෝගය දක්වන ශ්‍රී ලංකා රක්ෂණ කර්මාන්තයේ පාර්ශවකරුවන්ටද ස්තූතිය පුදකරමි. තවද, වසර පුරාම මණ්ඩලය විසින් ඉටුකරන ලද සියළු කටයුතු සාර්ථක කර ගැනීමට මහත් කැපවීමෙන් කටයුතු කරන ලද හිටපු අධ්‍යක්ෂ ජනරාල් සහ හිටපු අධ්‍යක්ෂිකා (විමර්ශන) ඇතුළු අනෙක් අධ්‍යක්ෂවරුන්ටද කාර්ය මණ්ඩලයේ සියළු දෙනාටද මාගේ කෘතඥතාව පිරිනමමි.




**ඉන්ද්‍රාණි සුගතදාස**

*සභාපතිනිය*

2014 නොවැම්බර් 3

# මණ්ඩලයේ සාමාජිකයන්






1. **ඉන්ද්‍රාණි සුගතදාස මහත්මිය**
   සභාපතිනි

2. **බී. ඩී. ඩබ්ලිව් ආනන්ද සිල්වා මහතා**
   සාමාජික

3. **නලින් ආටිගල මහතා**
   සාමාජික

4. **සමන්ත කුමාරසිංහ මහතා**
   සාමාජික

5. **එස්. ආර්. ආටිගල මහතා**
   සාමාජික

6. **ඩී. එන්. ආර්. සිරිවර්ධන මහතා**
   සාමාජික

# මණ්ඩල සාමාජිකයන් පිළිබඳව

## ඉන්ද්‍රාණි සුගතදාස මහත්මිය

2010 වසරේ සිට මණ්ඩලයේ සභාපතිනිය ලෙස කටයුතු කරයි. කොළඹ මියුසියස් විද්‍යාලයෙන් පාසල් අධ්‍යාපනය ලද සුගතදාස මහත්මිය කොළඹ විශ්ව විද්‍යාලයෙන් ශාස්ත්‍රපති උපාධිය ලබා, අනතුරුව ඕස්ට්‍රේලියාවේ මොනෑෂ් සරසවියෙන් ව්‍යාපාර/රාජ්‍ය පරිපාලන ශාස්ත්‍රපති උපාධිය හිමිකරගෙන ඇත. මීට අමතරව, ඇය 1990 වර්ෂයේ එක්සත් ජනපද රාජ්‍යයෙන් පිරිනමන හියුබට් එච්. හම්ප්‍රි අධි ශිෂ්‍යත්වයක් ලැබ, එම වර්ෂය තුළ නිව්යෝර්ක් නුවර සරසවියට අනුබද්ධිතව අධ්‍යාපනය ලබා ඇත.

1977 දි ශ්‍රී ලංකා පරිපාලන සේවයට ඇතුළත් වුනු සුගතදාස මහත්මිය සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යංශයට අනුයුක්තව සිය වෘත්තීය දිවිය ආරම්භ කරන ලදී. ඇයගේ වසර 35 ඉක්මවා ගිය දීර්ඝ කාලීන සේවා කාලය තුළ ඇය දැරූ ජ්‍යෙෂ්ඨ තනතුරු අතර ජාතික තරුණ සේවා සභාවේ අධ්‍යක්ෂිකා, ශ්‍රී ලංකා කාන්තා කාර්යංශයේ අධ්‍යක්ෂිකා, ළමා සංවර්ධන හා වනිතා කටයුතු අමාත්‍යංශයේ ස්ථිර ලේකම්, සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යංශයේ ස්ථිර ලේකම් සහ ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ සභාපති යන තනතුරු විය.

සුගතදාස මහත්මිය ශ්‍රී ලංකාව නියෝජනය කරමින්, විදේශ රාජ්‍යයන් විසින් හා ජාත්‍යන්තර ආයතන විසින් සංවිධානය කරන ලද සම්මන්ත්‍රණ සහ වැඩමුළු ගණනාවකට ද සහභාගි වී ඇත.

වර්තමානයේදී සුගතදාස මහත්මිය ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ සභාපති ධූරයට අමතරව ජාතික සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකාවක් ලෙස සහ කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගමේ අධ්‍යක්ෂිකාවක ලෙසද කටයුතු කරයි.

සිය රාජ්‍ය සේවා කාළය තුළ සුගතදාස මහත්මිය ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ, අපනයන සංවර්ධන මණ්ඩලය, ශ්‍රී ලංකා තේ මණ්ඩලය, ජාතික තරුණ සේවා සභාව, මධ්‍යම පරිසර අධිකාරිය, ශ්‍රී ලංකා විදේශ නියුක්ති කාර්යාංශය, ජාතික වැවිලි කළමනාකරණ ආයතනය සහ තේ, පොල්, රබර් යන පර්යේෂණ ආයතනවල අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකාවක ලෙස ද කටයුතු කර ඇත.

සුගතදාස මහත්මිය රාජ්‍ය සේවයට කළ දායකත්වය හා විවිධ ක්ෂේත්‍රයන්හි කටයුතු කරමින් ලබාදෙන ලද නායකත්වය අගයමින් ඇය වෙත ප්‍රධානයන් හා සම්මාන කිහිපයක්ම ලැබී ඇති අතර 2013 ඕස්ට්‍රේලියානු ඇලුම්නි විශිෂ්ට සම්මානයෙන්ද ඇය පිදුම් ලැබුවාය.

## එස්. ආර්. ආටිගල මහතා

ශ්‍රී ලංකා මහ බැංකුවේ ජ්‍යෙෂ්ඨ ආර්ථික විද්‍යාඥයෙක් වන අතර ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ අධ්‍යක්ෂකවරයෙක් සහ වැඩබලන සභාපතිවරයෙක් වශයෙන් ද ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂකවරයෙක් ලෙස ද සේවය කර ඇත. මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වශයෙන් ද රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වශයෙන් ද 2011 වසරේ අවසානය තෙක් කටයුතු කර තිබේ.

ඔහු දැනට භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්වරයෙක් වශයෙන් සේවය කරයි. තව ද ඔහු ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ මණ්ඩල අධ්‍යක්ෂකවරයෙක් ලෙස ද විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ මණ්ඩල සාමාජිකයෙක් ලෙස ද උපරිමාධිකරණ සංකීර්ණයේ කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයෙක් ලෙස ද සේවය කරයි. ආටිගල මහතා කොළඹ විශ්ව විද්‍යාලයෙන් ගණිතය පිළිබඳ ශාස්ත්‍රවේදි උපාධිය ලැබ එක්සත් ජනපදයේ වොරික් සරසවියෙන් ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ලබා සිටී.

## බී. ඩී. ඩබ්. ආනන්ද සිල්වා මහතා

වසර 31ක කාලයක් මහ බැංකුවේ සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව සහ බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ සේවය කර ඇත. ශ්‍රී ලංකා මහ බැංකුවේ වසර 31ක තම සේවා කාලය තුළ ඔහු මුල්‍ය ප්‍රතිපත්ති, බැංකු අධීක්ෂණය, මූල්‍ය ප්‍රතිපත්ති ස්ථායීතාව, විනිමය අනුපාත ප්‍රතිපත්ති, විදේශ වෙළඳාම සහ ගෙවුම් ශේෂය යන ක්ෂේත්‍ර කෙරෙහි පුළුල් අත්දැකීම් ලබා ගෙන තිබේ. ඔහු වර්තමානයේ දී ශ්‍රී ලංකා මහ බැංකුවේ නියෝජ්‍ය අධිපති වේ. යාපනය විශ්ව විද්‍යාලයෙන් පළමු පෙළ විද්‍යාවේදී උපාධියක් ලබා ඇති ඔහු ඇමෙරිකා එක්සත් ජනපදයේ අයෝවා විශ්ව විද්‍යාලයෙන් ශාස්ත්‍රපති උපාධියක් ද ඇමෙරිකා එක්සත් ජනපදයේ ඉලිනොයිස් විශ්ව විද්‍යාලයෙන් විද්‍යාපති උපාධියක් ද ලබා සිටී. කොළඹ විශ්ව විද්‍යාලයේ බාහිර කථිකාචාර්යවරයෙක් ලෙස සේවය කරමින් සිටින අතරම ඔහු මහා බැංකුව විසින් පවත්වනු ලබන උසස් පාඨමාලා කීපයකම සම්පත් දායකයෙක් ලෙස ද ක්‍රියාකරමින් සිටී.

සිල්වා මහතා දැනට ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශයේ සභාපති, ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ සභාපති, සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ සාමාජිකයෙක්, ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ සාමාජිකයෙක්, “අපි වෙනුවෙන් අපි” අරමුදලේ අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ තත්ත්ව සහතික මණ්ඩලයේ සාමාජිකයෙක් සහ සීමාසහිත වෙස්ට් කෝස්ට් පවර් (පුද්ගලික) සමාග මේ අධ්‍යක්ෂ යන ධූරයන් හොබවමින් සිටියි

## ඩී. එන්. ආර්. සිරිවර්ධන මහතා

පේරාදෙණිය විශ්ව විද්‍යාලයෙන් භූගෝලය පිළිබඳ ශාස්ත්‍රපති (ගෞරව) උපාධිය ද ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයෙන් නීතිවේදී උපාධිය ද හිමිකර ගෙන ඇති අතර කොළඹ විශ්ව විද්‍යාලය මඟින් පවත්වනු ලබන නීතිපති උපාධි වැඩසටහනේ ලියාපදිංචි ශිෂ්‍යයෙක් ද වෙයි. වෘත්තියෙන් නීතිඥයෙක් වන ඒ මහතා 1988 දී සමාගම් පරීක්ෂකවරයෙක් ලෙස සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවට බැඳුනු අතර 2001 වසරේ දී සහකාර සමාගම් රෙජිස්ට්‍රාර් ලෙස උසස්වීමක් ලැබීය. ඔහු සමාගම් රෙජස්ට්‍රාර් ජනරාල්වරයා ලෙස (රාජකාරී ආවරණය කිරීම සඳහා) පත් කර ඇත. සිරිවර්ධන මහතා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ නිල බලයෙන් පත් වන සාමාජිකයෙක් වන අතර ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ ද නිල බලයෙන් පත් වන සාමාජිකයෙක් වෙයි.

# මණ්ඩල සාමාජිකයන් පිළිබඳව

### සමන්ත කුමාරසිංහ මහතා

පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ රසායන විද්‍යා උපාධිධාරියෙක් ද ඇමෙරිකා එක්සත් ජනපදයේ බොස්ටන් පිහිටි හාවර්ඩ් ව්‍යාපාර පාසලේ උපාධිධාරියෙක් ද වන අතර 1993 වසරේ දී සිය ව්‍යවසායකත්ව වෘත්තිය ආරම්භ කරන ලදී.

ගෝලීය වෙළඳ නාමයක් ලෙස ද ගොඩනැගීමට බලාපොරොත්තු වන ශ්‍රී ලංකාවේ අංක එකේ ශාකසාර විලවුන් වෙළඳනාමයක් වන නේචර්ස් සීක්‍රට්ස් ඇතුළු ප්‍රමුඛ ව්‍යාපෘති රැසකටම ඔහු සම්බන්ධ වී සිටී. 2007 වසරේ දී වසරේ හොඳම ව්‍යාවසායකයාට හිමි සම්මානය ඔහුට ප්‍රදානය කරන ලද අතර 2009/2010 වසරවල දී ජනාධිපති බදුකරන කොමිෂමේ සාමාජිකයෙක් ලෙස සේවය කර ඇත.

### නලින් ආටිගල මහතා

පුද්ගලික සහ රාජ්‍ය යන අංශ දෙකේම වසර 30කට වැඩි අත්දැකීම් සහිත ආටිගල මහතා සංස්ථා විද්වතෙක් සහ පළපුරුදු අලෙවිකරුවෙක් ද වේ. අලෙවිකරණ හා කළමනාකරණ උපදේශකවරයෙක්, පුහුණුකරුවෙක් සහ කථිකාචාර්යවරයෙක් වශයෙන් ඔහු පාරිභෝගික කල්පැවැත්ම, ඉලෙක්ට්‍රොනික, කර්මාන්ත භාණ්ඩ, FMCG සහ සේවා අංශය ආදී විවිධ වැඩ ක්ෂේත්‍ර මාලාවක නිරතව ඇත. රාජ්‍ය හා පුද්ගලික අංශ ආයතන සඳහා තවද ඔහු ඉතා සාර්ථක සංයුක්ත සැලසුම් හා ක්‍රමෝපායන සැලසුම්කරණ වැඩසටහන් රාශියක් පවත්වා ඇත.


න්‍යෂ්ටික ව්‍යවසායක පදනමේ සභාපති, කොළඹ විශ්ව විද්‍යාලයේ සනාථන සභාවේ සාමාජික, FCCISL ආයතනයේ ජ්‍යෙෂ්ඨ සභික සාමාජික, ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනයේ හිටපු සභාපති, ශ්‍රී ලංකා ජාතික ක්‍රීඩා කවුන්සිලයේ සභාපති, සෞන්දර්ය කලා විශ්ව විද්‍යාලයේ සනාතන සභාවේ සාමාජික, පවුල් සැලසුම්කරණ සංගමයේ මණ්ඩල සාමාජික, පවුල් සැලසුම් සංවිධානයේ අධ්‍යක්ෂ මණ්ඩල සමාජික, සමාජ අලෙවිකරණ ව්‍යාපෘතියේ සභාපති, සීමාසහිත හම්බන්තොට 2018 (පුද්ගලික) සමාගමේ ප්‍රධාන විධායක නිලධාරි, EU, OXFAM-GB අරමුදල් සපයන ව්‍යාපෘතියේ ජාතික ව්‍යාපෘති අධ්‍යක්ෂ, අපනයන සංවර්ධන මණ්ඩලය මඟින් සංවිධානය කළ 2012 එක්ස්පෝ සඳහා ප්‍රධාන උපදේශක ලෙස ද සේවය කර ඇත.

වර්තමානයේ දී එම මහතා තෘතීය හා වෘත්තීය පුහුණු කොමිෂන් සභාවේ සාමාජිකයෙක්, ශ්‍රී ලංකා ගිණුම්කරන හා ප්‍රමිති ආයතනයේ සාමාජිකයෙක්, ශ්‍රී ලංකා වාණිජ හා කර්මාන්ත සම්මේලනයේ මහ ලේකම්/ ප්‍රධාන විධායක නිලධාරී සහ කළමනාකරණ උපදේශකවරයෙක් සහ අලෙවිකරණ විශේෂඥයෙක් ලෙස සේවය කරයි. පළමු වරට දිනා ගත් සංචාර හා සංචාරක කර්මාන්තය පිළිබඳ ජනාධිපති සම්මානය, පළමු වරට පවත්වන ලද අන්තර්ජාතික ශ්‍රී ලංකා බෝට්ටු සංදර්ශනය, පළමු වරට පවත්වන ලද දකුණු ආසියානු වරාය ක්‍රීඩා - SAPOG සහ දකුණු ආසියානු ක්‍රීඩා - SAG යනාදිය ආටිගල මහතාගේ අවස්ථා කළමනාකරණ නිපුණතාවන් යොදා ගෙන ශ්‍රී ලංකාව දිනාගත් ජයග්‍රහණ හා විශේෂ අවස්ථාවලින් කීපයකි.

විනිශ්චය මඩුල්ලේ සභාපතිවරයා ද වූ ඒ මහතා සංචාර හා සංචාරක කර්මාන්තය පිළිබඳ ජනාධිපති සම්මාන උළෙල, ජාතික අපනයන සම්මාන, ශ්‍රී ලංකාවේ වසරේ ව්‍යාවසායකයා, බලපත්‍රලාභී විදේශ රැකියා අනුයෝජිතවරු සඳහා වූ ජාතික සම්මානය, ජාතික ආහාර සම්මානය, ජාතික තත්ත්ව සම්මානය, වසරේ කාන්තා ව්‍යවසායකයාට හිමි සම්මානය සහ එවැනි වෙනත් අවස්ථා රැසක දී ආටිගල මහතා විනිශ්චය මඩුල්ලේ සාමාජිකයෙක් ලෙස කටයුතු කර ඇත.

# ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම






1. දමයන්ති ප්‍රනාන්දු මහත්මිය
   *(අධ්‍යක්ෂ ජනරාල්)*

2. නිහාල් රාමනායක මහතා
   *(අධ්‍යක්ෂ විමර්ශන)*

3. චමරි ඒකනායක මහත්මිය
   *(සහකාර අධ්‍යක්ෂ අධීක්ෂණ)*

4. රාජන් නිරූබසිංහම් මහතා
   *(සහකාර අධ්‍යක්ෂ නීති)*

5. චායා විතානවසම් මහත්මිය
   *(අධ්‍යක්ෂ මූල්‍ය හා පරිපාලන)*

# කාර්ය මණ්ඩලය



## ඉදිරි පෙළ


1. කෞශාලි දයාරත්න මහත්මිය
2. කෝකිලා සිරිවර්ධන මහත්මිය
3. තුෂාරි විජේගුණවර්ධන මෙනවිය
4. ප්‍රියංගි ද සිල්වා මහත්මිය
5. ලක්මාලි අල්ගම මහත්මිය
6. පවිත්‍රා පුංචිහේවා මහත්මිය

## මැද පෙළ

7. කපිල තිලකරත්න මහතා
8. වීනා දිනේකා මහත්මිය
9. චන්දිමා කඹුරුගමුව මහත්මිය
10. උපලක්ෂි රණසිංහ මෙනවිය
11. උපේන්ද්‍රා සෙනවිරත්න මහත්මිය

## පසු පෙළ

12. එතිර්රාජ් ශ්‍රීකාන්තන් මහතා
13. චමින්ද ලාල් කුමාර මහතා
14. එච්.පී. අසංක මහතා
15. සනත් උදයංග මහතා



# කාර්ය මණ්ඩලය



## ඉදිරි පෙළ


1. බිම්සර විජේසිංහ මහතා
2. ශ්‍යාමලී අත්තනායක මහත්මිය
3. චතුරි බණ්ඩාර මහත්මිය
4. ලසන්ති තොටහේවා මහත්මිය
5. තිළිණි වාකිෂ්ඨ මහත්මිය
6. රුවිනි ලියනගේ මහත්මිය
7. ඬෙසිකා රත්නායක මහත්මිය

## මැද පෙළ

8. ලක්ෂ්මන් විජේසිංහ මහතා
9. තනුජා ඇන්තනි මහත්මිය
10. මල්හාරි වික්‍රමසිංහ මහත්මිය
11. සෂිනි වත්සලා මහත්මිය
12. සාරිකා වත්තුහේවා මහත්මිය
13. සමන් සේනාධීර මහතා

## පසු පෙළ

14. සුජීවා රණසිංහ මහත්මිය
15. ලක්මාල් කළුබෝවිල මහතා
16. චරිත වික්‍රමසිංහ මහතා
17. ශානිකා නානායක්කාර මහත්මිය



# සමාලෝචනයන්


පොදු සමාලෝචනය 14
සංඛ්‍යානමය සමාලෝචනය 19

මෙහෙයුම් කටයුතු සමාලෝචනය

- අධීක්ෂණ සමාලෝචනය 50
- නියාමන සමාලෝචනය 54
- විමර්ශනාත්මක සමාලෝචනය 59
- වෙළඳපොල සංවර්ධන හා බාහිර සබඳතා සමාලෝචනය 62
- පරිපාලනමය සමාලෝචනය 65
- මූල්‍ය සමාලෝචනය 66

# පොදු සමාලෝචනය

## පනත ක්‍රියාත්මක කිරීම

### නීති සම්පාදනය

රක්ෂිත සහතිකදරන්නන්ගේ සහ අනාගත රක්ෂණ සහතික දරන්නන්ගේ අයිතිවාසිකම් ආරක්ෂාවන ආකාරයෙන් ශ්‍රී ලංකා රක්ෂණ කර්මාන්තය සද්භාවයෙන් ද වෘත්තීමය හා විචක්ෂණභාවයෙන් ද යුතුව කරගෙන යනු ලබන බවට සහතික කිරීම ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ පරමාර්ථය හා වගකීම වේ.

රක්ෂණ ආයතන, රක්ෂණ තැරැව්කරුවන්, රක්ෂණ නියෝජිතයින් හා අලාභ ගලපන්නන් නියාමනය හා අධීක්ෂණය සඳහා අවශ්‍ය නෛතික රාමුව 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත ("පනත") මඟින් සලසා ඇත.

මෙකී වාර්තාවේ නියාමන සමාලෝචනයෙහි සවිස්තරාමකව දැක්වෙන පරිදි රක්ෂණ කර්මාන්තය වඩාත් ශක්තිමත් කිරීම පිණිස ප්‍රධාන පනතටත් ඊට අදාළ උපනීතිවලටත් සංශෝධන කිහිපයක් වරින් වර මෙම වසර තුල හඳුන්වා දෙන ලදී.

### වෙළඳපොළ ව්‍යුහය

#### රක්ෂණ සමාගම්


පනතේ 12 වන වගන්තියට අනුව, පනතේ විධිවිධානයන්ට අනුකූලව යම් තැනැත්තකු ශ්‍රී ලංකාවේ රක්ෂණ ව්‍යාපාර කර ගෙන යාමට මේ පනත යටතේ තත් කාලයේ ලියාපදිංචි වී ඇත්නම් හෝ ලියාපදිංචි කර ඇතැයි සලකනු ලබන්නේ නම් මිස, ඒ තැනැත්තා විසින් ශ්‍රී ලංකාව තුළ රක්ෂණ ව්‍යාපාර කර ගෙන යනු නොලැබිය යුතුය.

පනතේ 13 වන වගන්තියට අනුව ශ්‍රී ලංකාව තුළ රක්ෂණ ව්‍යාපාරයේ නියැලෙන්නට උනන්දුවක් දක්වන තැනැත්තෙකු 2007 අංක 7 දරණ සමාගම් පනත යටතේ පොදු සමාගමක් වශයෙන් සංස්ථාපනය විය යුතු අතර පනතෙන් නියමිත අනෙකුත් ව්‍යවස්ථාපිත අවශ්‍යතා සපුරාලීමෙන් අනුතුරුව පනත යටතේ රක්ෂකයෙක් වශයෙන් ලියාපදිංචි විය යුතුය.

වසර අවසාන වන විට පනත යටතේ සමාගම් 22ක් රක්ෂණ සමාගම් වශයෙන් ලියාපදිංචි වී තිබුණි. කෙසේ වුවද මෙයින් සමාගම් 21ක් පමණක් ක්‍රියාකාරීව පවතින අතර සෙලින්කෝ තකාෆුල් ලිමිටඩ් හි ලියාපදිංචිය 2009 වසරේ සිට අත්හිටුවා ඇත. රූප සටහන 1 මඟින් දැක්වෙන්නේ රක්ෂණ සමාගම් ව්‍යාපාර මෙහෙයුම් සඳහා ලියාපදිංචි වී ඇති පන්තීන්ය. ක්‍රියාකාරීව පවතින සමාගම් 21න් 12ක් දිගු කාලීන හා සාමාන්‍ය යන දෙආකාරයෙන්ම රක්ෂණ කටයුතු කරන සංයුක්ත සමාගම් වශයෙන් ලියාපදිංචි වී ඇති අතර දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාර සඳහා සමාගම් 3ක් ද සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතු සඳහා සමාගම් 6ක් ද ලියාපදිංචි වී ඇත.

*රූප සටහන 1*

***රක්ෂණ සමාගම් විසින් කර ගෙන යනු ලබන රක්ෂණ ව්‍යාපාර පන්තීන්***





#### රක්ෂණ තැරැව්කරුවෝ

රක්ෂණ තැරැව්කරුවකු යනු 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සංස්ථාපනය කරන ලද හා රක්ෂණ තැරැව්කාර ව්‍යාපාරයෙහි යෙදීම සඳහා පනත යටතේ ලියාපදිංචි කරන ලද සමාගම් වේ. රක්ෂණ තැරැව්කරුවන් යනු තැරැව්කාර ගාස්තු හෝ කොමිස් මුදල් අපේක්ෂාවෙන් රක්ෂණ සමාගමක් හෝ ප්‍රතිරක්ෂණ සමාගමක් සමඟ හෝ ඔවුන් වෙනුවෙන් රක්ෂණ ව්‍යාපාර ඇති කිරීම සඳහා රක්ෂණ සමාගම් හෝ රක්ෂණ සහතික දරන්නන් හෝ රක්ෂණය හෝ ප්‍රතිරක්ෂණය සඳහා යෝජනා කරන්නන් අතර අතරමැදියන් ලෙස කටයුතු කරන්නන් අදහස් කෙරේ.

වසර අවසානයේ දී රක්ෂණ තැරැව්කාර ව්‍යාපාර ලෙස ලියාපදිංචි සමාගම් 59ක් තිබුණි. එකී සමාගම් අතුරින් සමාගම් 40ක් දිගු කාලීන හා සාමාන්‍ය රක්ෂණ තැරැව්කාර ව්‍යාපාර යන දෙකහිම ලියාපදිංචි වී සිටි අතර 19ක් සාමාන්‍ය තැරැව්කාර ව්‍යාපාර කටයුතුවල පමණක් යෙදී සිටියේය. පහත 2 වන රූප සටහනේ දැක්වෙන්නේ රක්ෂණ තැරැව්කාර සමාගම් ව්‍යාපාර මෙහෙයුම් සඳහා ලියාපදිංචි වී ඇති පන්තීන්ය.

*රූප සටහන 02*

***රක්ෂණ තැරැව්කාර සමාගම් විසින් කරගෙන යනු ලබන රක්ෂණ තැරැව්කාර ව්‍යාපාර පන්තීන්***



# පොදු සමාලෝචනය

### රක්ෂණ නියෝජිතයන්

පනත යටතේ රක්ෂණ සමාගම් හෝ රක්ෂණ තැරැව්කාර සමාගම් සමඟ ලියාපදිංචි වී ඇති හා රක්ෂණ සමාගම් හෝ රක්ෂණ තැරැව්කාර සමාගම් සඳහා රක්ෂණ ව්‍යාපාර සොයා දීම වෙනුවෙන් ප්‍රතිශ්ඨාව ලෙස කොමිස් ලබා ගන්නා තනි පුද්ගලයින් රක්ෂණ නියෝජිතයින් වේ. එලෙස ලියාපදිංචිය ලබා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් මණ්ඩලය විසින් දක්වා ඇත.

2011 අංක 3 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ සංශෝධන පනත ("සංශෝධන පනත") මඟින් තනි පුද්ගලයන් නොවන ආයතනවලට රක්ෂණ නියෝජිතයින් ලෙස ක්‍රියාකාරන්නට අවසර ලබා දී ඇති අතර ලියාපදිංචිය සඳහා සුදුසුකම් නිශ්චිතව දක්වන රීති සකස් කර ඇත.

පනතේ 34 වන වගන්තිය අනුව රක්ෂණ නියෝජිතයින් රක්ෂණ සමාග ම්වලට රක්ෂණ ව්‍යාපාර සොයා දෙන ප්‍රධාන ප්‍රවාහයන් එකක් වේ.


රක්ෂණ සමාගම් විසින් සපයා ඇති තොරතුරුවලට අනුව මෙම වසර තුළ දී රක්ෂණ නියෝජිතයින් වශයෙන් තනි පුද්ගලයින් 15,606ක් පමණ බඳවා ගෙන ඇති අතර පසුගිය වසරේ (12,604) සිට 23.82% ක ඉහළ යාමකි.

වසර අවසානය වන විට රක්ෂණ සමාගම් නියෝජනය කරමින් සිටි මුළු නියෝජිත සංඛ්‍යාව 38,635ක් පමණ වූ අතර පසුගිය වසරේ (36,801) සිට 4.98%ක ඉහළයාමකි.

පහත 3වන රූපසටහනේ දැක්වෙන්නේ රක්ෂණ සමාගම් සමඟ ලියාපදිංචි රක්ෂණ නියෝජිත සංඛ්‍යාව වේ.

***රූප සටහන 03***

***රක්ෂණ සමාගම් හි ලියාපදිංචි රක්ෂණ නියෝජිතයින්***




2013 වසර සඳහා රක්ෂණ තැරැව්කාර සමාගම් සඳහා ලියාපදිංචි වූ රක්ෂණ නියෝජිතයින් සංඛ්‍යාව ආසන්න වශයෙන් 261ක් පමණ වේ.


ඒ අනුව 2013 වසර සඳහා මුළු රක්ෂණ නියෝජිතයින් සංඛ්‍යාව 38,896ක් පමණ වේ.

### සමාගම්වල තත්ත්වය සහ ප්‍රාග්ධන වෙනස්කම්

රක්ෂණ ව්‍යාපාර කටයුතුවල නියුතු රක්ෂණ සමාගම් අතරින් සමාගම් 7ක් කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තු ගත කොට ඇත. නම් වශයෙන් ඒවා සෙලින්කෝ ඉන්ෂුවරන්ස් පීඑල්සී, ඒඅයිඒ ඉන්ෂුවරන්ස් ලංකා පීඑල්සී, යුනියන් ඇෂුවරන්ස් පීඑල්සී, ඒෂියන් එලායන්ස් ඉන්ෂුවරන්ස් පීඑල්සී, එච්එන්බී ඇෂුවරන්ස් පීඑල්සී, අමානා තකාෆුල් පීඑල්සී සහ ජනශක්ති ඉන්ෂුවරන්ස් පීඑල්සී වේ. 4වන රූපසටහනේ දැක්වෙන්නේ ලැයිස්තුගත සහ ලැයිස්තුගත නොවූ රක්ෂණ සමාගම්හි ප්‍රතිශතය වේ.

***රූප සටහන 04***

***ලැයිස්තුගත කරන ලද/ ලැයිස්තුගත නොකරන ලද රක්ෂණ සමාගම්වල තත්ත්වය***




සංශෝධිත පනතින් ඒ වන විට රක්ෂණ ව්‍යාපාර කටයුතුවල නිරතව සිටි රක්ෂණ ආයතන 2016 පෙබරවාරි වන විට 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත යටතේ බලපත්‍රලාභී කොටස් හුවමාරුවක ලැයිස්තුගතව තිබිය යුතුය. ඒ සඳහා සංයුක්ත රක්ෂණ සමාගම් ලැයිස්තුගත කිරීමට පෙර, 2015 පෙබරවාරි මාසය වන විට හෝ ඊට පෙර ඒවායේ ව්‍යාපාර කටයුතු වෙන් වෙන් සමාගම් දෙකකට වෙන් කළ යුතුය.

මෙසේ වෙන් කිරීමේ දී පැන නැඟිය හැකි අභියෝගයන් සහ ඒ සඳහා පිළියම් හඳුනා ගැනීමේ අරමුණින් මණ්ඩලය, ශ්‍රී ලංකා රක්ෂණ සංගමය (IASL) සමඟ එක්ව කටයුතු කරයි.

# පොදු සමාලෝචනය

සංශෝධිත පනත බලාත්මක වූවායින් පසුව ලියාපදිංචිය ලැබූ නව රක්ෂණ සමාගමක් මණ්ඩලය මඟින් බලපත්‍රයක් නිකුත් කරනු ලැබීමෙන් වසර තුනක කාලයක් ඇතුලත දී 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත යටතේ බලපත්‍රලාභී කොටස් හුවමාරුවක ලැයිස්තුගත විය යුතු බවට නියම කෙරේ.

2011 ජුනි මාසයට පෙරාතුව ලියාපදිංචිය ලද රක්ෂණ සමාගම්, 2015 පෙබරවාරි මස 11 වන දින හෝ එදිනට පෙර එක් ව්‍යාපාර පන්තියක් සඳහා තමන්ගේ ගෙවා නිමි කොටස් ප්‍රාග්ධනය රුපියල් මිලියන 500 අවමයක් දක්වා වැඩි කළ යුතු බවට මණ්ඩලය නියම කර ඇත.

2011 ජුනි මාසයට පසුව ලියාපදිංචි කරන ලද රක්ෂණ සමාගම්වලට රුපියල් මිලියන 500කට නොඅඩු ගෙවා නිමි කොටස් ප්‍රාග්ධනයක් ඇත.

එමෙන්ම මණ්ඩලය විසින් රක්ෂණ සමාගම් සඳහා අවදානම් පාදක ප්‍රාග්ධන රීති හඳුන්වාදීමේ ක්‍රියාවලියක නිරතව සිටී. මෙම රීතිවලින් වර්තමානයේ ඇති නුබුන්වත් සීමා රීති ප්‍රතිස්ථාපනය කරනු ලබන අතර 2016 වසරේ සිට ඉදිරියට ඒවා පිළිපැදීම අනිවාර්ය වනු ඇත.


රක්ෂණ තැරැව්කාර සමාගම් සඳහා මෙකී තත්ත්වය වන්නේ, එකී සමාගමේ 2014 දෙසැම්බර් 31වන දින හෝ එදිනට පෙර රුපියල් මිලියන 2.5කට නොඅඩු ගෙවා නිමි කොටස් ප්‍රාග්ධනයක් තිබිය යුතු වීමයි.

## රක්ෂණ සමාගම්වලින් සෙස් බද්දක් අය කිරීම

පනතේ 7 වන වගන්තිය යටතේ ගරු මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යවරයා විසින් රක්ෂණ ඔප්පු හිමියන් සඳහා ආරක්ෂණ අරමුදලක් පිහිටුවීම පිණිස සෙස් බද්දක් අය කිරීමේ නියෝගයක් පනවන ලදී. 2002 ජූලි 9වන දින අංක 1244/5 දරන ගැසට් නිවේදනය මඟින් දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරයක සමස්ථ ශුද්ධ වාරිකයෙන් 0.2%ක් ද සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයක සමස්ත ශුද්ධ වාරිකයෙන් 0.4%ක් ද වශයෙන් රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලට බැර කළ යුතු බවට නියම කොට ඇත. රක්ෂකයන්ගෙන් සෙස් බදු එකතු කිරීම 2003 ජනවාරියේ සිට ක්‍රියාත්මක වූ අතර 2013 වසරේ එසේ එකතු කරන ලද මුදල රුපියල් මිලියන 246කි. වගුව 1 මඟින් සෙස් බද්ද හා ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල ගැන දැක්වේ.

*වගුව 01*

### සෙස් බද්ද හා ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල




## ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල

පනතේ 103 වන වගන්තිය ප්‍රකාර ස්ථාපනය කෙරුණු ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලට රක්ෂකයන්ගෙන් එකතු කළ සෙස් බද්ද තැන්පත් කරනු ලැබේ. වර්තමාන මෙන්ම අනාගත ඔප්පු හිමියන්ගේ ද යහපත උදෙසා මෙම අරමුදල පහත දැක්වෙන කාර්යයන් සඳහා යොදා ගනු ලැබේ.

අ) රක්ෂණ කර්මාන්තය පිළිබඳව මහජනතාව දැනුවත් කිරීමේ දීත්, රක්ෂණ කර්මාන්තය සංවර්ධනය කිරීම් කටයුතුවලදීත් සිදුවන වියදම් පියවාලීම සහ

ආ) මණ්ඩලය එහි බලතල, වගකීම් හා මෙහෙයුම් ක්‍රියාවට නැංවීමේ දී දරනු ලබන වියදම් පියවා ගැනීම.

ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලෙහි ඇති වත්කම් රජයේ සුරැකුම්පත්හි ආයෝජනය කෙරේ. 2013 දෙසැම්බර් 31වන දිනට එම අරමුදලෙහි සංචිතය රුපියල් මිලියන 1,778ක් විය. මෙය පසුගිය වසරට වඩා (රුපියල් මිලියන 1,622) 9.62%ක වර්ධනයකි.

## රක්ෂණ බදු

සාමාන්‍ය රක්ෂණ කටයුතුවල කිසිදු පන්තියක් සඳහා වන බදු කිසිවක් දැනට ක්‍රියාත්මක නැත. 2002, 2005 හා 2007 යන වර්ෂවල ජනවාරි 1 වැනි දින සිට අනුපිළිවෙලින් ක්‍රියාත්මක වන පරිදි මෝටර් රථ රක්ෂණය, ගිනි රක්ෂණය සහ කම්කරු වන්දි රක්ෂණය මත ක්‍රියාත්මක වූ බදු අහෝසි කරන ලදී.

## පනතේ බලපෑමෙන් නිදහස්වීම

1999 අංක 20 දරන කෘෂි හා වගා රක්ෂණ පනත මඟින් ස්ථාපනය කරන ලද කෘෂි හා වගා රක්ෂණ මණ්ඩලය, 1978 අංක 15 දරන ශ්‍රී

# පොදු සමාලෝචනය

ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථා පනත මඟින් ස්ථාපිත ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව, 1996 අංක 17 දරන සමාජ රක්ෂණ මණ්ඩලය පනත යටතේ ස්ථාපිත සමාජ රක්ෂණ මණ්ඩලය ආදියට පනතේ 12(3) වන වගන්තිය ප්‍රකාරව පනතෙන් පැණවෙන නීති රීති අදාළ නොවේ.

### ජාතික රක්ෂණ භාර අරමුදල (NITF)

2006 අංක 28 දරන ජාතික රක්ෂණ භාර අරමුදල් පනත මඟින් ස්ථාපනය කරන ලද ජාතික රක්ෂණ භාර අරමුදල් මණ්ඩලය, පනතට කරන ලද සංශෝධනයක් මඟින් මණ්ඩලයේ විෂය පථය තුළට ග්‍රහණය කරනු ලැබ ඇත.

ජාතික රක්ෂණ භාර අරමුදල් පනත ප්‍රකාරව මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය විසින් පවත්වාගෙන යනු ලැබූ වර්ජන, කැරලි, සිවිල් කැළඹීම් හා ත්‍රස්ත අරමුදල ජාතික රක්ෂණ භාර අරමුදලට පවරන ලදී. ජාතික රක්ෂණ භාර අරමුදල වෙනුවෙන් වර්ජන, කැරලි, සිවිල් කැළඹීම් හා ත්‍රස්ත අවදානම් ආවරණය කෙරෙන රක්ෂණ කටයුතු කරන සමාගම්, අයකර ගන්නා වාරික ජාතික රක්ෂණ භාර අරමුදලට බැර කළ යුතුය.

2007 අංක 27 දරන සංශෝධන පනත අනුව සියළු ලියාපදංචි රක්ෂණ සමාගම් සාමාන්‍ය රක්ෂණ කටයුතු සඳහා වන ප්‍රතිරක්ෂණ වගකීමෙන් 50%ක් නොඉක්මවන ප්‍රතිශතයක් ජාතික රක්ෂණ භාර අරමුදලට ලබා දිය යුතුය. මේ සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් සියලු රක්ෂණ සමාගම් වෙත නියෝගයක් පනවමින් 2013 ජනවාරි මස 1 වැනි දින සිට සියළුම වර්ගයේ ප්‍රතිරක්ෂණ සම්මුතීන් සහ වෛකල්පිත ප්‍රතිරක්ෂණ සැලසුම් සඳහා 30%ක් ජාතික රක්ෂණ භාර අරමුදලට දායක කළ යුතු බවට දක්වා ඇත. මීට පෙර මෙම ප්‍රතිශතය 20%ක් විය.

### අනෙකුත් අදාළ කරුණු

### මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව (NCRS)

මෝටර් රථවාහන පනත යටතේ ස්ථාපනය කරනු ලැබූ මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව නම් වූ ආයතනය ප්‍රවාහන අමාත්‍යාංශයේ විෂය පථය යටතේ පවතී. මෝටර් රථවාහන රක්ෂණ ආවරණ ලබා දෙන රක්ෂකයින් සෑම කෙනෙකුම තෙවන පාර්ශ්වික රක්ෂණ වාරිකයකින් 1%ක් මාර්ග ආරක්ෂක අරමුදලට දායක කළ යුතුය. මෙම ජාතික සභාවේ පාලක සභාවෙහි ද රක්ෂණ මණ්ඩලයට නියෝජනයක් ඇත.

### අන්තර් නියාමන ආයතන සභාව (IRIC)

අන්තර් නියාමන ආයතන සභාව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පිහිටුවන ලද්දකි. ඉහළ මට්ටමෙ කමිටුවක් වන මෙහි ප්‍රධානත්වය ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිවරයා විසින් උසුලනු ලබන අතර මෙය පිහිටුවීමේ අරමුණ වූයේ මූල්‍ය වෙළඳපොළෙහි ක්‍රමානුකූල වර්ධනය සඳහා අවශ්‍ය නිසි ප්‍රතිපත්ති සම්පාදනය හා සමස්ථ මූල්‍ය පද්ධතියේම අභිවෘද්ධිය උදෙසා සියලු නියාමන නියෝජිතයින් සම්බන්ධීකරණය කරමින් තොරතුරු හුවමාරු කර ගැනීමයි. රක්ෂණ මණ්ඩලය අන්තර් නියාමන ආයතන සභාවේ ද නියෝජනය වෙයි.

### ශ්‍රී ලංකා රක්ෂණ සංගමය (IASL)

1989 දී ස්ථාපනය කරන ලද ශ්‍රී ලංකා රක්ෂණ සංගමයේ සාමාජිකත්වය පනත යටතේ ලියාපදිංචිය ලබා ඇති සෑම රක්ෂණ සමාගමකටම ලබා ගත හැකිය. ජාතික රක්ෂණ භාර අරමුදල හැර අනෙක් සියලු රක්ෂණ සමාගම් මෙම සංගමයේ සාමාජිකයෝය.

සියළුම රක්ෂණ සමාගම්හි ප්‍රධාන විධායක නිලධාරීන්ගෙන් සමන්විත විධායක කමිටුව සමස්ථ කළමනාකරණය පිළිබඳ වගකීම දරයි.

- ජීවිත රක්ෂණ සංසදය
- සාමාන්‍ය රක්ෂණ සංසදය
- මූල්‍ය තාක්ෂණ අනුකමිටුව
- නීති උපදේශන සංසදය
- මානව සම්පත් අනුකමිටුව
- තොරතුරු තාක්ෂණය පිළිබඳ අනු කමිටුව
- අලෙවිකරණය හා විකිණුම් සංසදය

යන කමිටු විසින් විධායක කමිටුවට සහාය වෙමින් ස්වකීය වගකීම් හා අදාළ වන්නාවූ විෂය ක්ෂේත්‍ර පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කෙරේ.

ශ්‍රී ලංකා රක්ෂණ සංගමයේ ප්‍රධාන අරමුණු:-

1. රක්ෂණය වන ජනතාව හා රක්ෂකයන්ගේ පොදු යහපත හා සුබසාධනය උදෙසා උපදෙස් සැපයීමටත්, සහයෝගීතාවටත් අවස්ථාව සලසනු වස් ශ්‍රී ලංකාව තුළ රක්ෂණ ව්‍යාපාරයේ නිරතව සිටින සියළු රක්ෂකයින් එකමුතු කිරීම.

2. රක්ෂණ ව්‍යාපාරය තුළ ඒකාකාරී යහපත් ක්‍රියා පිළිවෙතක් හා උසස් සදාචාරාත්මක මට්ටමක් පවත්වා ගැනීම ප්‍රවර්ධනය කිරීම මඟින් රක්ෂණ ව්‍යාපාරය පිළිබඳ රක්ෂණය වන ජනතාවගේ විශ්වාසය වර්ධනය කිරීම.

3. සාමාන්‍ය ජනතාව අතර රක්ෂණයේ අවශ්‍යතා හා වටිනාකම් පිළිබඳ දැනුවත්භාවය ගොඩනැගීම.

4. ව්‍යවස්ථාදායක හා නියාමන අවශ්‍යතා නිරීක්ෂණය තුළින් රක්ෂණ කර්මාන්තයේ ස්ථායීථාවය හා වර්ධනය සඳහා අදාළ බලධාරීන් වෙත කරුණු ඉදිරිපත් කිරීම.

5. වෙනත් රටවල රක්ෂණ ක්‍රමවේද හා තාක්ෂණික උපක්‍රම පරීක්ෂා කිරීම හා පුනරීක්ෂණය කිරීම මඟින් වඩාත් සුදුසු ක්‍රමවේදය ශ්‍රී ලංකා වෙළඳපොළට යොදා ගැනීම.

6. අධ්‍යාපන හා පුහුණු වැඩමුළු ඔස්සේ රක්ෂණ ක්ෂේත්‍රයේ වෘත්තීයභාවය ප්‍රවර්ධනය දිරිගැන්වීම හා ඊට සක්‍රීයව සහායවීම, ඒ සඳහා පන්ති, සම්මන්ත්‍රණ, වැඩමුළු, සංවාද, උපදේශන සහ රැස්වීම් පැවැත්වීම.

# පොදු සමාලෝචනය

## ශ්‍රී ලංකා රක්ෂණ තැරැව්කරුවන්ගේ සංගමය (SLIBA)

මණ්ඩලය විසින් අනුමත කරන ලද එකම රක්ෂණ තැරැව්කරුවන්ගේ සංගමය වන්නේ ශ්‍රී ලංකා රක්ෂණ තැරැව්කරුවන්ගේ සංගමයයි. පනතේ 79 වන වගන්තිය අනුව රක්ෂණ තැරැව්කාර සමාගමක් ලෙස ක්‍රියාකිරීමට අපේක්ෂා කරන සෑම සමාගමක්ම මණ්ඩලයේ ලියාපදිංචිය ලබා ගැනීමට පෙර මෙම සංගමයේ සාමාජිකත්වය ලබා ගැනීමට අවශ්‍ය වේ.

සංගමය විසින් සකස් කරනු ලැබූ එහි කටයුතු සඳහා අදාළ නීති මාලාව සාමාජික සමාගම් විසින් පිළිපදිනු ලැබිය යුතු වන්නේය.

ශ්‍රී ලංකා රක්ෂණ තැරැව්කරුවන්ගේ සංගමයේ ප්‍රධාන අරමුණු:

රක්ෂණ තැරැව්කරුවන්ගේ කාර්යභාරය පිළිබඳ මහජනතාව තුළ දැනුවත්භාවයක් ඇති කිරීම.

සාමාජිකයින් අතර තාක්ෂණික දැනුම වැඩි කිරීම හා ඉහළ මට්ටමක නිපුණතාවයක් සහ වෘත්තීය භාවයක් ගොඩනැගීම.

රක්ෂණ පාඨමාලාවන් හැදෑරීම සහ වෘත්තීය සුදුසුකම් ලබා ගැනීමට සාමාජිකයින්ව දිරිමත් කිරීම හා සහයෝගය ලබා දීම.

නියාමකයින්, රක්ෂකයින් සහ මහජනතාව සමඟින් හොඳ හිත සහ හිතකර සබඳතාවන් පවත්වා ගැනීම.

## ශ්‍රී ලංකා රක්ෂණ ආයතනය (SLII)

1982 වසරේ දී ස්ථාපනය කරන ලද ශ්‍රී ලංකා රක්ෂණ ආයතනය ලාභ නොලබන සංවිධානයක් වන අතර එහි ප්‍රධාන අරමුණ වන්නේ රක්ෂණ ව්‍යාපාරයෙහි නියුක්තවන්නන්ගේ දැනුම හා කුසලතා වර්ධනය කිරීමයි. ආයතනය අරමුදල් සපයා ගන්නේ රක්ෂණ සමාගම්වලින් පිරිනමන දායකත්වය තුළින් හා සාමාජිකයන්ගේ වාර්ෂික සාමාජික මුදල්වලිනි.

ශ්‍රී ලංකා රක්ෂණ ආයතනයේ ප්‍රධාන අරමුණු:

රක්ෂණ ක්ෂේත්‍රයේ නියුතු අයගේ පොදු සංවර්ධනය, ප්‍රගතිය හා කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය මධ්‍යම සංවිධානයක් ලෙස කටයුතු කිරීම හා ඔවුන්ගේ යහපත පිණිස මෙන්ම රක්ෂණ ව්‍යාපාරය වඩාත් කාර්යක්ෂම කිරීම හා කර්මාන්තය පිළිබඳව වෘත්තිකත්වය ලබා දීම.

රක්ෂණය පිළිබඳ වෘත්තීය සුදුසුකම් වර්ධනය කරවීමට ඩිප්ලෝමා සහ සහතිකපත්‍ර පාඨමාලා පැවැත්වීම තුළින් රක්ෂණය පිළිබඳ දැනුම වර්ධනය කිරීම. ඕනෑම පිළිගත් අධ්‍යාපන ආයතනයක් හරහා රක්ෂණ ක්ෂේත්‍රයේ ඕනෑම අංශයක විෂයයන් වෘත්තීය මට්ටමින් හැදෑරීම සඳහා සහාය දැක්වීමටත්, උනන්දු කිරීමටත් විහාග පැවැත්වීම.

වෘත්තීය කරුණු පිළිබඳව සාකච්ඡා, සම්මන්ත්‍රණ හෝ රැස්වීම් පැවැත්වීමටත්, පර්යේෂණ පත්‍රිකා, දේශන ආදිය ඉදිරිපත් කිරීමටත්, සාමාජිකයන්ට වැදගත් වන්නා වූ සිදුවීම්, වාර්තා හෝ ලැයිස්තු වැනි දෑ සංස්කරණයටත් ඉඩ සැලසීම.

ශ්‍රී ලංකා රක්ෂණ ආයතනයේ සාමාජිකයන්ගේ අයිතිවාසිකම් සහ සුභසාධනය ආරක්ෂා කිරීමටත්, ඔවුන්ගේ ප්‍රවර්ධනය පුළුල් කිරීමට මෙන්ම පොදුවේ ගත් කළ රක්ෂණ නිලධාරීන්ගේත්, ආයතනික සාමාජිකයින්ගේත් තත්ත්වයන් ඉහළ නැංවීම උදෙසා අවශ්‍ය වෘත්තීමය අධීක්ෂණය හා පාලනය ඇති කිරීම.

මෙම ආයතනය ලන්ඩනයේ වරලත් රක්ෂණ ආයතනයට අනුබද්ධව ඇති අතර ලන්ඩනයේ වරලත් රක්ෂණ ආයතනය, ඉන්දියාවේ රක්ෂණ ආයතනය සහ ඉන්දියාවේ ජීවගණක සංගමය වැනි වෘත්තීය ආයතනවල විභාග ද මෙහෙයවනු ලබයි. රක්ෂණ කර්මාන්තයෙහි නියැලෙන්නන් සඳහා සංගමය විසින් කෙටි කාලීන රක්ෂණ ඩිප්ලෝමා පාඨමාලා ද පවත්වනු ලැබේ.

රක්ෂණ නියෝජිතයින් ලෙස කටයුතු කිරීමට කැමැත්තක් දක්වන අය සඳහා පූර්ව බඳවා ගැනීම් පරීක්ෂණ සිදු කිරීමේ වගකීම මණ්ඩලය විසින් මෙම ආයතනයට පවරා ඇත. රක්ෂණ ක්ෂේත්‍රයෙහි සාමාන්‍ය හා දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාර පන්ති දෙවර්ගය සඳහාම ආයතනය විසින් පූර්ව බඳවා ගැනීමේ පරීක්ෂණ පවත්වනු ලැබේ.

## රක්ෂණ අධීක්ෂකයන්ගේ ජාත්‍යන්තර සංගමය (IAIS)

රක්ෂණ අධීක්ෂකයන්ගේ ජාත්‍යන්තර සංගමයේ සාමාජිකයෙක් වශයෙන් ඔවුන් විසින් ප්‍රකාශයට පත් කරනු ලබන ප්‍රකාශන මෙන්ම ප්‍රධාන රක්ෂණ ක්‍රියා පිළිවෙත් සහ සංගමයේ ක්‍රියාකාරකම් ආදිය පිළිබඳ තොරතුරු ද නිතිපතා මණ්ඩලයට ලැබේ. එම සංගමය විසින් නිර්දේශ කරනු ලබන සමහර ප්‍රධාන රක්ෂණ ක්‍රම පිළිවෙත් ශ්‍රී ලංකාවේ රක්ෂණ කර්මාන්තය එලදායී ලෙස අධීක්ෂණය කරනු හා මෙහෙයවනු පිණිස මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරනු ලැබේ.

# සංඛ්‍යානමය සමාලෝචනය

## රක්ෂණ කර්මාන්තය පිළිබඳ දළ විශ්ලේෂණය

2013 වසරේ දී ශ්‍රී ලංකා ආර්ථිකය 7.3% ක වර්ධනයක් පෙන්වමින් සතුටුදායක අයුරින් ක්‍රියාත්මක විය. තවද ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය රු. 372,814 (එ.ජ.ඩොලර් 2,922) සිට රු. 423,467 (එ.ජ.ඩොලර් 3,280) දක්වා වර්ධනයක් දක්නට ලැබුනි. 2013 වසරේ දී රක්ෂණ සමාගම් මුහුණ දුන් විවිධ අභියෝග හමුවේ වුව ද රක්ෂණ කර්මාන්තය අඛණ්ඩව වර්ධනය විය.

2013 වසරේ දී ජාතික රක්ෂණ භාර අරමුදල ඇතුළු රක්ෂණ ආයතන 21 ක් රක්ෂණ කර්මාන්තය තුළ ක්‍රියාත්මක විය. පළමු වන වගුවේ නිරූපණය වන ආකාරයට 2013 වසර තුළ රක්ෂණ කර්මාන්තය වාර්තා කළ මුළු දළ ලිඛිත වාරික (ද.ලි.වා) ආදායම පසුගිය වසරේ එම අගය වූ රු. මිලියන 87,171 හා සැසඳීමේ දී රු. මිලියන 94,483 ක් ලෙස වාර්තා විය. රක්ෂණ සමාගම් විසින් තහවුරු කළ පරිදි ජාතික රක්ෂණ භාර අරමුදලට අයත් වර්ජන, කැරලි කෝලාහල, සිවිල් කැළඹීම් හා ත්‍රස්තවාදය සඳහා වූ වාරික ආදායම රු. මිලියන 3,107 ක් වූ අතර ඒ සමඟ 2013 වසරේ සමුච්චිත දළ ලිඛිත වාරික ආදායම රු. මිලියන 97,590 (2012: රු. මිලියන 89,410) විය. 2012 වසරේ දී රක්ෂණ කර්මාන්තය වාර්තා කළ 11.06% ක දළ ලිඛිත වාරික ආදායමේ වර්ධනය හා සැසඳීමේදී 2013 වසරේදී එම අගය 8.39% ක් විය.

දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය රු. මිලියන 41,306 ක වාරික ආදායමක් වාර්තා කර ඇති අතර එය පසුගිය වසර හා සැසඳීමේදී 10.22% කින් වර්ධනය වී ඇත. 2013 වසරේදී දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරයේ වාරික ආදායම වර්ධනය විවිධ ප්‍රාරක්ෂණ සහ රක්ෂණ නිපැයුම් ක්‍රමෝපායන හඳුන්වා දීම හේතු වූ අතර මේ සඳහා සමාගම් විසින් ආයෝජන, ඉතුරුම් සහ විශ්‍රාම ඇතුළු රක්ෂණ නිපැයුම් කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීම සිදු විය.

පසුගිය වසරවල දී මෙන්ම සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය මුළු දළ ලිඛිත වාරික ආදායමෙන් 56.28% ක් වාර්තා කරමින් වෙළඳපොළ ඉදිරියෙන් සිටී. සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය 2012 වසරේ දී වාර්තා කළ රු. මිලියන 49,694 ක දළ ලිඛිත වාරික ආදායම හා සැසඳීමේ දී 2013 වසරේ දී එම අගය රු. මිලියන 53,177 ක් විය. සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ දළ ලිඛිත වාරික ආදායම වසර තුළ 7.01% කින් වර්ධනය වී ඇත.

රක්ෂණ වාරික ආදායම දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස ගණනය කළ විට ව්‍යාප්තිය 2013 වසරේ දී 1.09 ක් විය. දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරයේ ව්‍යාප්තිය 2013 වසරේ දී 0.48 ක් (2012 : 0.49) වූ අතර පසුගිය වසර හා සැසඳීමේ දී සුළු පසුබෑමක් වාර්තා කළේය. පසුගිය වසර පහ තුළ දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය නිරපේක්ෂ ලෙස වර්ධනය වුව ද රක්ෂණය කෙරෙහි පොදු ජනතාවගේ ආකල්ප, ප්‍රමාණවත් දැනුවත්භාවයක් නොමැතිකම, රක්ෂණ ඔප්පු කළමනාකරණයේ අකාර්යක්ෂම බව ආදී විවිධ හේතු මුල් කර ගෙන දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරයේ ව්‍යාප්තිය සාපේක්ෂව අඩු විය. 2012 වසරේ දී සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ ව්‍යාප්තිය 0.66 සිට 2013 වසරේ දී 0.61 දක්වා අඩුවීමක් පෙන්නුම් කළේය.

රක්ෂණ ඝනත්වය යනු රක්ෂණ වාරික ආදායම සමස්ත ජනගහනයේ අනුපාතයක් ලෙස දැක්වීම වන අතර එය පසුගිය වසර පහ ඇතුලත අඛණ්ඩව වර්ධනය වී ඇත. 2012 වසරේ රු. 4,288 ක් ලෙස වාර්තා වූ රක්ෂණ ඝනත්වය 2013 වසරේ දී රු. 4,613 ක් ලෙස වාර්තා විය.

*වගුව 01*

*වාරික ආදායම සහ ව්‍යාප්තිය*

| | 2009 | 2010 | 2011 | 2012(අ) | 2013(ආ) |
|---|---|---|---|---|---|
| දීර්ඝ කාලීන රක්ෂණය (රු. මිලියන) | 24,005 | 31,152 | 35,162 | 37,477 | 41,306 |
| සාමාන්‍ය රක්ෂණය (රු. මිලියන) | 33,548 | 35,101 | 43,329 | 49,694 | 53,177 |
| මුළු වාරික ආදායම (රු. මිලියන) | 57,553 | 66,253 | 78,491 | 87,171 | 94,483 |
| මුළු වාරික ආදායම් වර්ධන අනුපාතය (%) | (1.06) | 15.12 | 18.47 | 11.06 | 8.39 |
| දළ දේශීය නිෂ්පාදිතය (රු. බිලියන)* | 4,835 | 5,604 | 6,544 | 7,579 | 8,674 |
| දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන අනුපාතය (%)* | 3.5 | 8.0 | 8.2 | 6.3 | 7.3 |
| දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස ව්‍යාප්තිය - මුළු වාරික ආදායම | 1.19 | 1.18 | 1.20 | 1.15 | 1.09 |
| දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස ව්‍යාප්තිය - දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය | 0.50 | 0.56 | 0.54 | 0.49 | 0.48 |
| දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස ව්‍යාප්තිය - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය | 0.69 | 0.63 | 0.66 | 0.66 | 0.61 |
| රක්ෂණ ඝනත්වය - (මුළු වාරික ආදායම / ජනගහනය) (රුපියල්) | 2,814 | 3,208 | 3,761 | 4,288 | 4,613 |
| මධ්‍ය වාර්ෂික ජනගහනය (000)* | 20,450 | 20,653 | 20,869 | 20,328 | 20,483 |

** මූලාශ්‍රය ඃ ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව*
*(අ) ප්‍රතිශෝධිත විගණිත සංඛ්‍යා*
*(ආ) තාවකාලික සංඛ්‍යා*

*සටහන්:*

1. *2010 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා රක්ෂණ සමාගම්හි සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ ද.ලි.වා. ආදායම ගණනය සඳහා ජාතික රක්ෂණ භාර අරමුදලේ (NITF) වර්ජන, කැරලි කෝලාහල, සිවිල් කැළඹීම් හා ත්‍රස්තවාදය (SRCC & T) වාරික ආදායම සලකා බලා නොමැත.*
2. *අවශ්‍ය කරන ලද සම්පූර්ණ තොරතුරු මණ්ඩලය වෙත යොමු කර නොමැති බැවින් ජාතික රක්ෂණ භාර අරමුදලේ තොරතුරු ඉහත විශ්ලේෂණය සඳහා ඇතුලත් කර නොමැත.*
3. *රක්ෂණ ව්‍යාපාර කටයුතුවල නියැලීම සෙලින්කෝ තකාෆුල් සමාගම වෙත 2009 අගෝස්තු මස 5 වැනි දින සිට තහනම් කරනු ලැබීය. 2010 වර්ෂයේ සිට මූල්‍ය වාර්තා සමාගම විසින් මණ්ඩලය වෙත යොමු කර නොමැත.*

# සංඛ්‍යානමය සමාලෝචනය

## රක්ෂණ සමාගම් සතු මුළු වත්කම්

දෙවන වගුවේ දක්වා ඇති අන්දමට රක්ෂණ සමාගම් සතු මුළු වත්කම් 2012 වසර අවසානය වන විට වාර්තා කළ රු. මිලියන 315,817 හා සැසඳීමේ දී 2013 වසර අවසානය වන විට රු. මිලියන 356,566 ක් දක්වා වර්ධනයක් පෙන්නුම් කළේය. කෙසේවුව ද 2012 වසරේ දී වත්කම්වල වර්ධන අනුපාතය ලෙස වාර්තා වූ 20.81% හා සැසඳීමේ දී වත්කම්වල වර්ධන අනුපාතය 2013 වසර තුළ සැලකිය යුතු මට්ටමකින් අඩු වී ඇත.

දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරයෙහි වත්කම් 2013 දෙසැම්බර් මස 31 වන දින වන විට රු. මිලියන 217,004 ක් වූ අතර (2012: රු. මිලියන 190,642) ඉතිරි වත්කම් අගය වූ රු. මිලියන 146,778 (2012: රු. මිලියන 131,202) සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයට සහ කොටස්හිමියන්ට අයත් විය. දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරයේ වත්කම් සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ වත්කම් වසරින් වසර පිළිවෙලින් 13.83% කින් සහ 11.87% කින් වර්ධනය වී ඇත. පළමු වන රූප සටහන මඟින් 2009 සිට 2013 වසර දක්වා රක්ෂණ කර්මාන්තයේ මුළු වත්කම් සහ වත්කම්වල වර්ධන අනුපාතය පෙන්නුම් කරයි.

*වගුව 02*

**රක්ෂණ සමාගම් සතු වත්කම්**

| | 2009 | 2010 | 2011 | 2012(අ) | 2013(ආ) |
|---|---|---|---|---|---|
| දීර්ඝකාලීන රක්ෂණය (රුපියල් මිලියන) | 118,305 | 139,647 | 165,519 | 190,642 | 217,004 |
| සාමාන්‍ය රක්ෂණය සහ කොටස්හිමියන් (රුපියල් මිලියන) | 62,740 | 82,450 | 100,192 | 131,202 | 146,778 |
| **එකතුව** | **181,045** | ***219,102** | ***261,412** | ***315,817** | ***356,566** |


** 3 වන වගුවට අනුකූලව සංයුක්ත රක්ෂණ සමාගම්වල අන්තර් ව්‍යාපාර අංශ අතර ගනුදෙනු (දීර්ඝ කාලීන හා සාමාන්‍ය) ඉවත් කර ඇත.*
*(අ) ප්‍රතිශ්ඨාපිත විගණන සංඛ්‍යා*
*(ආ) තාවකාලික සංඛ්‍යා*

*සටහන්:*

1. *අවශ්‍ය කරන ලද සම්පූර්ණ තොරතුරු මණ්ඩලය වෙත යොමු කර නොමැති බැවින් ජාතික රක්ෂණ භාර අරමුදලේ (NITF) තොරතුරු ඉහත විශ්ලේෂණය සඳහා ඇතුලත් කර නොමැත.*
2. *රක්ෂණ ව්‍යාපාර කටයුතුවල නියැලීම සෙලින්කෝ තකාෆුල් සමාගම වෙත 2009 අගෝස්තු මස 5 වැනි දින සිට තහනම් කරනු ලැබීය. 2010 වර්ෂයේ සිට මූල්‍ය වාර්තා සමාගම විසින් මණ්ඩලය වෙත යොමු කර නොමැත.*
3. *අලියාන්ස් - ජීවිත, ආර්පිකෝ සහ එල්අයිසී හි කොටස් හිමියන්ට අයත් වත්කම් දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාර යටතේ වාර්තා කර ඇත.*

*රූප සටහන 01*

**රක්ෂණ කර්මාන්තයේ මුළු වත්කම් සහ වත්කම්වල වර්ධන අනුපාතය**




*(අ) ප්‍රතිශ්ඨාපිත විගණන සංඛ්‍යා (ආ) තාවකාලික සංඛ්‍යා*

# සංඛ්‍යානමය සමාලෝචනය

## රක්ෂණ සමාගම්වල වත්කම් ව්‍යාප්තිය

තෙවන වගුව සහ දෙවන රූප සටහන මගින් 2013 දෙසැම්බර් 31 වන දිනට රක්ෂණ සමාගම් අතර වත්කම් ව්‍යාප්තිය පෙන්නුම් කරයි. රක්ෂණ සමාගම්වලට අයත් මුළු වත්කම් ප්‍රමාණය රු. මිලියන 7,216 ක් වූ අන්තර් ව්‍යාපාර අංශ වත්කම් ඉවත් කිරීමෙන් පසුව රු. මිලියන 356,566 ක් විය. රු. මිලියන 142,905 ක් වටිනා වත්කම් වාර්තා කරමින් එස්එල්අයිසී සමස්ත වත්කම්වලින් 40.08% ක් හිමිකර ගත් අතර 2013 වසරේ දී රක්ෂණ සමාගම් අතර විශාලතම වත්කම් හිමිකරුවා බවට පත්විය. තවද රක්ෂණ ව්‍යාපාර වර්ගීකරණය අනුව එස්එල්අයිසී, දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරයේ වත්කම්වලින් 36.98% ක් ද සාමාන්‍ය රක්ෂණ හා කොටස් හිමියන්ට අයත් වත්කම්වලින් 42.69% ක් ද නියෝජනය කළේය. රු. මිලියන 81,574 ක් (22.88%) වාර්තා කරමින් සෙලින්කෝ දෙවන විශාලතම වත්කම් හිමිකරු බවට පත් වූ අතර ඉන්පසුව ඒඅයිඒ (රු. මිලියන 44,158, 12.38%), යූඒඑල් (රු. මිලියන 30,061, 8.43%%) සහ ජනශක්ති (රු. මිලියන 18,246, 5.12%) පත් විය.

මෙම රක්ෂණ සමාගම් පහ මුළු වත්කම්වලින් 88.98% ක් හිමි කර ගත් අතර ඉතිරි වත්කම් 11.11% අනෙකුත් රක්ෂණ සමාගම් පහළොව සතු විය. පසුගිය වසරට සාපේක්ෂව සියලු රක්ෂණ සමාගම්වල වත්කම් වර්ධනය වී ඇති අතර අලියාන්ස් - ජීවිත (72.06%), අලියාන්ස් සාමාන්‍ය (38.46%) සහ ඒඅයිජී (36.58%) කැපීපෙනෙන වර්ධනයන් වාර්තා කර ඇත.

*වගුව 03*

### රක්ෂණ සමාගම් අනුව වත්කම් විශ්ලේෂණය

| රක්ෂකයා | වත්කම්වල ව්‍යාප්තිය | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2012 (අ) | | | | | 2013 (ආ) | | | | |
| | දීර්ඝ කාලීන රක්ෂණය (රු. '000) | සාමාන්‍ය රක්ෂණය/ කොටස් හිමියන් (රු. '000) | අන්තර් ව්‍යාපාර අංශ ගනුදෙනු ඉවත් කිරීම (රු. '000) | එකතුව (රු. '000) | % | දීර්ඝ කාලීන රක්ෂණය (රු. '000) | සාමාන්‍ය රක්ෂණය/ කොටස් හිමියන් (රු. '000) | අන්තර් ව්‍යාපාර අංශ ගනුදෙනු ඉවත් කිරීම (රු. '000) | එකතුව (රු. '000) | % |
| ඒඅයිඒ | 33,250,987 | 7,695,830 | 189 | 40,946,628 | 12.97 | 35,442,431 | 8,742,090 | 26,385 | 44,158,136 | 12.38 |
| ඒඅයිජී | - | 877,850 | - | 877,850 | 0.28 | - | 1,198,947 | - | 1,198,947 | 0.34 |
| අලියාන්ස් සාමාන්‍ය | - | 1,970,061 | - | 1,970,061 | 0.62 | - | 2,727,780 | - | 2,727,780 | 0.77 |
| අලියාන්ස් ජීවිත | 621,738 | - | - | 621,738 | 0.20 | 1,069,784 | - | - | 1,069,784 | 0.30 |
| අමානා තකාෆුල් | 799,002 | 1,437,353 | 66,277 | 2,170,078 | 0.69 | 1,006,856 | 1,602,460 | 44,253 | 2,565,063 | 0.72 |
| ආර්පිකෝ | 574,549 | - | - | 574,549 | 0.18 | 740,875 | - | - | 740,875 | 0.21 |
| ඒෂියන් එලායන්ස් | 3,396,594 | 2,309,537 | - | 5,706,131 | 1.81 | 4,418,928 | 2,921,100 | - | 7,340,028 | 2.06 |
| සෙලින්කෝ | 47,823,738 | 25,321,135 | 4,809,161 | 68,335,712 | 21.64 | 57,204,038 | 30,853,084 | 6,483,228 | 81,573,894 | 22.88 |
| කොන්ටිනෙන්ටල් | - | 1,313,231 | - | 1,313,231 | 0.42 | - | 1,415,145 | - | 1,415,145 | 0.40 |
| කෝපරේටිව් | 706,116 | 1,638,413 | 24,584 | 2,319,945 | 0.73 | 832,844 | 2,176,431 | 6,386 | 3,002,889 | 0.84 |
| එච්එන්බීඒ | 3,875,310 | 3,143,968 | - | 7,019,278 | 2.22 | 4,598,540 | 3,436,137 | - | 8,034,677 | 2.25 |
| ජනශක්ති | 6,854,363 | 9,580,533 | - | 16,434,896 | 5.20 | 7,553,509 | 10,692,654 | - | 18,246,163 | 5.12 |
| එල්අයිසී | 1,404,322 | - | - | 1,404,322 | 0.44 | 1,666,226 | - | - | 1,666,226 | 0.47 |
| එල්ඕඑල්සී | 125,900 | 1,808,243 | 3,814 | 1,930,329 | 0.61 | 291,199 | 2,073,617 | 6,398 | 2,358,418 | 0.66 |
| එම්බීඑස්එල් | 191,718 | 1,113,219 | - | 1,304,937 | 0.41 | 257,450 | 1,270,345 | - | 1,527,795 | 0.43 |
| ඔරියන්ට් | - | 928,425 | - | 928,425 | 0.29 | - | 929,206 | - | 929,206 | 0.26 |
| පීපල්ස් | - | 3,163,419 | - | 3,163,419 | 1.00 | - | 3,853,669 | - | 3,853,669 | 1.08 |
| සණස | 363,054 | 595,524 | - | 958,578 | 0.30 | 572,540 | 617,857 | - | 1,190,397 | 0.33 |
| එස්එල්අයිසී | 72,615,041 | 59,767,334 | 282,157 | 132,100,218 | 41.83 | 80,245,761 | 62,659,721 | - | 142,905,482 | 40.08 |
| යූඒඑල් | 18,039,393 | 8,537,445 | 839,915 | 25,736,923 | 8.15 | 21,103,511 | 9,607,354 | 649,778 | 30,061,087 | 8.43 |
| **එකතුව** | **190,641,825** | **131,201,520** | **6,026,097** | **315,817,248** | **100** | **217,004,492** | **146,777,597** | **7,216,428** | **356,565,661** | **100** |

*(අ) ප්‍රතිශ්ධාපිත විගණන සංඛ්‍යා*
*(ආ) තාවකාලික සංඛ්‍යා*


*සටහන්:*

1. *අවශ්‍ය කරන ලද සම්පූර්ණ තොරතුරු මණ්ඩලය වෙත යොමු කර නොමැති බැවින් ජාතික රක්ෂණ භාර අරමුදලේ (NITF) තොරතුරු ඉහත විශ්ලේෂණය සඳහා ඇතුලත් කර නොමැත.*
2. *රක්ෂණ ව්‍යාපාර කටයුතුවල නියැලීම සෙලින්කෝ තකාෆුල් සමාගම වෙත 2009 අගෝස්තු මස 5 වැනි දින සිට තහනම් කරනු ලැබීය. 2010 වර්ෂයේ සිට මූල්‍ය වාර්තා සමාගම විසින් මණ්ඩලය වෙත යොමු කර නොමැත.*
3. *අලියාන්ස් - ජීවිත, ආර්පිකෝ සහ එල්අයිසී හි කොටස් හිමියන්ට අයත් වත්කම් දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාර යටතේ වාර්තා කර ඇත.*

# සංඛ්‍යානමය සමාලෝචනය

*රූප සටහන 02*

***සමාගම් මට්ටමින් සමස්ත වත්කම් සංකේන්ද්‍රගතවීම - 2013 දෙසැම්බර් 31***




## රක්ෂණ සමාගම්වල කොටස් හිමියන්ගේ අරමුදල්

සිව්වන වගුවෙන් නිරූපණය වන පරිදි රක්ෂණ සමාගම්වල කොටස් හිමියන්ගේ අරමුදල් 2012 දෙසැම්බර් මස 31 දින වන විට වාර්තා කළ රු. මිලියන 74,023 හා සැසඳීමේ දී 2013 දෙසැම්බර් 31 දින වන විට රු. මිලියන 84,407 විය. මෙම අගයට රුපියල් මිලියන 20,551 ක් වූ කොටස් ප්‍රාග්ධනය ද (2012: රු. මිලියන 20,137) රු. මිලියන 63,856ක් වූ සංචිතය ද (2012: රු. මිලියන 53,886) ඇතුලත් විය.

2012 වසර හා සැසඳීමේ දී සමස්ත කොටස් හිමියන්ගේ අරමුදල් 14.03% කින් ඉහළ ගිය අතර මෙය ප්‍රධාන වශයෙන් 18.5% ක වර්ධනය වූ සංචිත හේතුවෙන් සිදු විය. කොටස්හිමියන්ගේ අරමුදල් වලින් බහුතරය වූ 51.94% ක් (2012: 54.86%) එස්එල්අයිසී විසින් දැරූ අතර සෙලින්කෝ සමස්ත කොටස් හිමියන්ගේ අරමුදල් වලින් 17.81% ක් (2012:15.57%) දරමින් දෙවැනි ස්ථානය හිමිකර ගත්තේය. තවද සෙලින්කෝ කොටස් හිමියන්ගේ අරමුදල් රු. මිලියන 15,036 ලෙස 2013 වසරේ දී වාර්තා වී ඇති අතර එය 30.48%කින් වර්ධනයකි. යූඒඑල් සහ ඒඅයිඒ සමස්ත කොටස් හිමියන්ගේ අරමුදල් වලින් පිළිවෙලින් 5.65% ක් සහ 5.38% ක් හිමිකර ගනිමින් තෙවැනි හා හතරවැනි ස්ථාන හිමිකර ගත්තේය. යූඒඑල් සහ ඒඅයිඒ සමස්ත කොටස් හිමියන්ගේ අරමුදල් පිළිවෙලින් 17.37% කින් හා 12.97% කින් ඉහළ අගයක් වාර්තා කර ඇත.

ජනශක්ති කොටස් හිමියන්ගේ අරමුදල රු. මිලියන 4,028 ක් (2012: රු. මිලියන 3,376) ලෙස වාර්තා කර ගනිමින් පස්වන ස්ථානයට පත් විය. එය සමස්ත කොටස් හිමියන්ගේ අරමුදල් වලින් 4.77% ක් විය.

අලියාන්ස් ජීවිත හා ඒඅයිපී ඍණාත්මක සංචිත වාර්තා කළ ද මෙම සමාගම්වල සමස්ත කොටස් හිමියන්ගේ අරමුදල් 2012 වසර හා සැසඳීමේ දී පිළිවෙලින් 68.86% කින් හා 49.48% කින් වර්ධනය වී ඇත. සමාගම් විස්සෙන් හයක් 2013 වසර අවසන් වන විට ඍණ සංචිත වාර්තා කර ඇත.

# සංඛ්‍යානමය සමාලෝචනය

*වගුව 04*

***රක්ෂණ සමාගම්වල කොටස් හිමියන්ගේ මුළු අරමුදල්***

| රක්ෂකයා | 2012(අ) | | 2013(ආ) | | | |
|---|---|---|---|---|---|---|
| | කොටස් හිමියන්ගේ මුළු අරමුදල් (රු. '000) | % | කොටස් ප්‍රාග්ධනය (රු. '000) | මුළු සංචිත (රු. '000) | කොටස් හිමියන්ගේ මුළු අරමුදල් (රු. '000) | % |
| ඒඅයිඒ | 4,017,462 | 5.43 | 300,000 | 4,238,450 | 4,538,450 | 5.38 |
| ඒඅයිජී | 229,339 | 0.31 | 536,265 | (193,459) | 342,806 | 0.41 |
| අලියාස් සාමාන්‍ය | 780,285 | 1.05 | 250,000 | 624,849 | 874,849 | 1.04 |
| අලියාන්ස් ජීවිත | 155,105 | 0.21 | 592,624 | (330,710) | 261,914 | 0.31 |
| අමානා තකාෆුල් | 837,987 | 1.13 | 1,250,001 | (343,269) | 906,732 | 1.07 |
| ආර්පිකෝ | 470,459 | 0.64 | 563,000 | (46,334) | 516,666 | 0.61 |
| ඒෂියන් එලායන්ස් | 1,424,951 | 1.93 | 1,062,500 | 667,214 | 1,729,714 | 2.05 |
| සෙලින්කෝ | 11,523,688 | 15.57 | 1,324,822 | 13,710,905 | 15,035,727 | 17.81 |
| කොන්ටිනෙන්ටල් | 504,078 | 0.68 | 500,000 | 67,276 | 567,276 | 0.67 |
| කෝපරේටිව් | 750,943 | 1.01 | 632,020 | 360,945 | 992,965 | 1.18 |
| එච්එන්බීඒ | 1,868,281 | 2.52 | 1,171,875 | 944,741 | 2,116,616 | 2.51 |
| ජනශක්ති | 3,376,380 | 4.56 | 1,496,000 | 2,532,491 | 4,028,491 | 4.77 |
| එල්අයිසී | 508,724 | 0.69 | 500,000 | 89,632 | 589,632 | 0.70 |
| එල්ඕඑල්සී | 586,357 | 0.79 | 650,000 | 65,244 | 715,244 | 0.85 |
| එම්බීඑස්එල් | 400,851 | 0.54 | 880,724 | (481,673) | 399,051 | 0.47 |
| ඔරියන්ට් | 673,561 | 0.91 | 750,000 | (69,670) | 680,330 | 0.81 |
| පීපල්ස් | 863,002 | 1.17 | 600,000 | 484,881 | 1,084,881 | 1.29 |
| සණස | 377,602 | 0.51 | 352,922 | 63,789 | 416,711 | 0.49 |
| එස්එල්අයිසී | 40,609,497 | 54.86 | 6,000,000 | 37,837,829 | 43,837,829 | 51.94 |
| යූඒඑල් | 4,064,678 | 5.49 | 1,138,432 | 3,632,439 | 4,770,871 | 5.65 |
| **එකතුව** | **74,023,230** | **100** | **20,551,185** | **63,855,570** | **84,406,755** | **100** |

*(අ) ප්‍රතිශ්ඨාපිත විගණන සංඛ්‍යා*
*(ආ) තාවකාලික සංඛ්‍යා*

*සටහන්:*
*1. අවශ්‍ය කරන ලද තොරතුරු මණ්ඩලය වෙත යොමු කර නොමැති බැවින් ජාතික රක්ෂණ භාර අරමුදලේ (NITF) තොරතුරු ඉහත විශ්ලේෂණය සඳහා ඇතුලත් කර නොමැත.*

# සංඛ්‍යානමය සමාලෝචනය

## ප්‍රධාන මූල්‍ය අංශ අතර මුළු වත්කම් බෙදීයාම

පස්වන වගුවෙන් නිරූපණය වන ආකාරයට ආර්ථිකයේ ප්‍රධාන මූල්‍ය අංශ සතු මුළු වත්කම් 2013 වසර අවසානයේ දී රු. බිලියන 10,314 ක් වූ අතර එය 2012 වසරේ දී වාර්තා වූ රු. බිලියන 9,070 හා සැසඳීමේ දී 13.72% ක වර්ධනයකි. කෙසේවුවද, පසුගිය වසර තුන තුළ වාර්තා වූ 17% ක සාමාන්‍ය වර්ධන අනුපාතිකය හා සැසඳීමේ දී 2013 වසර තුළ දී මෙම මූල්‍ය ආයතනවල වත්කම් වර්ධනයවීමේ අනුපාතිකයේ අඩුවීමක් දක්නට ලැබුනි. 2013 වසරේ දී තැන්පතු භාර ගන්නා මූල්‍ය ආයතන හා විශේෂිත මූල්‍ය ආයතන පිළිවෙලින් 21.76% ක හා 21.10% ක වර්ධනයක් වාර්තා කර ඇත. මේ සමඟ සැසඳීමේ දී බැංකු අංශය, ගිවිසුම්ගත ඉතිරි කිරීමේ ආයතන හා රක්ෂණ සමාගම් පිළිවෙලින් 12.71% ක, 13.30% ක හා 12.9% ක සාමාන්‍ය වර්ධනයක් වාර්තා කර ඇත.

පස්වන වගුවෙන් සහ තෙවන රූප සටහනෙන් නිරූපණය වන ආකාරයට බැංකු අංශය රු. බිලියන 7,187 ක වත්කම් වාර්තා කළ අතර එය ප්‍රධාන මූල්‍ය ආයතනවල මුළු වත්කම්වලින් 69.7% ක් නිරූපණය කළේය. එමෙන්ම ගිවිසුම්ගත ඉතිරි කිරීමේ ආයතන රු. බිලියන 1,637.9 ක වත්කම් වාර්තා කළේය. තැන්පතු භාර ගන්නා අනෙකුත් මූල්‍ය ආයතන සහ විශේෂිත මූල්‍ය ආයතන මුළු වත්කම්වල සිය පංගුව වැඩි කර ගෙන ඇති අතර ඒවා පිළිවෙලින් 7.3% ක් සහ 3.6% ක් වේ. රක්ෂණ සමාගම්වල පංගුව 3.5% ක අගයේ පැවතුණි.

*වගුව 05*

**ප්‍රධාන මූල්‍ය අංශ අතර මුළු වත්කම් බෙදීයාම**

| වත්කම් බෙදීයාම | වත්කම් බෙදීයාම | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2009 | | 2010 | | 2011 | | 2012 (අ) | | 2013 (ආ) | |
| | රු. බිලියන | % | රු. බිලියන | % | රු. බිලියන | % | රු. බිලියන | % | රු. බිලියන | % |
| බැංකු අංශය | 3,832.0 | 68.2 | 4,527.3 | 68.9 | 5,375.6 | 69.7 | 6,377.0 | 70.3 | 7,187.5 | 69.7 |
| තැන්පතු භාර ගන්නා අනෙකුත් මූල්‍ය ආයතන | 315.1 | 5.6 | 295.0 | 4.5 | 427.1 | 5.5 | 621.2 | 6.9 | 756.4 | 7.3 |
| අනෙකුත් විශේෂිත මූල්‍ය ආයතන | 265.3 | 4.7 | 354.3 | 5.4 | 338.8 | 4.4 | 310.4 | 3.4 | 375.9 | 3.6 |
| ගිවිසුම්ගත ඉතිරි කිරීමේ ආයතන | 1,022.6 | 18.3 | 1,178.7 | 17.9 | 1,305.4 | 16.9 | 1,445.6 | 15.9 | 1,637.9 | 15.9 |
| රක්ෂණ සමාගම් | 181.0 | 3.2 | 219.10 | 3.3 | 261.4 | 3.4 | 315.8(a) | 3.5 | 356.6(b) | 3.5 |
| **එකතුව** | **5,616.0** | **100** | **6,574.4** | **100** | **7,708.3** | **100** | **9,070.0** | **100** | **10,314.3** | **100** |


*මූලාශය: ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තා - 2013 (රක්ෂණ සමාගම් සහ ගිවිසුම්ගත ඉතිරි කිරීමේ ආයතනවල වත්කම් රක්ෂණ සමාගම් වලින් ලැබූ දත්ත පාදකව ප්‍රතිශ්ඨාපිත කර ඇත.)*

*(අ) ප්‍රතිශ්ඨාපිත විගණන සංඛ්‍යා*

*(ආ) තාවකාලික සංඛ්‍යා*

*රූප සටහන 03*

**ප්‍රාග්ධන මූල්‍ය අංශ අතර මුළු වත්කම් බෙදීයාම - 2013 දෙසැම්බර් 31**



# සංඛ්‍යානමය සමාලෝචනය

## රක්ෂණ සමාගම්වල අලෙවිකරණ ව්‍යුහය

රක්ෂණ සමාගම් සිය වෙළඳපොළ පංගුව අත්කර ගැනීම සඳහා විවිධ ක්‍රමෝපායන යොදා ගෙන ඇත. මෑත අතීතයේ දී සමාගම් විසින් විශේෂයෙන්ම මෝටර් රථ රක්ෂණය වැනි රක්ෂණ නිපැයුම් අලෙවිකරණය වැඩි දියුණු කර ගැනීම සඳහා විද්‍යුත්-සේවාවන් යොදා ගෙන ඇත. එමෙන්ම ඇතැම් සමාගම් සමූහ අනුබද්ධිත සමාගම් හරහා ප්‍රතිලාභ උකහා ගෙන ඇති අතර ඇතැම් සමාගම් වෙළඳපොළ සුවිශේෂී අංශ, ක්ෂුද්‍ර රක්ෂණය ආදී ක්ෂේත්‍ර පිළිබඳව අවධානය යොමු කර ඇත.

## සේවාදායකයින්

රක්ෂණ කර්මාන්තය ශ්‍රී ලංකාවේ සෘජු හා වක්‍ර සේවානියුක්තිය සඳහා විශාල වශයෙන් දායක වී ඇත. 6 වන වගුව අනුව රක්ෂණ කර්මාන්තයේ සෘජුව රැකියා ලැබී ඇති සේවාදායක සංඛ්‍යාව 13,764 කි (2012: 12,471). සේවාදායකයින්ගෙන් බහුතරය බස්නාහිර පළාතේ සිටින අතර ඔවුන් සමස්ත සේවාදායකයින්ගෙන් 62.58% ක් නියෝජනය කරති. ඉන්පසුව දකුණු පළාත (7.60%), මධ්‍යම පළාත (7.49%) සහ වයඹ පළාත (5.44%) පිළිවෙලින් වැඩිම සේවාදායකයින් සංඛ්‍යාව නියෝජනය කරනු ලබයි. අනෙක් සියලු පළාත් මුළු සේවාදායකයින්ගෙන් 5%කටත් අඩු සංඛ්‍යාවක් නියෝජනය කරයි.

## ශාඛා ජාලය

2013 වර්ෂයේ දී සියලුම රක්ෂණ සමාගම්වල ශාඛාවන් සංඛ්‍යාව 1,376 ක් විය (2012: 1,184). මෙයට සාමාන්‍ය රක්ෂණ කටයුතුවල නියැලෙන ශාඛා 389 ක් ද, දීර්ඝ කාලීන රක්ෂණ කටයුතුවල නියැලෙන ශාඛා 524 ක් ද ඇතුලත් විය. රක්ෂණ සමාගම් ශාඛා 489 ක් පිහිටා ඇති බස්නාහිර පළාත තවදුරටත් විශාලතම වෙළඳපොළ විය. එමෙන්ම රක්ෂණ සමාගම් නව ශාඛා 195 ක් පිහිටුවමින් සිය ශාඛා ජාලය පුළුල් කර ගෙන ඇති අතර මෙයින් නව ශාඛා 99 ක් බස්නාහිර පළාත තුළ පිහිටුවා ඇත. අනෙක් නව ශාඛා ඔප්පු හිමියන්ට ඇති ප්‍රවේශය පුළුල් කරමින් සියලුම පළාත්වල විසිරී පිහිටා ඇති නමුත් 2012 වර්ෂයේ දී ශාඛා 79 ක් තිබූ ඌව පළාතේ 2013 වර්ෂයේ දී ශාඛා සංඛ්‍යාව 67 ක් දක්වා අඩු විය.

## රක්ෂකයන්ගේ නියෝජිතයින්

2013 වර්ෂය තුළ රක්ෂණ වෙළඳපොළ තුළ නියෝජිතයින් 38,635 ක් (2012: 36,801) අනුයුක්තව සිටියහ. දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාර ප්‍රධාන වශයෙන්ම නියෝජිතයින් මත රැඳී පැවති අතර ජීවිත රක්ෂණ නිපැයුම් පමණක් අලෙවි කළ නියෝජිතයින් සංඛ්‍යාව 20,909 ක් විය. තවද නියෝජිතයින් 13,649 ක් ජීවිත හා සාමාන්‍ය රක්ෂණ නිපැයුම් අලෙවිකරණයේත් නියෝජිතයින් 4,077 ක් සාමාන්‍ය රක්ෂණ නිපැයුම් පමණක් අලෙවිකරණයේත් නිරත වූහ.

2013 දෙසැම්බර් 31 වන දිනට එක් එක් පළාතේ ක්‍රියාත්මක වූ ශාඛා, සේවාදායකයින් සහ නියෝජිතයින් සංඛ්‍යාව පිළිබඳ විස්තර සිව්වන රූප සටහන මගින් දැක්වේ.

*වගුව 06*

***2012 සහ 2013 දෙසැම්බර් 31 ට ක්‍රියාත්මක වූ ශාඛා සංඛ්‍යාව, සේවාදායකයින් සහ නියෝජිතයින්***


| පළාත | ශාඛා සංඛ්‍යාව | | ප්‍රධාන කාර්යාලයේ සේවාදායකයින් ඇතුළුව සමස්ත සේවාදායකයින් සංඛ්‍යාව | | නියෝජිතයින් සංඛ්‍යාව | |
|---|---|---|---|---|---|---|
| | 2013 | 2012 | 2013 | 2012 | 2013 | 2012 |
| මධ්‍යම පළාත | 126 | 112 | 1,031 | 800 | 3,820 | 3,338 |
| නැගෙනහිර පළාත | 86 | 71 | 404 | 343 | 1,773 | 1,916 |
| උතුරුමැද පළාත | 97 | 95 | 603 | 540 | 2,324 | 2,363 |
| වයඹ පළාත | 126 | 116 | 749 | 780 | 3,613 | 3,592 |
| උතුරු පළාත | 108 | 83 | 421 | 364 | 2,945 | 2,704 |
| සබරගමුව පළාත | 104 | 95 | 535 | 500 | 2,611 | 2,257 |
| දකුණු පළාත | 176 | 143 | 1,046 | 948 | 4,637 | 4,080 |
| ඌව පළාත | 67 | 79 | 362 | 492 | 2,294 | 2,200 |
| බස්නාහිර පළාත | 489 | 390 | 8,613 | 7,704 | 14,618 | 14,351 |
| **එකතුව** | **1,379** | **1,184** | **13,764** | **12,471** | **38,635** | **36,801** |

*සටහන්:*

*1. අවශ්‍ය කරන ලද සම්පූර්ණ තොරතුරු මණ්ඩලය වෙත යොමු කර නොමැති බැවින් ජාතික රක්ෂණ භාර අරමුදලේ (NITF) තොරතුරු ඉහත විශ්ලේෂණය සඳහා ඇතුලත් කර නොමැත.*

*රූප සටහන 04*

***2013 දෙසැම්බර් 31 ට ක්‍රියාත්මක වූ ශාඛා සංඛ්‍යාව, සේවාදායකයින් සහ නියෝජිතයින්***




# සංඛ්‍යානමය සමාලෝචනය

## රක්ෂණ සමාගම්වල බෙදා හැරීමේ නාලිකා

රක්ෂණ නියෝජිතයින් තවදුරටත් දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරයේ ප්‍රධාන බෙදා හැරීමේ නාලිකාව වන අතර 2013 වසර තුළ දී වාරික ආදායම්වලින් 91.22% ක් නියෝජිතයින් හරහා සිදු විය. ඉතිරිය සෘජු අලෙවිකරණය (5.96%), බැංකු රක්ෂණය (2.36%) සහ තැරැව්කාර සමාගම් (0.46%) ආදී අනෙකුත් සෘජු නාලිකා හරහා සිදු විය.

රක්ෂණ සමාගම් දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාර සඳහා මෙන් නොව සාමාන්‍ය රක්ෂණ නිපැයුම් අලෙවිකරණය සඳහා විවිධාකාර බෙදාහැරීමේ නාලිකා භාවිතා කරයි. 5 වැනි වගුවේ නිරූපණය කර ඇති පරිදි සෘජු අලෙවිකරණය හරහා ලැබූ වාරික ආදායම 2012 වර්ෂයේ වාර්තා කළ 47.38% හා සැසඳීමේ දී 2013 වර්ෂයේ මුළු දළ ලිඛිත ආදායමින් 50.17% ක් විය. එමෙන්ම අනෙකුත් බෙදාහැරීමේ නාලිකා හා සැසඳීමේ දී සෘජු අලෙවිකරණය 2011 වර්ෂයේ සිට ක්‍රමයෙන් වර්ධනය වී ඇති බව මෙමඟින් නිරූපණය වේ. නියෝජිතයින් තවදුරටත් දෙවැනියට විශාලතම බෙදාහැරීමේ නාලිකාව වූ අතර 2013 වර්ෂයේ දී දළ ලිඛිත ආදායමින් 22.16% ක් විය. මෙයට අමතරව තැරැව්කාර සමාගම් සහ බැංකු රක්ෂණවලින් සාමාන්‍ය රක්ෂණයේ දළ ලිඛිත ආදායමට කළ දායකත්වය 2013 වර්ෂයේ දී පිළිවෙලින් 20.98% ක් සහ 2.44% ක් විය.

*රූප සටහන 05*
***රක්ෂණ සමාගම්වල බෙදා හැරීමේ නාලිකා***




| | 2012 | | 2013 | |
|---|---|---|---|---|
| | දීර්ඝ කාලීන | සාමාන්‍ය | දීර්ඝ කාලීන | සාමාන්‍ය |
| නියෝජිතයින් | 92.69 | 24.30 | 91.22 | 22.16 |
| තැරැව්කරුවන් | 0.52 | 21.28 | 0.46 | 20.98 |
| සෘජු | 4.89 | 47.38 | 5.96 | 50.17 |
| බැංකු රක්ෂණ | 1.90 | 2.66 | 2.36 | 2.44 |
| වෙනත් | - | 4.38 | - | 4.26 |

# සංඛ්‍යානමය සමාලෝචනය

## දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාරය

### දළ ලිඛිත වාරික ආදායම

2013 වර්ෂය තුළ දී දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරයෙහි දළ ලිඛිත වාරික ආදායම රුපියල් මිලියන 41,306 ක් වූ අතර (2012: රුපියල් මිලියන 37,477) පසුගිය වසර හා සැසඳීමේ දී 10.22% කින් වර්ධනය විය. මෙයට සාපේක්ෂව දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාරයේ දළ ලිඛිත වාරික ආදායම 2012 දී 6.58% කින් වර්ධනය විය. තවද දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාරයේ අඩු ව්‍යාප්ති මට්ටම් වාර්තා වුව ද දළ ලිඛිත වාරික ආදායම 2009 සහ 2013 වර්ෂ අතර 72.07% කින් වර්ධනය වී ඇත.

වෙළඳපොළ පංගුවේ සුළු පහළයාමක් තිබුන ද සෙලින්කෝ දීර්ඝකාලීන රක්ෂණ වෙළඳපොළේ ප්‍රමුඛයා බවට පත්ව ඇති අතර එම සමාගම විසින් 26.93% වෙළඳපොළ පංගුවක් (2012: 28.90%) සමඟ රුපියල් මිලියන 11,123 ක (2012: රුපියල් මිලියන 10,829) දළ ලිඛිත වාරික ආදායමක් උපයා ගෙන ඇත. 19.54% ක පංගුවක් ඇතිව එස්එල්අයිසී වෙළඳපොළේ විශාලතම ක්‍රියාකරුවා වූ අතර ඒඅයිඒ (16.62%) සහ යූඒඑල් (13.35%) ඉන්පසුව තෙවන හා හතරවන ස්ථාන හිමි කර ගැනීමට සමත් විය. 6.10% ක (2012: 5.43%) වෙළඳපොළ පංගුවක් හිමිකර ගත් ඒෂියන් එලායන්ස් 2013 වර්ෂය තුළ දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාර වෙළඳපොළේ පස්වන ස්ථානය හිමි කර ගත්තේය.

2012 වර්ෂය හා සැසඳීමේ දී 2013 වර්ෂය තුළ එල්ඕඑල්සී (158.66%) සහ ආර්පිකෝ (102.64%) වැනි නව සමාගම්වල සහ අලියාන්ස් ජීවිත (55.75%) සහ අමානා තකාෆුල් (46.86%) වැනි සමාගම්වල ද දළ ලිඛිත වාරික ආදායමේ කැපීපෙනෙන වර්ධනයක් දක්නට ලැබුනි. 7 වන වගුව සහ 6 වන රූප සටහන මගින් දක්වා දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරයෙහි දළ ලිඛිත වාරික ආදායම සමාගම් මට්ටමින් වන වෙළඳපොළ පංගුව නිරූපණය කරයි.

*වගුව 07*

**දළ ලිඛිත වාරික ආදායම සමාගම් මට්ටමින් - දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාර**


| රක්ෂකයා | 2009 | | 2010 | | 2011 | | 2012(අ) | | 2013(ආ) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | වාරික ආදායම (රු. '000) | වෙළඳපොළ පංගුව (%) | වාරික ආදායම (රු. '000) | වෙළඳපොළ පංගුව (%) | වාරික ආදායම (රු. '000) | වෙළඳපොළ පංගුව (%) | වාරික ආදායම (රු. '000) | වෙළඳපොළ පංගුව (%) | වාරික ආදායම (රු. '000) | වෙළඳපොළ පංගුව (%) |
| ඒඅයිඒ | 4,632,490 | 19.30 | 7,783,925 | 24.99 | 7,846,447 | 22.32 | 6,495,863 | 17.33 | 6,863,047 | 16.62 |
| අලියාන්ස් ජීවිත | 101,816 | 0.42 | 204,814 | 0.66 | 351,299 | 1.00 | 532,142 | 1.42 | 828,790 | 2.01 |
| අමානා තකාෆුල් | 207,097 | 0.86 | 240,156 | 0.77 | 303,786 | 0.86 | 364,759 | 0.97 | 542,986 | 1.31 |
| ආර්පිකෝ | - | - | - | - | - | - | 101,900 | 0.27 | 206,494 | 0.50 |
| ඒෂියන් එලායන්ස් | 1,009,031 | 4.20 | 1,242,608 | 3.99 | 1,579,191 | 4.49 | 2,034,084 | 5.43 | 2,520,283 | 6.10 |
| සෙලින්කෝ | 7,522,328 | 31.34 | 8,786,120 | 28.21 | 9,815,943 | 27.91 | 10,829,470 | 28.90 | 11,122,906 | 26.93 |
| කෝපරේටිව් | 149,401 | 0.62 | 233,540 | 0.75 | 269,579 | 0.77 | 312,056 | 0.83 | 337,976 | 0.82 |
| එච්එන්බීඒ | 984,866 | 4.10 | 1,084,480 | 3.48 | 1,290,367 | 3.67 | 1,500,028 | 4.00 | 2,014,547 | 4.88 |
| ජනශක්ති | 1,431,628 | 5.96 | 1,685,409 | 5.42 | 1,871,986 | 5.32 | 2,025,075 | 5.40 | 2,150,507 | 5.21 |
| එල්අයිසී | 251,150 | 1.05 | 252,656 | 0.81 | 295,859 | 0.84 | 303,344 | 0.81 | 322,712 | 0.78 |
| එල්ඕඑල්සී | - | - | - | - | 51,427 | 0.15 | 106,238 | 0.28 | 274,798 | 0.67 |
| එම්බීඑස්එල් | 55,606 | 0.24 | 89,984 | 0.28 | 143,156 | 0.41 | 192,780 | 0.51 | 251,720 | 0.61 |
| සණස | 61,563 | 0.26 | 73,030 | 0.23 | 128,113 | 0.36 | 203,616 | 0.54 | 283,975 | 0.69 |
| එස්එල්අයිසී | 4,819,860 | 20.08 | 6,009,859 | 19.29 | 6,743,073 | 19.18 | 7,369,031 | 19.66 | 8,069,964 | 19.54 |
| යූඒඑල් | 2,778,184 | 11.57 | 3,465,505 | 11.12 | 4,471,627 | 12.72 | 5,106,323 | 13.63 | 5,515,063 | 13.35 |
| **එකතුව** | **24,005,020** | **100** | **31,152,086** | **100** | **35,161,853** | **100** | **37,476,709** | **100** | **41,305,768** | **100** |
| **වර්ධන අනුපාතය (%)** | **1.66** | | **29.77** | | **12.87** | | **6.58** | | **10.22** | |

*(අ) ප්‍රතිශෝධිත විගණන සංඛ්‍යා*
*(ආ) තාවකාලික සංඛ්‍යා*

# සංඛ්‍යානමය සමාලෝචනය

*රූප සටහන 06*

***දළ ලිඛිත වාරික ආදායම සමාගම් මට්ටමින් - 2013 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාරය***





**ඉහළම දළ ලිඛිත වාරික ආදායමක් ජනනය කළ ප්‍රමුඛතම සමාගම් පහේ සහ අනෙක් රක්ෂකයන්ගේ වෙළඳපොළ කොටස - දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාරය**

7 වන වගුවේ නිරූපණය වන පරිදි සෙලින්කෝ, එස්එල්අයිසී, ඒඅයිඒ, යූඒඑල් සහ ඒෂියන් එලායන්ස් සමාගම් වෙළඳපොළ තුළ ප්‍රමුඛතම ස්ථාන හිමිකර ගැනීමට සමත්විය. කෙසේවුව ද අනෙකුත් ක්‍රියාකාරුවන් පහළොස් දෙනාගෙන් එල්ල වූ ඉහළ තරඟකාරිත්වය හේතුවෙන් මෙම ප්‍රමුඛ සමාගම් පහේ සමුච්චිත වෙළඳපොළ පංගුව 2012 දී තිබූ 84.95% සිට 2013 වර්ෂයේ දී 82.54% දක්වා අඩු වී ඇත. මෙම සමාගම් පහේ සහ අනෙක් රක්ෂකයන්ගේ වෙළඳපොළ කොටස 7 වන රූප සටහනෙන් නිරූපණය කෙරේ.

*රූප සටහන 07*

***2009 සිට 2013 දක්වා වර්ෂ සඳහා ඉහළම දළ ලිඛිත වාරික ආදායමක් ජනනය කළ ප්‍රමුඛතම සමාගම් පහේ සහ අනෙක් රක්ෂකයන්ගේ වෙළඳපොළ කොටස - දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාරය***




| | සෙලින්කෝ | එස්එල්අයිසී | ඒඅයිඒ | යූඒඑල් | ඒෂියන් එලායන්ස් | වෙනත් රක්ෂකයින් |
|---|---|---|---|---|---|---|
| 2009 | 31.34 | 20.08 | 19.30 | 11.57 | 4.20 | 13.51 |
| 2010 | 28.21 | 19.29 | 24.99 | 11.12 | 3.99 | 12.39 |
| 2011 | 27.91 | 19.18 | 22.32 | 12.72 | 4.49 | 13.39 |
| 2012(a) | 28.90 | 19.66 | 17.33 | 13.63 | 5.43 | 15.05 |
| 2013(b) | 26.93 | 19.54 | 16.62 | 13.35 | 6.10 | 17.47 |

*(ඇ) ප්‍රතිශ්ඨාපිත විගණන සංඛ්‍යා*
*(ආ) තාවකාලික සංඛ්‍යා*

# සංඛ්‍යානමය සමාලෝචනය


## රක්ෂණ සමාගම් දැරූ හිමිකම්පෑම් - දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාරය

පසුගිය වසර පහ තුළ දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාරයේ නියැලි රක්ෂණ සමාගම් විසින් දැරූ හිමිකම්පෑම් 8 වන රූප සටහන මඟින් නිරූපණය වේ. 2013 වර්ෂය සඳහා සමාගම් දැරූ මුළු දිගුකාලීන රක්ෂණ හිමිකම්පෑම් රුපියල් මිලියන 18,181 ක් (2012: රුපියල් මිලියන 13,472) වූ අතර 2012 වසර හා සැසඳීමේ දී 34.95% ක වර්ධනයක් නිරූපණය විය. කල්පිරුණු හිමිකම්පෑම් රුපියල් මිලියන 9,728 ක් (2012: රුපියල් මිලියන 7,861) වූ අතර එය මුළු හිමිකම්පෑම්වලින් 53.51% ක් විය.

2013 වසරේ දී ඒකක සබැඳි රක්ෂණ ඔප්පුවල පවාරණයේ කැපී පෙනෙන වර්ධනයක් දක්නට ලැබුනු අතර ඒ අනුව 2012 වසරේ දී වාර්තා වූ රුපියල් මිලියන 2,824 හා සැසඳීමේ දී රුපියල් මිලියන 5,687 ක පවාරණ හිමිකම්පෑම් සිදු විය. මෙය 2013 වසරේ සිදු කළ මුළු හිමිකම්පෑම්වලින් 31.28% ක් නිරූපණය කළේය. මරණ හිමිකම්පෑම් රුපියල් මිලියන 1,030 ක් (2012: රුපියල් මිලියන 789) වූ අතර අත්තිකාරම් ගෙවීම්, මූල්‍ය ප්‍රසාද දීමනා සහ කල්නොපිරුණු ගෙවීම් ආදී වෙනත් හිමිකම්පෑම් රුපියල් මිලියන 1,566 ක් (2012: රුපියල් මිලියන 1,921) ක් විය.

*රූප සටහන 08*

**රක්ෂණ සමාගම් දැරූ හිමිකම්පෑම් - දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාරය**




| | 2009 | 2010 | 2011 | 2012(අ) | 2013(ආ) |
|---|---|---|---|---|---|
| අකර්මන්‍යතා ප්‍රතිලාභ | 38,990 | 63,296 | 31,183 | 77,717 | 169,281 |
| මරණ | 1,150,507 | 1,073,808 | 681,111 | 789,166 | 1,030,424 |
| පවාරණ | 2,132,216 | 2,243,555 | 2,225,506 | 2,823,924 | 5,687,033 |
| කල්පිරීමේ ප්‍රතිලාභ | 4,841,981 | 6,441,973 | 6,242,096 | 7,860,715 | 9,728,046 |
| වෙනත් | 1,269,225 | 1,792,890 | 1,367,512 | 1,920,859 | 1,566,340 |

*(අ) ප්‍රතිශ්ඨාපිත විගණන සංඛ්‍යා*
*(ආ) තාවකාලික සංඛ්‍යා*

## රක්ෂණ හිමිකම්පෑම් සංඛ්‍යාව - දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාරය

2013 වසරේ දීර්ඝකාලීන රක්ෂණ සමාගම් විසින් හිමිකම්පෑම් 284,103 ක් දරා ඇත. කල්පිරුණු හිමිකම්පෑම් මුළු හිමිකම්පෑම්වලින් 46% ක් විය. තවද අනෙකුත් හිමිකම්පෑම් සහ පවාරණ හිමිකම්පෑම් දිගුකාලීන රක්ෂණ හිමිකම්පෑම් මුළු සංඛ්‍යාවෙන් පිළිවෙලින් 34.90% ක් සහ 14.77% ක් විය. 2009 වසරේ සිට 2013 වසර දක්වා දිගුකාලීන රක්ෂණ හිමිකම්පෑම් සංඛ්‍යාව කාණ්ඩ අනුව 8 වන වගුවේ නිරූපණය වේ.

*වගුව 08*

**රක්ෂණ හිමිකම්පෑම් සංඛ්‍යාව - දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාරය**

| | 2009 | 2010 | 2011 | 2012(අ) | 2013(ආ) |
|---|---|---|---|---|---|
| අකර්මන්‍යතා ප්‍රතිලාභ | 441 | 628 | 569 | 578 | 7,009 |
| මරණ | 4,423 | 5,063 | 4,328 | 4,358 | 5,278 |
| පවාරණ | 27,150 | 25,771 | 25,661 | 24,631 | 41,976 |
| කල්පිරීමේ ප්‍රතිලාභ | 58,265 | 87,742 | 98,363 | 102,465 | 130,692 |
| වෙනත් | 37,685 | 42,939 | 45,885 | 51,773 | 99,148 |
| **එකතුව** | **127,964** | **162,143** | **174,806** | **183,805** | **284,103** |

*(අ) ප්‍රතිශ්ඨාපිත විගණන සංඛ්‍යා*
*(ආ) තාවකාලික සංඛ්‍යා*

# සංඛ්‍යානමය සමාලෝචනය

## දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාරයේ වත්කම්

දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාරයේ වත්කම් සංකේන්ද්‍රගතවීම 9 වන වගුව සහ 9 වන රූපසටහන මඟින් දැක්වෙයි. වගකීම්වල දිගුකාලීන ස්වභාවය හේතුවෙන් දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාරයේ ආයෝජන ප්‍රධාන වශයෙන් රාජ්‍ය සුරැකුම්පත් සහ තැන්පතුවල ආයෝජනය කර ඇති අතර එය මුළු වත්කම්වලින් 62.15% ක් (2012 : 68.16%) ලෙස පෙන්නුම් කරයි.

රාජ්‍ය සුරැකුම්පත්වල ආයෝජනය ප්‍රධාන ආයෝජන කාණ්ඩය ලෙස තවදුරටත් රැඳී තිබූ අතර 2013 දෙසැම්බර් 31 වන විට එය මුළු වත්කම්වලින් 43.33% ක් විය. මුළු වත්කම්වල රාජ්‍ය සුරැකුම්පත්වල කොටස මීට පෙර වසරේ දී පවත්වා ගත් 51.48% ක කොටස හා සැසඳීමේ දී 2013 වසර තුළ කැපීපෙනෙන අඩු වීමක් දක්නට ලැබේ.

මුළු වත්කම්වලින් 18.82% ක් (2012 : 16.68%) වූ බැංකු තැන්පතු ප්‍රධාන ආයෝජන කාණ්ඩයක් විය. තවද සංස්ථා ණය සාධනපත්‍රවල ආයෝජනය කිරීමේ නැඹුරුව 2013 වසරේ දී ඉහළ වර්ධනයක් දක්නට ලැබුනි. පසුගිය වසරේ දී රුපියල් මිලියන 13, 286 ක් වූ සංස්ථා ණය ආයෝජන හා සැසඳීමේ දී 2013 වසරේ දී රුපියල් මිලියන 32,934 ක කැපීපෙනෙන වර්ධනයක් දක්නට ලැබේ. මෙය මුළු වතකම්වලින් 15.18% ක් (2012 : 6.97%) නිරූපණය කරයි.

*වගුව 09*


*2012 සහ 2013 දෙසැම්බර් 31 දිනට දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරයේ වත්කම් සංකේන්ද්‍රගතවීම*

| | 2012(අ) | | 2013(ආ) | |
|---|---|---|---|---|
| **වත්කම් වර්ගය** | රු. '000 | % | රු. '000 | % |
| රාජ්‍ය ණය සුරැකුම්පත් | 98,146,810 | 51.48 | 94,024,169 | 43.33 |
| ස්කන්ධ | 26,404,884 | 13.85 | 25,061,264 | 11.55 |
| සංස්ථා ණය | 13,285,667 | 6.97 | 32,934,384 | 15.18 |
| ඉඩම් හා ගොඩනැගිලි | 5,951,450 | 3.12 | 6,129,837 | 2.82 |
| තැන්පතු | 31,790,111 | 16.68 | 40,837,963 | 18.82 |
| ඒකක භාර | 1,589,873 | 0.83 | 2,302,039 | 1.06 |
| රත්රන්වල ආයෝජනය | 31,832 | 0.02 | 29,295 | 0.01 |
| දිගුකාලීන රක්ෂණ ඔප්පු මත ණය | 4,678,904 | 2.45 | 5,182,399 | 2.39 |
| වෙනත් වත්කම් | 7,349,386 | 3.86 | 8,988,394 | 4.14 |
| මුදල් හා මුදල් සමාන දෑ | 1,412,907 | 0.74 | 1,514,748 | 0.70 |
| **එකතුව** | **190,641,825** | **100** | **217,004,492** | **100** |

*(අ) ප්‍රතිශ්ඨාපිත විගණන සංඛ්‍යා*
*(ආ) තාවකාලික සංඛ්‍යා*

*රූප සටහන 09*

*2013 දෙසැම්බර් 31 දිනට දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරයේ වත්කම් සංකේන්ද්‍රගතවීම - දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාරය*



# සංඛ්‍යානමය සමාලෝචනය

## දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාරයේ ආයෝජන ප්‍රතිලාභ

10 වන වගුව මඟින් 2012 සහ 2013 වසරවල සාමාන්‍ය ආයෝජනය, ආයෝජන ආදායම සහ ආයෝජන ප්‍රතිලාභ නිරූපණය කරයි. 2013 වසරේ දී මුළු ආයෝජන ආදායම රුපියල් මිලියන 21,479 ක් විය. 2012 වසරේ රුපියල් මිලියන 17,172 ක් වූ ආයෝජන ආදායම හා සැසඳීමේ දී 2013 වසරේ එම අගය 25.28% කින් වර්ධනය වී ඇත.

රුපියල් මිලියන 11,880 ක් වූ රාජ්‍ය සුරැකුම්පත් ආයෝජන ප්‍රතිලාභ වසර තුළ දී ඉහළම ආදායම වාර්තා කළේය. බැංකු තැන්පතුවල ආයෝජන ආදායම රුපියල් මිලියන 5,814 ක් වූ අතර 16.01% ක ඉහළම ආයෝජන ප්‍රතිලාභය වාර්තා කළේය. දීර්ඝකාලීන රක්ෂකයින් ඉහළ ප්‍රතිලාභ ඇති බැංකු තැන්පතුවල ආයෝජනය කිරීම මෙයට හේතු විය. 2013 වසර තුළ දී සමාගම්වලට මෙම දීර්ඝකාලීන බැංකු තැන්පතුවලින් ප්‍රතිලාභ නෙළා ගැනීමට හැකි විය. තවද මූල්‍ය සමාගම්වල බැංකු තැන්පතුවලින් උපයා ගත් රුපියල මිලියන 164 ක ආයෝජන ආදායම හා සැසඳීමේ දී රක්ෂණ සමාගම් මඟින් බැංකු තැන්පතුවලින් රුපියල් මිලියන 5,650 ක ආයෝජන ආදායමක් උත්පාදනය කර ගැනීමට හැකි වී ඇති බව පෙනේ. එමෙන්ම බැංකු තැන්පතු ආදායම වර්ධනය 53.87% ක් ලෙස වාර්තා විය.

සංස්ථා ණයවල සාමාන්‍ය ආයෝජනය කැපී පෙනෙන ලෙස ඉහළ ගොස් ඇති අතර (92.80%) 2013 වසරේ දී ප්‍රතිලාභය 11.07% ක් ලෙස වාර්තා විය. කොටස් වෙළඳපොළ මෙහෙයුම් යහපත් අතට හැරීමේ ඇතැම් ලක්ෂණ සමඟ ස්කන්ධ ආයෝජන 2013 වසරේ දී ධනාත්මක ප්‍රතිලාභ පෙන්නුම් කර ඇත. 2013 වසරේ දී රුපියල් මිලියන 93 ක (2012: රුපියල් මිලියන 856) ප්‍රාග්ධන අලාභයක් සිදු වුව ද ලාභාංශ ආදායම ලැබීමත් සමඟ ස්කන්ධ ආදායම රුපියල් මිලියන 914 ක ධනාත්මක ශේෂයක් වාර්තා කර ඇත.

රත්‍රන් මිල පහළයාමේ ප්‍රතිඵලයක් ලෙස 2012 වසරේ දී රක්ෂණ සමාගම් ඉපැයූ රුපියල් මිලියන 26 ක ලාභය හා සැසඳීමේ දී 2013 වසරේ දී රත්‍රන්වල ආයෝජනයෙන් රුපියල් මිලියන 11 ක අලාභයක් වාර්තා කර ඇත.

*වගුව 10*

**සවිස්තරාත්මක සාමාන්‍ය ආයෝජනය සහ ආයෝජන ප්‍රතිලාභ - දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාරය**

| වර්ගීකරණය | 2012(අ) | | | 2013(ආ) | | |
|---|---|---|---|---|---|---|
| | ආයෝජන ආදායම (රු. '000) | සාමාන්‍ය ආයෝජනය (රු. '000) | ආයෝජන ප්‍රතිලාභ අනුපාතය | ආයෝජන ආදායම (රු. '000) | සාමාන්‍ය ආයෝජනය (රු. '000) | ආයෝජන ප්‍රතිලාභ අනුපාතය |
| **රජයේ ණය සුරැකුම්පත්** | 10,972,525 | 91,445,229 | 12.00 | 11,880,429 | 96,085,490 | 12.36 |
| - භාණ්ඩාගාර බැඳුම්කර | 9,137,669 | | | 9,612,859 | | |
| - භාණ්ඩාගාර බිල්පත් | 186,642 | | | 249,377 | | |
| - වෙනත් (රිපෝ) | 1,648,214 | | | 2,018,193 | | |
| **ස්කන්ධ** | (69,948) | 24,759,142 | (0.28) | 914,353 | 25,733,074 | 3.55 |
| - ප්‍රාග්ධන ලාභ/ පාඩු | (855,777) | | | (92,781) | | |
| - ලාභාංශ | 785,829 | | | 1,007,134 | | |
| **සංස්ථා ණය** | 1,636,239 | 11,986,395 | 13.65 | 2,558,858 | 23,110,025 | 11.07 |
| - ණයකර | 1,504,615 | | | 2,419,957 | | |
| - වෙළඳ පත්‍රිකා | 125,876 | | | 119,306 | | |
| - වත්කම් මඟින් සනාථ කරනු ලබන සුරැකුම්පත් | 5,748 | | | 19,595 | | |
| - වෙනත් සමාන මූල්‍ය උපකරණ | - | | | - | | |
| **ඉඩම් හා ගොඩනැගිලි** | 56,209 | 5,915,963 | 0.95 | 65,636 | 6,040,644 | 1.09 |
| **තැන්පතු** | 3,778,232 | 28,815,685 | 13.11 | 5,813,633 | 36,314,037 | 16.01 |
| - බැංකු | 3,656,310 | | | 5,649,639 | | |
| - මූල්‍ය ආයතන | 121,922 | | | 163,994 | | |
| **ඒකක භාර** | 123,617 | 1,441,082 | 8.58 | 106,619 | 1,945,956 | 5.48 |
| **රත්‍රන්** | 25,887 | 71,374 | 36.27 | (10,968) | 30,564 | (35.89) |
| **ජීවිත රක්ෂණ ඔප්පු මත ණය** | 17,178 | 4,463,050 | 0.38 | 25,895 | 4,930,651 | 0.53 |
| **වෙනත්** | 632,488 | 867,219 | 72.93 | 124,374 | 943,539 | 13.18 |
| **එකතුව** | **17,172,427** | **169,765,139** | **10.12** | **21,478,829** | **195,133,980** | **11.01** |

*(අ) ප්‍රතිශ්ඨාපිත විගණන සංඛ්‍යා*
*(ආ) තාවකාලික සංඛ්‍යා*

*සටහන්:*
*අලියාන්ස් - ජීවිත, ආර්පිකෝ සහ එල්අයිසී හි කොටස් හිමියන්ට අයත් වත්කම් දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය යටතේ වාර්තා කර ඇත.*
.


# සංඛ්‍යානමය සමාලෝචනය

### නිකුත් කරන ලද ජීවිත රක්ෂණ ඔප්පු සංඛ්‍යාව හා බලපවත්නා ජීවිත රක්ෂණ ඔප්පු සංඛ්‍යාව - දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාරය

2013 වසර අවසානයේ දී බලපවත්නා දී දීර්ඝකාලීන රක්ෂණ ඔප්පු සංඛ්‍යාව 2,494,899 ක් විය. 2012 වසරේ දී තිබූ බලපවත්නා දීර්ඝකාලීන රක්ෂණ ඔප්පු 2,438,340 හා සැසඳීමේ දී 2013 වසරේ බලපවත්නා දීර්ඝකාලීන රක්ෂණ ඔප්පු 2.32% කින් සුළු වශයෙන් ඉහළ ගොස් ඇත. 10 වන වගුවේ දක්වා ඇති පරිදි රක්ෂණ සමාගම් 552,436 ක නව දීර්ඝකාලීන රක්ෂණ ඔප්පු සංඛ්‍යාවක් 2013 වසරේ දී නිකුත් කර ඇත. මීට පෙර වසරට සමානව බලපවත්නා ඔප්පු සංඛ්‍යාව රටේ සමස්ථ ජනගහනයෙන් 12% ක් පමණ විය. තවද බලපවත්නා දීර්ඝකාලීන ඔප්පු ප්‍රමාණය රටේ ශ්‍රම බලකායෙන් ප්‍රතිශතයක් ලෙස 2012 වසරේ දී වාර්තා වූ 28.8% ක් වූ අගය 2013 දී 0.5% ක සුළු අඩු වීමක් පෙන්නුම් කරයි.

*රූප සටහන 10*

**නිකුත් කරන ලද ජීවිත රක්ෂණ ඔප්පු සංඛ්‍යාව හා බලපවත්නා ජීවිත රක්ෂණ ඔප්පු සංඛ්‍යාව - දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාරය**




| | 2009 | 2010 | 2011 | 2012(අ) | 2013(ආ) |
|---|---|---|---|---|---|
| නිකුත් කරන ලද නව ජීවිත රක්ෂණ ඔප්පු සංඛ්‍යාව | 468,317 | 516,139 | 526,023 | 514,516 | 552,436 |
| බලපවත්නා ජීවිත රක්ෂණ ඔප්පු සංඛ්‍යාව | 2,068,548 | 2,214,976 | 2,355,449 | 2,438,340 | 2,494,899 |
| බලපවත්නා ජීවිත රක්ෂණ ඔප්පු සංඛ්‍යාව මුළු ජනගහනයෙන් ප්‍රතිශතයක් ලෙස * | 10.1 | 10.7 | 11.3 | 12.0 | 12.2 |
| බලපවත්නා ජීවිත රක්ෂණ ඔප්පු සංඛ්‍යාව මුළු ශ්‍රම බලකායෙන් ප්‍රතිශතයක් ලෙස * | 25.6 | 27.3 | 27.5 | 28.8 | 28.3 |

** මූලාශ්‍රය:වසර මැද ජනගහනය හා ශ්‍රම බලකාය - ජන හා සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තුව*

*(අ) ප්‍රතිශෝධාපිත විගණන සංඛ්‍යා*
*(ආ) තාවකාලික සංඛ්‍යා*

# සංඛ්‍යානමය සමාලෝචනය


### රක්ෂණ ඔප්පු අවලංගුවීම - දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාරය

නව ව්‍යාපාර දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාරය තුළ ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. ඔප්පු කළමනාකරණයේ අකාර්යක්ෂමතාවය, අලෙවිකරණ වැඩිකිරීමේ උපාය, පාරිභෝගික අවශ්‍යතාවන් වෙනස්වීම ආදී විවිධ කරුණු හේතුවෙන් දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාරය තුළ නව ඔප්පු අවලංගුවීම සැලකිය යුතු තරම් ඉහළ ගොස් ඇත. 2013 වසරේ දී නිකුත් කරන ලද නව ජීවිත රක්ෂණ ඔප්පු 552,436 අතුරින් නව ජීවිත රක්ෂණ ඔප්පු අවලංගුවීමේ අනුපාතිකය 19.70% ක් ලෙස නිරූපණය විය.

ඔප්පු අවලංගුවීම අවම කිරීම වෙනුවෙන් ගත් විවිධ ක්‍රියාමාර්ග තිබියදීත් ඔප්පු අඛණ්ඩව පවත්වා ගෙනයාම දීර්ඝකාලීන රක්ෂණ සමාගම්වලට දුෂ්කර කාර්යයක් වී ඇත. වසර තුළ දී දීර්ඝකාලීන රක්ෂණ ඔප්පු 367,724 ක් (2012: 332,707) අවලංගු වී ඇති අතර මෙම ඔප්පුවලින් 29.60% ක් 2013 වසරේ දී නිකුත් කරන ලද නව රක්ෂණ ඔප්පු මඟින් නියෝජනය කළේය. 2012 වසරේ දී වාර්තා කළ 13.64% හා සැසඳීමේ දී 2013 වසර තුළ අවලංගු කරන ලද මුළු ඔප්පු බලපවත්නා ඔප්පු සංඛ්‍යාවෙන් ප්‍රතිශතයක් ලෙස 14.74% විය. 2009 වසරේ සිට 2013 වසර දක්වා දීර්ඝකාලීන රක්ෂණ ඔප්පු අවලංගුවීම පිළිබඳ විස්තර 11 වන රූප සටහන මඟින් නිරූපණය වේ.

*රූප සටහන 11*

***2009 වසරේ සිට 2013 වසර දක්වා අවලංගු වූ ඔප්පු සහ ඔප්පු අවලංගුවීමේ අනුපාතය - දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාරය***




| | | 2009 | 2010 | 2011 | 2012(අ) | 2013(ආ) |
|---|---|---|---|---|---|---|
| | අවලංගු වූ නව රක්ෂණ ඔප්පු | 94,232 | 84,413 | 82,080 | 94,936 | 108,854 |
| | අවලංගු වූ මුළු රක්ෂණ ඔප්පු | 506,005 | 432,707 | 371,196 | 332,707 | 367,724 |
| | අවලංගු වූ මුළු රක්ෂණ ඔප්පු ප්‍රමාණය බලපවත්නා මුළු රක්ෂණ ඔප්පු ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස | 20.12 | 16.35 | 15.60 | 18.45 | 19.70 |
| | අවලංගු වූ මුළු රක්ෂණ ඔප්පු ප්‍රමාණය බලපවත්නා මුළු රක්ෂණ ඔප්පු ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස | 24.46 | 19.54 | 15.76 | 13.64 | 14.74 |

*(අ) මණ්ඩලයට ඉදිරිපත් කරන ලද ජීව ගණක වාර්තාවලට අනුව*
*(ආ) තාවකාලික සංඛ්‍යා*

# සංඛ්‍යානමය සමාලෝචනය

## රක්ෂණ සමාගම්වල නුබුන්වත් බව - දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාරය

රක්ෂණ සමාගම් විසින් මණ්ඩලය මඟින් නිකුත් කර ඇති නීතිවලට අනුව ගණනය කළ නුබුන්වත් ආන්තික අවශ්‍යතාවන් පිළිපැදීම අවශ්‍ය වේ. 2012 දෙසැම්බර් 31 සහ 2013 දෙසැම්බර් 31 ට දීර්ඝකාලීන රක්ෂණ සමාගම්වල නුබුන්වත් අනුපාතය සහ ඔප්පු වගකීම් 11 වන වගුවෙන් නිරූපණය වේ. 2013 දෙසැම්බර් 31 වන විට සමාගම් දෙකකට නුබුන්වත්බවේ අනුපාතය වන '01' අත්කර ගැනීමට නොහැකි වූ අතර මණ්ඩලය මඟින් ඒ පිළිබඳව අවශ්‍ය පියවර ගෙන ඇත. 2012 දෙසැම්බර් 31 වන විට වාර්තා වූ රුපියල් මිලියන 119,214 ක් වූ දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාරයේ ඔප්පු වගකීම් හා සැසඳීමේ දී 2013 වසරේ දී එම අගය රුපියල් මිලියන 130,368 ක් විය.

*වගුව 11*

***2012 සහ 2013 දෙසැම්බර් 31 දිනට රක්ෂණ සමාගම්වල නුබුන්වත් බවේ අනුපාතය සහ රක්ෂණ ඔප්පුවල වගකීම් වටිනාකම් - දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාරය***

| රක්ෂකයා | 2012 දෙසැම්බර් 31 දිනට (අ) | | 2013 දෙසැම්බර් 31 දිනට (ආ) | | | |
|---|---|---|---|---|---|---|
| | නුබුන්වත් අනුපාතය | ඔප්පු වගකීම් වටිනාකම (රුපියල් '000) | පවත්නා නුබුන්වත් ආන්තිකය (රුපියල් '000) | අවශ්‍ය නුබුන්වත් ආන්තිකය (5% ඔප්පු වගකීම් වටිනාකම (රු. '000) | නුබුන්වත් අනුපාතය | ඔප්පු වගකීම් වටිනාකම (රුපියල් '000) |
| ඒඅයිඒ | 2.53 | 22,399,842 | 3,421,556 | 1,182,239 | 2.89 | 23,644,788 |
| අලියාන්ස් ජීවිත | 4.67 | 370,898 | 179,234 | 33,184 | 5.40 | 663,689 |
| අමානා තකාෆුල් | 3.71 | 530,026 | 54,461 | 26,928 | 2.02 | 538,568 |
| ආර්පිකෝ | 41.32 | 47,568 | 63,545 | 7,673 | 8.28 | 153,458 |
| ඒෂියන් එලායන්ස් | 1.88 | 2,857,628 | 458,470 | 184,898 | 2.48 | 3,697,969 |
| සෙලින්කෝ | 10.76 | 29,176,262 | 20,933,232 | 1,629,674 | 12.85 | 32,593,476 |
| කෝපරේටිව් | 1.76 | 579,790 | 51,870 | 35,716 | 1.45 | 714,312 |
| එච්එන්බීඒ | 2.28 | 3,332,214 | 411,966 | 201,666 | 2.04 | 4,033,316 |
| ජනශක්ති | 4.08 | 5,087,080 | 1,789,900 | 264,268 | 6.77 | 5,285,357 |
| එල්අයිසී | 10.79 | 759,476 | 521,098 | 43,674 | 11.93 | 873,476 |
| එල්ඕඑල්සී | 44.00 | 64,793 | (140,605) | 12,576 | *(11.18) | 251,522 |
| එම්බීඑස්එල් | 3.30 | 136,510 | (1,802) | 10,928 | (0.16) | 218,559 |
| සණස | 1.69 | 330,899 | 27,719 | 26,900 | 1.03 | 537,990 |
| එස්එල්අයිසී | 10.14 | 39,968,188 | 26,763,191 | 2,055,326 | 13.02 | 41,106,515 |
| යූඒඑල් | 2.79 | 13,572,802 | 3,203,778 | 802,734 | 3.99 | 16,054,685 |
| **එකතුව/සමස්ත** | **7.17** | **119,213,976** | **57,737,613** | **6,518,384** | **8.86** | **130,367,680** |

** පසුව නිවැරදි කරන ලදී.*

*(අ) ප්‍රතිශ්ඨාපිත විගණන සංඛ්‍යා*

*(ආ) තාවකාලික සංඛ්‍යා*

# සංඛ්‍යානමය සමාලෝචනය

## සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය

### දළ ලිඛිත වාරික ආදායම

පසුගිය වසර හා සමානව රක්ෂණ කර්මාන්තයේ දළ ලිඛිත වාරික ආදායම සඳහා සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය ප්‍රධාන වශයෙන් දායක වී ඇති අතර එය මුළු දළ ලිඛිත වාරික ආදායමෙන් 56.28% ක් විය. 12 වන වගුවෙන් සහ 12 වන රූප සටහනෙන් නිරූපණය වන පරිදි 2012 වසරේ දී වාර්තා කළ රුපියල් මිලියන 46,694 හා සැසඳීමේ දී සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ දළ ලිඛිත වාරික ආදායම රුපියල් මිලියන 53,177 ක් විය. රක්ෂණ සමාගම් මඟින් තහවුරු කළ පරිදි සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයට අදාළ වර්ජන, කැරලි කෝලාහල, සිවිල් කැළඹීම් හා ත්‍රස්තවාදය වාරික ආදායම රුපියල් මිලියන 3,107 ක් වූ අතර ඒ අනුව වර්ජන, කැරලි කෝලාහල, සිවිල් කැළඹීම් හා ත්‍රස්තවාදය වාරික ආදායම ද ඇතුලත් වූ දළ ලිඛිත වාරික ආදායම රුපියල් මිලියන 56,285 ක් විය.

2013 වසරේ දී වූ මහා පරිමාණ යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන්, පුද්ගලික ඉදිකිරීම්, වෙනත් ආර්ථික කටයුතු ආදී විශාල සංවර්ධන වැඩසටහන් මඟින් දළ ලිඛිත වාරික ආදායම 7.01% කින් වර්ධනය වී ඇත. රක්ෂණ සමාගම්වල ශාඛා ජාලය පුළුල් වීමත් සමඟ මෙය තවදුරටත් ව්‍යාප්ත විය.

කෙසේවුව ද 2013 වසරේ දී දළ ලිඛිත වාරික ආදායමේ වර්ධන අනුපාතය පසුගිය වසරේ 14.69% අගය හා සැසඳීමේ දී අඩු වේගයකින් සිදු විය.

එස්එල්අයිසී 2013 වසරේ දී රුපියල් මිලියන 12,786 ක් සහ වෙළඳපොළ පංගුවෙන් 24.04% ක් අත් කර ගනිමින් පිට පිට හතරවන වසරටත් සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ ප්‍රමුඛයා බවට පත් විය. සෙලින්කෝ රුපියල් මිලියන 10,311 ක (2012: රුපියල් මිලියන 10,435) දළ ලිඛිත වාරික ආදායමක් වාර්තා කරමින් දෙවැනියට විශාලතම සමාගම වූ අතර 2013 වසරේ දී සිය දළ ලිඛිත වාරික ආදායමේ සුළු පසුබෑමක් පෙන්නුම් කර ඇත. මෙම සමාගම් දෙක විසින් 2013 වසරේ දී මුළු වෙළඳපොළ පංගුවෙන් 43.43% ක් අත්කර ගත්තේය. ජනශක්ති (11.93%), යූඒඑල් (9.62%) සහ පීපල්ස් (5.80%) සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය තුළ පිළිවෙලින් තෙවන, සිව්වන සහ පස්වන ස්ථාන හිමි කර ගෙන ඇත. අලියාන්ස් සාමාන්‍ය රුපියල් මිලියන 1,965 ක් (2012: රුපියල් මිලියන 1,397) වාර්තා කරමින් වෙළඳපොළ තුළ සිය ස්ථානය ඉහළට ගෙන ගොස් ඇත. එමෙන්ම එස්එල්අයිසී, සෙලින්කෝ, කොන්ටිනෙන්ටල්, එම්බීඑස්එල් සහ සණස යන සමාගම් පහේ වෙළඳපොළ පංගුවේ සුළු අඩුවීමක් දක්නට ලැබුණි.

*වගුව 12*

**සමාගම්වල දළ ලිඛිත වාරික ආදායම සහ වෙළඳපොළ පංගුව - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය**

| රක්ෂකයා | 2009 | | 2010 | | 2011 | | 2012(අ) | | 2013(ආ) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | වාරිකය (රු. '000) | වෙළඳපොළ පංගුව (%) | වාරිකය (රු. '000) | වෙළඳපොළ පංගුව (%) | වාරිකය (රු. '000) | වෙළඳපොළ පංගුව (%) | වාරිකය (රු. '000) | වෙළඳපොළ පංගුව (%) | වාරිකය (රු. '000) | වෙළඳපොළ පංගුව (%) |
| ඒඅයිඒ | 2,503,628 | 7.46 | 2,490,843 | 7.10 | 2,456,347 | 5.67 | 2,143,252 | 4.31 | 2,428,675 | 4.57 |
| ඒඅයිජී | 879,285 | 2.62 | 890,387 | 2.54 | 942,901 | 2.18 | 819,448 | 1.65 | 880,059 | 1.65 |
| අලියාන්ස් සාමාන්‍ය | 1,174,822 | 3.50 | 1,356,660 | 3.86 | 1,379,406 | 3.18 | 1,397,127 | 2.81 | 1,964,907 | 3.70 |
| අමානා තකාෆුල් | 953,798 | 2.84 | 908,756 | 2.59 | 916,754 | 2.12 | 1,125,838 | 2.27 | 1,232,433 | 2.32 |
| ඒෂියන් එලායන්ස් | 496,749 | 1.48 | 397,789 | 1.13 | 582,257 | 1.34 | 1,133,240 | 2.28 | 1,376,657 | 2.59 |
| සෙලින්කෝ | 9,081,297 | 27.07 | 8,724,292 | 24.85 | 9,558,942 | 22.06 | 10,434,917 | 21.00 | 10,311,479 | 19.39 |
| සෙලින්කෝ තකාෆුල් | 28,324 | 0.08 | - | - | - | - | - | - | - | - |
| කොන්ටිනෙන්ටල් | - | - | 359,105 | 1.02 | 1,149,121 | 2.65 | 1,545,225 | 3.11 | 1,330,515 | 2.50 |
| කෝපරේටිව් | 596,183 | 1.78 | 644,814 | 1.84 | 922,859 | 2.13 | 1,135,011 | 2.28 | 1,272,941 | 2.39 |
| එච්එන්බීඒ | 1,130,781 | 3.37 | 1,255,190 | 3.58 | 1,623,830 | 3.75 | 1,635,306 | 3.29 | 1,767,361 | 3.32 |
| ජනශක්ති | 4,272,926 | 12.74 | 4,324,170 | 12.32 | 5,086,207 | 11.74 | 5,773,429 | 11.62 | 6,342,546 | 11.93 |
| එල්ඕඑල්සී | - | - | - | - | 364,735 | 0.84 | 1,295,133 | 2.61 | 1,485,521 | 2.79 |
| එම්බීඑස්එල් | 271,309 | 0.81 | 467,606 | 1.33 | 636,738 | 1.47 | 1,049,147 | 2.11 | 1,118,983 | 2.10 |
| ඔරියන්ට් | - | - | - | - | 1,749 | 0.00 | 308,547 | 0.62 | 355,002 | 0.67 |
| පීපල්ස් | - | - | 847,064 | 2.42 | 2,284,578 | 5.27 | 2,795,448 | 5.63 | 3,085,041 | 5.80 |
| සණස | 184,409 | 0.55 | 234,914 | 0.67 | 232,374 | 0.54 | 308,142 | 0.62 | 322,591 | 0.61 |
| එස්එල්අයිසී | 8,764,539 | 26.13 | 8,766,027 | 24.97 | 11,134,583 | 25.70 | 12,359,188 | 24.87 | 12,785,671 | 24.04 |
| යූඒඑල් | 3,210,217 | 9.57 | 3,433,830 | 9.78 | 4,055,443 | 9.36 | 4,436,052 | 8.93 | 5,116,966 | 9.62 |
| **එකතුව** | **33,548,266** | **100** | **35,101,447** | **100** | **43,328,824** | **100** | **49,694,450** | **100** | **53,177,348** | **100** |
| **වර්ධන අනුපාතය (%)** | **(2.92)** | | **4.63** | | **23.44** | | **14.69** | | **7.01** | |

*(අ) ප්‍රතිශ්ධාපිත විගණන සංඛ්‍යා*
*(ආ) තාවකාලික සංඛ්‍යා*


*සටහන්:*

1. *2010 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා රක්ෂණ සමාගම්හි සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ ද.ලි.වා. ආදායම ගණනය සඳහා ජාතික රක්ෂණ භාර අරමුදලේ (NITF) වර්ජන, කැරලි කෝලාහල, සිවිල් කැළඹීම් හා ත්‍රස්තවාදය (SRCC & T) වාරික ආදායම සලකා බලා නොමැත.*
2. *අවශ්‍ය කරන ලද සම්පූර්ණ තොරතුරු මණ්ඩලය වෙත යොමු කර නොමැති බැවින් ජාතික රක්ෂණ භාර අරමුදලේ තොරතුරු ඉහත විශ්ලේෂණය සඳහා ඇතුලත් කර නොමැත.*
3. *රක්ෂණ ව්‍යාපාර කටයුතුවල නියැලීම සෙලින්කෝ තකාෆුල් සමාගම වෙත 2009 අගෝස්තු මස 5 වැනි දින සිට තහනම් කරනු ලැබීය. 2010 වර්ෂයේ සිට විණනය කරන ලද මූල්‍ය වාර්තා සමාගම විසින් මණ්ඩලය වෙත යොමු කර නොමැත.*

# සංඛ්‍යානමය සමාලෝචනය

*රූප සටහන 12*

**සමාගම් මට්ටමින් දළ ලිඛිත වාරික ආදායමේ වෙළඳපොළ පංගුව - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය (2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා)**





## දළ ලිඛිත වාරික ආදායම ජනනය කිරීම අතින් ප්‍රමුඛතම සමාගම් පහේ සහ අනෙක් රක්ෂකයන්ගේ වෙළඳපොළ පංගුව - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය

සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ දළ ලිඛිත වාරික ආදායම් ජනනය කිරීම අතින් ප්‍රමුඛතම වෙළඳපොළ පංගු වාර්තා කරන ලද සමාගම් පහ සහ අනෙක් රක්ෂකයින් 13 වන රූප සටහනින් නිරූපණය වේ. එස්එල්අයිසී, සෙලින්කෝ, ජනශක්ති, යූඑල් සහ පීපල්ස් දළ ලිඛිත වාරික ආදායමේ ඉහළම දායකයින් වූහ. ඔවුන් එක්ව 2013 වසරේ දී දළ ලිඛිත වාරික ආදායමේ 70.78% කට දායක වී ඇත. අනෙක් කුඩා සමාගම්වලින් එල්ල වූ තරඟකාරී පීඩනයත් සමඟ 2012 වසරේ 72.05% ක වෙළඳපොළ පංගුව හා සැසඳීමේ දී 2013 වසරේ දී මෙම සමාගම් පහේ වෙළඳපොළ පංගුවේ සුළු අඩුවීමක් දක්නට ලැබුණි. එමෙන්ම සෙලින්කෝ සමාගමේ වෙළඳපොළ පංගුව පසුගිය වසර පහ තුළ අඩු වී ඇත. මෙහෙයුම්වල සිය හතරවන වසරේ පසුවන පීපල්ස් සමාගම වෙළඳපොළ තුළ පස්වන ස්ථානය හිමිකර ගැනීමට සමත් වී ඇත.

*රූප සටහන 13*

**දළ ලිඛිත වාරික ආදායම ජනනය කිරීම අතින් ප්‍රමුඛතම සමාගම් පහේ සහ අනෙක් රක්ෂකයන්ගේ වෙළඳපොළ පංගුව - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය**




| | එස්එල්අයිසී | සෙලින්කෝ | ජනශක්ති | යූඑල් | පීපල්ස් | වෙනත් රක්ෂකයින් |
|---|---|---|---|---|---|---|
| 2009 | 26.13 | 27.07 | 12.74 | 9.57 | - | 24.50 |
| 2010 | 24.97 | 24.85 | 12.32 | 9.78 | 2.42 | 25.65 |
| 2011 | 25.70 | 22.06 | 11.74 | 9.36 | 5.27 | 25.87 |
| 2012(අ) | 24.87 | 21.00 | 11.62 | 8.93 | 5.63 | 27.96 |
| 2013(ආ) | 24.04 | 19.39 | 11.93 | 9.62 | 5.80 | 29.21 |

(අ) ප්‍රතිශ්ඨාපිත විගණන සංඛ්‍යා
(ආ) තාවකාලික සංඛ්‍යා

# සංඛ්‍යානමය සමාලෝචනය

### දළ ලිඛිත වාරික ආදායම රක්ෂණ උප පන්ති අනුව විශ්ලේෂණය - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය

පසුගිය වසර පහ ඇතුලත ගිනි, මුහුදු, රථ වාහන සහ විවිධ යන සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ එක් එක් රක්ෂණ උප පන්ති මඟින් ජනනය කරන ලද දළ ලිඛිත වාරික ආදායම 13 වන වගුවෙන් සහ 14 වන රූප සටහනෙන් දැක්වේ. රථ වාහන රක්ෂණ ව්‍යාපාරය දළ ලිඛිත වාරික ආදායමෙන් 62.21% ක විශාලතම වෙළඳපොළ පංගුවක් අත් කර ගෙන ඇති අතර විවිධ රක්ෂණ උප පන්තිය 22.46% ක්ද ගිනි රක්ෂණ උප පන්තිය 11.87% ක් සහ මුහුදු රක්ෂණ උප පන්තිය 3.46% ක් ලෙස අගයන් පිළිවෙලින් වාර්තා කර ඇත.

නව රථ වාහන ලියාපදිංචිය අඩුවීම සහ රක්ෂණ සමාගම් අතර මිල තරඟකාරිත්වය යන කරුණු රථ වාහන රක්ෂණ ව්‍යාපාරයට ඍණාත්මක ලෙස බලපා ඇත. මෝටර් රථ රක්ෂණ ව්‍යාපාරයේ වර්ධන අනුපාතය පසුගිය වසරේ දී වාර්තා කළ ඉලක්කම් දෙකේ වර්ධනයේ (16.57%) සිට සැලකිය යුතු මට්ටමකින් පහළ ගොස් (4.56%) ඇත.

විවිධ රක්ෂණ උප පන්තිය සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ දෙවන විශාලතම කාණ්ඩය නියෝජනය කළේය. විවිධ රක්ෂණ උප පන්තියේ මුළු දළ ලිඛිත වාරික ආදායම රුපියල් මිලියන 11,943 ක් වූ අතර වසර තුළ 11.44% කින් වර්ධනය වී ඇත.

ගිනි රක්ෂණ උප පන්තියේ දළ ලිඛිත වාරික ආදායම 2013 වසරේ දී 16.39% කින් වර්ධනය වූ අතර එය රුපියල් මිලියන 6,311 ක් විය. ඉදිකිරීම් කර්මාන්තයේ සිදු වූ දියුණුව සහ සාමාන්‍ය ආර්ථික කාර්යසාධනයේ දියුණුව මෙම ධනාත්මක කාර්යසාධනය සඳහා දායක විය හැකිය. මුහුදු රක්ෂණ උප පන්තිය 2012 වසරේ දී වාර්තා කළ 14.28% ක අගයට ප්‍රතිවිරුද්ධව 2013 වසරේ දී 3.98% ක ඍණාත්මක වර්ධනයක් වාර්තා කර ඇත.

*වගුව 13*

***දළ ලිඛිත වාරික ආදායම රක්ෂණ උප පන්ති අනුව විශ්ලේෂණය - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය***

| උප පන්තිය | දළ ලිඛිත වාරිකය (රු. '000) | | | | |
|---|---|---|---|---|---|
| | 2009 | 2010 | 2011 | 2012(අ) | 2013(ආ) |
| ගිනි | 7,049,399 | 5,012,443 | 5,376,094 | 5,422,347 | 6,310,911 |
| මුහුදු | 1,442,729 | 1,498,832 | 1,678,027 | 1,917,570 | 1,841,345 |
| රථවාහන | 17,897,763 | 20,948,782 | 27,141,119 | 31,637,508 | 33,081,602 |
| විවිධ | 7,158,375 | 7,641,390 | 9,133,584 | 10,717,025 | 11,943,490 |
| **එකතුව** | **33,548,266** | **35,101,447** | **43,328,824** | **49,694,450** | **53,177,348** |

| උප පන්තිය | වර්ධනය (%) | | | | |
|---|---|---|---|---|---|
| | 2009 | 2010 | 2011 | 2012 | 2013 |
| ගිනි | 3.26 | (28.90) | 7.25 | 0.86 | 16.39 |
| මුහුදු | (21.01) | 3.89 | 11.96 | 14.28 | (3.98) |
| රථවාහන | (4.38) | 17.05 | 29.56 | 16.57 | 4.56 |
| විවිධ | (0.40) | 6.75 | 19.53 | 17.34 | 11.44 |
| **එකතුව** | **(2.92)** | **4.63** | **23.44** | **14.69** | **7.01** |

| උප පන්තිය | ප්‍රතිශතාත්මක කොටස (%) | | | | |
|---|---|---|---|---|---|
| | 2009 | 2010 | 2011 | 2012 | 2013 |
| ගිනි | 21.01 | 14.28 | 12.41 | 10.91 | 11.87 |
| මුහුදු | 4.30 | 4.27 | 3.87 | 3.86 | 3.46 |
| රථවාහන | 53.35 | 59.68 | 62.64 | 63.66 | 62.21 |
| විවිධ | 21.34 | 21.77 | 21.08 | 21.57 | 22.46 |
| **එකතුව** | **100** | **100** | **100** | **100** | **100** |

*(අ) ප්‍රතිශ්ඨාපිත විගණන සංඛ්‍යා*
*(ආ) තාවකාලික සංඛ්‍යා*


*සටහන්:*

1. *2010 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා රක්ෂණ සමාගම්හි සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ ද.ලි.වා. ආදායම ගණනය සඳහා ජාතික රක්ෂණ භාර අරමුදලේ (NITF) වර්ජන, කැරලි කෝලාහල, සිවිල් කැළඹීම් හා ත්‍රස්තවාදය (SRCC & T) වාරික ආදායම සලකා බලා නොමැත.*
2. *අවශ්‍ය කරන ලද සම්පූර්ණ තොරතුරු මණ්ඩලය වෙත යොමු කර නොමැති බැවින් ජාතික රක්ෂණ භාර අරමුදලේ (NITF) තොරතුරු ඉහත විශ්ලේෂණය සඳහා ඇතුලත් කර නොමැත.*
3. *රක්ෂණ ව්‍යාපාර කටයුතුවල නියැලීම සෙලින්කෝ තකාෆුල් සමාගම වෙත 2009 අගෝස්තු මස 5 වැනි දින සිට තහනම් කරනු ලැබීය. 2010 වර්ෂයේ සිට විගණනය කරන ලද මූල්‍ය වාර්තා සමාගම විසින් මණ්ඩලය වෙත යොමු කර නොමැත.*

# සංඛ්‍යානමය සමාලෝචනය

*රූප සටහන 14*

***දළ ලිඛිත වාරික ආදායම රක්ෂණ උප පන්ති අනුව විශ්ලේෂණය - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය***




| | 2009 | 2010 | 2011 | 2012(ආ) | 2013(අ) |
|---|---|---|---|---|---|
| මුහුදු | 4.30 | 4.27 | 3.87 | 3.86 | 3.46 |
| ගිනි | 21.01 | 14.28 | 12.41 | 10.91 | 11.87 |
| විවිධ | 21.34 | 21.77 | 21.08 | 21.57 | 22.46 |
| මෝටර් රථ | 53.35 | 59.68 | 62.64 | 63.66 | 62.21 |
| කර්මාන්ත වර්ධනය (සාමාන්‍ය රක්ෂණ) | (2.92) | 4.63 | 23.44 | 14.69 | 7.01 |

*(අ) ප්‍රතිශ්ඨාපිත විගණන සංඛ්‍යා*
*(ආ) තාවකාලික සංඛ්‍යා*

*සටහන්:*

1. *2010 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා රක්ෂණ සමාගම්හි සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ ද.ලි.වා. ආදායම ගණනය සඳහා ජාතික රක්ෂණ භාර අරමුදලේ (NITF) වර්ජන, කැරලි කෝලාහල, සිවිල් කැළඹීම් හා ත්‍රස්තවාදය (SRCC & T) වාරික ආදායම සලකා බලා නොමැත.*

2. *අවශ්‍ය කරන ලද සම්පූර්ණ තොරතුරු මණ්ඩලය වෙත යොමු කර නොමැති බැවින් ජාතික රක්ෂණ භාර අරමුදලේ (NITF) තොරතුරු ඉහත විශ්ලේෂණය සඳහා ඇතුලත් කර නොමැත.*

3. *රක්ෂණ ව්‍යාපාර කටයුතුවල නියැලීම සෙලින්කෝ තකාෆුල් සමාගම වෙත 2009 අගෝස්තු මස 5 වැනි දින සිට තහනම් කරනු ලැබීය. 2010 වර්ෂයේ සිට විණනය කරන ලද මූල්‍ය වාර්තා සමාගම විසින් මණ්ඩලය වෙත යොමු කර නොමැත.*

# සංඛ්‍යානමය සමාලෝචනය

**රක්ෂණ ව්‍යාපාරයේ විවිධ රක්ෂණ උප පන්තියේ දළ ලිඛිත වාරික ආදායම කාණ්ඩ අනුව විශ්ලේෂණය**

සෞඛ්‍ය හා ශල්‍යකර්ම, පුද්ගලික අනතුරු, ගුවන්යානා බඳ, බැංකුකරුවන්ගේ හානි රක්ෂණය, සේවක වන්දි රක්ෂණය, මාර්ග ස්ථ මුදල් ආදී විවිධ රක්ෂණ උප පන්තියේ ප්‍රධාන රක්ෂණ කාණ්ඩ වේ. 14 වන රූපසටහන මඟින් 2012 සහ 2013 වසර සඳහා විවිධ රක්ෂණ උප පන්තියේ රක්ෂණ ව්‍යාපාරය කාණ්ඩ අනුව විශ්ලේෂණය නිරූපණය කරයි.

2013 වසර තුළ දී සෞඛ්‍ය රක්ෂණ ව්‍යාපාරය තුළ ධනාත්මක කාර්යසාධනයක් දක්නට ලැබුණු අතර 'සෞඛ්‍ය හා ශල්‍යකර්ම' අංශය 2012 වසරේ දී වාර්තා කළ රුපියල් මිලියන 5,075 හා සැසඳීමේ දී එය රුපියල් මිලියන 5,992 ක් විය. තවද සෞඛ්‍ය හා ශල්‍යකර්ම අංශය විවිධ රක්ෂණ උප පන්ති රක්ෂණ ව්‍යාපාරයේ දළ ලිඛිත වාරික ආදායමෙන් 48.95% ක් වාර්තා කරමින් වසර තුළ 18.06% ක වර්ධනයක් වාර්තා කළේය. මෙම අංශය වර්ධනය වීම සඳහා වෛද්‍ය පිරිවැය ඉහළයාම, නව නිෂ්පාදන හඳුන්වාදීම සහ රක්ෂණ කර්මාන්තවල විවිධ අලෙවිකරණ ක්‍රමෝපායන යන කරුණු යහපත් ලෙස බලපා ඇත.

පුද්ගලික අනතුරු විවිධ රක්ෂණ උප පන්තියේ රක්ෂණ ව්‍යාපාරයේ මුළු දළ ලිඛිත වාරික ආදායමෙන් 12.99% ක් නියෝජනය කරමින් දෙවන විශාලතම කාණ්ඩය බවට පත්විය. වසර තුළ පුද්ගලික අනතුරු රක්ෂණ ව්‍යාපාරය 2012 වසරේ රුපියල් මිලියන 1,338 හා සැසඳීමේ දී රුපියල් මිලියන 1,590 ක දළ ලිඛිත වාරික ආදායමක් වාර්තා කළේය. ගුවන්යානා බඳ කාණ්ඩයේ දළ ලිඛිත වාරික ආදායම රුපියල් මිලියන 1,045 ක් (2012: රුපියල් මිලියන 1,218) වූ අතර වසර තුළ දළ ලිඛිත වාරික ආදායමෙන් 14.20% ක පහළ බැසීමක් වාර්තා විය.

*වගුව 14*

***රක්ෂණ ව්‍යාපාරයේ විවිධ රක්ෂණ උප පන්තියේ දළ ලිඛිත වාරික ආදායම කාණ්ඩ අනුව විශ්ලේෂණය - 2012 සහ 2013***

| | දළ ලිඛිත වාරික ආදායම (රුපියල් '000) | |
|---|---|---|
| **කාණ්ඩය** | **2012(අ)** | **2013(ආ)** |
| ගුවන්යානා බඳ | 1,217,540 | 1,044,639 |
| බැංකුකරුවන්ගේ හානිරක්ෂණය | 375,910 | 332,731 |
| ගෙවල් බිඳීම | 306,362 | 340,075 |
| සේප්පුවේ ඇති මුදල් ඇතුළු මාර්ගස්ථ මුදල් | 346,582 | 385,460 |
| කොන්ත්‍රාත්කරුගේ සියලු අවදානම් | 10,855 | 40,848 |
| විශ්වාසත්‍ව ඇපය | 45,992 | 58,670 |
| මාර්ගස්ථ භාණ්ඩ | 69,127 | 73,039 |
| සෞඛ්‍ය හා ශල්‍යකර්ම | 5,075,204 | 5,992,033 |
| පුද්ගලික අනතුරු | 1,337,571 | 1,590,464 |
| නිෂ්පාදන වගකීම | 39,961 | 43,726 |
| වෘත්තීය හානිරක්ෂණය | 327,064 | 267,295 |
| මහජන වගකීම | 114,144 | 112,860 |
| අභිධානය - හිමිකම් | 224,578 | 225,967 |
| චාරිකා රක්ෂණය | 215,037 | 231,896 |
| ඩබ්ලිව්සීඅය - කම්කරු වන්දි | 366,989 | 432,511 |
| වෙනත් | 953,346 | 1,069,835 |
| **මුළු විවිධ රක්ෂණ දළ ලිඛිත වාරික ආදායම** | **11,026,262** | **12,242,049** |
| ජාතික රක්ෂණ භාර අරමුදලේ වර්ජන, කැරලි කෝලාහල, සිවිල් කැළඹීම් හා ත්‍රස්තවාදය මුළු වාරික ආදායම | (294,331) | (267,569) |
| සහභාග රක්ෂකයන්ගේ වාරික ආදායම | (14,906) | (30,990) |
| **රක්ෂණ කර්මාන්තයේ (සමාගම්වල) ශුද්ධ වාරික ආදයම** | **10,717,025** | **11,943,490** |

*(අ) ප්‍රතිශ්ඨාපිත විගණන සංඛ්‍යා*
*(ආ) තාවකාලික සංඛ්‍යා*

*සටහන:*

*විවිධ රක්ෂණ උප පන්ති රක්ෂණ ව්‍යාපාරයේ උප කාණ්ඩවල ඉහත දළ ලිඛිත වාරික ආදායම් සංඛ්‍යා සහභාග රක්ෂණය, වර්ජන, කැරලි කෝලාහල, සිවිල් කැළඹීම් හා ත්‍රස්තවාදය මුළු වාරික ආදායම ඇතුලත්ව ඉදිරිපත් කරනු ලැබීය.*

# සංඛ්‍යානමය සමාලෝචනය

### දළ ලිඛිත වාරික ආදායම, ප්‍රතිරක්ෂණ වාරික ආදායම සහ රක්ෂණකරුවන් විසින් රඳවා ගැනීම - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය

15 වන වගුවේ පෙන්වා දී ඇති පරිදි රක්ෂණ සමාගම් විසින් රඳවා ගත් දළ ලිඛිත වාරික ආදායම 2013 වසර තුළ දළ ලිඛිත වාරික ආදායම වූ රුපියල් මිලියන 53,177 න් රුපියල් මිලියන 44,385 ක් විය. රක්ෂණ වාරික ආදායම රඳවා ගැනීම සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ දළ ලිඛිත වාරික ආදායමෙන් ප්‍රතිශතයක් ලෙස සැලකිය යුතු තරම් ඉහළ මට්ටමක වූ අතර 2013 වසරේ දී එම අගය 83.47% ක් විය. රථ වාහන උප පන්ති රක්ෂණ ව්‍යාපාරයේ ඉහළ රඳවා ගැනීමේ අනුපාතිකය මේ සඳහා ප්‍රධාන වශයෙන් බලපා ඇත. දළ ලිඛිත වාරික ආදායමෙන් 62.21% නිරූපණය කළ රථ වාහන උප පන්ති රක්ෂණ ව්‍යාපාරය 99.08% ක ඉහළම රඳවා ගැනීමේ අනුපාතිකයක් වාර්තා කළ අතර එය පසුගිය වසර 5ක කාලය තුළ සැලකිය යුතු තරම් ස්ථාවරව තිබුනි. විවිධ රක්ෂණ උප පන්ති රක්ෂණ ව්‍යාපාරය 77.61% ක (2012: 74.32%) සාපේක්ෂව ඉහළ රඳවා ගැනීමේ අනුපාතයක් අඛණ්ඩව වාර්තා කළේය.

ගිනි (76%), මුහුදු (55%) රක්ෂණ උප පන්ති රක්ෂණ ව්‍යාපාරවල ප්‍රාරක්ෂණ අවදානම් ආවරණය කිරීම සඳහා 2013 වසරේ දී ඉහළ පවරාදීම් අනුපාතික දක්නට ලැබුණි.

*වගුව 15*

**දළ ලිඛිත වාරික ආදායම, ප්‍රතිරක්ෂණ වාරික ආදායම සහ රක්ෂකයන් විසින් රඳවා ගනු ලැබීම - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය**

| උප පන්තිය | දළ ලිඛිත වාරිකය (රුපියල් '000)* | | | | |
|---|---|---|---|---|---|
| | 2009 | 2010 | 2011 | 2012(අ) | 2013(ආ) |
| ගිනි | 7,049,399 | 5,012,443 | 5,376,094 | 5,422,347 | 6,310,911 |
| මුහුදු | 1,442,729 | 1,498,832 | 1,678,027 | 1,917,570 | 1,841,345 |
| රථවාහන | 17,897,763 | 20,948,782 | 27,141,119 | 31,637,508 | 33,081,602 |
| විවිධ | 7,158,375 | 7,641,390 | 9,133,584 | 10,717,025 | 11,943,490 |
| **මුළු දළ ලිඛිත වාරික ආදායම** | **33,548,266** | **35,101,447** | **43,328,824** | **49,694,450** | **53,177,348** |

| උප පන්තිය | ප්‍රතිරක්ෂණ වාරික ආදායම (රුපියල් '000) | | | | |
|---|---|---|---|---|---|
| | 2009 | 2010 | 2011 | 2012(අ) | 2013(ආ) |
| ගිනි | 5,904,806 | 4,233,236 | 4,090,136 | 4,140,877 | 4,799,516 |
| මුහුදු | 892,411 | 813,665 | 847,392 | 1,326,369 | 1,014,706 |
| රථවාහන | 533,720 | 316,594 | 387,211 | 478,478 | 304,451 |
| විවිධ | 1,918,389 | 2,020,031 | 2,302,942 | 2,752,627 | 2,673,807 |
| **මුළු ප්‍රතිරක්ෂණ වාරික ආදායම** | **9,249,326** | **7,383,526** | **7,627,681** | **8,698,351** | **8,792,480** |

| උප පන්තිය | රඳවා ගැනීම (රුපියල් '000) | | | | |
|---|---|---|---|---|---|
| | 2009 | 2010 | 2011 | 2012 | 2013 |
| ගිනි | 1,144,593 | 779,208 | 1,285,958 | 1,281,469 | 1,511,395 |
| මුහුදු | 550,318 | 685,167 | 830,635 | 591,202 | 826,639 |
| රථවාහන | 17,364,043 | 20,632,188 | 26,753,908 | 31,159,029 | 32,777,152 |
| විවිධ | 5,239,986 | 5,621,359 | 6,830,643 | 7,964,399 | 9,269,684 |
| **මුළු දළ ලිඛිත වාරික ආදායම** | **24,298,940** | **27,717,922** | **35,701,143** | **40,996,099** | **44,384,868** |

| උප පන්තිය | රඳවා ගැනීම දළ ලිඛිත වාරික ආදායමෙන් ප්‍රතිශතයක් ලෙස %) | | | | |
|---|---|---|---|---|---|
| | 2009 | 2010 | 2011 | 2012 | 2013 |
| ගිනි | 16.24 | 15.55 | 23.92 | 23.63 | 23.95 |
| මුහුදු | 38.14 | 45.71 | 49.50 | 30.83 | 44.89 |
| රථවාහන | 97.02 | 98.49 | 98.57 | 98.49 | 99.08 |
| විවිධ | 73.20 | 73.56 | 74.79 | 74.32 | 77.61 |
| **සමස්ත රඳවාගැනීමේ අනුපාතය** | **72.43** | **78.97** | **82.40** | **82.50** | **83.47** |

*(අ) ප්‍රතිශ්ඨාපිත විගණන සංඛ්‍යා*
*(ආ) තාවකාලික සංඛ්‍යා*


*සටහන්:*

1. *2010 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා රක්ෂණ සමාගම්හි සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ ද.ලි.වා. ආදායම ගණනය සඳහා ජාතික රක්ෂණ භාර අරමුදලේ (NITF) වර්ජන, කැරලි කෝලාහල, සිවිල් කැළඹීම් හා ත්‍රස්තවාදය (SRCC & T) වාරික ආදායම සලකා බලා නොමැත.*
2. *අවශ්‍ය කරන ලද සම්පූර්ණ තොරතුරු මණ්ඩලය වෙත යොමු කර නොමැති බැවින් ජාතික රක්ෂණ භාර අරමුදලේ :භෂඔත* තොරතුරු ඉහත විශ්ලේෂණය සඳහා ඇතුලත් කර නොමැත.*
3. *රක්ෂණ ව්‍යාපාර කටයුතුවල නියැලීම සෙලින්කෝ තකාෆුල් සමාගම වෙත 2009 අගෝස්තු මස 5 වැනි දින සිට තහනම් කරනු ලැබීය. 2010 වර්ෂයේ සිට විගණනය කරන ලද මූල්‍ය වාර්තා සමාගම විසින් මණ්ඩලය වෙත යොමු කර නොමැත.*

# සංඛ්‍යානමය සමාලෝචනය

*රූප සටහන 15*

***ප්‍රතිරක්ෂණ වාරිකය සහ රක්ෂකයන් විසින් රඳවා ගනු ලැබීම - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය***




*(අ) ප්‍රතිශ්ඨාපිත විගණන සංඛ්‍යා*
*(ආ) තාවකාලික සංඛ්‍යා*

# සංඛ්‍යානමය සමාලෝචනය

### ශුද්ධ ඉපැයූ වාරික ආදායම, දැරූ ශුද්ධ හිමිකම්පෑම්, ශුද්ධ හිමිකම්පෑම් අනුපාතිකය, ශුද්ධ වියදම් අනුපාතිකය සහ ශුද්ධ ඒකාබද්ධ අනුපාතිකය - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය

16 වන වගුව මඟින් පෙන්වා දෙන පරිදි සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ සෑම රක්ෂණ උප පන්තියකම මුළු ශුද්ධ ඉපැයූ වාරික ආදායම 2012 වසරේ දී වාර්තා කළ රුපියල් මිලියන 38,454 හා සැසඳීමේ දී 2013 වසරේ දී රුපියල් මිලියන 42,183 ක් විය. දළ ලිඛිත වාරික ආදායමේ සහ දළ ලිඛිත වාරික ආදායමේ ඉහළ රඳවා ගැනීම වැඩිවීමේ ප්‍රතිඵලයක් ලෙස 2013 වසර තුළ ශුද්ධ ඉපැයූ වාරික ආදයමේ කැපී පෙනෙන වර්ධනයක් දක්නට ලැබුණි.

2012 වසරේ වාර්තා වූ 61.81% ක ශුද්ධ හිමිකම්පෑම් අනුපාතිකය හා සැසඳීමේ දී 2013 වසරේ එම අගය 58.65% දක්වා අඩු වී ඇත. වසර තුළ දැරූ හිමිකම්පෑම් 4.09% කින් වැඩිවීමට සාපේක්ෂව ශුද්ධ ඉපැයූ වාරික ආදායම 9.70% කින් ඉහළයාම මෙයට හේතුවයි.

රථ වාහන උප පන්තිය ඉහළම හිමිකම්පෑම් අනුපාතිකය වූ 60.50% ක අගයක් වාර්තා කර ඇති අතර විවිධ රක්ෂණ උප පන්තිය (56.28%) සහ මුහුදු උප පන්තිය (47.09%) ඉන්පසුව පිළිවෙලින් වාර්තා විය. ගිනි රක්ෂණ උප පන්ති රක්ෂණ ව්‍යාපාරය හැරුණු කොට, සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ සියලු රක්ෂණ උප පන්තිවල හිමිකම්පෑම් අනුපාතිකය පහළ බැස ඇත.

16 වන වගුව සහ 16 වන රූප සටහන මඟින් පසුගිය වසර 5 සඳහා ශුද්ධ හිමිකම්පෑම් අනුපාතිකය සහ ශුද්ධ ඒකාබද්ධ අනුපාතිකයේ නැඹුරුතා සමඟ ශුද්ධ ඉපැයූ වාරික ආදායම, ශුද්ධ හිමිකම්පෑම් සහ ශුද්ධ වියදම් නිරූපණය කරයි.

2012 වසරේ දී රුපියල් මිලියන 14,807 ක් වූ ශුද්ධ වියදම් අගයේ සිට 2013 වසරේ දී රුපියල් මිලියන 18,147 ක වර්ධනයක් පෙන්නුම් කරයි. සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ ශුද්ධ වියදම් අනුපාතිකය 2013 වසරේ දී 43.02% (2012: 38.51%) ක් විය. සමාගමේ ප්‍රාරක්ෂණ පරිපාලනය සහ ආයෝජනය ආශ්‍රිත පිරිවැය වසර තුළ වැඩි වී ඇති බව වියදම් සමාලෝචනයේ දී පෙනී යයි. ශුද්ධ ඒකාබද්ධ අනුපාතිකය 2012 වසරේ දී 100.32% ක් ලෙස වාර්තා වූ අතර 2013 දී එම අගය 101.67% ක් විය.

*වගුව 16*

**ශුද්ධ ඉපැයූ වාරික ආදායම, දැරූ ශුද්ධ හිමිකම්පෑම්, ශුද්ධ හිමිකම්පෑම් අනුපාතිකය, ශුද්ධ වියදම් අනුපාතිකය සහ ශුද්ධ ඒකාබද්ධ අනුපාතිකය - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය**

| උප පන්තිය | ශුද්ධ ඉපැයූ වාරික ආදායම (රුපියල් '000) | | | | |
|---|---|---|---|---|---|
| | 2009 | 2010 | 2011 | 2012(ඇ) | 2013(ආ) |
| ගිනි | 1,199,158 | 1,098,186 | 1,141,591 | 1,400,808 | 1,424,130 |
| මුහුදු | 580,333 | 674,476 | 802,677 | 537,073 | 833,192 |
| රථවාහන | 17,593,582 | 18,356,887 | 23,575,071 | 29,293,110 | 31,488,387 |
| විවිධ | 5,200,212 | 5,282,148 | 6,298,058 | 7,222,611 | 8,437,462 |
| **එකතුව** | **24,573,285** | **25,411,697** | **31,817,397** | **38,453,602** | **42,183,171** |

| උප පන්තිය | දැරූ ශුද්ධ හිමිකම්පෑම් (රුපියල් '000) | | | | |
|---|---|---|---|---|---|
| | 2009 | 2010 | 2011 | 2012(ඇ) | 2013(ආ) |
| ගිනි | 953,478 | 529,448 | 482,646 | 505,101 | 550,497 |
| මුහුදු | 221,210 | 216,143 | 232,189 | 321,077 | 392,354 |
| රථවාහන | 11,680,229 | 11,733,879 | 15,416,753 | 18,235,622 | 19,051,748 |
| විවිධ | 4,166,757 | 3,091,110 | 4,160,145 | 4,705,619 | 4,745,884 |
| **එකතුව** | **17,021,674** | **15,570,580** | **20,291,734** | **23,767,419** | **24,740,483** |

| උප පන්තිය | ශුද්ධ හිමිකම්පෑම් අනුපාතිකය (%) | | | | |
|---|---|---|---|---|---|
| | 2009 | 2010 | 2011 | 2012 | 2013 |
| ගිනි | 79.51 | 48.21 | 42.28 | 36.06 | 38.65 |
| මුහුදු | 38.12 | 32.05 | 28.93 | 59.78 | 47.09 |
| රථවාහන | 66.39 | 63.92 | 65.39 | 62.25 | 60.50 |
| විවිධ | 80.13 | 58.52 | 66.05 | 65.15 | 56.25 |
| **එකතුව** | **69.27** | **61.27** | **63.78** | **61.81** | **58.65** |

| උප පන්තිය | 2009 | 2010 | 2011 | 2012(ඇ) | 2013(ආ) |
|---|---|---|---|---|---|
| ශුද්ධ වියදම් (රුපියල් '000) | 12,907,013 | 10,058,322 | 12,105,102 | 14,807,142 | 18,146,550 |
| **ශුද්ධ වියදම් අනුපාතිකය (%)** | **52.52** | **39.58** | **38.04** | **38.51** | **43.02** |

| | | | | | |
|---|---|---|---|---|---|
| **ශුද්ධ ඒකාබද්ධ අනුපාතිකය (%)** | **121.79** | **100.85** | **101.82** | **100.32** | **101.67** |

*(ඇ) ප්‍රතිශ්ඨාපිත විගණන සංඛ්‍යා*
*(ආ) තාවකාලික සංඛ්‍යා*


*සටහන්:*

1. *2010 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා රක්ෂණ සමාගම්හි සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ ද.ලි.වා. ආදායම ගණනය සඳහා ජාතික රක්ෂණ භාර අරමුදලේ (NITF) වර්ජන, කැරලි කෝලාහල, සිවිල් කැළඹීම් හා ත්‍රස්තවාදය (SRCC & T) වාරික ආදායම සලකා බලා නොමැත.*
2. *අවශ්‍ය කරන ලද සම්පූර්ණ තොරතුරු මණ්ඩලය වෙත යොමු කර නොමැති බැවින් ජාතික රක්ෂණ භාර අරමුදලේ (NITF) තොරතුරු ඉහත විශ්ලේෂණය සඳහා ඇතුලත් කර නොමැත.*
3. *රක්ෂණ ව්‍යාපාර කටයුතුවල නියැලීම සෙලින්කෝ තකාෆුල් සමාගම වෙත 2009 අගෝස්තු මස 5 වැනි දින සිට තහනම් කරනු ලැබීය. 2010 වර්ෂයේ සිට විගණනය කරන ලද මූල්‍ය වාර්තා සමාගම විසින් මණ්ඩලය වෙත යොමු කර නොමැත.*

# සංඛ්‍යානමය සමාලෝචනය

*රූප සටහන 16*

***ශුද්ධ ඉපැයූ වාරික ආදායම, දැරූ ශුද්ධ හිමිකම්පෑම්, ශුද්ධ වියදම්, ශුද්ධ හිමිකම්පෑම් අනුපාතිකය සහ ශුද්ධ ඒකාබද්ධ අනුපාතිකය - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය***




*(අ) ප්‍රතිශ්ඨාපිත විගණන සංඛ්‍යා*
*(ආ) තාවකාලික සංඛ්‍යා*

# සංඛ්‍යානමය සමාලෝචනය

### සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ සහ කොටස් හිමියන්ගේ වත්කම්

2013 දෙසැම්බර් 31 වන දිනට සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ සහ කොටස් හිමියන්ගේ වත්කම්වල සංකේන්ද්‍රගතවීම 17 වන වගුව සහ 17 වන රූප සටහන මඟින් නිරූපණය වේ. සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ මුළු වත්කම් රුපියල් මිලියන 146,778 ක් වූ අතර වසර තුළ දී 11.87% ක වර්ධනයක් පෙන්නුම් කරයි.

ස්කන්ධය සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ ප්‍රධාන ආයෝජන කාණ්ඩයක් වී ඇති අතර රුපියල් මිලියන 34,519 ක් (2012: රුපියල් මිලියන 33,796) ක් විය. එමෙන්ම ස්කන්ධ ආයෝජන, 2013 වසරේ දී මුළු සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර වත්කම්වලින් 23.52% ක් (2012: 25.76%) නිරූපණය කරයි.

2012 වසරේ දී රුපියල් මිලියන 29,603 ක් වූ රජයේ සුරැකුම්පත් හා සැසඳීමේ දී 2013 වසරේ දී රජයේ සුරැකුම්පත් රුපියල් මිලියන 27,585 ක් විය. රජයේ සුරැකුම්පත් සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ මුළු වත්කම්වලින් 18.79% ක් වාර්තා කළ අතර 2012 වසරේ දී වාර්තා කළ 22.56% හා සැසඳීමේ දී සුළු පහළ බැසීමක් දක්නට ලැබුණි. බැංකු තැන්පතු රුපියල් මිලියන 18,797 ක් වූ අතර සමස්ත වත්කම්වලින් 12.81% ක් නිරූපණය කරයි. 2012 වසරේ රුපියල් මිලියන 12,733 ක් වූ බැංකු තැන්පතු හා සැසඳීමේ දී 2013 වසරේ දී බැංකු තැන්පතු 47.63% කින් වර්ධනය වී ඇත.

වසර තුළ සංස්ථා ණය සහ ඒකක භාරවල කළ ආයෝජන වැඩි වී ඇත. 2012 දී සංස්ථා ණය සහ ඒකක භාර වාර්තා කළ වර්ධනය හා සැසඳීමේ දී ඒවායේ වර්ධනය පිළිවෙලින් 55.34% ක් සහ 67.39% ක් විය. හිඟ වාරික රුපියල් මිලියන 12,478 ක් වූ අතර එම සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ මුළු වත්කම්වලින් 8.5% ක් වාර්තා වේ. පසුගිය වසර හා සැසඳීමේ දී මෙය 14.43% ක වර්ධනයකි.

*වගුව 17*

***2012 සහ 2013 දෙසැම්බර් 31 දිනට සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ සහ කොටස්හිමියන්ගේ වත්කම් සංකේන්ද්‍රගත වීම***

| | 2012(අ) | | 2013(ආ) | |
|---|---|---|---|---|
| **වත්කම් වර්ගය** | රුපියල් '000 | % | රුපියල් '000 | % |
| රජයේ ණය සුරැකුම්පත් | 29,602,514 | 22.56 | 27,585,481 | 18.79 |
| ස්කන්ධ | 33,795,539 | 25.76 | 34,519,471 | 23.52 |
| සංස්ථා ණය | 3,842,230 | 2.93 | 5,968,491 | 4.07 |
| ඉඩම් හා ගොඩනැගිලි | 11,900,162 | 9.07 | 11,068,119 | 7.54 |
| තැන්පතු | 12,732,650 | 9.70 | 18,797,380 | 12.81 |
| ඒකක භාර | 1,220,424 | 0.93 | 2,042,822 | 1.39 |
| රත්රන්වල ආයෝජන | 7,130 | 0.01 | 31,214 | 0.02 |
| ලැබිය යුතු ප්‍රතිරක්ෂණය | 6,092,051 | 4.64 | 6,658,134 | 4.54 |
| ඔප්පුහිමියන්ගෙන් හා අතරමැදියන්ගෙන් ලැබිය යුතු වාරික ආදායම | 10,904,496 | 8.31 | 12,478,139 | 8.50 |
| දේපළ පිරියත හා උපකරණ | 3,600,510 | 2.74 | 5,167,540 | 3.52 |
| මුදල් හා මුදල් සමාන දෑ | 1,423,164 | 1.08 | 1,420,945 | 0.97 |
| වෙනත් වත්කම් | 16,080,650 | 12.26 | 21,039,861 | 14.33 |
| **එකතුව** | **131,201,520** | **100** | **146,777,597** | **100** |

*(අ) ප්‍රතිශ්ධාපිත විගණන සංඛ්‍යා*
*(ආ) තාවකාලික සංඛ්‍යා*


*සටහන්:*

1. *අවශ්‍ය කරන ලද සම්පූර්ණ තොරතුරු මණ්ඩලය වෙත යොමු කර නොමැති බැවින් ජාතික රක්ෂණ භාර අරමුදලේ (NITF) තොරතුරු ඉහත විශ්ලේෂණය සඳහා ඇතුලත් කර නොමැත.*
2. *අලියාන්ස් ජීවිත, ආර්පිකෝ සහ එල්අයිසී සමාගම්වල කොටස්හිමියන්ට අයත් වත්කම් දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාරය යටතේ වාර්තා කර ඇත.*

# සංඛ්‍යානමය සමාලෝචනය

*රූප සටහන 17*

***2013 දෙසැම්බර් 31 දිනට සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ සහ කොටස්හිමියන්ගේ වත්කම් සංකේන්ද්‍රගත වීම***



# සංඛ්‍යානමය සමාලෝචනය

### සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ හා කොටස් හිමියන්ගේ ආයෝජන ආදායම

18 වන වගුව මඟින් නිරූපණය කර ඇති පරිදි 2013 වසර සඳහා වාර්තා කළ මුළු ආයෝජන ආදායම රුපියල් මිලියන 98.080 ක් වූ සාමාන්‍ය ආයෝජනය සඳහා රුපියල් මිලියන 7,523 ක් විය. 2013 වසරේ මුළු ආයෝජන ඵලදා අනුපාතය 7.67% ක් විය.

'ස්කන්ධ' සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ ප්‍රධාන ආයෝජන කාණ්ඩයක් වුව ද එහි ඵලදා අනුපාතය පසුගිය වසර දෙක තුළ අඩු මට්ටමක තිබුණි. ස්කන්ධ ඵලදා අනුපාතය 2013 වසරේ දී 4.49% ක් (2012 : 2.49%) විය. එමෙන්ම ලාභාංශ ආදායම රුපියල් මිලියන 1,543 ක් වූ මුළු ස්කන්ධ ආදායමෙන් 88.41% ක් විය. 2012 වසරේ දී රුපියල් මිලියන 552 ක අලාභයක් වූ ස්කන්ධ ආයෝජන හා සැසඳීමේ දි එය 2013 වසරේ දී රුපියල් මිලියන 178 ක ධනාත්මක ප්‍රාග්ධන ආදායමක් අත් කර ගෙන ඇත.

රජයේ සුරැකුම්පත්වලින් ලද මුළු ආයෝජන ආදායම 2013 වසරේ දී රුපියල් මිලියන 2,972 ක් විය. එහි ඵලදා අනුපාතය 2012 වසරේ දී වාර්තා කළ 11.41% සිට 2013 වසරේ දී වාර්තා වූ 10.39% දක්වා අඩු වී ඇත. භාණ්ඩාගාර බිල්පත්වල කළ ආයෝජනවලින් ලද ආදායම 2012 වසරේ දී රුපියල් මිලියන 1,537 ක අගයේ සිට 2013 වසරේ දී රුපියල් මිලියන 1,374 දක්වා අඩු වී ඇත.

සංස්ථා ණය වෙළඳපොළ සම්බන්ධව ධනාත්මක කාර්යසාධනයක් දක්නට ලැබුනු අතර පසුගිය වසර හා සැසඳීමේ දී 2013 වසරේ දී සංස්ථානික ණය 72.71% කින් වර්ධනය වී ඇත. ණයකර හා වෙළඳ පත්‍රිකාවලින් ලද ආයෝජන ආදායම වසර තුළ 86.42% ක සාමාන්‍ය වර්ධනයක් ලබා ඇත. ඒකක භාර සම්බන්ධව 2012 වසරේ දී වාර්තා කළ 9.42% ක ආයෝජන ඵලදාව හා සැසඳීමේ දී 2013 වසරේ දී වාර්තා කළ එම අගය වූ 8.88% දෙස බැලීමේ දී සුළු පහළ බැසීමක් දක්නට ලැබුනි.

තැන්පතුවල සාමාන්‍ය ආයෝජන 2013 දී රුපියල් මිලියන 15,765 ක් (2012: 12.90%) වූ අතර එමඟින් 12.82% ක් (2012: 12.90%) වූ ආයෝජන ඵලදාවක් සහ රුපියල් මිලියන 2,020 ක පොලී ආදායමක් උත්පාදනය කර ඇත.

*වගුව 18*

***සවිස්තරාත්මක ආයෝජන ආදායම සහ සාමාන්‍ය ආයෝජන - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය***

| වර්ගය | 2012(අ) | | | 2013(ආ) | | |
|---|---|---|---|---|---|---|
| | ආයෝජිත ආදායම (රුපියල් '000) | සාමාන්‍ය ආයෝජන (රුපියල් '000) | ආයෝජන ඵලදා අනුපාතය (%) | ආයෝජිත ආදායම (රුපියල් '000) | ආයෝජන ඵලදා අනුපාතය (%) | ආයෝජන ඵලදා අනුපාතය (%) |
| **රජයේ ණය සුරැකුම්පත්** | 3,098,265 | 27,144,244 | 11.41 | 2,971,576 | 28,593,998 | 10.39 |
| - භාණ්ඩාගාර බැඳුම්කර | 1,537,331 | | | 1,374,429 | | |
| - භාණ්ඩාගාර බිල්පත් | 487,267 | | | 592,990 | | |
| - වෙනත් (ප්‍රති සුරැකුම්) | 1,073,667 | | | 1,004,157 | | |
| **ස්කන්ධ** | 762,200 | 30,616,881 | 2.49 | 1,533,601 | 34,157,505 | 4.49 |
| - ප්‍රාග්ධන ලාභ/ අලාභ | (552,143) | | | 177,734 | | |
| - ලාභාංශ | 1,314,343 | | | 1,355,867 | | |
| **සංස්ථා ණය** | 467,003 | 3,764,956 | 12.40 | 806,539 | 4,905,360 | 16.44 |
| - ණයකර | 326,272 | | | 607,072 | | |
| - වාණිජ පත්‍රිකා | 95,585 | | | 179,340 | | |
| - වත්කම් අනුබල සුරැකුම්පත් | 35,987 | | | 11,569 | | |
| - වෙනත් මූල්‍ය පත්‍රිකා | 9,159 | | | 8,558 | | |
| **ඉඩම් හා ගොඩනැගිලි** | 4,800 | 9,883,372 | 0.05 | (27,858) | 11,484,141 | (0.24) |
| **තැන්පතු** | 1,257,652 | 9,752,912 | 12.90 | 2,021,330 | 15,765,015 | 12.82 |
| - බැංකු | 1,121,093 | | | 1,861,977 | | |
| - මූල්‍ය ආයතන | 136,559 | | | 159,353 | | |
| **ඒකක භාරය** | 105,183 | 1,116,041 | 9.42 | 144,895 | 1,631,623 | 8.88 |
| **රත්රන්** | 45,583 | 175,677 | 25.95 | (27,777) | 19,172 | (144.88) |
| **වෙනත්** | 611,039 | 944,575 | 64.69 | 101,189 | 1,523,008 | 6.64 |
| **එකතුව** | **6,351,725** | **83,398,658** | **7.62** | **7,523,495** | **98,079,822** | **7.67** |

*(අ) ප්‍රතිශ්ඨාපිත විගණන සංඛ්‍යා*
*(ආ) තාවකාලික සංඛ්‍යා*

*සටහන්:*

*1. අවශ්‍ය කරන ලද සම්පූර්ණ තොරතුරු මණ්ඩලය වෙත යොමු කර නොමැති බැවින් ජාතික රක්ෂණ භාර අරමුදලේ :NITF) තොරතුරු ඉහත විශ්ලේෂණය සඳහා ඇතුලත් කර නොමැත.*

# සංඛ්‍යානමය සමාලෝචනය

**නව, අලුත් කළ සහ පවත්නා රක්ෂණ ඔප්පු පිළිබඳ විස්තර - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය**

19 වන වගුවේ දක්වා ඇති පරිදි 2012 වසරේ දී 3,896,531 ක් වූ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ ක්‍රියාත්මකව ඇති මුළු රක්ෂණ ඔප්පු සංඛ්‍යාව හා සැසඳීමේ දී 2013 වසර අවසානය වන විට එම සංඛ්‍යාව 4,255,551 ක් විය. රථ වාහන රක්ෂණ ඔප්පු, ක්‍රියාත්මකව ඇති මුළු රක්ෂණ ඔප්පු සංඛ්‍යාවෙන් 87.51% ක් නිරූපණය කළ අතර විවිධ රක්ෂණ ඔප්පු (4.87%), ගිනි (4.57%) සහ මුහුදු (3.05%) රක්ෂණ ඔප්පු ඉන් අනතුරුව පිළිවෙලින් වාර්තා විය. 2012 වසර අවසානය වන විට ක්‍රියාත්මකව පැවති 168,683 ක් වූ විවිධ රක්ෂණවල රක්ෂණ ඔප්පු හා සැසඳීමේ දී එම අගය 22.81% කින් වැඩි වී ඇත.

වසර තුළ රක්ෂණ සමාගම් 1,872,060 ක නව රක්ෂණ ඔප්පු නිකුත් කර ඇති අතර එය ක්‍රියාත්මකව ඇති මුළු රක්ෂණ ඔප්පුවලින් 43.99% ක් වේ. පසුගිය වසර හා සැසඳීමේ දී රථ වාහන හා ගිනි රක්ෂණ ව්‍යාපාරවල නව රක්ෂණ ඔප්පු පිළිවෙලින් 13,502 කින් සහ 2,217 කින් අඩු වී ඇත. අනෙක් අතට 2013 වසරේ දී නිකුත් කළ නව මුහුදු රක්ෂණ ඔප්පු 7,179 කින් වැඩි වී ඇත. 2012 වසරේ දී අලුත් කළ රක්ෂණ ඔප්පු 2,180,953 හා සැසඳීමේ දී 2013 වසරේ දී රක්ෂණ ඔප්පු 2,428,197 ක් අලුත් කර ඇත.

*වගුව 19*

**නව, අලුත් කළ සහ ක්‍රියාත්මකව ඇති රක්ෂණ ඔප්පු පිළිබඳ විස්තර - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය**

| | 2012 | | | 2013 | | |
|---|---|---|---|---|---|---|
| උප පන්තිය | නව රක්ෂණ | ඔප්පු අලුත් | වසර අවසානය | නව රක්ෂණ | ඔප්පු අලුත් | වසර අවසානය |
| ගිනි | 70,202 | 115,714 | 183,487 | 67,985 | 129,932 | 194,676 |
| මුහුදු | 148,870 | 2,095 | 119,096 | 156,049 | 2,602 | 129,719 |
| රථ වාහන | 1,526,510 | 1,978,158 | 3,425,265 | 1,513,008 | 2,220,775 | 3,723,988 |
| කම්කරු වන්දි ඇතුළු විවිධ | 130,478 | 84,986 | 168,683 | 135,018 | 74,888 | 207,168 |
| | **1,876,060** | **2,180,953** | **3,896,531** | **1,872,060** | **2,428,197** | **4,255,551** |

*සටහන්:*

*අවශ්‍ය කරන ලද සම්පූර්ණ තොරතුරු මණ්ඩලය වෙත යොමු කර නොමැති බැවින් ජාතික රක්ෂණ භාර අරමුදලේ (NITF) තොරතුරු ඉහත විශ්ලේෂණය සඳහා ඇතුලත් කර නොමැත.*

# සංඛ්‍යානමය සමාලෝචනය

### රක්ෂණ සමාගම්වල නුබුන්වත්බව - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය

2012 සහ 2013 වසරවල දෙසැම්බර් 31 ට රක්ෂණ සමාගම්වල නුබුන්වත් අනුපාත සහ තාක්ෂණික සංචිත 20 වන වගුවෙන් නිරූපණය වේ. 2012 වසරේ දී 2.43 ක් වූ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ සාමාන්‍ය නුබුන්වත් අනුපාතය හා සැසඳීමේ දී එම අගය 2013 වසර අවසානයේ දී 2.61 ක් විය. කෙසේවුව ද 2013 දෙසැම්බර් මස 31 වන දින වන විට එක් සමාගමකට නුබුන්වත් ආන්තික අවශ්‍යතාවට අනුකූලවීමට නොහැකිවී ඇති අතර මණ්ඩලය විසින් ඒ පිළිබඳව සුදුසු පියවර ගෙන ඇත. රක්ෂණ සමාගම්වල තාක්ෂණික සංචිත වගකීම 2012 වසරේ දී රුපියල් මිලියන 33,188 ක් වූ අතර ඒ හා සැසඳීමේ දී එම අගය 2013 වසර අවසානයේ දී රුපියල් මිලියන 35,419 ක් විය.

*වගුව 20*

***2012 සහ 2013 දෙසැම්බර් 31වන දිනට රක්ෂණ සමාගම්වල නුබුන්වත්බව සහ තාක්ෂණික සංචිත සමාගම් අනුව විශ්ලේෂණය - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය***

| රක්ෂකයා | 2012 දෙසැම්බර් 31වන දිනට (අ) | | 2013 දෙසැම්බර් 31වන දිනට (ආ) | | | |
|---|---|---|---|---|---|---|
| | නුබුන්වත් අනුපාතය | තාක්ෂණික සංචිත (රු. 000) | පවත්නා නුබුන්වත් ආන්තිකය (රු. 000) | අවශ්‍ය නුබුන්වත් ආන්තිකය (රු. 000) | නුබුන්වත් අනුපාතය | තාක්ෂණික සංචිත (රු. 000) |
| ඒඅයිඒ | 3.78 | 1,515,737 | 1,587,812 | 395,709 | 4.01 | 1,702,296 |
| ඒඅයිජී | 1.79 | 304,886 | 223,992 | 97,341 | 2.30 | 399,942 |
| අලියාස් සාමාන්‍ය | 5.76 | 486,330 | 562,065 | 249,548 | 2.25 | 1,010,087 |
| අමානා තකාෆුල් | 1.89 | 476,582 | 420,995 | 227,176 | 1.85 | 511,409 |
| ඒෂියන් එලායන්ස් | 2.37 | 592,088 | 576,562 | 260,425 | 2.21 | 781,103 |
| සෙලින්කෝ | 1.23 | 5,190,708 | 2,442,288 | 1,841,647 | 1.33 | 5,686,878 |
| කොන්ටිනෙන්ටල් | 1.58 | 628,214 | 341,303 | 194,932 | 1.75 | 611,398 |
| කෝපරේටිව් | 2.10 | 650,851 | 508,019 | 244,683 | 2.08 | 717,559 |
| එච්එන්බීඒ | 3.48 | 855,641 | 1,119,244 | 287,795 | 3.89 | 924,712 |
| ජනශක්ති | 2.24 | 3,510,174 | 1,860,757 | 1,115,908 | 1.67 | 4,103,078 |
| එල්ඕඑල්සී | 1.23 | 883,883 | 285,865 | 273,294 | 1.05 | 1,074,318 |
| එම්බීඑස්එල් | 1.06 | 518,511 | 113,752 | 197,278 | 0.58 | 567,695 |
| ඔරියන්ට් | 11.67 | 165,938 | 436,971 | 55,626 | 7.86 | 150,739 |
| පීපල්ස් | 1.50 | 1,878,856 | 883,822 | 585,831 | 1.51 | 2,238,159 |
| සණස | 1.65 | 136,278 | 55,570 | 50,000 | 1.11 | 131,198 |
| එස්එල්අයිසී | 3.25 | 12,570,017 | 12,216,661 | 2,814,390 | 4.34 | 11,767,131 |
| යූඒඑල් | 2.33 | 2,823,314 | 1,714,780 | 827,106 | 2.07 | 3,040,948 |
| **එකතුව** | **2.43** | **33,188,008** | **25,350,459** | **9,718,689** | **2.61** | **35,418,650** |

*(අ) ප්‍රතිශ්ඨාපිත විගණන සංඛ්‍යා*
*(ආ) තාවකාලික සංඛ්‍යා*

*සටහන්:*

*අවශ්‍ය කරන ලද සම්පූර්ණ තොරතුරු මණ්ඩලය වෙත යොමු කර නොමැති බැවින් ජාතික රක්ෂණ භාර අරමුදලේ (NITF) තොරතුරු ඉහත විශ්ලේෂණය සඳහා ඇතුලත් කර නොමැත.*

## රක්ෂණ තැරැව්කාර සමාගම්

### රක්ෂණ තැරැව්කාර සමාගම්වල කාර්යසාධනය

2013 වසර තුළ දී රක්ෂණ වෙළඳපොළ තුළ රක්ෂණ තැරැව්කාර සමාගම් පනස් නවයක් ක්‍රියාත්මක වූ අතර 2012 වසර තුළ දී පනස් පහක් ලෙස වාර්තා විය. 21 වන වගුවේ නිරූපණය කළ පරිදි රක්ෂණ තැරැව්කාර සමාගම් විසින් දිගුකාලීන හා සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයන් තුළින් උපයන ලද මුළු කොමිස් ආදායම 2013 වසර තුළ දී රුපියල් මිලියන 1,522 ක් විය. ඒ අනුව 2012 වසරේ දී උපයන ලද රුපියල් මිලියන 1,338 ක කොමිස් ආදායම හා සැසඳීමේ දී 2013 වසරේ දී එම අගය 13.75% කින් වැඩි වී ඇත. සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයෙන් උපයන ලද කොමිස් ආදායම රුපියල් මිලියන 1,052 ක් වූ අතර මුළු කොමිස් ආදායමෙන් 98.71% ක් නිරූපණය කළේය.

2013 වසරේ දී රක්ෂණ තැරැව්කාර සමාගම් විසි හතරක් එක් සමාග මක් රුපියල් මිලියන 10 ක් ඉක්ම වූ කොමිස් ආදායම බැගින් උපයා ගෙන ඇති අතර මෙම රක්ෂණ තැරැව්කාර සමාගම් උපයන ලද මුළු කොමිස් ආදායමෙන් 93.03% ක් වූ රුපියල් මිලියන 1,415 ක සාමූහික කොමිස් ආදායමක් ජනනය කර ඇත. ඉතිරි රක්ෂණ තැරැව්කාර සමාගම් තිස් පහ 21 වන රූප සටහනේ නිරූපණය කර ඇති පරිදි මුළු කොමිස් ආදායමෙන් 6.97% ක් වූ රුපියල් මිලියන 106 ක් උපයා ගැනීමට සමත් වී ඇත.

# සංඛ්‍යානමය සමාලෝචනය

*වගුව 21*

***රක්ෂණ තැරැව්කාර සමාගම් විසින් ජනනය කරන ලද කොමිස් ආදායම - 2013***

| | | කොමිස් ආදායම (රුපියල් '000) | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | දිගුකාලීන | | සාමාන්‍ය | | එකතුව | |
| | රක්ෂණ තැරැව්කාර සමාගමේ නම | (රු. 000) | % | (රු. 000) | % | (රු. 000) | % |
| 1 | ඒඩීඉසෙඩ් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 838 | 4.25 | 24,067 | 1.60 | 24,905 | 1.64 |
| 2 | එයිට්කන් ස්පෙන්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 113 | 0.57 | 69,126 | 4.60 | 69,239 | 4.55 |
| 3 | ඇල්ෆින්කෝ ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 0 | - | 74,040 | 4.93 | 74,040 | 4.86 |
| 4 | ඇසට්ලයින් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ලිමිටඩ් | 0 | - | 117,012 | 7.79 | 117,012 | 7.68 |
| 5 | සීඑෆ් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 2 | 0.01 | 210,411 | 14.00 | 210,413 | 13.82 |
| 6 | කොමර්ෂල් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 2,884 | 14.64 | 185,751 | 12.36 | 188,635 | 12.39 |
| 7 | ඩෙල්මේජ් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 1,195 | 6.07 | 65,356 | 4.43 | 66,551 | 4.45 |
| 8 | ඉක්විටි ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 0 | - | 17,029 | 1.13 | 17,029 | 1.12 |
| 9 | එසාජි කර්ම්ජී ඇන්ඩ් කම්පනි (ප්‍රයිවට්) ලිමිටඩ් | 1,532 | 7.78 | 41,532 | 2.76 | 43,064 | 2.83 |
| 10 | ෆින්ලේ ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්)ලිමිටඩ් | 3,470 | 17.61 | 136,290 | 9.07 | 139,760 | 9.18 |
| 11 | ග්ලෝබල් ඉන්ෂුවරන්ස් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 95 | 0.48 | 36,863 | 2.45 | 36,958 | 2.43 |
| 12 | ඉන්ඩස්ට්‍රියල් ඇන්ඩ් කොමර්ෂල් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 243 | 1.24 | 32,914 | 2.19 | 33,157 | 2.18 |
| 13 | එල්එම් ඇන්ඩ් ඒ ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ඇන්ඩ් කන්සල්ටන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 134 | 0.68 | 16,423 | 1.09 | 16,557 | 1.09 |
| 14 | ලයිෆ් ඇන්ඩ් ජෙනරල් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් සිලෝන් (ප්‍රයිවට්) ලිමිටඩ් | 29 | 0.15 | 17,256 | 1.15 | 17,285 | 1.14 |
| 15 | නේෂන්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ලිමිටඩ් | 749 | 3.80 | 107,854 | 7.18 | 108,603 | 7.13 |
| 16 | පයනියර් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 0 | - | 20,541 | 1.37 | 20,541 | 1.35 |
| 17 | ප්‍රෝකෙයා ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 63 | 0.32 | 23,399 | 1.56 | 23,462 | 1.54 |
| 18 | ප්‍රොටෙක්ෂන් ඇන්ඩ් ඇෂුවරන්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 12 | 0.06 | 51,362 | 3.42 | 51,374 | 3.37 |
| 19 | රිලයන්ස් ඒඒපී ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් | 3,375 | 17.13 | 15,258 | 1.02 | 18,633 | 1.22 |
| 20 | රිලයන්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 329 | 1.67 | 28,170 | 1.87 | 28,499 | 1.87 |
| 21 | සේනාරත්න ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 228 | 1.16 | 31,572 | 2.10 | 31,800 | 2.09 |
| 22 | සෙන්කඩගල ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 0 | - | 43,789 | 2.91 | 43,789 | 2.88 |
| 23 | ස්ට්‍රැටජික් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 13 | 0.07 | 20,315 | 1.35 | 20,328 | 1.34 |
| 24 | සෙනිත් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 0 | - | 13,827 | 0.92 | 13,827 | 0.91 |
| | **උප-එකතුව** | **15,304** | **77.69** | **1,400,157** | **93.23** | **1,415,461** | **93.03** |
| | **වෙනත් රක්ෂණ තැරැව්කාර සමාගම් (35)** | **4,395** | **22.31** | **101,654** | **6.77** | **106,049** | **6.97** |
| | **මුළු එකතුව** | **19,699** | **100** | **1,501,811** | **100** | **1,521,510** | **100** |

## රක්ෂණ සමාගම් සඳහා කෙටි යෙදුම්

| | | |
|---|---|---|
| ඒඅයිඒ | : | ඒඅයිඒ ඉන්ෂුවරන්ස් පීඑල්සී (පෙර අවිවා එන්ඩීබී ඉන්ෂුවරන්ස් පීඑල්සී) |
| ඒඅයිජී | : | ඒඅයිජී ඉන්ෂුවරන්ස් ලිමිටඩ් (පෙර චාට්ස් ඉන්ෂුවරන්ස් ලිමිටඩ්) |
| අලියාන්ස් - සාමාන්‍ය | : | අලියාන්ස් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ් |
| අලියාන්ස් - ජීවිත | : | අලියාන්ස් ලයිෆ් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ් |
| අමානා තකාෆුල් | : | අමානා තකාෆුල් පීඑල්සී |
| ආර්පිකෝ | : | ආර්පිකෝ ඉන්ෂුවරන්ස් ලිමිටඩ් |
| ඒෂියන් එලායන්ස් | : | ඒෂියන් එලායන්ස් ඉන්ෂුවරන්ස් පීඑල්සී |
| සෙලින්කෝ තකාෆුල් | : | සෙලින්කෝ තකාෆුල් ලිමිටඩ් |
| සෙලින්කෝ | : | සෙලින්කෝ ඉන්ෂුවරන්ස් පීඑල්සී |
| කොන්ටිනෙන්ටල් | : | කොන්ටිනෙන්ටල් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ් |
| කෝපරේටිව් | : | කෝපරේටිව් ඉන්ෂුවරන්ස් කම්පනි ලිමිටඩ් |
| එච්එන්බීඒ | : | එච්එන්බී ඇෂුවරස්න් පීඑල්සී |
| ජනශක්ති | : | ජනශක්ති ඉන්ෂුවරන්ස් පීඑල්සී |
| එල්අයිසී | : | ලයිෆ් ඉන්ෂුවරන්ස් කෝපරේෂන් (ලංකා) ලිමිටඩ් |
| එල්ඕඑල්සී | : | එල්ඕඑල්සී ඉන්ෂුවරන්ස් කම්පනි ලිමිටඩ් |
| එම්බීඑස්එල් | : | එම්බීඑස්එල් ඉන්ෂුවරන්ස් කම්පනි ලිමිටඩ් |
| එන්අයිසීඑල් | : | නැෂනල් ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් |
| එන්අයිටීඑෆ් | : | ජාතික රක්ෂණ භාර අරමුදල |
| ඔරියන්ට් | : | ඔරියන්ට් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් |
| පීපල්ස් | : | පීපල්ස් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් |
| සණස | : | සීමාසහිත සණස රක්ෂණ සමාගම |
| එස්එල්අයිසී | : | ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් |
| යූඒඑල් | : | යුනියන් ඇෂුවරන්ස් පීඑල්සී |

# මෙහෙයුම් කටයුතු සමාලෝචනය

## අධීක්ෂණ සමාලෝචනය

### රක්ෂණ සමාගම්

1. මණ්ඩලයට ඉදිරිපත් කරන ලද වාර්තා පිළිබඳ සමාලෝචනය

**අ) වාර්ෂික ව්‍යාවස්ථානුකූල වාර්තා, විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සහ ජීවගණකඥ වාර්තා**

පනතේ විධිවිධාන ප්‍රකාරව සියළු රක්ෂකයින් විසින් ඔවුන්ගේ වාර්ෂික ව්‍යාවස්ථානුකූල වාර්තා සහ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන අදාල මූල්‍ය වර්ෂය අවසන් වී හය මසක් ඇතුළත මණ්ඩලයට ඉදිරිපත් කළ යුතු වේ. තව ද දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාරවල නියුක්තව සිටින රක්ෂකයින් විසින් ජීවගණකඥ වාර්තාවක් සහ එහි සංක්ෂිප්තයක් ද වාර්ෂික ව්‍යාවස්ථානුකූල වාර්තාව සමඟ ඉදිරිපත් කළ යුතු වේ.

මණ්ඩලය විසින් මෙම වාර්තාවල නිරවද්‍යතාවය හා පනතේ අඩංගු නියමයන්ට හා රෙගුලාසිවලට ඇති අනුකූලතාවය හා එම වාර්තා නියමිත දිනට මණ්ඩලයට ඉදිරිපත් කිරීම ඉතා සමීප සමාලෝචනයකට ලක් කරන ලදී. තවද ජීවග ණකඥ වාර්තාවක් සහ එහි සංක්ෂිප්ත සමාලෝචනය කිරීමට උපදේශක ජීවගණකඥයකුගේ සහාය ලබා ගන්නා ලදී.

වාර්තා සමාලෝචනය කිරීමේ දී මණ්ඩලය විසින් අධීක්ෂණය කරන ලද ව්‍යාවස්ථානුකූල අවශ්‍යතාවලින් බැහැරවීම්, වෙනත් විෂමතාවන් හා දෝෂ නිවැරදි කිරීම සඳහා අදාළ රක්ෂකයන්ව දැනුවත් කරන ලදී. නිශ්චිත කාලසීමාවක් තුළ නිවැරදි පියවර ගැනීම පිණිස මණ්ඩලය විසින් අදාළ රක්ෂකයන්ට උපදෙස් ලබා දෙයි. රක්ෂකයින් පනතේ විධිවිධාන සහ මණ්ඩලයේ නීති සහ රෙගුලාසි පිළිපදින බවට තහවුරු කිරීම පිණිස මණ්ඩලය විසින් පසු පියවර ගනී. තවද අදාළ වාර්තා පරීක්ෂණය කිරීමේ දී හඳුනා ගත් ඇතැම් කරුණු ද මණ්ඩලය සිදු කරන ක්ෂේත්‍රගත පරීක්ෂණවල දී සැලකිල්ලට ගනු ලැබේ.

**ආ) කාර්තුමය වාර්තා**

පනතේ විධිවිධාන ප්‍රකාරව සියලු රක්ෂකයින් විසින් එක් එක් කාර්තුව අවසන් වී දින 45 ක් ඇතුළත තමන්ගේ කාර්තුමය වාර්තා මණ්ඩලයට ඉදිරිපත් කළ යුතු වේ. රක්ෂකයින් ඉදිරිපත් කරන සියලුම කාර්තුමය වාර්තා මණ්ඩලය විසින් සමාලෝචනය කර ඒවා පනත, වෙනත් නීති සහ රෙගුලාසිවලට අනුකූලවන බවට තහවුරු කර ගනී. තවද රක්ෂකයින්ගේ කාර්තුමය කාර්යසාධනය හා මූල්‍ය තත්ත්වය ද කාර්තුමය වාර්තා සමාලෝචනය හරහා අගයනු ලැබේ. රක්ෂකයින් පනතේ, මණ්ඩලයේ නීති හා රෙගුලාසිවල විධිවිධාන සහ 2006 අංක 6 දරන මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ විධිවිධාන අනුග මනය කරන බවට තහවුරු කිරීමට කාර්තුමය වාර්තා සමඟ අනුකූලතා සහතික ඉදිරිපත් කිරීමට ද අවශ්‍ය වේ. තවද සියලුම රක්ෂකයින් විසින් සිය වෛකල්පික ප්‍රතිරක්ෂණ වැඩපිළිවෙල පිළිබඳ විස්තර ද කාර්තුමය වාර්තා සමඟ යොමු කිරීම කළ යුතුය.

දිගුකාලීන හා සාමාන්‍ය යන රක්ෂණ ව්‍යාපාර දෙකෙහිම වාරික ආදායම, ප්‍රාරක්ෂණ ලාභය සහ ශුද්ධ ලාභය පදනම් කරගනිමින් එක් එක් රක්ෂකයාගේ කාර්තුමය කාර්යසාධනය ඇගයීම පිණිස වාර්තා මණ්ඩලය විසින් විශ්ලේෂණය කරනු ලැබේ. තවද එක් එක් රක්ෂකයාගේ කාර්යසාධනය අවබෝධ කර ගැනීම සඳහා ලාභදායීත්වය, වියදම් හා හිමිකම්පෑම් මත විස්තීරණ අනුපාත විශ්ලේෂණයක් සිදු කරනු ලැබේ.

රක්ෂකයින්ගේ වත්කම් හා වගකීම් තත්ත්වයන් සහ නුබුන්වත්භාවය, ද්‍රවශීලතාවය හා ප්‍රාග්ධන ප්‍රමාණවත්බව පිළිබඳ අනුපාත විශ්ලේෂණය තුළින් කාර්තු අවසානයෙහි එක් එක් රක්ෂකයාගේ මූල්‍ය තත්ත්වය අඛණ්ඩව නිරීක්ෂණය කරනු ලැබේ. අනෙක් කර්මාන්ත සහභාගීවන්නන්ට එරෙහිව රක්ෂකයාගේ කාර්යසාධනය මිණුම් ලකුණු කිරීම අතරතුර රක්ෂණ කර්මාන්තයේ සමස්ථ කාර්යසාධනය ද තක්සේරු කරනු ලැබේ.

පනත, නීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම් කෙරෙහි රක්ෂකයන් දැනුවත් කර නිශ්චිත කාල සීමාවක දී ඒවා නිවැරදි කිරීමට අවශ්‍ය උපදෙස් සපයනු ලැබේ. රක්ෂකයන් නියාමන අවශ්‍යතා පිළිපැදීම අධීකෂණයට අවශ්‍ය පසු පියවර ද මණ්ඩලය විසින් ගෙන ඇත.

**ඇ) මාසික වාර්තා**

මණ්ඩලය විසින් නිකුත් කළ නියෝග අනුව 2013 වසර තුළ දී රක්ෂකයින් හතරදෙනෙකු සිය මාසික වාර්තා ලබා දී ඇත. එවැනි රක්ෂකයින් එක් එක් මාසය අවසන් වී දින 15 ක් ඇතුළත මාසික වාර්තා ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ. රක්ෂකයින් පනතේ, මණ්ඩලයේ නීති හා රෙගුලාසිවලට අනුකූලවීම පරීක්ෂා කිරීම පිණිස මණ්ඩලය විසින් ඔවුන්ගේ මාසික වාර්තා සමාලෝචනය කරනු ලැබීය. තවද අදාල රක්ෂකයින්ගේ කාර්යසාධනය හා මූල්‍ය තත්ත්වය මාසික පදනමක් මත අඛණ්ඩව නිරීක්ෂණය කරනු ලැබේ. අදාල වාර්තා සමාලෝචනයේ දී හඳුනා ගත් රෙගුලාසිවලට අනුකූල නොවීම් හා අක්‍රමිකතා පිළිබඳව නියමිත කාල සීමාවක් තුළ දී මණඩලය විසින් සුදුසු පියවර ගෙන ඇත.

**ඈ) අවදානම් තක්සේරු කිරීමේ සාරාංශය**

රක්ෂකයින් විසින් සෑම වසරකම මාර්තු 31 වන දිනට හෝ ඊට පෙර සිය අවදානම් තක්සේරු කිරීමේ සාරාංශය මණ්ඩලයට ගොනු කිරීමට අවශ්‍ය වේ. රක්ෂකයන්ගේ මෙහෙයුම්වල දළ විශ්ලේෂණයක් ලබා ගැනීම සඳහා ආයතනික හා හිමිකම් ව්‍යුහය, ව්‍යාපාර ආකෘතිය, ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය, අලෙවිකරණය හා බෙදාහැරීම,හිමිකම් පාලනය, අවදානම් කළමනාකරණය ආදිය පිළිබඳව අවදානම් තක්සේරු කිරීමේ සාරාංශයේ ඇති තොරතුරු මණ්ඩලය විසින් සමාලෝචනය කරනු ලැබේ.

# මෙහෙයුම් කටයුතු සමාලෝචනය

## 2. නුබුන්වත් ආන්තික හැකියාවේ සීමාව පිළිබඳ අනුකූලතාව අධීක්ෂණය කිරීම

නුබුන්වත් ආන්තික (සාමාන්‍ය සහ දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය) නීතිවලට අනුව සියලුම රක්ෂකයන් විසින් සාමාන්‍ය හා දිගුකාලීන රක්ෂණ ව්‍යාපාර සඳහා අවම නුබුන්වත් ආන්තික පවත්වා ගෙන යා යුතුය. රක්ෂකයින් විසින් ඔවුන්ගේ මාසික/ කාර්තුමය/ වාර්ෂික වාර්තා සමඟ නුබුන්වත් ආන්තික අනුපාත ගණනය කිරීම් ඉදිරිපත් කළ යුතු වන අතර නුබුන්වත් ආන්තික රීතිවලට අනුකූලවීම තහවුරු කිරීම පිණිස මණ්ඩලය විසින් එම ගණනය කිරීම් සමාලෝචනය කරනු ලැබේ. නුබුන්වත් ආන්තික අනුපාත ගණනය කිරීම් නිවැරදි නොවන බවට නිරීක්ෂණය වන්නේ නම් නිවැරදි කළ ගණනය කිරීම් නැවත ඉදිරිපත් කරන ලෙසට අදාළ රක්ෂකයන්ට උපදෙස් දෙනු ලැබේ. තවද රක්ෂකයන් විසින් අපේක්ෂිත නුබුන්වත් ආන්තික අනුපාත ඉෂ්ඨ කිරීමට අපොහොසත් වන්නේ නම් ඒවා නියමිත කාලසීමාවක් තුළ දී නිවැරදි කර නුබුන්වත් ආන්තික නීතිවලට අනුකූල වන ලෙස පියවර ගන්නා මෙන් අදාළ සමාගම්වලට උපදෙස් ලබා දෙයි. නුබුන්වත් ආන්තික නීතිවලට අනුකූලවීම තහවුරු කිරීම සඳහා මණ්ඩලය විසින් රක්ෂණ සමාගම්වල නුබුන්වත් තත්ත්වය අඛණ්ඩව අධීක්ෂණය කරයි.

## 3. නිශ්චිත ආයෝජනවල අනුකූලතාව අධීක්ෂණය කිරීම

### අ) රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කිරීම

පනතේ 25 වන පරිච්ඡේදයට අනුව සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය සඳහා වූ තාක්ෂණික සංචිත වත්කම්වලින් 20% කට නොඅඩු ප්‍රමාණයක් සහ දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය සඳහා වූ දිගුකාලීන රක්ෂණ අරමුදල් වත්කම්වලින් 30% කට නොඅඩු ප්‍රමාණයක් රක්ෂකයින් විසින් රජයේ සුරැකුම්පත්වල ආයෝජනය ලෙස පවත්වා ගෙන යා යුතු වේ. පනතේ 25 වන පරිච්ඡේදය අනුකූලවීම තහවුරු කිරීම සඳහා මණ්ඩලය විසින් මාසික/ කාර්තුමය/ වාර්ෂික පදනමක් මත රක්ෂකයින් විසින් රජයේ සුරැකුම්පත්වල සිදු කරන ආයෝජන සියුම්ව අධීක්ෂණයට ලක් කරනු ලැබේ. මේ අනුව වාර්තා කළ සංඛ්‍යාවල නිරවද්‍යතාව තහවුරු කිරීම සඳහා සහ රාජ්‍ය සුරැකුම්පත්වල කළ ආයෝජනවල හිමිකාරත්වය සහතික කර ගැනීම පිණිස ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන තැන්පතු පිළිබඳ ප්‍රකාශ මණ්ඩලය විසින් විමර්ශණයට ලක් කරනු ලැබේ. සමාලෝචනයේ දී අධීක්ෂණය කරනු ලැබූ නියාමන අවශ්‍යතාවන්ගෙන් වෙනස්වීම් කිසිවක් ඇත්නම් නියමිත කාලසීමාවක් තුළ දී ඒවා නිවැරදි කරනු පිණිස අදාළ රක්ෂකයන්ට දැනුම් දෙනු ලැබේ.

### ආ) නිර්ණයන් අනුව කෙරෙන වෙනත් ආයෝජන

2011 මාර්තු 01 වන දින දරන නිර්ණය කිරීම් අංක 1 සහ පසුකාලීන සංශෝධවලට අනුව සියලුම රක්ෂකයින් විසින් ඔවුන්ගේ තාක්ෂණික සංචිතයන්හි ශේෂව තිබෙන වත්කම් හා දිගුකාලීන රක්ෂණ අරමුදලෙහි ශේෂව තිබෙන වත්කම් ආයෝජනය කිරීම අවශ්‍ය වේ. ඒ අනුව නිර්ණය කිරීම් අංක 1 ට අනුකූලව පවතීදැයි තහවුරු කිරීම සඳහා තාක්ෂණික සංචිතයන්හි සහ දිගුකාලීන රක්ෂණ අරමුදලෙහි ආයෝජන විස්තර මණ්ඩලය විසින් සමාලෝචනය කරනු ලැබේ. අනුකූල නොවන අවස්ථාවන් මණ්ඩලය විසින් නියමිත කාලසීමාවක් තුළ දී ඒවා නිවැරදි කරනු පිණිස අදාළ රක්ෂකයන්ට දැනුම් දෙනු ලැබේ.

## 4. අනෙකුත් මූල්‍ය විශ්ලේෂණය

වසර තුළ හසුරුවනු ලැබූ විමර්ෂණ කටයුතු/පැමිණිලිවල කොටසක් ලෙස ඇතැම් රක්ෂකයින් පිළිබඳ වැඩිදුර මූල්‍ය ඇගයීම් මණ්ඩලය විසින් පවත්වා ගෙන යනු ලැබේ. මණ්ඩලය ගනු ලබන තීරණවලට ආධාර පිණිස සැලකිල්ලට ගන්නා විශේෂ ක්ෂේත්‍ර සම්බන්ධ වැඩිදුර මූල්‍ය තොරතුරු එක්රැස්කර ඇගයීම් කටයුතු සිදු කරයි.

## 5. රක්ෂණ කර්මාන්තය අධීක්ෂණය සඳහා වන අවදානම් පාදක ප්‍රාග්ධන (RBC) ආකෘතිය

2013 වර්ෂය තුළ මණ්ඩලය රක්ෂණ කර්මාන්තය සඳහා අවදානම් පාදක ප්‍රාග්ධන (RBC) ආකෘතිය අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී. රක්ෂණ කර්මාන්තය සහ පවතින ගෝලීය රක්ෂණ අධීක්ෂණ පරිචය ඉතා සියුම්ව විශ්ලේෂණය කිරීමෙන් පසු ඒ වන විට තිබූ රීති පාදක ආකෘතිය වෙනුවට අවදානම් සංවේදී අවම ප්‍රාග්ධන ආකෘතියක් ගොඩනැගීමේ ඉලක්කය ඇතිව 2009 වසරේ දී අවදානම් පාදක ප්‍රාග්ධන (RBC) ව්‍යාපෘතිය මණ්ඩලය විසින් ආරම්භ කරන ලදී. අවදානම් පාදක ප්‍රාග්ධන (RBC) ආකෘතිය සකස් කිරීම සඳහා මණ්ඩලයට ලෝක බැංකුවේ සහ FIRST INITIATIVE ආයතනයේ සහාය ලැබුණි. ලෝක බැංකුවේ උපදේශකයින් වශයෙන් Deloitte Touche Tohmatsu මඟින් මූලික තාක්ෂණික සහාය ලබා දෙන ලදී.

වෙළඳපොළ ඇගයීම් වාර්තාව, ගුණාත්මක වාර්තාව, ප්‍රමාණාත්මක වාර්තාව, අවසන් රීති කෙටුම්පත් සහ පුහුණුව ලෙස අවදානම් පාදක ප්‍රාග්ධන (RBC) ව්‍යාපෘතියේ අදියර රාශියක් ඇත. වෙළඳපොළ ඇගයීම් වාර්තාව සහ ගුණාත්මක වාර්තාව 2010 වසරේ දී අවසන් කරන ලද අතර ප්‍රමාණාත්මක වාර්තාව 2011 වසරේ දී අවසන් කරන ලදී. ගුණාත්මක වාර්තාව රක්ෂණ සමාගම් වෙත හඳුන්වාදීම සඳහා මණ්ඩලය විසින් ලෝක බැංකුව සමඟ එක්ව 2011 ඔක්තෝබර් මාසයේ දී සම්මන්ත්‍රණයක් සංවිධානය කරන ලදී. කර්මාන්ත නියෝජනය කරමින් සහභාගීවූවන්ට අවදානම් පාදක ප්‍රාග්ධන (RBC) ව්‍යාපෘතියේ සියලු අදියර අතරතුර දී සිය අදහස් සහ ප්‍රතිචාර ප්‍රකාශ කිරීම සඳහා අවස්ථාව ලබා දෙන ලදී.

2012 වසරේ තුන්වන කාර්තුවේ සිට අවදානම් පාදක ප්‍රාග්ධන (RBC) ආකෘතිය සම්බන්ධ පෙරහුරු පරීක්ෂණ ආරම්භ කිරීම පිණිස 2012 අගෝස්තු මාසයේ දී රක්ෂණ

# මෙහෙයුම් කටයුතු සමාලෝචනය

කර්මාන්තය සඳහා අවදානම් පාදක ප්‍රාග්ධන (RBC) ආකෘතිය සහ ආකෘති පත්‍ර ඉදිරිපත් කරන ලදී. අවදානම් පාදක ප්‍රාග්ධන (RBC) ආකෘතිය සහ පාරාමිතීන් නිසි පරිදි සකස්කර තිබේ ද යන්න ඇගයීම සහ එක් එක් රක්ෂකයින් සහ සමස්තයක් ලෙස රක්ෂණ කර්මාන්තය කෙරෙහි එහි බලපෑම හඳුනා ගැනීම අවදානම් පාදක ප්‍රාග්ධන (RBC) ආකෘතියේ පෙරහුරු පරීක්ෂණය පැවැත්වීමේ පරමාර්ථය වේ. පෙරහුරු පරීක්ෂණය 2012 වසරේ තුන්වන කාර්තුවේ දී ආරම්භ වී 2013 වසරේ දෙවැනි කාර්තුව තෙක් ක්‍රියාත්මක විය. තවද අවදානම් පාදක ප්‍රාග්ධන (RBC) ආකෘතිය සම්බන්ධ ගැටළු විසඳීම සඳහා පහසුකම් සැලසීමේ පරමාර්ථය ඇතිව මණ්ඩලයේ නිලධාරීන් සහ රක්ෂණ කර්මාන්තයේ නියෝජිතයින්ගේ සහභාගීත්වයෙන් අවදානම් පාදක ප්‍රාග්ධන (RBC) ආකෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා වූ ඒකාබද්ධ ක්‍රියාකාරී කමිටුවක්" පිහිටුවන ලදී. මෙම සාකච්ඡා පාදකව ආකෘති පත්‍ර සඳහා වැඩිදුර වෙනස්කිරීම් 2012 වසරේ සිට බලාත්මක කරන ලදී. පෙරහුරු පරීක්ෂණ ප්‍රතිඵල,මණ්ඩලයේ ආදාන සමඟ රක්ෂණ කර්මාන්තයෙන් ලැබූ ප්‍රතිචාර පාදකව අවසන් අවදානම් පාදක ප්‍රාග්ධන (RBC) ආකෘතිය 2013 වසරේ දී රක්ෂණ කර්මාන්තයට නිකුත් කරන ලදී. තවද මණ්ඩලය විසින් ලෝක බැංකුවේ සහයෝගය ඇතිව අවදානම් පාදක ප්‍රාග්ධන (RBC) ආකෘතිය කර්මාන්තය වෙත නිකුත් කිරීමට සහ එය පිළිබඳව සහභාගීවූවන් පුහුණු කිරීම සඳහා 2013 වසරේ ඔක්තෝබර් මාසයේ දී සම්මන්ත්‍රණයක් සංවිධානය කරන ලදී. වර්තමානය වන විට අවසන් අවදානම් පාදක ප්‍රාග්ධන (RBC) ආකෘතිය පාදකව ක්‍රියාත්මක කිරීම සඳහා අවදානම් පාදක ප්‍රාග්ධන (RBC) ආකෘති රීති කෙටුම්පත් කෙරෙමින් ඇත.

## 6. ක්ෂේත්‍රගත විමර්ශණ

2013 වසර තුළ දී මණ්ඩලය විසින් රක්ෂණ සමාගම්වල ක්ෂේත්‍රගත විමර්ශණ හතක් පවත්වන ලදී. මෙම විමර්ශණවල දී මණ්ඩලය විසින් රක්ෂකයන්ගේ මෙහෙයුම් පද්ධති, ප්‍රතිපත්ති සහ පටිපාටීන් සමාලෝචනය කර පනතේ විධිවිධාන සහ අනෙකුත් නීති හා මණ්ඩලයේ රෙගුලාසි පිළිපැදීම අගයන ලදී. තවදුරටත් අදාළ රක්ෂණ සමාගම්වල මෙහෙයුම් පද්ධති, ප්‍රතිපත්ති සහ පටිපාටීන් පිළිබඳ තොරතුරු ලබා ගැනීම පිණිස රක්ෂකයන්ගේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්, අභ්‍යන්තර/ බාහිර විගණකයින් සහ ජීවගණකඥයන් සමඟ සම්මුඛ සාකච්ඡා පවත්වන ලදී. ක්ෂේත්‍රගත විමර්ශණ අතරතුර දී කරන ලද නිරීක්ෂණ, වැඩිදියුණු කිරීම් සඳහා මණ්ඩලයේ නිර්දේශ සමඟ අදාල රක්ෂකයින්ගේ ප්‍රතිචාර ලබා ගැනීම පිණිස ඔවුන් වෙත යොමු කරනු ලදී.

## 7. ශ්‍රී ලංකා මහ බැංකුවට තොරතුරු ඉදිරිපත් කිරීම

මණ්ඩලය විසින් රක්ෂණ කර්මාන්තයේ කාර්යසාධනය පිළිබඳ මූල්‍ය තොරතුරු කාර්තුමය පදනමකින් ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය පද්ධති ස්ථායීතා දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරනු ලැබීය. වාරික ආදායම, ලාභදායීත්වය, ද්‍රවශීලත්වය ආදී කාර්තුමය වාර්තාවලින් එකතු කළ විස්තර මත පදනම්ව රක්ෂණ කර්මාන්තයේ කාර්යසාධනය අගයනු ලැබේ.

## 8. ප්‍රතිරක්ෂණ ක්‍රියාපටිපාටි සමාලෝචනය

පනතේ 31 (1) සහ 50 (1) වගන්ති අනුව සියළුම රක්ෂණ සමාගම් විසින් සෑම වසරකම මාර්තු 15 සහ 31 වැනි දිනවල හෝ ඊට පෙර සහතික කරන ලද ප්‍රතිරක්ෂණ ආවරණ සටහන් සහ ගිවිසුම් මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය. මණ්ඩලය විසින් නියම කරනු ලැබූ තක්සේරු අවශ්‍යතා ඉටු කරනු ලබන ප්‍රතිරක්ෂකයින්ගෙන් ලැබූ ප්‍රතිරක්ෂණ ආවරණ තහවුරු කිරීම සඳහා මණ්ඩලය විසින් එකී ලේඛණ සමාලෝචනය කරනු ලැබීය. නියාමන අවශ්‍යතාවලින් බැහැරවීම් නිරීක්ෂණය කළ අවස්ථාවල දී නියමිත කාලසීමාවක් තුළ දී ඒවා නිවැරදි කරනු පිණිස අදාළ රක්ෂකයන්ට දැනුම් දෙනු ලැබීය.

## 9. සංයුක්ත රක්ෂකයින් වෙන් කිරීම

සංශෝධිත පනතේ 53 වැනි වගන්තියට අනුව දිගුකාලීන සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරවල නියුතු රක්ෂකයින් විසින් 2015 පෙබරවාරි මාසය වන විට සිය සංයුක්ත රක්ෂණ ව්‍යාපාරය වෙනස් සමාගම් දෙකක් බවට වෙන් කළ යුතුය. රක්ෂණකරුවන් සිය සංයුක්ත ව්‍යාපාර වෙන් කිරීමට යෝජිත ආකෘති පිළිබඳව සංයුක්ත රක්ෂකයින් විසින් ඉදිරිපත් කළ වෙන් කිරීමේ යෝජනා සහ තොරතුරු 2013 වසරේ දී මණ්ඩලය විසින් සලකා බැලූ අතර ඒවා පිළිබඳ නිරීක්ෂණ අදාළ රක්ෂකයින්ට ලබා දෙන ලදී.

## 10. අවදානම් පාදක අධීක්ෂණ (RBS) ව්‍යාපෘතිය

ලෝක බැංකුවේ සහ FIRST INITIATIVE ආයතනයේ මූලාරම්භ ව්‍යාපෘතියක් වන අවදානම් පාදක අධීක්ෂණ (RBS) ව්‍යාපෘතිය, මණ්ඩලයේ අධීක්ෂණ කාර්යය ශක්තිමත් කිරීමේ පරමාර්ථය ඇතිව ආරම්භ කරන ලදී. අවදානම් පාදක අධීක්ෂණ (RBS) ව්‍යාපෘතිය මඟින් අවදානම් පාදක අධීක්ෂණය, ප්‍රතිරක්ෂණය, ප්‍රතිරක්ෂකයින්, අලාභ ගලපන්නන්, ආයෝජන, ආයෝජන සබැඳි නිෂ්පාදන ආදී ක්ෂේත්‍ර සම්බන්ධව මණ්ඩලයේ අධීක්ෂණ හැකියාව වැඩිදියුණු කෙරෙනු ඇත. අවදානම් පාදක අධීක්ෂණ (RBS) ව්‍යාපෘතිය අඛණ්ඩව කර ගෙන යාම සඳහා සමස්ත ව්‍යාපෘති සැලැස්ම, කාලසීමාවන්, බාර දිය හැකි දේ ආදිය පිළිබඳ 2013 වසර තුළ දී ලෝක බැංකුවේ උපදේශකයින් සමඟ සාකච්ඡා පැවැත්වින.

## 11. රක්ෂකයින් සඳහා විස්තරාත්මක මූල්‍ය ප්‍රකාශන

රක්ෂකයින්ගේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්ට (SLFRS) අනුකූල විය යුතු බවට නියම කරන වර්තමානයේ ඇති නිර්දේශිත පරිචය පිළිබඳ ප්‍රකාශය (SORP) විස්තරාත්මක මූල්‍ය ප්‍රකාශන සමඟ

# මෙහෙයුම් කටයුතු සමාලෝචනය

ප්‍රතිස්ථාපනය කිරීමේ කාර්යය සඳහා මණ්ඩලය, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය (ICASL) සමඟ එක්ව කටයුතු කළේය. විස්තරාත්මක මූල්‍ය ප්‍රකාශන මඟින් රක්ෂණ කර්මාන්තය තුළ ඒකාකාරී මූල්‍ය වාර්තාකරණ පද්ධතියක් නිර්මාණය කරනු ලබන අතර ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්ට අනුව මූල්‍ය තොරතුරු ඉදිරිපත් කිරීමට පහසුකම් සලසනු ඇත. විස්තරාත්මක මූල්‍ය ප්‍රකාශන සහ මාර්ගෝපදේශ සටහන් නිර්මාණය කිරීමක් ලෙස රක්ෂණ කර්මාන්තයට නිකුත් කිරීමේ ඉලක්කය ඇතිව ඒවා සකස් කිරීමේ කටයුතු අවසන් කිරීම සඳහා 2013 වසර තුළ දී මණ්ඩලය, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය (ICASL) සමඟ සම්බන්ධීකරණ කටයුතු ඉටු කරන ලදී.

### රක්ෂණ තැරැව්කරුවෝ

### 1. කාර්තුමය වාර්තා, අන්තර්කාලීන මූල්‍ය ප්‍රකාශන සහ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය

2010 පෙබරවාරි 25 දින අංක 1642/16 දරණ ගැසට් නිවේදනය (පළමු උපලේඛණය) අනුව සියලු රක්ෂණ තැරැව්කරුවන් ඔවුන්ගේ කාර්තුමය වාර්තා සහ අන්තර්වාර මූල්‍ය ප්‍රකාශන එක් එක් කාර්තුව අවසන් වී දින 45 ක් ඇතුලත මණ්ඩලයට ඉදිරිපත් කළ යුතුය. රක්ෂණ තැරැව්කරුවන් ඉදිරිපත් කළ කාර්තුමය වාර්තා මණ්ඩලය විසින් සමාලෝචනය කරනු ලැබේ. වාර්තා සමාලෝචනය අතරතුර දී කිසියම් නියාමන අවශ්‍යතාවලින් බැහැරවීම් සහ විෂමතා නිරීක්ෂණය කළේ නම් මණ්ඩලය නියම කළ කාලසීමාවක් තුළ දී ඒවා නිවැරදි කරනු පිණිස අදාළ තැරැව්කරුවන්ට දැනුම් දෙනු ලැබේ.

රක්ෂණ තැරැව්කරුවන්ගේ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන, මූල්‍ය වර්ෂය අවසන් වී මාස හයක් ඇතුලත මණ්ඩලයට ඉදිරිපත් කළ යුතුය. රක්ෂණ තැරැව්කරුවන්ගේ මූල්‍ය තත්ත්වය සහ කාර්යසාධනය ඇගයීම සඳහා මණ්ඩලය විසින් විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කරනු ලැබේ. නියාමන අවශ්‍යතාවලින් බැහැරවීම් නිවැරදි කරනු පිණිස අදාළ තැරැව්කරුවන්ට දැනුම් දෙනු ලැබේ.

### 2. වාරික එකතු කිරීමේ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම

පනතේ 89 වැනි වගන්තියට අනුව රක්ෂකයන් වෙනුවෙන් රක්ෂණ වාරික එකතු කරනු ලබන රක්ෂණ තැරැව්කරුවන් එකතු කරනු ලබන රක්ෂණ වාරික දෙසතියක් ඇතුලත ඒ ඒ අදාල රක්ෂකයන් වෙත ප්‍රේෂණය කළ යුතුය. මණ්ඩලය විසින් කාර්තුමය වාර්තා හරහා සහ ක්ෂේත්‍රගත විමර්ෂණ අතරතුර දී රක්ෂණ තැරැව්කරුවන් විසින් පනතේ 89 වැනි වගන්තිය පිළිපැදීම සියුම්ව අධීක්ෂණය කරනු ලබයි. එකී විධිවිධානවලට අනුකූල නොවන රක්ෂණ තැරැව්කරුවන්ට විරුද්ධව මණ්ඩලය අවශ්‍ය පියවර ගනු ලැබේ.

### 3. ක්ෂේත්‍රගත විමර්ශන

පනත සහ මණ්ඩලයේ රීති හා රෙගුලාසිවලට අනුකූලවන ආකාරයෙන් රක්ෂණ තැරැව් ව්‍යාපාරය ක්‍රියාත්මක වන්නේ ද යන්න අධීක්ෂණය කිරීම සඳහා 2013 වසර තුළ දී මණ්ඩලය විසින් ක්ෂේත්‍රගත විමර්ශණ අටක් පවත්වන ලදී. ක්ෂේත්‍රගත විමර්ශනවල දී සිදු කළ නිරීක්ෂණ නිවැරදි කිරීමේ පියවර සඳහා නිර්දේශ සමඟ අදාළ රක්ෂණ තැරැව්කරුවන්ගේ අවධානයට යොමු කරනු ලබන අතර අවශ්‍ය අවස්ථාවල දී මණ්ඩලය විසින් නියාමන පියවර ගෙන ඇත.

### 4. ලියාපදිංචිය අළුත් කිරීම

2014 වසර සඳහා රක්ෂණ තැරැව්කරුවන්ගේ ලියාපදිංචිය අලුත් කිරීම සඳහා ඔවුනගෙන් ලැබූ ඉල්ලුම්පත්‍ර මණ්ඩලය විසින් සමාලෝචනය කරන ලදී. රක්ෂණ තරැව්කරුවන්ගේ ලියාපදිංචිය අලුත් කිරීමට පෙර ඔවුන්ගේ විගණනය කළ මූල්‍ය ප්‍රකාශන සහ කාර්තුමය වාර්තා විශ්ලේෂණය කරමින් රක්ෂණ තැරැව්කරුවන්ගේ මූල්‍ය තත්ත්වය අගයනු ලැබේ.

# මෙහෙයුම් කටයුතු සමාලෝචනය

## නියාමන සමාලෝචනය

### රක්ෂණ සමාගම් ලියාපදිංචි කිරීම

රක්ෂණ සමාගම් ලෙස ලියාපදිංචි වීම සඳහා මෙම වසර තුළ දී ඉල්ලීම් නොලද බැවින් ලියාපදිංචිය ලැබූ රක්ෂකයින්ගේ සංඛ්‍යාව 22ක් ලෙස නොවෙනස්ව පවතී.

ඇමුණුම 1: මණ්ඩලය මඟින් ලියාපදිංචි කරන ලද සියළු රක්ෂණ සමාගම්වල නාම ලේඛනය හා ඔවුන්ට ක්‍රියාකිරීමට අවසර ලබා දී ඇති රක්ෂණ ව්‍යාපාර පන්තිය/ පන්ති දැක්වේ.

**නව රක්ෂණ තැරැව්කාර සමාගම් ලියාපදිංචි කිරීම සහ රක්ෂණ තැරැව්කාර සමාගම්වල ලියාපදිංචිය අලුත් කිරීම**

මෙම වසර තුළ දී රක්ෂණ තැරැව්කරුවන් වශයෙන් කටයුතු කිරීම සඳහා මණ්ඩලය විසින් සමාගම් 2කට ලියාපදිංචිය ලබා දුනි. මෙම සාමගම් දෙක දීර්ඝකාලීන සහ සාමන්‍ය රක්ෂණ තැරැව්කාර ව්‍යාපාර කටයුතු යන දෙකම කර ගෙන යාමට ලියාපදිංචිය ලැබූහ.

2014 වසරට ලියාපදංචිය අලුත් කිරීම සඳහා රක්ෂණ තැරැව්කාර සමාගම් 57කින් ඉල්ලීම් මණ්ඩලට ලැබුනු අතර පනත යටතේ අවශ්‍යතා සම්පූර්ණ කර තිබූ නිසා සමාගම් 56කම ලියාපදිංචිය අලුත් කිරීමට පියවර ගන්නා ලදී.

ඇමුණුම 11: මණ්ඩලයේ ලියාපදිංචි සියලු රක්ෂණ තැරැව්කාර සමාග ම්වල නාම ලේඛණය හා ඔවුන්ට ක්‍රියාකිරීමට අවසර ලබා දී ඇති රක්ෂණ ව්‍යාපාර පන්තිය/ පන්ති දැක්වේ.

### බලාත්මක කිරීමේ ක්‍රියාවලිය

#### රක්ෂණ සමාගම්

**අත්හිටුවීම්**

මේ වසර තුළ දී මණ්ඩලය විසින් කිසිදු අත්හිටුවීමක් පනවා නැත. එහෙත් 2009 වසරේ දී සෙලින්කෝ තකාෆුල් ලිමිටඩ් වෙත පනවා ඇති අත්හිටුවීම තවදුරටත් ක්‍රියාත්මකව පවතී.

අංක SC (FR) 191/ 09 දරන මූලික අයිතිවාසිකම් නඩුවේ දී ශ්‍රේෂ්ඨාධිකරණය ලබා දුන් නියෝගය අනුව යමින් සෙලින්කෝ තකාෆුල් ලිමිටඩ් වෙත ඉදිරිපත් කරනු ලබන අව්‍යාජ රක්ෂණ හිමිකම් ඉල්ලීම් ක්‍රමවත්ව බේරුම්කිරීම සඳහා එකී සමාගමේ වත්කම් බැහැර කිරීම සඳහා මණ්ඩලය විසින් සෙලින්කෝ තකාෆුල් ලිමිටඩ් සමඟ අවබෝධතා ගිවිසුමකට එළඹෙන ලදී. ඒ අනුව සෙලින්කෝ තකාෆුල් ලිමිටඩ් හි හිමිකම් ඉල්ලුම්කරුවන්ට ඔවුන්ගේ හිමිකම් ඉල්ලීම් මණ්ඩලය වෙත ලිඛිතව යොමු කරන ලෙස පුවත්පත් දැන්වීමක් මඟින් දැනුම් දෙන ලදී. එසේ ලැබුනා වූ හිමිකම් ඉල්ලීම්, මණ්ඩලය විසින් මේ දිනවල අධ්‍යයනය කරමින් පවතී.

**විධාන**

එක්තරා රක්ෂණ සමාගමක් විසින් නිකුත් කළ ආයෝජන ඇපකර ප්‍රතිපත්තිවල ඇතැම් නියම සහ කොන්දේසි සාධාරණ හා යුක්තිසහගත නොවන බැවින්, මණ්ඩලය විසින් එම සමාගම වෙත පනතේ 37 (2) වගන්තිය අනුව විධානයක් නිකුත් කරන ලදී.

පනතේ 37 (2) වගන්තිය ප්‍රකාරව, මණ්ඩලය විසින් යම් රක්ෂණ ඔප්පුවක් මඟින් ආවරණය කරනු ලැබූ රක්ෂණ ගිවිසුමක නියමයන් සාධාරණ හා යුක්තිසහගතවීම තහවුරු කරනු පිණිස, පනතේ 37 (1) වගන්තිය යටතේ මණ්ඩලය වෙත යොමු කරන ලද යම් රක්ෂණ ඔප්පු ආකෘතීන් සඳහා සංශෝධන කරන ලෙසට නියමයන් නිකුත් කළ හැක. එලෙස විධානය කරනු ලැබූ විට එවැනි සංශෝධන ක්‍රියාත්මක කිරීම එම රක්ෂකයින්ගේ යුතුකම වේ.

එක්තරා රක්ෂකයෙක් එළැඹුනු රක්ෂණ යෝජනාක්‍රමය සම්බන්ධ අක්‍රමිකතාවන් කීපයක් නිරීක්ෂණය කිරීමෙන් පසු එකී රක්ෂකයාගේ මූල්‍ය ස්ථාවරත්වය හා ස්ථිරතාවය යහපත්ව පවත්වා ගෙනයාමේ අරමුණින් මණ්ඩලය විසින් එකී රක්ෂකයාට පනතේ 57 වන වගන්තිය අනුව විධාන නිකුත් කර ඇත.

මහජනතාවට හෝ ජාතික වශයෙන් හෝ ඔප්පුහිමියන්ගේ අයිතිවාසිකම්වලට හෝ හානිදායක වන්නාවූ ආකාරයකින් කිසියම් රක්ෂකයකු කටයුතු කරන්නේ නම් ඔවුන්ට විධාන නිකුත් කරන්නට පනතේ 57වන වගන්තියෙන් මණ්ඩලයට බලය පැවරේ.

රක්ෂණ සමාගම්වලට මින් පෙර නිකුත් කර ඇති විධානයන්ට අනුව ඒවා කටයුතු කරන්නේ ද යන්න විමර්ෂනය කිරීම මණ්ඩලය විසින් නිරන්තරයෙන් හා දැඩිව කරනු ලැබේ.

**අවවාද කිරීම්**

මණ්ඩලය විසින් වසර තුළ කිසිදු රක්ෂකයෙක්ට අවවාද ලිපි යවා නොමැත.

#### රක්ෂණ තැරැව්කාර සමාගම්

පනතේ 86 වන වගන්තියට අනුකූලව ක්‍රියා කිරීමට අසමත් වූ රක්ෂණ තැරැව්කාර සමාගම් පහකට මණ්ඩලය විසින් අවවාද ලිපි යවා ඇත.

පනතේ 86 (1) වගන්තිය සමඟ කියැවෙන 2010 පෙබරවාරි 25 දිනැති අංක 1642/16 දරන ගැසට්පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 07 වන රීතියෙහි දක්වා ඇති වෙනත් කරුණු අතර දැක්වෙන්නේ සෑම රක්ෂණ තැරැව්කරුවෙකු විසින්ම රක්ෂණ තැරැව්කාර සමාගම් ප්‍රධාන නිලධාරියා සහ සමාගම් අධ්‍යක්ෂවරයෙකු විසින් සහතික කරනු ලැබූ කාර්තුමය වාර්තාව එක් එක් කාර්තුව අවසානයේ දී සිට දින 45ක් ඇතුළත දී මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු බවය.

තවද, පනතේ 89 වන වගන්තියට අනුකූලව ක්‍රියාකරන්නට අසමත් වූ වෙනත් රක්ෂණ තැරැව්කාර සමාගම් දෙකකට මණ්ඩලය විසින් අවවාද ලිපි නිකුත් කර ඇත.

# මෙහෙයුම් කටයුතු සමාලෝචනය

රක්ෂණ සමාගම් වෙනුවෙන් රක්ෂණ තැරැව්කාර සමාගම් විසින් එකතු කරනු ලබන වාරික මුදල් එසේ එකතු කිරීමෙන් සති දෙකක් ඇතුලත දී අදාළ රක්ෂණ සමාගම වෙත ප්‍රේෂණය කරනු ලැබීමේ අවශ්‍යතාවය පනතේ 89 වන වගන්තියේ සඳහන් වෙනත් කරුණු අතර දක්වා ඇත.

වෙනත් රක්ෂණ තැරැව්කරුවකු විසින් 2013 වසර සඳහා ලියාපදිංචිය අළුත්කිරීම සඳහා ඉල්ලුම්පත්‍රය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද අවස්ථාවේ දී, මණ්ඩලයට අසත්‍ය, නොමඟ යවන සුලු හෝ වැරදි සහගත තොරතුරු සැපයීම සහ අවශ්‍ය කරුණු හෙළිදරව් කිරීම සඟවා සිටීම හෝ එසේ හෙළිදරව් කිරීමට අපොහොසත්වීම හේතු කොට ගෙන, එකී තැරැව්කාර සමාගම වෙත අවවාද ලිපි නිකුත් කර ඇත.

රක්ෂණ තැරැව්කාර සමාගමක් විසින් මණ්ඩලයට සාවද්‍ය, නොමඟ යවන සුළු හා වැරදි සහගත තොරතුරු ඉදිරිපත් කිරීම සහ ලියාපදිංචිය සඳහා හෝ ලියාපදිංචිය අලුත් කිරීමට අයැදුම් කිරීමේ දී කරුණු සැඟවීම හෝ හෙළිදරව් කිරීමට අසමත්වීම යන හේතු මත රක්ෂණ තැරැව්කාර සමාගමක ලියාපදිංචිය අත්හිටුවීම හෝ අවලංගු කිරීම හෝ ලියාපදිංචිය අලුත් කිරීම ප්‍රතික්ෂේප කිරීම සඳහා බලය පනතේ 84 (1) (ඉ) අනුව මණ්ඩලය සතු වේ.

පනතේ 84 (1) (ඈ) අනුව යම්කිසි තැරැව්කාර සමාගමකට මණ්ඩලය විසින් යටත් පිරිසෙන් වෙන් වෙන් අවස්ථා තුනක දී අවවාද කරනු ලැබ තිබේ නම් එම සමාගමේ ලියාපදිංචිය අත්හිටුවීම හෝ අවලංගු කිරීම හෝ ලියාපදිංචිය අලුත් කිරීම ප්‍රතික්ෂේප කිරීම සඳහා බලය මණ්ඩලය සතු වේ.

### විධාන

රුපියල් මිලියන එකක අවම ශුද්ධ ප්‍රාග්ධන අවශ්‍යතාවය පවත්වා ගැනීම සඳහා ප්‍රාග්ධන ආවිලයනය කිරීමට විධානය කරමින් පනතේ 84අ වගන්තිය යටතේ මණ්ඩලය විසින් එක්තරා රක්ෂණ තැරැව්කාර සමාගමකට විධානයක් නිකුත් කරන ලදී. මේ සඳහා අනුකූලවීමට සාධාරණ කාලසීමාවක් ලබා දෙන ලදී.

84 වන වගන්තිය යටතේ ක්‍රියාකිරීම වෙනුවට මණ්ඩලය විසින් ඇතැම් පියවරවල් ගැනීමට නියම කරනු ලැබිය හැකි බවට 84අ වගන්තියෙන් මණ්ඩලයට බලය පවරනු ලබන අතර 84වන වගන්තිය යටතේ කිසියම් ක්‍රියාමාර්ගයක් ගැනීම වෙනුවට සහ ඒ වගන්තිය යටතේ ක්‍රියාමාර්ගයක් ගැනීමට අවසරදීමට තරම් අදාළ ක්‍රියාව හෝ නොකර හැරීමේ ස්වභාවය වැදගත් නොවන අවස්ථාවක දී -

(අ) එම ක්‍රියාවෙන් හෝ නොකර හැරීමෙන් උද්ගත වන යම් ප්‍රතිඵලයක් නිවැරදි කිරීම සඳහා සහ නිවැරදි ආකාරයකට සකස් කිරීම සඳහා; සහ

(ආ) මේ පනතේ විධිවිධාන හෝ ඒ යටතේ සාදනු ලබන යම් නියෝග හෝ රීති කිසිවක් හෝ මේ පනත යටතේ මණ්ඩලය විසින් පනවන ලද කොන්දේසි හෝ දෙන ලද නියෝග කිසිවක් හා අනුකූලවීම සඳහා,

මණ්ඩලය විසින් සුදුසු යයි තීරණය කරනු ලැබිය හැකි යම් පියවර ගැනීමට, රක්ෂණ තැරැව්කරුවකු හට විධාන කළ හැකි ය.

### නියාමන/ උපදේශනාත්මක ක්‍රියාමාර්ග:

1. ප්‍රතිරක්ෂණ ආස්ථිත්‍යයක් සිය තාවකාලික පහළවැටීම සමාලෝචනය කිරීමටත්, ශ්‍රී ලංකා වෙළඳපොළ තුළ එහි ව්‍යාපාර අඛණ්ඩව කර ගෙන යාමට හැකියාව ලබා දීම සඳහා එහි වර්ගීකරණය වැඩි කර ගැනීමට සාධාරණ කාලයක් ලබා දෙන ලෙසටත් මණ්ඩලයෙන් ඉල්ලා සිටින ලදී. මණ්ඩලය විසින් නිකුත් කළ, 2013 සිට ඉදිරියට රක්ෂකයින්ට අදාළ වන සංශෝධනය කරන ලද ප්‍රතිරක්ෂණ නියම සහ කොන්දේසිවලට පසුව මෙම ඉල්ලීම සිදු කරන ලදී. කෙසේවුව ද ඔවුන්ගේ ඉල්ලීමට මණ්ඩලය අවසර නොදෙන ලදී. තවද 2014 වසරේ සිට ඉදිරියට ප්‍රතිරක්ෂණ ගිවිසුම්වලට ඇතුලත් වීමේ දී මණ්ඩලය නිකුත් කළ නියම සහ කොන්දේසි දැඩිව පිළිපදින ලෙසට මණ්ඩලය සියලුම රක්ෂකයින් දැනුවත් කරන ලදී.

2. එක් රක්ෂණ සමාගමක් විසින් මාලදිවයිනේ පිහිටි රක්ෂණ සමාගමක ස්කන්ධවල ඇ. ඩො. 500,000ක් ආයෝජනය කිරීමට මණ්ඩලයේ අනුමැතිය ඉල්ලා සිටියේය. එම ආයෝජනය, ඉල්ලීම සිදු කළ සමාගමේ මුළු වත්කම්වලින් 3.3%ක් විය. 2005 ඔක්තෝබර් මස අංක 1414/19 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද රක්ෂණ මණ්ඩලයේ රෙගුලාසිවල 4 වන රීතිය අනුව, කිසියම් වේලාවක දී තනි පුද්ගලයෙක් හෝ පුද්ගලයෙක් සහ ආශ්‍රිත පාර්ශ්වයක් සතුව ශ්‍රී ලංකාවෙන් බැහැරට තබා ගැනීමට අවසර දී ඇති වත්කම්වල වටිනාකම, ශ්‍රී ලංකාවෙන් බැහැරව තබා ගැනීමට අවසර දී ඇති වත්කම්වල වටිනාකමින් සියයට 5ක් (20%) නොඉක්මවිය යුතුය. එබැවින් එවැන්නක බලාත්මක තනි පාර්ශ්ව නිරාවරණය මුළු වත්කම්වලින් 1%ක් වේ.

   එබැවින් එකී රීතිවල දක්වා ඇති සීමාවන් සමාගම ඉක්මවන බැවින් සහ යෝජිත ආයෝජන තුළින් සාධාරණ ආයෝජන ප්‍රතිලාභයක් උත්පාදනය කරනු ලබන්නේ ද යන්න සැකසහිත වන පදනම මත මණ්ඩලය විසින් එම සමාගමේ ඉල්ලීමට අනුමැතිය ලබා දුන්නේ නැත.

3. අධීක්ෂණ හා නියාමනය යන ක්ෂේත්‍රවල සහයෝගය, පුහුණුව හා තාක්ෂණික සහාය සඳහා සහයෝගය සහ අධීක්ෂණය හා නියාමන තොරතුරු හුවමාරුව සඳහා සහයෝගය යන කාර්යයන් සඳහා මණ්ඩලය සමඟ අවබෝධතා ගිවිසුමකට එළැඹීමට මාලදිවයිනේ මුදල් අධිකාරිය ඉල්ලීමක් කර ඇත. කිසියම් දේශීය හෝ විදේශීය අධිකාරියක් සමඟ තොරතුරු හුවමාරු කර ගැනීම සඳහා ද්විපාර්ශ්වික හෝ බහුපාර්ශ්වික අවබෝධතා ගිවිසුම්වලට එළැඹීමට පනතේ 5 (ඈ) (ඈ) වගන්තිය මඟින් මණ්ඩලයට බලය පවරනු ලැබේ. එබැවින් මණ්ඩලය ඔවුන්ගේ ඉල්ලීමට එකඟව මාලදිවයිනේ මුදල් අධිකාරිය සමඟ අවබෝධතා ගිවිසුමකට එළැඹුනි.

# මෙහෙයුම් කටයුතු සමාලෝචනය

4. රක්ෂණ තැරැව්කාර සමාගමක්, තැරැව්කරුවෙක් ලෙස ප්‍රතිරක්ෂණ ව්‍යාපාරයේ නියැලීම අවහිර කරන කිසියම් නෛතික විධිවිධානයක් පනතේ අන්තර්ගත වන්නේ ද සහ මණ්ඩලය විසින් නිකුත් කළ අවසරය මඟින් (ලියාපදිංචි සහතිකය) ඔවුන්ට ප්‍රතිරක්ෂණ ව්‍යාපාර ගනුදෙනු කිරීමට සහ විදේශ ප්‍රතිරක්ෂණ ස්ථාපන සඳහා අවසර දෙන්නේ දැයි මණ්ඩලයෙන් විමසන ලදී. මණ්ඩලය විසින් ප්‍රතිරක්ෂණ ස්ථාපනයන් සඳහා නිකුත් කර ඇති නියම සහ කොන්දේසිවලට අනුව ශ්‍රී ලංකාවේ හෝ ශ්‍රී ලංකාවෙන් බැහැර ප්‍රතිරක්ෂණ ව්‍යාපාර සම්බන්ධව ශ්‍රී ලංකාවේ ලියාපදිංචි රක්ෂකයින් සඳහා අතරමැදියෙක් ලෙස ඔවුන්ට කටයුතු කළ හැකි බවට මණ්ඩලට දැනුම් දෙන ලදී. තවද එම කරුණ මණ්ඩලය විසින් ශ්‍රී ලංකා තැරැව්කරුවන්ගේ සංගමයට සහ ශ්‍රී ලංකා රක්ෂණ ආයතනයට දැනුම් දෙන ලදී.

5. එක්තරා රක්ෂණ සමාගමක්, යම් දේපළක් සම්බන්ධව නව කල්බදු ගිවිසුමකට එළැඹුනු දින සිට වසර දෙකක් සඳහා, ඔවුන්ගේ නුබුන්වත් ආන්තික ගණනය කිරීම් සඳහා පිළිගත හැකි වත්කමක් ලෙස එකී විකල්ප කල්බදු දේපළ සැලිකිල්ලට ගැනීමට මණ්ඩලයෙන් අවසර ඉල්ලා සිටින ලදී. නුබුන්වත් ආන්තික (සාමාන්‍ය රක්ෂණ හා දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාර) සංශෝධිත රීති අනුව 2010 දෙසැම්බර් 31 වැනි දිනට අත්කර ගන්නා ලද කල්බදු ඉඩම් සහ ගොඩනැගිලි 2013 අප්‍රේල් මස 01 වැනි දින තෙක් පිළිගත හැකි බවට මණ්ඩලය විසින් ඔවුන්ට දැනුම් දෙන ලදී.

6. රක්ෂණ සමාගමක් වෙත, එහි ආශ්‍රිත සමාගම් වෙත ගෙවීම් කිරීම වළක්වන විධානයක් මණ්ඩලය විසින් 2009 වසරේ දී නිකුත් කරන ලදී. එකී රක්ෂණ සමාගම ආශ්‍රිත සමාගමකට ගෙවිය යුතු හිඟ ගෙවීම් පියවීම සඳහා 2011 වසරේ දී මණ්ඩලයෙන් අවසරය ඉල්ලූ අතර එම රක්ෂණ සමාගම ද සාමාජිකයෙක් වන සමූහ ව්‍යාපාරයක සියලුම සමාගම්, ශ්‍රේෂ්ඨාධිකරණයේ විශේෂ අවසරයකින් මිස, මෝටර් රථ කිහිපයක් හැර වෙනත් කිසිදු ප්‍රාග්ධන වත්කම් හෝ වෙනත් වත්කම් පැවරීම වළක්වන ලද ශ්‍රේෂ්ඨාධිකරණ නියෝගයක් නිකුත් කර තිබීම හේතුවෙන් එම ඉල්ලීම මණ්ඩලය පිළිනොගන්නා ලදී. එම කාර්යය සඳහා ශ්‍රේෂ්ඨාධිකරණ අවසරය ලබා දී ඇති බවට ප්‍රකාශ කරමින් එකී රක්ෂණ සමාගම නැවත වරක් මණ්ඩලයේ අවසරය අයැද සිටි අතර එබැවින් එකී ඉල්ලීම කොන්දේසි කිහිපයකට යටත්ව මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

7. රක්ෂණ සමාගමක් විසින් රක්ෂණ ආවරණයක ආරම්භක දිනයේ දී මුළු රක්ෂණ වාරික ආදායම නොලැබ ආශ්‍රිත සමාගමකට රක්ෂණ ඔප්පු නිකුත් කිරීම වළක්වන විධානයක්, මණ්ඩලය විසින් 2012 වසරේ දී නිකුත් කරන ලදී. එකී විධානය නැවත සලකා බලන ලෙසට එම සමාගම මණ්ඩලයෙන් ඉල්ලා සිටි අතර එම රක්ෂණ සමාගමෙන් ලැබූ තොරතුරු විභාග කළ මණ්ඩලය එකී විධානය කොන්දේසි කිහිපයකට යටත්ව අවලංගු කරන ලදී.

8. සංශෝධිත පනතින් හඳුන්වා දෙන ලද නව විධිවිධානවලට අනුව රක්ෂණ සමාගම්වල අධ්‍යක්ෂකවරු පත් කිරීම සඳහා යොමු කළ අයැදුම් රාශියකට මණ්ඩලයේ අනුමැතිය ප්‍රදානය කරන ලදී.

9. සංශෝධිත පනතින් හඳුන්වා දෙන ලද නව විධිවිධානවලට අනුව රක්ෂණ සමාගම්වල සහ රක්ෂණ තැරැව්කාර සමාගම්වල ප්‍රධාන නිලධාරීන් පත් කිරීම සඳහා යොමු කළ අයැදුම් රාශියකට මණ්ඩලයේ අනුමැතිය ප්‍රදානය කරන ලදී.

10. නුබුන්වත් ආන්තික රීති යටතේ රක්ෂණ සමාගම් දෙකක තක්සේරුකරුවන් පත් කිරීමට මණ්ඩලයේ අනුමැතිය ප්‍රදානය කරන ලදී.

## නියාමන ප්‍රතිසංස්කරණ

### රීති

**රක්ෂණ සමාගම්වල සහ රක්ෂණ තැරැව්කාර සමාගම්වල ගෙවා නිමි කොටස් ප්‍රාග්ධනය වැඩි කිරීම සඳහා රීති**

2011 ජුනි මස 30 වැනි දිනට පෙර ලියාපදිංචි කළ රක්ෂණ සමාගම්වල එක් එක් රක්ෂණ ව්‍යාපාර පන්තිය සඳහා 2015 පෙබරවාරි මස වන විට හෝ ඊට පෙර, ගෙවා නිමි කොටස් ප්‍රාග්ධනය රුපියල් මිලියන 500 නොඅඩු ලෙස වැඩි කිරීම සඳහා වූ නව රීති මණ්ඩලය විසින් නිකුත් කරන ලදී. 2011 ජුනි මස 30 වැනි දිනට පසුව රක්ෂකයන් ලෙස ලියාපදිංචි වූ සමාගම්වලට ගෙවා නිමි කොටස් ප්‍රාග්ධනය රුපියල් මිලියන 500 නොඅඩු වේ.

එමෙන්ම රක්ෂණ තැරැව්කාර සමාගම්වලට 2014 දෙසැම්බර් 31ට හෝ ඊට පෙර වන විට ගෙවා නිමි කොටස් ප්‍රාග්ධනය රුපියල් මිලියන 2.5කට නොඅඩු මට්ටමක් දක්වා වැඩි කිරීම සඳහා රීති නිකුත් කර ඇත.

පනතේ 95අ වගන්තිය ප්‍රකාරව ඉහත රීති සකස් කරනු ලබන අතර 2013 මැයි 7 වැනි දින දරන අංක 1809/7 දරන අතිවිශේෂ ගැසට් නිවේදනයෙන් ප්‍රකාශයට පත් කර ඇත.

**සංයුක්ත රක්ෂණ සමාගම්වල වෙන් කිරීමේ අවශ්‍යතාවය පිළිපැදීමට පසුව පිහිටුවන ලද රක්ෂණ සමාගම්වල ගෙවා නිමි කොටස් ප්‍රාග්ධනය පිළිබඳ රීති**

වෙන් කිරීමේ අවශ්‍යතාවය පිළිපැදීමට පසුව පිහිටුවන ලද රක්ෂණ සමාගම්වලට එය රක්ෂකයෙක් ලෙස ලියාපදිංචි කරනු ලබන අවස්ථාවේ දී රුපියල් මිලියන 100ක ගෙවා නිමි කොටස් ප්‍රාග්ධනයක් තිබීමට අවසර දීමට සහ 2015 පෙබරවාරි මස වන විට හෝ ඊට පෙර ගෙවා නිමි කොටස් ප්‍රාග්ධනය රුපියල් මිලියන 500ක් දක්වා වැඩි කිරීමට රීති සකස් කරන ලදී. මෙම රීති ළඟදීම ප්‍රකාශයට පත් කිරීමට නියමිතය.

# මෙහෙයුම් කටයුතු සමාලෝචනය

**ආයතනික නියෝජිතයින්ගේ ලියාපදිංචි අවශ්‍යතා සඳහන් කරනු ලබන රීති**

රක්ෂණ සමාගම්වල සහ රක්ෂණ තැරැව්කාර සමාගම්වල රක්ෂණ නියෝජිතයින් ලෙස ලියාපදිංචි වීමට නියමිත තැනැත්තන්ගේ (තනි පුද්ගලයින් හැරුණු කොට) ලියාපදිංචි අවශ්‍යතා දක්වන රීති සකස් කරන ලදී.

## නිශ්චයන්

**පනතේ 98වන වගන්තියේ අරමුණු සඳහා සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය යටතේ උපරිම රක්ෂණ මුදල පිළිබඳ නිශ්චයන් - 2013 අප්‍රේල් මස 30 වැනි දින තවදුරටත් සංශෝධනය කළ සහ 2009 මැයි මස 25 වැනි දින සංශෝධිත 2002 ඔක්තෝබර් මස 30 වැනි දිනැති අංක 11 දරන නිශ්චය**

2011 අංක 3 දරන පනත මඟින් සංශෝධිත 98වැනි වගන්තිය මඟින් මණ්ඩලය විසින් තීරණය කරනු ලබන නිශ්චිත මුදලක් නොඉක්මවන රක්ෂිත මුදලක් සඳහා දිගුකාලීන සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයක් තුළින් පැන නඟින, හිමිකම්පාන්නන් විසින් මණ්ඩලයට යොමු කළ හිමිකම්පෑම් පියවීම පිළිබඳ ආරාවුල් විමර්ශනය කිරීමට මණ්ඩලයට බලය පවරනු ලැබේ.

දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාරය සඳහා උපරිම රක්ෂිත මුදල රුපියල් මිලියන 100ක් ලෙසින් 2009 වසරේ දී නිශ්චය කර ඇත. සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය සඳහා උපරිම රක්ෂිත මුදල රුපියල් මිලියන 200,00ක් ලෙස නිශ්චය කර ඇත.

**රක්ෂණ සමාගම්වල අනුකූලතා සහතිකය පිළිබඳ නිශ්චයන් - 2013 අප්‍රේල් මස 30 වැනි දින සංශෝධිත 2011 මැයි මස 31 දිනැති අංක 12 දරන නිශ්චය**

මෙම නිශ්චය අනුව රක්ෂණ සමාගම් මණ්ඩලය වෙත කාර්තුමය වශයෙන් ලබා දෙන කාර්තුමය වාර්තා සමඟ අනුකූලතා සහතිකයක් ද ලබා දීම අවශ්‍ය වේ.

මෙම අනුකූලතා සහතික මඟින් රක්ෂණ සමාගම් විසින් පනතේ විධිවිධාන සහ 2006 අංක 6 දරන මූල්‍ය ගනුදෙනු වාර්තාකරණ පනතේ විධිවිධාන පිළිපදින්නේද යන කරුණ සහතික කිරීමට අවශ්‍ය වේ.

## පනතේ 96අ වගන්තිය යටතේ නිකුත් කළ විධාන

**රක්ෂණ ඔප්පුහිමියන් වෙත රක්ෂණ ඔප්පු ලබාදීම පිළිබඳ සියලු රක්ෂණ සමාගම් වෙත කළ නිශ්චය - 2013 නොවැම්බර් මස 29 දිනැති අංක 2 දරන විධානය**

ඇතැම් රක්ෂකයින් විසින් සිය ඔප්පුහිමියන්ට රක්ෂණ ඔප්පු ලේඛණ ලබාදීම ප්‍රමාද කරන බව අධීක්ෂණය කළ මණ්ඩලය සියලුම රක්ෂණ සමාගම් වෙත පහත දැක්වෙන විධාන නිකුත් කර ඇත:

- රක්ෂණ ඔප්පුව නිකුත් කළ දිනයේ සිට සතියක් ඇතුලත, ඔප්පුහිමියාට රක්ෂණ ඔප්පු ලේඛණ ලැබී ඇති බවටත්, රක්ෂණ ලේඛණ ලැබූ දිනයත් දක්වමින්, ඔප්පුහිමියාගෙන් ලිඛිත පිළිගැනීමක් රක්ෂණ සමාගම් විසින් ලබා ගත යුතුය. රක්ෂිතයා සමාගමක් වන අවස්ථාවක දී රක්ෂණ සමාග මේ අධ්‍යක්ෂවරයෙක්ගෙන්, එවැනි සමාගමක සමාගම් ලේකම්වරයාගෙන් හෝ සමාගම වෙනුවෙන් රක්ෂණ ඔප්පු ලේඛණ භාර ගැනීමට බලයලත් තැනැත්තෙක්ගෙන් එකී පිළිගැනීම ලබා ගත යුතුය.

**සියලුම රක්ෂණ සමාගම්වලට වෙනම ප්‍රධාන නිලධාරියෙක් සහ වෙනම නිශ්චිත නිලධාරියෙක් සිටීම සඳහා වූ විධානය - 2013 දෙසැම්බර් 31 දිනැති අංක 3 දරන විධානය**

සියලුම රක්ෂණ සමාගම්වලට ප්‍රධාන නිලධාරියෙක් සහ නිශ්චිත නිලධාරියෙක් සිටිය යුතු බවටත් එකී ප්‍රධාන නිලධාරියා හෝ නිශ්චිත නිලධාරියා කිසිදු ආකාරයකින් වෙනත් රක්ෂණ සමාගමක් මඟින් සේවයට බඳවා නොගත යුතු බවටත් අංක 3 දරන නිශ්චය මඟින් මණ්ඩලය විධානය කර ඇත. මෙකී විධානය 2014 ජූලි මස 31 වැනි දින සිට බලාත්මක වනු ඇත.

රක්ෂණ සමාගමක නිශ්චිත නිලධාරියා පනතේ 32 (2) වගන්තිය අනුව පමණක් එම රක්ෂණ සමාගමේම ප්‍රධාන නිලධාරියා ලෙස කටයුතු කළ හැකි බව ඉහත දැක්වෙන විධානය මඟින් දක්වනු ලබන අතර දැනටමත් පොදු ප්‍රධාන නිලධාරියෙක් සහ පොදු නිශ්චිත නිලධාරියෙක් සිටින රක්ෂණ සමාගම් විසින් 2014 ජූනි මස 30 වැනි දිනට හෝ ඊට පෙර එකී විධානය පිළිපැදිය යුතුය.

## චක්‍රලේඛ

**රක්ෂණ සමාගමක බදු අයිතිය ඇති සහ සින්නක්කර අයිතිය ඇති ඉඩම් සහ ගොඩනැගිලි තක්සේරු කිරීමට තක්සේරුකරුවෙක් සතු විය යුතු සුදුසුකම් - 2013 මාර්තු මස 14 දිනැති අංක 30 දරන චක්‍රලේඛය**

රක්ෂණ සමාගමක තක්සේරුකරුවෙක්ට මණ්ඩලයේ නුබුන්වත් ආන්තික රීතිවල කාර්යයන් සඳහා, ශ්‍රී ලංකාවේ ඇති ඉඩම් සහ ගොඩනැගිලි තක්සේරු කිරීමට තිබිය යුතු නිර්ණායක මණ්ඩලය විසින් නිශ්චිතව දක්වන ලදී.

**අංක 18 දරන චක්‍රලේඛය අනුව රක්ෂණ සමාගම් විසින් ලබා දීමට නියමිත අර්ධ වාර්ෂික සහතිකකරණය අවලංගු කිරීම - 2013 අප්‍රේල් මස 30 දිනැති අංක 31 දරන චක්‍රලේඛය**

2013 අප්‍රේල් 30 දිනැති අංක 12 දරන නිශ්චයට කරන ලද සංශෝධනය ප්‍රකාරව, 2005 ජනවාරි 18 දිනැති අංක 18 දරන චක්‍රලේඛය සහ 2006 දෙසැම්බර් 22 දිනැති අංක 18 දරන එම චක්‍රලේඛයට කරන ලද සංශෝධනය, නොසලකා හරින ලෙසට මණ්ඩලය විසින් සියලු රක්ෂණ සමාගම්වලින් ඉල්ලා සිටින ලදී.

# මෙහෙයුම් කටයුතු සමාලෝචනය

**විදේශ සෞඛ්‍ය සහ සංචාරක රක්ෂණය - 2013 ඔක්තෝබර් මස 30 දිනැති අංක 32 දරන චක්‍රලේඛය**

විදේශ සෞඛ්‍ය සහ සංචාරක රක්ෂණය සම්බන්ධව 2002 ජූනි මස 5 දිනැති අංක 4 දරන චක්‍රලේඛයේ අංක 1 අයිතමයෙන් ප්‍රදානය කළ අනුමැතිය මණ්ඩලය විසින් 2013 ඔක්තෝබර් මස 30 වන දිනයේ සිට බලාත්මක වන පරිදි අවලංගු කරන ලදී.

කෙසේවුව ද 2002 ජූනි මස 5 දිනැති අංක 4 දරන චක්‍රලේඛයේ අංක 1 අයිතමය අවලංගු කරනු ලැබුව ද විදේශයක අවසර ලත් හෝ ලියාපදිංචි වූ රක්ෂණ සමාගමක් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරනු නොලැබුව ද පනතේ 101 වන වගන්තිය ප්‍රකාරව පමණක්

I. විදේශයක සංචාරයක කිරීමේ කාර්යය සඳහා;

II. විදේශයක නතරව සිටීමේ කාලපරිච්ඡේදය සඳහා;

III පනත යටතේ ලියාපදිංචි රක්ෂණ තැරැව්කාර සමාගම් හරහා

සෘජුව හෝ වක්‍රව සෞඛ්‍ය සහ සංචාරක රක්ෂණ ආවරණයක් ආරම්භ කිරීම සඳහා ශ්‍රී ලංකාව තුළ දී ඕනෑම තැනැත්තෙක්ට මණ්ඩලය විසින් අනුමැතිය ප්‍රදානය කරනු ලැබේ.

2013 ඔක්තෝබර් මස 31 වන දින සිට ඉහත අනුමැතිය බලාත්මකවීම ආරම්භ විය.

කෙසේවුව ද පනතේ 101වන වගන්තිය යටතේ මණ්ඩලයෙන් ලිඛිත අනුමැතිය ලැබීමෙන් පසු පමණක් පනත යටතේ ලියාපදිංචි වී ඇති රක්ෂණ සමාගම් සතුව නොමැති සෞඛ්‍ය සහ සංචාරක්ෂණ රක්ෂණ ඔප්පු විදේශීය රක්ෂකයන් මඟින් ලබා ගැනීමට හැකියාව ඇත.

**රක්ෂණ සමාගම් විසින් යෝජනා ආකෘති පත්‍රයේ සහතික කළ පිටපතක් සහ තිබෙන්නේ නම්, යෝජකයා විසින් වෛද්‍ය නිලධාරියෙක්ට කළ පුද්ගලික ප්‍රකාශනයේ සහතික කළ පිටපතක් රක්ෂණ ඔප්පු ලේඛණවලට ඇමිණීම - 2013 දෙසැම්බර් 9 දිනැති අංක 33 දරන චක්‍රලේඛය**

පනතේ 42 (3) වගන්තියේ අවශ්‍යතාවන් සැලකිල්ලට ගැනීමෙන් පසුව මණ්ඩලය විසින් යෝජනා ආකෘති පත්‍රයේ සහතික කළ පිටපතක් සහ තිබෙන්නේ නම්, යෝජකයා විසින් වෛද්‍ය නිලධාරියෙක්ට කළ පුද්ගලික ප්‍රකාශනයේ සහතික කළ පිටපතක් රක්ෂණ ඔප්පු ලේඛණවලට ඇමිණීම යහපත් පරිචයක් ලෙස සිදු කරන මෙන් රක්ෂණ සමාගම්වලට උපදෙස් දෙන ලදී.

පනතේ 42(3) වගන්තිය අනුව, රක්ෂණ ඔප්පුව සඳහා වූ යෝජනාවෙහි හා යෝජක විසින් වෛද්‍ය නිලධරයෙක් වෙත කරනු ලැබූ පෞද්ගලික ප්‍රකාශයෙහි සහතික පිටපත් රක්ෂණ ඔප්පුවට අමුණා ඇත්තේ නම් මිස, ඒ යෝජනාවේ හා පෞද්ගලික ප්‍රකාශයෙහි සහතික පිටපතක් ලබා ගැනීම සඳහා රක්ෂණකරුවෙකු වෙත කරනු ලැබූ ඉල්ලීමක් මත, රක්ෂණකරු විසින්, රක්ෂණ ඔප්පුව දරන්නාට හෝ ඔහුගේ නීත්‍යානුකූල නියෝජිතයාට හෝ රක්ෂණ ඔප්පුව භාරගත් තැනැත්තකුට හෝ ඒ සහතික පිටපත සපයනු ලැබිය යුතුය.

**සංයුක්ත රක්ෂණ සමාගම් සඳහා වෙන් කිරීමේ මාර්ගෝපදේශ**

දීර්ඝකාලීන සහ සාමාන්‍ය යන රක්ෂණ ව්‍යාපාර දෙකෙහිම නියුතු එනම් සංයුක්ත රක්ෂකයින් වෙන් කිරීම පිළිබඳ මාර්ගෝපදේශ මණ්ඩලය විසින් නිකුත් කරන ලදී. සංයුක්ත සමාගම්, 2015 පෙබරවාරි මාසය වන විට හෝ ඊට පෙර සංශෝධිත පනතේ 53වන වගන්තියට අනුකූලවීම අවශ්‍ය වේ.

# මෙහෙයුම් කටයුතු සමාලෝචනය

## විමර්ශනාත්මක සමාලෝචනය

රක්ෂණ සහතික දරන්නන්ගේ සහ අනාගත රක්ෂණ සහතික දරන්නන්ගේ සම්බන්ධතා ආරක්ෂා කිරීම මණ්ඩලයේ සමස්ත අරමුණු වලින් එකක් වන අතර, එය පනතේ 3 වන වගන්තියෙහි සඳහන් ව්‍යවස්ථාපිත වගකීමකි. ඒ අනුව, රක්ෂිතයෙකු විසින් ඉදිරිපත් කරනු ලබන රක්ෂණ හිමිකම් ගෙවීමක් සම්බන්ධ ආරවුලක දී එය විමර්ශනය කිරීමේ ව්‍යවස්ථාපිත බලතල මණ්ඩලයට ඇත. එය සපුරා ගැනීම සඳහා මණ්ඩලයට ගොනු කරනු ලබන පැමිණිල්ලක් මණ්ඩලය විමර්ශනය කරනු ලබයි.

පැමිණිලිකරු හා රක්ෂණ සමාගම විසින් යොමු කරනු ලබන විස්තරාත්මක තොරතුරු විශ්ලේෂණය කිරීම විමර්ශන ක්‍රියාවලියට ඇතුලත් වේ. අවශ්‍ය අවස්ථාවන්හි දී දෙපාර්ශ්වයම කැඳවා සාකච්ඡා කිරීම සහ සමහර අවස්ථාවන්හි දී යම් කරුණු පිළිබඳව බාහිර විශේෂඥ මත විමසීම සඳහා යොමු කරනු ලැබේ.

2013 වර්ෂය ඇතුළත මණ්ඩලයට මුළු පැමිණිලි 298 ක් ලැබී ඇත. 2013 වසරේ දී විමසීමට ලක් කළ මුළු පැමිණිලි සංඛ්‍යාවෙන් පැමිණිලි 278 ක් විමර්ශනය කොට අවසන් කර ඇත. වගුව 01 න් දැක්වෙන්නේ සමාලෝචන කාලය තුළ කාණ්ඩ අනුව ලැබූ පැමිණිලි ගණනයි.

*වගුව 01*


*කාණ්ඩ අනුව ලැබූ පැමිණිලි*

| සාමාන්‍ය | ගණන | දීර්ඝ කාලීන | ගණන | රක්ෂණ නියෝජිත හා බැඳුනු | ගණන |
|---|---|---|---|---|---|
| මෝටර් රථවාහන රක්ෂණය | 135 | රෝහල් ගතවීම | 06 | සේවය හා සම්බන්ධ කරුණු | 09 |
| මුහුදු රක්ෂණය | 02 | මරණ ප්‍රතිලාභ | 18 | සුදුසුකම් | 13 |
| ගිනි රක්ෂණය | 10 | අබලතා | 02 | සාවද්‍ය මුදල් පරිහරණය | 08 |
| වර්ජන, කැරලි කෝලහාල හා සිවිල් ආරවුල්/ත්‍රස්තවාදී ක්‍රියා | 02 | ආවරණ අහෝසි කිරීම/ඔප්පු ප්‍රාණවත් නොකිරීම | 06 | වෙනත් | 07 |
| සොරකම් රක්ෂණය | 07 | පූර්ණත්ව ප්‍රතිලාභ/පවාරණ අගය | 21 | | |
| අත්තිකාරම් ගෙවීම් සහ කාර්යසාධන රක්ෂණය | 07 | වෙනත්- ණය | 02 | | |
| කම්කරු වන්දි | 01 | වාරික නැවත ගෙවීම | 12 | | |
| ගංවතුර | 03 | ආයෝජන ඔප්පු | 10 | | |
| අග්‍රහාර/ගුරු අභිමානී | 03 | අසාධ්‍ය රෝග | 07 | | |
| සියළු ආදායම්වලට එරෙහිව කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ රක්ෂණය | 01 | | | | |
| ණය ආරක්ෂණය | 02 | | | | |
| සමූහ රක්ෂණය | 01 | | | | |
| සියළු අවදාම් වලට එරෙහිව යන්ත්‍රෝපකරණ පිළිබඳ රක්ෂණය | 03 | | | | |

රූප සටහන 01 න් දැක්වෙන්නේ 2013 වසර තුළ ලැබුණු පැමිණිලි සහ විමසීම් අවසන් කොට ඇති පැමිණිලියි.

*රූප සටහන 01*

*2013 වසර තුළ ලැබුණු පැමිණිලි සහ විමසීම් අවසන් කොට ඇති පැමිණිලි*




# මෙහෙයුම් කටයුතු සමාලෝචනය

රූප සටහන 02 න් දැක්වෙන්නේ 2013 වසර තුළ රක්ෂණ සමාගම් අනුව වර්ගීකරණයේ දී ලැබුණු පැමිණිලි සංඛ්‍යාව වේ.

*රූප සටහන 02*


***2013 වසර තුළ රක්ෂණ සමාගම් අනුව වර්ගීකරණයේ දී ලැබුණු පැමිණිලි***




ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයෙහි විමර්ශන අංශය 2009 වසරේ දී ස්ථාපිත කරන ලද අතර, එය 2010 වසරේ දී වෙනමම අංශයක් වශයෙන් පිහිටුවන ලදී. 2009 වසරේ සිට වාර්ෂිකව ලැබුණු පැමිණිලි පහත දක්වා ඇති පරිදි වේ.

*රූප සටහන 03*

***2009 වසරේ සිට වාර්ෂිකව ලැබුණු පැමිණිලි***



# මෙහෙයුම් කටයුතු සමාලෝචනය

වසර තුළ විමර්ශනය කිරීමෙන් පසුව මුළු පැමිණිලි 43 ක් නිරවුල් කරන ලද අතර, එකී හිමිකම් වල සමස්ත වටිනාකම රු. 18,276,694 ක් වේ.

**වෙනත් විමසීම්:**

සීමාසහිත ජාතික රක්ෂණ සංස්ථාවෙහි රක්ෂණ ඔප්පුවල ප්‍රසාද දීමනා සම්බන්ධයෙන් මණ්ඩලයට පැමිණිලි කිහිපයක් ලැබුණු අතර එකී කරුණු විමර්ශනය කොට රක්ෂණ ඔප්පු දරන්නන්ට ඔවුන්ගේ ගැටළුවලට සුදුසු පරිදි උපදෙස් දෙනු ලැබීය.

- තෙවන පාර්ශ්වීය වාහන රක්ෂණ හා හිමිකම් ගෙවීමේ පටිපාටිය සරල කිරීමේ අදහසින් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව හා අදාල අනෙකුත් පාර්ශ්වයන් සමඟ සාකච්ඡා කරනු ලැබීය. වෙනත් වර්තමාන භාවිතයන් හා වෙනත් අධිකරණ බල සීමාවන්හි පවතින කාර්ය පටිපාටිය අධ්‍යයනය කිරීමෙන් අනතුරුව මණ්ඩලය විසින් මෝටර් වාහන පනතට ඇතුලත් කිරීමට යෝජනා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරන ලදී.

- පැමිණිලි පිළිබඳව කටයුතු කිරීමේදී මණ්ඩලය නිරීක්ෂණය කරන ලද පරිදි රක්ෂණ නියෝජිතයින් හා ඔවුන්ගේ බඳවා ගැනීම්, සේවය අවසන් කිරීමේ ක්‍රියා පටිපාටි යනාදිය සම්බන්ධයෙන් ක්ෂේත්‍ර කිහිපයක් දියුණු කිරීම සඳහා ශ්‍රී ලංකා රක්ෂණ සංගමය සමඟ සාකච්ඡා කොට එම ක්‍රියාවලිය විධිමත් කිරීමට පියවර ගනිමින් සිටී.

- යොදා ගනු ලබන ක්‍රියාපටිපාටිය හා කාර්යාවලිය නොවෙනස්ව හා පාරදෘශ්‍ය බව සුරක්ෂිත විය හැකි ලෙස මණ්ඩලය එහි හිමිකම් ගෙවීමේ කටයුතු මෙහෙයවීම පිළිබඳව අභ්‍යන්තරික කාර්ය පටිපාටිය ක්‍රමවත් කොට ඇත.

- මහජනතාව සන්නිවේදනය කළ යුතු වැදගත් ක්ෂේත්‍රයන් පිළිබඳව මණ්ඩලයට ලැබුණු විවිධ වර්ගයෙහි පැමිණිලි නිරීක්ෂණයෙන් පසුව මණ්ඩලය විසින් නිකුත් කරන ලද උපාංග සකස් කිරීමේදී සලකා බලන ලදී.

# මෙහෙයුම් කටයුතු සමාලෝචනය

## වෙළඳපොළ සංවර්ධන හා බාහිර සම්බන්ධතා ඒකකය

වඩා දැනුවත්කාරී ජනතාවක් සමඟ රක්ෂණ ඔප්පු හිමියන් ආරක්ෂාකිරීමේ අරමුණ ද ඇතිව මහජනතාව දැනුවත් කිරීම තුළින් රක්ෂණය පිළිබඳව දැනුම වර්ධනය කිරීමට මණ්ඩලය උත්සාහ දරයි.

ඉහත කී අරමුණු අතැතිව, 2013 වර්ෂය තුළ ඉලක්කගත කණ්ඩායම් වෙත ළඟාවීම සඳහා විවිධ මාධ්‍යයන් මණ්ඩලය විසින් උපයෝගී කර ගන්නා ලදී.

### ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල පැවැත්වෙන දැනුවත් කිරීමේ වැඩසටහන්

මෙම වැඩසටහන 2012 වර්ෂයේ දී ආරම්භ කරන ලද්දකි. සමාලෝචනයට භාජනය කරන ලද කාලය තුළ බස්නාහිර, වයඹ, සබරගමුව, දකුණ, මධ්‍යම සහ උතුරුමැද පළාත්වල පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාල ආවරණය කරන ලදී. මෙම වැඩසටහනේ අරමුණ වූයේ එදිනෙදා ජීවිතයේ මහජනතාව සමඟ සමීපව කටයුතු කරන රාජ්‍ය නියෝජිතයින්ගේ රක්ෂණය පිළිබඳව දැනුම වර්ධනය කිරීමයි. මේ සඳහා අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාල සේවකයින්, ග්‍රාම නිලධාරීන්, ක්ෂේත්‍ර නිලධාරීන්, සමෘද්ධි නිලධාරීන් සහ සංවර්ධන නිලධාරීන් සහභාගි විය.

මෙහිදී ග්‍රාමසේවා නිලධාරි වසම් 690ක් ආවරණය වන පරිදි පාදුක්ක, මිනුවන්ගොඩ, ආනමඩුව, කුරුණෑගල, බලංගොඩ, බේරුවල, මිහින්තලේ, හික්කඩුව, කළුතර හා කුණ්ඩසාලේ යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල 10ක දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී.





### ප්‍රදර්ශන සඳහා සහභාගිත්වය

65වන නිදහස් දින උත්සව සැමරීම හා සමගාමීව අම්පාර හාඩි උසස් තාක්ෂණ ආයතනයේ පැවති “දැයට කිරුළ ජාතික ප්‍රදර්ශනය” වෙනුවෙන් මණ්ඩලය 2013 මාර්තු 23 සිට 29 දක්වා 7වන වරටත් සහභාගි විය. මෙහිදී මණ්ඩලය විසින් හාඩි උසස් තාක්ෂණික ආයතනයේ ප්‍රයෝජනය පිණිස සාදන ලද කියවීම් ශාලාව ඉදිකිරීම වෙනුවෙන් රුපියල් මිලියනයක මුදලකින් දායකත්වය ලබාදෙන ලදී.







වාර්ෂිකව පවත්වනු ලබන මෙම ජාතික ප්‍රදර්ශනය මගින් ග්‍රාමීය සාමාන්‍ය ජනතාව රක්ෂණ කර්මාන්තය සමඟ සම්බන්ධ කිරීමට හා මෙම ප්‍රදර්ශනය නැරඹීමට එන ජනතාව මණ්ඩලයේ නිලධාරීන් සමඟ අදහස් හුවමාරු කර ගැනීමේ අවස්ථාවක් මෙමගින් නිර්මාණය විය. දළ වශයෙන් 4000ක පමණ පිරිසක් මෙම වසරේ ප්‍රදර්ශන කුටිය නැරඹීමට පැමිණියහ.

මණ්ඩලය විසින් මාධ්‍ය භාවිතා කිරීමේදී විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය ඒ සඳහා භාවිතා කරන ලදී.

### මාධ්‍ය සාකච්ඡා පැවැත්වීම

ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව මගින් ප්‍රචාරණය වන ‘නුග සෙවන’ වැඩසටහනින් 2013 අප්‍රේල් 09 වන දින සජීවී මාධ්‍ය සාකච්ඡාවක්

# මෙහෙයුම් කටයුතු සමාලෝචනය

පවත්වන ලදී. මණ්ඩලයේ අධ්‍යක්ෂක (නීති) සහ ශ්‍රී ලංකා රක්ෂණ සංගමයේ නියෝජිතයෙකුගේ සහභාගිත්වයෙන් රක්ෂණයේ අවශ්‍යතාවය හා රක්ෂණ නීති රෙගුලාසි යන මැයින් සාකච්ඡාවක් පවත්වන ලදී. මේ සම්බන්ධව බොහෝ අයගෙන් හොඳ ප්‍රතිචාරයක් ලැබුනු අතර පසුව ජනතා විමසීම්ද අඛණ්ඩව ලැබුනි.

### ප්‍රකාශන

මණ්ඩලය විසින් අදාල කාලය තුළ ප්‍රකාශන කිහිපයක් ප්‍රකාශයට පත් කර බෙදා හරින ලදී. රක්ෂණ ඔප්පු මිලදී ගැනීමේ දී ඊට පහසුවක් පිණිස රක්ෂණ සංකල්ප හා රක්ෂණයට අදාල අනිකුත් වැදගත් කරුණු අවබෝධ කරගැනීම මෙමගින් මහජනතාවට පහසුවක් විය.

මණ්ඩලය විසින් පහත සඳහන් පුවත්පත් නිල නිවේදන, පුවත්ලිපි, දැන්වීම් හා මාධ්‍ය සාකච්ඡාවන් පවත්වා ප්‍රකාශයට පත්කර ඇත.

**අ) පුවත්පත් නිල නිවේදන**

- 2013 ජූනි මස පළකරන ලද "2012 වර්ෂයේ රක්ෂණ කර්මාන්තයේ ප්‍රගතිය" සම්බන්ධව පළවුන පුවත්පත් නිල නිවේදනය
- 2013 නොවැම්බර් මස පළකරන ලද "2013 වර්ෂයේ ප්‍රථම භාගය තුළ රක්ෂණ කර්මාන්තයේ ප්‍රගතිය" සම්බන්ධව පළවුන පුවත්පත් නිල නිවේදනය

**(ආ) පුවත්පත් දැන්වීම්**

- 2013 ජූනි මස භාෂා තුනෙන්ම පළ කරන ලද "ලියාපදිංචි රක්ෂණ සමාගම්වල ලැයිස්තුව"
- 2013 ජූනි මස භාෂා තුනෙන්ම පළ කරන ලද "ලියාපදිංචි රක්ෂණ තැරැව්කාර සමාගම්වල ලැයිස්තුව"
- 2013 ජූනි මස භාෂා තුනෙන්ම පළකරන ලද "සුපරීක්ෂාකාරීව කටයුතු කළහොත් පසුතැවීමට සිදු නොවේ" පුවත්පත් දැන්වීම

**(ඇ) පුවත්පත් ලිපි**

- 2013 පෙබරවාරි මස ඩේලි මිරර් පුවත්පතේ අතිරේකයක පළකරන ලද "රක්ෂණ ආවරණයක් ලබාගැනීමේ දී" යන පුවත්ලිපිය
- 2013 ජූලි මස පවත්වනු ලැබූ "අවදානම් පාදක ප්‍රාග්ධන ආකෘතිය" සම්බන්ධ සම්මන්ත්‍රණය පිළිබඳව පළ වූ පුවත්පත් ලිපිය

**(ඈ) මාධ්‍ය සාකච්ඡා**

- සිලෝන් ටුඩේ පුවත්පතේ ඉල්ලීමක් පරිදි එම පුවත්පත 2013 නොවැම්බර් මස සංවිධානය කරන ලද මාධ්‍ය සාකච්ඡාවක් සඳහා මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා සහභාගි විය.

**(ඉ) පෝස්ටර් බෙදා හැරීම**

- මණ්ඩලය විසින් සංවිධානය කරන දැනුවත් කිරීමේ වැඩසටහන් වල දී මහජනයා වෙත බෙදා හැරීම පිණිස භාෂා තුනෙන්ම මුද්‍රණය කරන ලද රක්ෂණය පිළිබඳ වූ පෝස්ටර් මුද්‍රණය කර බෙදාහැරීම

**(ඊ) අත්පත්‍රිකා බෙදාහැරීම (භාෂා තුනෙන්ම) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි**

**පහත සඳහන් මාතෘකා යටතේ අත්පත්‍රිකා මුද්‍රණය කරන ලදී.**

- "රක්ෂණය ඔබ දැනුවත්ව සිටින්නේ ද?" සිංහල හා දෙමළ
- "රක්ෂණයක් ලබා ගැනීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු" සිංහල හා දෙමළ
- "රක්ෂණ යෝජනා පත්‍රයක් සම්පූර්ණ කිරීමේ දී සැලකිලිමත් වන්න" සිංහල හා දෙමළ
- "රක්ෂණ සමාගම්වල ලැයිස්තුව" සිංහල හා දෙමළ
- "රක්ෂණයේ වැදගත්කම" සිංහල හා දෙමළ
- "ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය" සිංහල, දෙමළ හා ඉංග්‍රීසි



# මෙහෙයුම් කටයුතු සමාලෝචනය

## අනෙකුත් ක්‍රියාකාරකම්

**(අ) මණ්ඩලය පිළිබඳව නිපද වූ වාර්තාමය චිත්‍රපටිය**

මණ්ඩලය පිළිබඳව නිපද වූ වීඩියෝ වාර්තාමය චිත්‍රපටිය නව වෙළඳපල දත්ත සහිතව ඉංග්‍රීසි උප සිරැසි ඇතුළත් කිරීම

**(ආ) රක්ෂණ ඔප්පු නිමැයුම් විශ්ලේෂණය කිරීම**

රක්ෂණ කර්මාන්තයේ හා රක්ෂණ ඔප්පුහිමියන්ගේ යහපත උදෙසා රක්ෂණ ඔප්පු වැඩි දියුණු කිරීමේ අදහසින් රක්ෂණ සමාගම්වල රක්ෂණ නිපැයුම් සමාලෝචනයට ලක්කිරීම. මෙහි මූලික පියවරක් ලෙස අදාල වර්ෂය තුළ මෝටර් රථ රක්ෂණ ඔප්පු කීපයක් සමාලෝචනයට භාජනය කොට ඒ සම්බන්ධව වාර්තාවක් පිළියෙල කළේය.

**(ඇ) මහජන විමසීම්**

මෙම වර්ෂය තුළ රක්ෂණ කර්මාන්තයට හා රක්ෂණයට අදාල තොරතුරු පිළිබඳව සාමාන්‍ය ජනතාවගෙන්, රක්ෂණ ඔප්පු හිමියන්ගෙන් මෙන්ම කර්මාන්තයට සම්බන්ධ අනිකුත් පාර්ශ්වයන්ගේ විමසීම් හා දුක් ගැනවිලි වලට මණ්ඩලය විසින් අවධානය යොමු කරන ලදී.

# මෙහෙයුම් කටයුතු සමාලෝචනය

## පරිපාලනමය සමාලෝචනය

### මානව සම්පත්

ඕනෑම සංවිධානයක සාර්ථකත්වය විශාල වශයෙන්ම රැඳී තිබෙන්නේ එහි ක්‍රියාකාරීත්වයට හවුල් වන්නා වූ පුද්ගලයින්ගේ විශේෂඥ ඥානය මතය. මණ්ඩලයේ සාර්ථක උපක්‍රමවල කශේරුව (කොඳුනාරටිය) වන්නේ අපගේ මානව සම්පත් බැව් අප විශ්වාස කරන්නේ එබැවිනි.

ශ්‍රී ලංකාවේ රක්ෂණ කර්මාන්තය සියළුම රක්ෂණ සහතික දරන්නන්ගේ සහ අනාගත රක්ෂණ සහතික දරන්නන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ අරමුණින් ක්‍රියාත්මක විය යුතුය යන අභිප්‍රාය සාක්ෂාත් කර ගැනීම උදෙසා අවශ්‍ය යුතුකම් සහ කාර්යභාරය හඳුනා ගැනීම තුළින් මණ්ඩලය සිය සංවිධාන ව්‍යුහය ස්ථාපනය කර ඇත.

අපේක්ෂිත වෘත්තිකයින් නිසි කලට බඳවා ගැනීම තුලින් මානව සම්පත් ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය පියවර මේ වසර තුළදී මණ්ඩලය විසින් ගන්නා ලදී. මෙම පියවර සාක්ෂාත් කර ගැනීම උදෙසා සමාලෝචිත වසර තුළ දී එක් අධ්‍යක්ෂිකාවක්, විධායක නිලධාරීන් පස් දෙනෙකු සහ එක් ලේකම්වරියක් ස්ථිර කාර්ය මණ්ඩලයට බඳවා ගන්නා ලදී. 2013 දෙසැම්බර් 31 වන දිනට කාර්ය මණ්ඩලය හතලිස් දෙදෙනෙකුගෙන් සමන්විත විය.

2013 දෙසැම්බර් 31 වන දිනට කාර්ය මණ්ඩලයේ අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් පහත වගුවෙන් දැක්වේ.

| අධ්‍යාපනික / වෘත්තීය සුදුසුකම් | පශ්චාත් උපාධිය ප්‍රථම උපාධිය හා වෘත්තීය සුදුසුකම් | පශ්චාත් උපාධිය හා වෘත්තීය සුදුසුකම් | පශ්චාත් උපාධිය හා ප්‍රථම උපාධිය | ප්‍රථම උපාධිය හා වෘත්තීය සුදුසුකම් | ප්‍රථම උපාධිය | වෘත්තීය සුදුසුකම් |
|---|---|---|---|---|---|---|
| නිළධාරීන් සංඛ්‍යාව | 03 | 03 | 01 | 09 | 11 | 04 |

### පුහුණු කිරීම්

ආයතනික අරමුණු සහ කාර්යසාධනය වර්ධනය කර ගැනීම උදෙසා දැනුම සහ වෘත්තීයමය නිපුණතාවන් ලබා ගැනීමට සේවක මණ්ඩලයට සහායවීමේ අරමුණින් පුහුණු සහ සංවර්ධන ප්‍රතිපත්තීන් වෙත අවධානය යොමු කරන ලදී. සේවක මණ්ඩලයේ හැකියාවන් ශක්තිමත් කිරීම උදෙසා දේශීය මෙන්ම විදේශීය පුහුණු අවස්ථාවන් ඔවුන් වෙත ලබා දෙන ලදී.

| වර්ගය | 2012 (රුපියල්) | 2013 (රුපියල්) |
|---|---|---|
| දේශීය පුහුණු | 811,321 | 1,535,494 |
| විදේශීය පුහුණු | 6,290,479 | 6,287,452 |

### කාර්යය මණ්ඩල සුභසාධනය

කාර්ය මණ්ඩලයේ අභිප්‍රේරණය සහ ධෛර්යය වර්ධනය කිරීම සඳහා ඔවුන්ගේ සුභසාධනය වැදගත් සාධකයකි. එබැවින් ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය විසින් නේවාසික සහ බාහිර වෛද්‍ය පහසුකම්, හදිසි අනතුරු රක්ෂණාවරණ, වාහන ණය, ආපදා ණය හා උත්සව අත්තිකාරම් වැනි සිත්ගන්නා සුළු සුභසාධනයන් ලබා දෙන ලදී. තව ද, කාර්ය මණ්ඩලය සහ ඔවුන්ගේ පවුල්වල අයගේ සබැඳියාවන් වර්ධනය කිරීම උදෙසා නේවාසික පුහුණු වැඩසටහනක් සහ වාර්ෂික සුහද හමුව පවත්වන ලදී.

### තොරතුරු තාක්ෂණය

තොරතුරු පැහැදිලි ලෙස සිය පාර්ශවකරුවන් වෙත ලබාදීම සඳහා මණ්ඩලය සිය වෙබ් අඩවිය නවීකරණය කරන ලදී.

ආරක්ෂක ප්‍රමිතීන් වර්ධනය කිරීම උදෙසා CCTV කැමරා පද්ධතිය සවිකරන ලදී. වර්තමාන තොරතුරු තාක්ෂණ සැලසුම සහ ප්‍රසම්පාදන සැලසුමට අනුකූල ලෙස නවීන පරිඝණක කිහිපයක් පැරණි පරිඝණක වෙනුවට සවිකරන ලදී.

# මෙහෙයුම් කටයුතු සමාලෝචනය


## මූල්‍ය සමාලෝචනය

### රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල

රක්ෂණ පනතේ නියමයන්ට අනුව රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල වෙනුවෙන් එකතුවන මුදලින් (සෙස්) නියම කොට ඇති කටයුතු සඳහා ක්ෂණිකව යොදවන්නට අවශ්‍ය නොවන මුදල් විචක්ෂණ ලෙස උපරිම ප්‍රතිලාභ ලැබෙන අන්දමින් මෙම වර්ෂය තුළදී ද රක්ෂණ මණ්ඩලය විසින් ආයෝජනය කරන ලද අතර පහත දැක්වෙන ප්‍රස්ථාරය එම සෙස් ආදායමත් ආයෝජන ආදායමත් විදහා දක්වයි.

*රූප සටහන 01*

*2009 - 2013 කාලය තුළ සෙස් ආදායම සහ ආයෝජන ආදායම*




| | 2009 | 2010 | 2011 | 2012 | 2013 |
|---|---|---|---|---|---|
| සෙස් ආදායම (රු. මිලි.) | 139 | 145 | 217 | 237 | 246 |
| ආයෝජන ආදායම (රු.මිලි.) | 91 | 76 | 80 | 136 | 236 |


සෙස් ආදායම (රුපියල් මිලියන)

ආයෝජන ආදායම (රුපියල් මිලියන)

ඉහත ප්‍රස්ථාරය මගින් වසර 2009 සිට 2013 දක්වා පස් අවුරුදු කාලය තුළ සෙස් බදු ආදායමෙහි වූ වර්ධනය පෙන්නුම් කෙරේ. 2012, 2013 වර්ෂයන් තුළ ආයෝජන ආදායමේ කැපී පෙනෙන වර්ධනයක් ආයෝජන විවිධාංගීකරණය හේතු කොටගෙන ගෙන පෙන්නුම් කෙරේ. රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලේ වටිනාකම ගතවූ පස් වසර තුල වැඩි වී ඇති අන්දම පහත ප්‍රස්ථාරයෙන් පෙන්නුම් කරයි.

*රූප සටහන 02*

*2009 - 2013 කාලය තුළ රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලේ අගය*





| | 2009 | 2010 | 2011 | 2012 | 2013 |
|---|---|---|---|---|---|
| අරමුදලේ අගය (රු. මිලි.) | 755 | 1,012 | 1,276 | 1,622 | 1,778 |

# මෙහෙයුම් කටයුතු සමාලෝචනය

2013 දෙසැම්බර් 31 වන දිනට රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලේ වත්කම් සංයුතිය පහත ප්‍රස්ථාරයෙන් පෙන්නුම් කරයි.

***රූප සටහන 03***

***2013 දෙසැම්බර් 31 දිනට රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලේ වත්කම් සංයුතිය***




## මණ්ඩලයේ ආදායම


මණ්ඩලයේ සමස්ථ ආදායම ජනනය වන්නේ පහත දැක්වෙන ප්‍රභවයන් වලිනි.

- රක්ෂකයින් හා රක්ෂණ තැරැව්කාර සමාගම් ලියාපදිංචිය සඳහා අය කරන ලියාපදිංචි කිරීමේ ගාස්තු
- රක්ෂණ සමාගම්වලින් අය කෙරෙන වාර්ෂික ගාස්තු
- වාර්ෂිකව ලියාපදිංචිය අළුත්කිරීම සඳහා රක්ෂණ තැරැව්කාර සමාගම්වලින් අය කරන ගාස්තු
- අතිරික්ත අරමුදල් ආයෝජනයෙන් ලැබෙන පොලී ආදායම

පහත දැක්වෙන ප්‍රස්ථාරය 2009 - 2013 දක්වා කාල පරිච්ඡේදය තුළ මණ්ඩලයේ සමස්ථ ආදායම බෙදී ඇති ආකරය දක්වයි.

***රූප සටහන 04***

***2009 - 2013 කාලය තුල මණ්ඩලයේ ආදායම***




| | 2009 | 2010 | 2011 | 2012 | 2013 |
|---|---|---|---|---|---|
| වාර්ෂික ගාස්තු (රු. මිලි.) | 29 | 29 | 35 | 61 | 70 |
| ලියාපදිංචි හා ලියාපදිංචිය අළුත් කිරීමේ ගාස්තු (රු. මිලි.) | 2 | 2 | 3 | 5 | 4 |
| වෙනත් ආදායම් (රු. මිලි.) | 9 | 3 | 1 | 2 | 1 |
| ප්‍රදාන හඳුනාගැනීම් (රු. මිලි.) | 9 | 8 | 6 | 7 | 5 |
| මුළු ආදායම (රු. මිලි.) | 49 | 42 | 44 | 75 | 80 |

# මෙහෙයුම් කටයුතු සමාලෝචනය


### මණ්ඩලයේ වියදම්

2009 සිට 2013 වන විට මණ්ඩලයේ වියදම් ක්‍රමිකව ඉහළ ගොස් ඇත. ආදායම් හා වියදම් අතර හිඟය පනතේ විධිවිධානයන්ට අනුකූලව රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලින් පියවාගෙන ඇත.

පහත ප්‍රස්ථාරය 2009 - 2013 කාල පරිච්ඡේදය තුල මණ්ඩලයේ සමස්ථ වියදම පෙන්වයි.

*රූප සටහන 05*

***2009 - 2013 කාල පරිච්ඡේදය තුළ මණ්ඩලයේ සමස්ථ වියදම***




| | 2009 | 2010 | 2011 | 2012 | 2013 |
|---|---|---|---|---|---|
| මුළු වියදම (රු.මිලි.) | 66 | 71 | 74 | 94 | 105 |

# මූල්‍ය තොරතුරු


මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය 70

විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය 71

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය 72

රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලේ
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය 73

ගිණුම්කරණ ප්‍රතිපත්ති 74

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් 76

# මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

| දෙසැම්බර් 31 දිනට | සටහන් | 2013 රුපියල් | 2012 රුපියල් |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපළ පිරියත සහ උපකරණ | 1 | 9,941,815 | 13,165,749 |
| රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල - කුළී සහ විද්‍යුත් තැන්පතු | 2 | 11,088,660 | 11,088,660 |
| **ජංගම වත්කම්** | | | |
| භාණ්ඩ තොග | 3 | 413,051 | 391,138 |
| රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල - ආයෝජන හා වෙනත් | 2 | 1,766,611,670 | 1,610,930,804 |
| අනෙකුත් ජංගම වත්කම් | 4 | 15,135,397 | 13,513,443 |
| මුදල් හා මුදල් හා සමාන දෑ | 5 | 658,301 | 1,530,608 |
| **මුළු වත්කම්** | | 1,803,848,894 | 1,650,620,402 |
| **සංචිත හා වගකීම්** | | | |
| **සංචිත** | | | |
| රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල | 6 | 1,777,700,330 | 1,622,019,464 |
| **වගකීම්** | | | |
| **ජංගම නොවන වගකීම්** | | | |
| ප්‍රදාන | 7 | 9,941,815 | 13,165,749 |
| විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් | 8 | 3,345,318 | 1,889,445 |
| | | 13,287,133 | 15,055,194 |
| **ජංගම වගකීම්** | | | |
| ලද අත්තිකාරම් | | 4,862,417 | 4,727,599 |
| අනෙකුත් ජංගම වගකීම් | 9 | 7,999,014 | 8,818,145 |
| | | 12,861,431 | 13,545,744 |
| **මුළු සංචිත හා වගකීම්** | | 1,803,848,894 | 1,650,620,402 |

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම හා ඉදිරිපත් කිරීම පිළිබඳ වගකීම රක්ෂණ මණ්ඩලයේ සාමාජිකයින් වෙත පැවරේ.

ඉහත මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය පිටු අංක 74 සිට 82 දක්වා ඉදිරිපත් කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ සටහන් සමඟ සංයෝජිතව කියවිය යුතු වේ.

ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය සහ ඒ වෙනුවෙන්,

**ඉන්ද්‍රාණි සුගතදාස**
සභාපතිනිය

**එස්. ආර්. ආටිගල**
සාමාජික

කොළඹ. ශ්‍රී ලංකාව
2014 පෙබරවාරි 24.

# විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා | සටහන් | 2013 රුපියල් | 2012 රුපියල් |
|---|---|---|---|
| **ආදායම** | | | |
| අයභාරය | 10 | 74,278,594 | 65,774,167 |
| ප්‍රදාන හඳුනා ගැනීම් | 7 | 4,526,970 | 6,662,626 |
| පොලී ආදායම | | 1,235,056 | 1,932,676 |
| රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලෙන් මාරු කිරීම් | 6 | 25,090,847 | 19,295,177 |
| වෙනත් ආදායම් | 11 | 167,242 | 172,686 |
| **මුළු ආදායම** | | 105,298,709 | 93,837,332 |
| **වියදම්** | | | |
| කාර්ය මණ්ඩල පිරිවැය | 12 | (58,324,541) | (48,661,790) |
| වෘත්තීය ගාස්තු | 13 | (2,178,627) | (994,405) |
| මෙහෙයුම් වියදම් | 14 | (44,480,612) | (43,817,296) |
| මූල්‍ය සහ අනෙකුත් | 15 | (166,722) | (125,629) |
| **මුළු වියදම්** | | (105,150,502) | (93,599,120) |
| බදුවලට පෙර ශුද්ධ අතිරික්තය (ඌණතාවය) | | 148,207 | 238,212 |
| බදු | | (148,207) | (238,212) |
| බදුවලට පසු ශුද්ධ අතිරික්තය (ඌණතාවය) | | - | - |
| **වර්ෂය සඳහා ශුද්ධ අතිරික්තය** | | - | - |

පිටු අංක 74 සිට 82 දක්වා ඉදිරිපත් කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශනවල සංකලිත කොටසකි.

# මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා | සටහන් | 2013 රුපියල් | 2012 රුපියල් |
|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් ලැබූ මුදල් ප්‍රවාහ** | | | |
| කාල පරිච්ඡේදය සඳහා ශුද්ධ වැඩිවීම්/(අඩුවීම්) | | - | - |
| ක්ෂය සඳහා ගැලපීම් | | 4,526,970 | 6,582,865 |
| විශ්‍රාම ප්‍රතිලාභ සඳහා ප්‍රතිපාදන | | 1,698,014 | 55,536 |
| විශ්‍රාම ප්‍රතිලාභ සඳහා ගෙවීම | | (242,141) | - |
| දේපල, පිරියත හා උපකරණ විකුණුම් අලාභය | | - | 79,761 |
| ප්‍රදාන හඳුනා ගැනීම | | (4,526,970) | (6,662,626) |
| ආදායම් බදු | | 148,207 | 238,212 |
| පොලී ආදායම | | (1,235,056) | (1,932,676) |
| කාරක ප්‍රාග්ධනය වෙනස්වීම්වලට පෙර ශුද්ධ වැඩිවීම | | 369,024 | (1,638,928) |
| කාරක ප්‍රාග්ධනය වෙනස්වීම | | | |
| තොගවල (වැඩිවීම) / අඩුවීම | | (21,914) | (208,007) |
| ලැබිය යුතු දෑවල (වැඩිවීම) / අඩුවීම | | (1,643,609) | (2,656,106) |
| අත්තිකාරම් ලැබීම්වල වැඩිවීම / (අඩුවීම) | | 134,817 | 457,580 |
| ණය හිමියන් සහ උපචිතයන්හි වැඩිවීම / (අඩුවීම) | | (819,130) | 3,655,659 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා භාවිත කරන ලද මුදල් ප්‍රවාහය | | (2,349,836) | 1,249,126 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් වන ශුද්ධ මුදල් ප්‍රවාහය | | (1,980,812) | (389,802) |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලැබූ/(ක්‍රියාකාරකම් සඳහා යෙදූ) මුදල් ප්‍රවාහය** | | | |
| පොලී ආදායම | | 1,108,505 | 1,735,251 |
| දේපල, පිරියත සහ උපකරණ මිලට ගැනීම | | (1,303,036) | (7,459,488) |
| ආයෝජන ක්‍රියාකාරකම් සඳහා භාවිතා කරන ලද ශුද්ධ මුදල් ප්‍රවාහය | | (194,531) | (5,724,237) |
| **මූල්‍ය ක්‍රියාකාරකම් තුළින් ලැබූ මුදල් ප්‍රවාහය** | | | |
| රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලින් ප්‍රාග්ධන මාරු කිරීම් | | 1,303,036 | 7,459,488 |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය | | 1,303,036 | 7,459,488 |
| මුදල් සහ මුදල් හා සමාන දෑවල ශුද්ධ වැඩිවීම / (අඩුවීම) | | (872,307) | 1,345,449 |
| වර්ෂය ආරම්භයේ දී මුදල් සහ මුදල් හා සමාන දෑ | | 1,530,608 | 185,159 |
| වර්ෂය අවසානයේ දී මුදල් සහ මුදල් හා සමාන දෑ | | 658,301 | 1,530,608 |
| අතැති සහ බැංකුවේ ඇති මුදල් | 5 | 658,301 | 1,530,608 |

පිටු අංක 74 සිට 82 දක්වා ඉදිරිපත්කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශනවල සංකලිත කොටසකි.

# රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලේ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා | සටහන් | 2013 රුපියල් | 2012 රුපියල් |
|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහය** | | | |
| රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලේ ශුද්ධ වර්ධනය | | * 155,680,866 | 345,634,597 |
| කාරක ප්‍රාග්ධන වෙනස්වීමට පෙර ශුද්ධ වැඩිවීම | | 155,680,866 | 345,634,597 |
| කාරක ප්‍රාග්ධනය වෙනස්වීම | | | |
| රජයේ සුරැකුම්පත් හා ස්ථාවර තැන්පතු වලින් ලැබිය යුතු පොලියෙහි (වැඩිවීම)/අඩුවීම | | (82,171,165) | (12,560,479) |
| ලැබිය යුතු සෙස් බදුවල (වැඩිවීම) / අඩුවීම | | (1,000,000) | (10,000,000) |
| කුළී තැන්පතුවල (වැඩිවීම) / අඩුවීම | | - | (2,360,070) |
| අරමුදල් කලමණාකරණ ගිණුමේ ශේෂය (වැඩිවීම) / අඩුවීම | | (2,476,670) | - |
| සෙස් අරමුදලින් මාරු කළ යුතු අරමුදල්හි වැඩිවීම / (අඩුවීම) | | 1,193,883 | 702,733 |
| | | (84,453,952) | (24,217,816) |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය | | 71,226,914 | 321,416,781 |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහය** | | | |
| රජයේ සුරැකුම්පත්වල ආයෝජනය | | 458,601,187 | 212,926,661 |
| ස්ථාවර තැන්පතුවල ආයෝජනය | | (529,200,000) | (534,000,000) |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද / (යෙදවූ) ශුද්ධ මුදල් ප්‍රවාහය | | (70,598,813) | (321,073,339) |
| මුදල් සහ මුදල් හා සමාන දෑ වල ශුද්ධ වැඩිවීම (අඩුවීම) | | 628,101 | 343,442 |
| වර්ෂය ආරම්භයේ දී මුදල් සහ මුදල් හා සමාන දෑ | | 371,899 | 28,457 |
| වර්ෂය අවසානයේ දී මුදල් සහ මුදල් හා සමාන දෑ | | 1,000,000 | 371,899 |
| බැංකුවේ ඇති මුදල් | 2 | 1,000,000 | 371,899 |

* රුපියල් 155,680,866 ගණනය කර ඇත්තේ භාණ්ඩාගාරයේ ඉල්ලීම මත ඒකාබද්ධ අරමුදලට දායක කරන ලද රු. 300,000,000 ක මුදල අඩු කිරීමෙන් පසුවය.

පිටු අංක 74 සිට 82 දක්වා ඉදිරිපත්කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශනවල සංකලිත කොටසකි.

# ගිණුම්කරණ ප්‍රතිපත්ති

## 1. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

### 1.1 සකස් කිරීමේ පදනම

ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පදනම මත සකස් කර ඇති අතර ඒවා ඉදිරිපත් කිරීමේ දී අගයන් ආසන්නම ශ්‍රී ලංකා රුපියලට දක්වා ඇත.

යථායෝග්‍ය පරිදි ගිණුම්කරණ ප්‍රතිපත්ති ඉදිරියේ දැක්වෙන සටහන් මගින් අනාවරණය කර ඇත.

### 1.2 අනුකූලතාව පිළිබඳ ප්‍රකාශනය

ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලකා වරලත් ගණකාධිකරණ ආයතනය විසින් නිකුත් කරනු ලැබ ඇති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සකස් කර ඇති අතර, එම මූල්‍ය ප්‍රකාශන එම ගිණුම්කරණ ප්‍රමිතීන් හා අනුකූලතාවය දක්වනු ලැබේ.

### 1.3 වාර්තා කරන දිනයෙන් පසු හටගන්නා සිදුවීම්

වාර්තා කරන දිනයෙන් පසු හටගන්නා සියළුම ප්‍රමාණාත්මක සිද්ධීන් මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ කාර්යයේ දී සැලකිල්ලට ගෙන අවශ්‍ය ගැලපීම් හෝ අනාවරණයන් කර ඇත.

### 1.4 සංසන්දනාත්මක සංඛ්‍යාවන්

ප්‍රවර්ථන වර්ෂයේ ඉදිරිපත් කිරීම හා අනුකූල විය යුතු ආකාරයට පෙර වර්ෂවල සංසන්දනාත්මක සංඛ්‍යා ගැලපීම් කර ඇත.

### 1.5 බදුකරණය

ආදායම් බදු සඳහා ප්‍රතිපාදන 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතෙහි ප්‍රතිපාදනයන් හා අනුකූලව ගණනය කර ඇත.

පොලී හා ලාභාංශ ආදායම හැර මණ්ඩලයේ අනෙකුත් ආදායම් මේ වන විට ආදායම් බදුවලින් නිදහස් කර ඇත.

### 1.6 විදේශ ව්‍යවහාර මුදල් පරිවර්තනය

සියළුම විදේශීය මුදලින් සිදු වූ ගනුදෙනු ඒවා සිදු වූ අවස්ථාවේ දී පැවැති විනිමය අනුපාතිකයන් පාදකව, වාර්තා කරන මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් අගයට පරිවර්තනය කර ඇත.

## 2. වත්කම් සහ අගය කිරීමේ පදනම

### 2.1 දේපල, පිරියත හා උපකරණ

#### ස්වසන්තක අයිතිය සහිත දේපල, පිරියත හා උපකරණ

දේපල, පිරියත හා උපකරණ ඒවායේ පිරිවැයෙන් සමුච්චිත ක්ෂය අඩු කළ අගයට නිරූපණය කර ඇත. දේපල, පිරියත හා උපකරණවල පිරිවැයට ඇතුළත් වන්නේ, අත්පත් කර ගැනීමේ පිරිවැය සමඟ එම වත්කම් අපේක්ෂිත භාවිත තත්ත්වයට ගෙන ඒම සඳහා දරන ලද අනෙකුත් වියදම්වල එකතුවයි.

#### ක්ෂය

වත්කම්වල ඇස්තමේන්තුගත ඵලදායී ජීවිත කාලය පුරා පහත අනුපාත පාදකව සරල මාර්ග ක්‍රමයට ක්ෂය ගණනය කරනු ලැබේ.

| | වාර්ෂික (%) |
|---|---|
| මෝටර් වාහන | 25 |
| ලී බඩු, වැද්දුම් සහ සවි කිරීම් | 12.5 |
| කාර්යාල හා විද්‍යුත් දත්ත සැකසුම් උපකරණ | 25 |
| පුහුණු උපකරණ | 25 |

ක්ෂය ප්‍රතිපාදන එම වත්කම් මිල දී ගත් දින සිට කරනු ලැබේ. ක්ෂය ප්‍රතිපාදනය වත්කම භාවිතයෙන් ඉවත් කරන තෙක් කරනු ලැබේ.

### 2.2 ආයෝජන

රජයේ සුරැකුම්පත් හි සහ ස්ථාවර තැන්පත්වල කර ඇති ආයෝජන අගය කර ඇත්තේ ඒවායේ පිරිවැයට වන අතර ඒවා සඳහා වර්ෂය අවසානය තෙක් පොලී උපචිත පදනම මත ගිණුම්ගත කර ඇත.

### 2.3 තොග

තොග ඒවායේ පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන අගයවලින් අඩු අගයට දක්වා ඇත. තොගවල පිරිවැය නිශ්චය කිරීමේ දී ප්‍රථම ලැබීම් ප්‍රථම නිකුත් කිරීමේ ක්‍රමය (ප්‍ර.ලැ.ප්‍ර.නි) ඒ සඳහා පාදක කරගෙන ඇත.

### 2.4 ලැබිය යුතු දෑ

ලැබිය යුතු දෑ නිරූපණය කර ඇත්තේ, ඇස්තමේන්තුගත උපලබ්ධි අගයටයි.

### 2.5 මුදල් සහ මුදල් හා සමාන දෑ

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සකස් කිරීමේ පරමාර්ථය සඳහා මුදල් හා මුදල් හා සමාන දෑවලින් නියෝජනය වන්නේ බැංකුවේ මුදල් සහ අතැති මුදල්ය.

## 3. බැරකම් සහ ප්‍රතිපාදන

### 3.1 විශ්‍රාම ප්‍රතිලාභ

#### 3.1.1 නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් - පාරිතෝෂික

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 19 - ''සේවක ප්‍රතිලාභ'' හා අනුකූලව යෝජිත ඒකක බැර ක්‍රමය පදනම් කරගෙන සේවක පාරිතෝෂිකය ප්‍රථම සේවා වර්ෂයේ සිට සම්පූර්ණ

# ගිණුම්කරණ ප්‍රතිපත්ති

ප්‍රතිපාදනය කෙරෙන ආකාරයට ගිණුම් ගත කර ඇත.

කෙසේ වෙතත් 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත හා අනුකූලව ගෙවීම් පිළිබඳව වගකීම ඇති වන්නේ වර්ෂ 5 ක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කරන ලද්දේ නම් පමණි.

### 3.1.2 නිශ්චිත සහභාග සැලසුම් - සේ.අ.අ. සහ සේ.නි.භා.අ.

නිශ්චිත ව්‍යවස්ථාවන් සහ නියාමන හා අනුකූලව මණ්ඩලයේ සියළුම සේවකයන් සේවක අර්ථසාධක අරමුදලට දායකවීමට සහ සේවක භාරකාර අරමුදලට දායකවීමට සුදුසුකම් ලබති. මණ්ඩලය සේවක අර්ථසාධක අරමුදලට සහ සේවක භාරකාර අරමුදලට සේවකයන්ගේ දළ පාරිශ්‍රමිකය මත පිළිවෙළින් 12% ක සහ 3% ක මුදලක් දායක කරයි.

### 3.2 බැරකම්

බැරකම් අතරින් වාර්තා කරන දිනයෙන් පසු වර්ෂයක් තුළ දී හෝ ඉල්ලුම් කළවිටක දී ගෙවිය යුතු වන දෑ මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයේ ජංගම බැරකම් සේ වර්ගීකරණය කර ඇත. වාර්තා කරන දිනයෙන් පසු වර්ෂයකින් ඔබ්බට ගෙවිය යුතු සියළුම ගෙවීම් ජංගම නොවන බැරකම් ගණයට ඇතුළත් කර ඇත.

මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේ දී සියළුම දන්නා බැරකම් ඒවායේ පිරිවැයට ඇතුළත් කර ඇත.

### 3.3 ප්‍රදාන

රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලෙන් මාරු කරනු ලබන ප්‍රාග්ධන වියදම් සහ ක්ෂුද්‍ර රක්ෂණ ව්‍යාපෘතියෙන් ලැබුනු සියළුම වත්කම් ප්‍රදාන සේ හඳුනා ගන්නා අතර එම වත්කම්වල ඇස්තමේන්තුගත ඵලදායී ජීවිත කාලය තුළ දී ඒවා හඳුනා ගනු ලැබේ.

## 4. ආදායම් සහ වියදම්

### 4.1 ආදායම් හඳුනා ගැනීම

ආදායම් උපචිත පදනම මත හඳුනාගෙන ඇත.

### 4.2 වියදම් හඳුනා ගැනීම

මණ්ඩලය පවත්වාගෙන යෑමේ දී දරනු ලබන සියළුම වියදම් වියදමට වැඩි ආදායම ගණනය කිරීමේ කාර්යය සඳහා ආදායමට එරෙහිව ලියාහරිනු ලැබේ.

### 4.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සකස් කර ඇත්තේ වක්‍ර ක්‍රමය මතයි.

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

## 1 දේපළ පිරියත හා උපකරණ

| | මෝටර් වාහන රුපියල් | ලී බඩු, වැද්දුම් හා සවිකිරීම් රුපියල් | කාර්යාල උපකරණ විද්‍යුත් දත්ත සැකසුම් සහ වෙනත් රුපියල් | පුහුණු උපකරණ රුපියල් | එකතුව රුපියල් |
|---|---|---|---|---|---|
| **පිරිවැය** | | | | | |
| 2013 ජනවාරි 01 දිනට ශේෂය | 16,317,321 | 12,604,715 | 20,660,336 | 141,450 | 49,723,822 |
| එකතු කිරීම් | - | 398,491 | 904,545 | - | 1,303,036 |
| බැහැර කිරීම් | - | - | (1,054,290) | - | (1,054,290) |
| 2013 දෙසැම්බර් 31 දින ශේෂය | 16,317,321 | 13,003,206 | 20,510,591 | 141,450 | 49,972,568 |
| **සමුච්චිත ක්ෂය** | | | | | |
| 2013 ජනවාරි මස 01 දිනට ශේෂය | 10,886,344 | 7,414,655 | 18,115,624 | 141,450 | 36,558,073 |
| වර්ෂය සඳහා අය කිරීම් | 1,711,019 | 1,502,093 | 1,313,858 | - | 4,526,970 |
| බැහැර කිරීම් | - | - | (1,054,290) | - | (1,054,290) |
| 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය | 12,597,363 | 8,916,748 | 18,375,192 | 141,450 | 40,030,753 |
| **ලියා අඩු කළ අගය 2013 දෙසැම්බර් 31 දිනට** | 3,719,958 | 4,086,458 | 2,135,399 | - | 9,941,815 |
| **ලියා අඩු කළ අගය** 2012 දෙසැම්බර් 31 දිනට | 5,430,977 | 5,190,060 | 2,544,712 | - | 13,165,749 |

| දෙසැම්බර් 31 දිනට | 2013 රුපියල් | 2012 රුපියල් |
|---|---|---|
| **2 රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල - ආයෝජන සහ අනෙකුත් ජංගම නොවන වත්කම්** | | |
| කුලී සහ විද්‍යුත් තැන්පතු | 11,088,660 | 11,088,660 |
| **ජංගම වත්කම්** | | |
| රජයේ සුරැකුම්හි ආයෝජන | 518,050,000 | 976,651,187 |
| ස්ථාවර තැන්පතුවල ආයෝජන | 1,063,200,000 | 534,000,000 |
| රජයේ සුරැකුම්පත්වලින් සහ ස්ථාවර තැන්පතු මගින් ලැබිය පොලිය | 126,616,550 | 44,445,385 |
| ලැබිය යුතු සෙස් බදු | 61,000,000 | 60,000,000 |
| අරමුදල් කළමණාකරණ ගිණුමේ ශේෂය | 2,476,670 | - |
| බැංකුවේ ඇති ශේෂය | 1,000,000 | 371,899 |
| අඩු කළා | | |
| රක්ෂණ ඔප්පුහිමියන්ගේ ආරක්ෂණ අරමුදලින් මාරු කළ යුතු අගය | 5,731,550 | 4,537,667 |
| | 1,766,611,670 | 1,610,930,804 |
| **මුළු වත්කම්** | 1,777,700,330 | 1,622,019,464 |

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

| දෙසැම්බර් 31 දිනට | 2013 රුපියල් | 2012 රුපියල් |
|---|---|---|
| **3 භාණ්ඩ තොග** | | |
| මුද්‍රණ, ලිපිද්‍රව්‍ය හා පරිගණක උපාංග | 367,631 | 303,083 |
| මුද්දර | 45,420 | 88,055 |
| | 413,051 | 391,138 |
| **4 අනෙකුත් ජංගම වත්කම්** | | |
| තැන්පතු | 178,594 | 172,122 |
| වෙනත් ලැබිය යුතු දෑ | 167,233 | 114,597 |
| ලැබිය යුතු රඳවා ගැනීමේ බදු | 1,111,985 | 1,049,296 |
| එකතු කළ අගය මත බදු පාලන ගිණුම | 668,820 | 502,748 |
| සේවක ණය * | 3,682,040 | 3,923,116 |
| අත්තිකාම් සහ පෙර ගෙවීම් | 1,988,800 | 3,038,082 |
| ආර්ථික සේවා ගාස්තු | - | 90,815 |
| ස්ථාවර වත්කම් මිලට ගැනීම සඳහා අත්තිකාරම් | 445,000 | 85,000 |
| අරමුදල් කළමණාකරණ ගිණුමේ ශේෂය | 1,161,375 | - |
| රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලෙන් මාරු කළ යුතු අගය | 5,731,550 | 4,537,667 |
| | 15,135,397 | 13,513,443 |
| ***කාර්යය මණ්ඩලය සඳහා ප්‍රදානය කළ ණය** | | |
| ජනවාරි 1 දිනට ශේෂය | 3,923,116 | 3,668,481 |
| වර්ෂය තුළ දී ප්‍රදානය කළ ණය | 2,157,000 | 2,942,391 |
| | 6,080,116 | 6,610,872 |
| වර්ෂය තුළ දී ණය ආපසු ගෙවීම් | (2,398,076) | (2,687,756) |
| දෙසැම්බර් 31 දිනට ශේෂය | 3,682,040 | 3,923,116 |
| **5 මුදල් සහ මුදල් හා සමාන දෑ** | | |
| ලංකා බැංකුව | 658,301 | 1,530,608 |
| | 658,301 | 1,530,608 |

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

| දෙසැම්බර් 31 දිනට | 2013<br>රුපියල් | 2012<br>රුපියල් |
|---|---|---|
| **6 රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල** | | |
| ආරම්භක ශේෂය | 1,622,019,464 | 1,276,384,867 |
| වර්ෂය තුළදී ලද සෙස් බදු | 245,743,034 | 236,534,917 |
| භාණ්ඩාගාර බිල්පත් ආයෝජනය මත පොලී | 665,374 | 47,865,987 |
| ප්‍රති මිල දී ගැනීම් සහ ඉල්ලුම් ගිණුම් මත පොලී | 58,473,214 | 87,316,447 |
| ස්ථාවර තැන්පතු මත පොලී | 177,119,438 | 696,541 |
| අරමුදල් කළමණාකරණ ගිණුමේ ශේෂය මත පොලිය | 92,109 | - |
| | 2,104,112,633 | 1,648,798,759 |
| අඩු කළා: | | |
| මෙහෙයුම් වියදම් සඳහා මාරු කිරීම් | 25,090,847 | 19,295,177 |
| ප්‍රාග්ධන වියදම් සඳහා මාරු කිරීම් | 1,303,036 | 7,459,488 |
| රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලෙන් මුළු මාරු කිරීම් | 26,393,883 | 26,754,665 |
| ඒකාබද්ධ ගිණුමට කළ දායකයන්* | 300,000,000 | - |
| බැංකු ගාස්තු | 18,420 | 24,630 |
| | 326,412,303 | 26,779,295 |
| අවසාන ශේෂය | 1,777,700,330 | 1,622,019,464 |

* රු.මිලියන 300 නියෝජනය කරනු ලබන්නේ 1971 අංක 38 දරන මුදල් පනතේ 9(එෆ්) වගන්තිය අනුව භාණ්ඩාගාරයේ ඉල්ලීම පරිදි ඒකාබද්ධ අරමුදලට දායක කල මුදල්ය.

| | 2013 | 2012 |
|---|---|---|
| **7 ප්‍රදාන** | | |
| වසර ආරම්භයේ දී ශේෂය | 13,165,749 | 12,368,887 |
| රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලෙන් ප්‍රාග්ධන වියදම් | 1,303,036 | 7,459,488 |
| අඩු කළා වර්ෂය තුළ දී ක්‍රමක්ෂය කිරීම් | (4,526,970) | (6,662,626) |
| වසර අවසානයේ දී ශේෂය | 9,941,815 | 13,165,749 |

**සටහන - ප්‍රදාන හඳුනා ගැනීම**

ශ්‍රී.ල.ගි.ප්‍ර. 20 හා අනුකූලව ප්‍රදානයන් ගිණුම් ගත කර ඇති අතර ආදායම් ප්‍රකාශයේ පහත අනුපාත යටතේ හඳුනාගෙන ඇත.

| | | |
|---|---|---|
| මෝටර් රථ වාහන | 25% | |
| කාර්යාල උපකරණ - වෙනත් සහ වි.ද.සැ. | 25% | |
| ලී බඩු වෑද්දුම් සහ සවි කිරීම් | 12.5% | |
| පුහුණු උපකරණ | 25% | |

| | 2013 | 2012 |
|---|---|---|
| **8 විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්** | | |
| වසර ආරම්භයේ දී ශේෂය | 1,889,445 | 1,833,909 |
| වසර තුළ ප්‍රතිපාදන | 1,698,014 | 55,536 |
| අඩුකළා - වසර තුළ සිදු කරන ලද ගෙවීම් | (242,141) | - |
| වසර අවසානයේ ශේෂය | 3,345,318 | 1,889,445 |
| **9 අනෙකුත් ජංගම වගකීම්** | | |
| උපචිත වියදම් | 6,992,531 | 8,077,508 |
| සේවක අර්ථසාධක අරමුදල් සඳහා කළ යුතු ගෙවීම් | 571,676 | 489,052 |
| සේවක භාරකාර අරමුදල් සඳහා කළ යුතු ගෙවීම් | 85,752 | 73,359 |
| උපයන විට හා රඳවා ගැනීමේ බදු ගෙවීම් | 246,239 | 84,130 |
| වෙනත් | 102,816 | 94,096 |
| | 7,999,014 | 8,818,145 |

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

| දෙසැම්බර් 31 දිනට | 2013<br>රුපියල් | 2012<br>රුපියල් |
|---|---|---|
| **10 අයභාරය** | | |
| රක්ෂණ සමාගම්වලින් වාර්ෂික ගාස්තු | 70,079,988 | 61,044,774 |
| ලියාපදිංචි කිරීමේ සහ අළුත් කිරීමේ ගාස්තු | 4,198,606 | 4,729,393 |
| | 74,278,594 | 65,774,167 |
| **11 වෙනත් ආදායම්** | | |
| මෝටර් වාහන ණය මත පොලී | 29,751 | 31,086 |
| ආපදා ණය මත පොලී | 94,025 | 94,812 |
| වෙනත් ආදායම් | 43,466 | 46,788 |
| | 167,242 | 172,686 |
| **12 කාර්ය මණ්ඩල වියදම** | | |
| කාර්ය මණ්ඩල වැටුප් | 31,019,437 | 24,881,974 |
| සේ.අ.අ. 12% | 3,830,332 | 3,095,562 |
| සේ.භා.අ. 3% | 957,584 | 773,891 |
| සභාපතිනියගේ වියදම් - දීමනා | 900,000 | 900,000 |
| සභාපතිනියගේ ඉන්ධන වියදම් | 348,840 | 317,520 |
| වේතන - කෝන්ත්‍රාත් සේවක | 32,500 | - |
| අතිකාල | 127,215 | 115,156 |
| කාර්ය මණ්ඩල වෛද්‍ය වියදම් | 1,363,224 | 1,241,257 |
| කාර්ය මණ්ඩල වෛද්‍ය රක්ෂණය | 560,059 | 639,338 |
| පුද්ගල රක්ෂණය | 421,334 | 407,469 |
| කාර්ය මණ්ඩල සුබසාධන | 1,369,462 | 1,264,829 |
| කාර්ය මණ්ඩල පුහුණු | 1,535,494 | 811,321 |
| විදේශ ගමන් - අධ්‍යක්ෂක මණ්ඩල | 1,184,546 | 1,490,524 |
| විදේශ පුහුණු - කාර්ය මණ්ඩල | 5,102,907 | 4,799,951 |
| වාර්ෂික ප්‍රසාද දීමනා | 1,951,246 | 1,662,580 |
| ප්‍රචාරණය | 70,495 | 393,405 |
| අධ්‍යක්ෂක දුරකථන | 164,635 | 183,496 |
| නිවාඩු දීමනා | 599,941 | 616,660 |
| අධ්‍යක්ෂකවරුන්ගේ වාහන දීමනා | 3,876,986 | 3,850,000 |
| අධ්‍යක්ෂකවරුන්ගේ ඉන්ධන දීමනා | 1,210,291 | 1,161,320 |
| සේවා පාරිතෝෂික | 1,698,014 | 55,536 |
| | 58,324,541 | 48,661,790 |
| **13 වෘත්තීමය ගාස්තු** | | |
| උපදේශක සේවා ගාස්තු | 2,178,627 | 766,444 |
| වෙනත් | - | 227,961 |
| | 2,178,627 | 994,405 |

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

| දෙසැම්බර් 31 දිනට | 2013 | 2012 |
|---|---|---|
| | රුපියල් | රුපියල් |
| **14 මෙහෙයුම් වියදම්** | | |
| කාර්යාල කුලී | 22,167,658 | 19,580,929 |
| රථ ගාල් කිරීමේ ගාස්තු | 365,825 | 319,446 |
| දුරකථන හා අන්තර්ජාල වියදම් | 1,603,557 | 1,776,117 |
| විදුලිය | 1,226,881 | 1,143,907 |
| කාර්යාල නඩත්තු කිරීම් | 442,421 | 357,278 |
| මුද්‍රණ හා ලිපිද්‍රව්‍ය | 2,482,807 | 2,564,226 |
| මහජන දැනුවත් කිරීම් | 4,399,327 | 4,281,143 |
| සංග්‍රහ වියදම් | 213,539 | 128,266 |
| ගමන් වියදම් - දේශීය | 56,158 | 63,440 |
| කාර්යාල උපකරණ නඩත්තු වි.ද.සෑ හා වෙනත් | 1,413,830 | 737,679 |
| සාමාජිකත්වය - IAIS | 2,091,794 | 1,961,689 |
| සාමාජිකත්වය - IIAP | (30,000) | 30,000 |
| ප්‍රචාරණය - වෙනත් | 96,419 | 30,157 |
| අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් ගාස්තු | 480,000 | 494,547 |
| රැස්වීම් ගාස්තු | 309,846 | 263,807 |
| පුවත්පත් හා පුස්තකාල පොත් | 214,007 | 126,976 |
| තැපැල් හා පණිවිඩ ගාස්තු | 226,448 | 606,641 |
| විගණන ගාස්තු - විගණකාධිපති | 370,055 | 375,000 |
| අභ්‍යන්තර විගණන ගාස්තු | - | 375,000 |
| ක්ෂය | 4,526,970 | 6,582,865 |
| පොදු වියදම් | 104,959 | 132,434 |
| නීති වියදම් | 248,672 | 23,559 |
| විමර්ශණ වියදම් | 10,560 | 12,170 |
| සෙලින්කෝ තකාෆුල් පරිපාලනය කිරීමේ වියදම් | 31,859 | 717,820 |
| අධීක්ෂණ වියදම් | 129,350 | 19,896 |
| වාහන නඩත්තු | 159,587 | 107,609 |
| වාහන රක්ෂණ | 261,217 | 202,902 |
| වාහන ඉන්ධන වියදම් | 308,155 | 268,077 |
| ජාතිය ගොඩනැගීමේ බදු | 568,712 | 453,957 |
| වත්කම් ඉවත් කිරීමේ අලාභය | - | 79,761 |
| | 44,480,612 | 43,817,296 |
| **15 මූල්‍ය හා වෙනත් වියදම්** | | |
| බැංකු ගාස්තු | 166,422 | 125,629 |
| අධිභාර හා දඩ | 300 | - |
| | 166,722 | 125,629 |

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

## 16. බදුකරණය

2013 දෙසැම්බර් 31 දිනට බදුකරණය සඳහා ප්‍රතිපාදන ගණනය කර ඇත්තේ 2006 අංක 10 දරණ ආදායම් පනතේ විධිවිධාන වලට අනුකූලවයි.

### 16.1 රජයේ සුරැකුම්පත් පිළිබඳ ද්විතීය වෙළඳපල ගනුදෙනු වෙනුවෙන් රඳවාගත් බදු සඳහා ලැබෙන නාමික බැර

2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ අංක 137 වන වගන්තිය ප්‍රකාරව මණ්ඩලය රජයේ සුරැකුම්පත් පිළිබඳ ද්විතීය වෙළඳපොළ ගනුදෙනු මත උයන පොලී ආදායම අදාළ තක්සේරු වර්ෂය සඳහා වන ව්‍යවස්ථාපිත ආදායමේ කොටසක් සේ සලකන අතර එම පොලිය වෙනුවෙන් නාමික බදු බැර සඳහා හිමිකාරත්වය ලැබේ.

ඒ අනුව රජයේ සුරැකුම්පත් පිළිබඳ ද්විතීය වෙළඳපොළ ගනුදෙනුවලින් මණ්ඩලය විසින් උපයන ලද ශුද්ධ ආදායම දළ ආදායම බවට පරිවර්තනය කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් නාමික බදු බැර වටිනාකම රුපියල් 106,379/47 ක් 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන ඇත.

රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල විසින් රජයේ සුරැකුම්පත් පිළිබඳ ද්විතීය වෙළඳපොළ ගනුදෙනු මත කරනු ලැබූ ආයෝජනයන්ගෙන් උපයන ලද පොලී ආදායම ගිණුම්ගත කර හඳුනාගෙන ඇත්තේ ශුද්ධ අගයටය.

## 17. ප්‍රාග්ධන බැඳියාව

2013 දෙසැම්බර් 31 දිනට කිසිදු ප්‍රාග්ධන බැඳියාවකට එළැඹ නොමැත.

## 18. අසම්භාව්‍ය බැරකම්

2013 දෙසැම්බර් 31 දිනට කිසිදු අසම්භාව්‍ය බැරකමක් නොමැත.

## 19. වාර්තා කරන දිනෙන් පසු හටගත් සිදුවීම්

මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් කළ යුතු හෝ අනාවරණය කිරීම අවශ්‍ය වන කිසිදු සිද්ධියක් වාර්තා කරන දිනට පසු සිදු වී නොමැත.

## 20. සම්බන්ධිත පාර්ශව අනාවරණ

ඉන්ද්‍රාණි සුගතදාස මහත්මිය (සභාපතිනිය), බී.ඩී. ඩබ්.ඒ. සිල්වා මහතා, එස්. ආර්. ආටිගල මහතා (නිල බලයෙන් පත්වූ සාමාජිකයන්) 2013 වර්ෂය මුළුල්ලේම අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික සාමාජිකාවන් ලෙස ක්‍රියා කළහ.

ඩී. එන්. ආර්. සිරිවර්ධන මහතා නිල බලයෙන් පත්වූ අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයෙක් වශයෙන් 2013 වසරේ ජුනි මස වැඩ භාර ගන්නා ලදී. සමන්ත කුමාරසිංහ මහතා හා නලින් ආටිගල මහතා පිලිවෙලින් ජුනි මස 5 වන දින හා ජූලි මස 30 වන දින අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයන් ලෙස පත් කරන ලදී.

ජී. ගුණවර්ධන මහතාගේ සාමාජිකත්වය 2013 වසරේ අප්‍රේල් මාසයේදී සහ නවාස් රාජබ්ඩීන් මහතා හා ගාමිණී කොහොන මහතාගේ සාමාජිකත්වය 2013 වසරේ ජූලි මාසයේදී අවසන් විය.

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

සමාලෝචිත වර්ෂය තුළ දී මණ්ඩලයේ සාමාජික සාමාජිකාවන්ගේ සංස්ථාපිත සම්බන්ධතාවය පහත වගුවෙන් නිරූපණය කෙරේ.

| සාමාජිකයාගේ නම | සම්බන්ධිත ආයතනයේ නම | සම්බන්ධතාව |
|---|---|---|
| ඉන්ද්‍රාණි සුගතදාස මහත්මිය | කළුබෝවිටියාන තේ කම්හල් සමාගම<br>එන් ඩී බී බැංකුව | අධ්‍යක්ෂිකා<br>අධ්‍යක්ෂිකා (ස්වාධීන විධායක නොවන) 2013 ඔක් 04 සිට |
| ඩී.ඩී.ඩබ්.ඒ. සිල්වා මහතා | ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය<br>ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය<br>අපි වෙනුවෙන් අපි කළමණාකරණ මණ්ඩලය<br>ශ්‍රී ලංකා සුරැකුම්කුපත් හා විනිමය කොමිසම් සභාව<br>ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යාංශය<br>වෙස්ට් කෝස්ට් පවර් පුද්. සමාගම | සභාපති<br>සභාපති<br>මණ්ඩල සාමාජික<br>මණ්ඩල සාමාජික<br>සාමාජික<br>සාමාජික |
| එස්.ආර්. ආටිගල මහතා | ශ්‍රී ලංකා වරාය අධිකාරිය<br>ලංකා බැංකුව<br>උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලය<br>ජාතික ඉතිරිකිරීමේ බැංකුව<br>ආයෝජන මණ්ඩලය | අධ්‍යක්ෂක (2013 සැප්තැම්බර් තෙක්)<br>අධ්‍යක්ෂක (2013 අප්‍රේල් තෙක්)<br>සාමාජික<br>අධ්‍යක්ෂක (2013 අප්‍රේල් 23 සිට)<br>නිරීක්ෂක (2013 අප්‍රේල් තෙක්) |
| ඩී.එන්.ආර්. සිරිවර්ධන මහතා | ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව<br>ශ්‍රී ලංකා ගණකාධිකරණ හා විගණන ප්‍රමිත අධීක්ෂණ මණ්ඩලය<br>වරලත් ගණකාධිකරුවන්ගේ ආයතනය | නිල බලයෙන් පත්වූ සාමාජික<br>නිල බලයෙන් පත්වූ සාමාජික<br>නිල බලයෙන් පත්වූ සාමාජික |
| නලින් ආටිගල මහතා | තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව<br>ශ්‍රී ලංකා ගණකාධිකරණ හා විගණන ප්‍රමිත අධීක්ෂණ මණ්ඩලය<br>ශ්‍රී ලංකා පවුල් සැලසුම් සංවිධානය<br>ශ්‍රී ලංකා කර්මාන්ත හා වානිජ මණ්ඩල සංගමය | මණ්ඩල සාමාජික<br>මණ්ඩල සාමාජික<br>උපදේශක සභා සාමාජික<br>ලේකම් / ප්‍රධාන විධායක නිලධාරි |
| සමන්ත කුමාරසිංහ මහතා | නේචර්ස් බියුටි ක්‍රියේෂන්ස් ලිමිටඩ්<br>මල්ටිකෙම් ඉන්ටනැෂනල් ලිමිටඩ්<br>මල්ටිකෙම් එක්ස්පෝට්ස් (පුද්) සමාගම<br>ඉකෝ ප්‍රොටෙක්ට් ඉන්ජිනියරින් (පුද්) සමාගම<br>ටී.ඩී. මදනායක ඇන්ඩ් කම්පැනි (පුද්) සමාගම | සභාපති / කළමණාකාර අධ්‍යක්ෂ<br>සභාපති / කළමණාකාර අධ්‍යක්ෂ<br>සභාපති / කළමණාකාර අධ්‍යක්ෂ<br>සභාපති / කළමණාකාර අධ්‍යක්ෂ<br>අධ්‍යක්ෂක |
| ග්‍රේෂන් ගුණවර්ධන මහතා (2013 අප්‍රේල් දක්වා) | හෑන්ඩ්ස් ඉන්ටනැෂනල් (පුද්) සමාගම<br>හෑන්ඩ්ස් ඩිපින් (පුද්) සමාගම<br>21st සෙන්චරි හෝම්ස් (පුද්) සමාගම<br>ලංකා ලෙෂර් රිසෝට්ස් හෝල්ඩින්ස් (පුද්) සමාගම<br>කිඩ් කෙයාර් හෝම් ඇනඩ් රෙසිඩන්ට් ස්කූල් ට්‍රස්ට් | සභාපති<br>සභාපති<br>සභාපති<br>සභාපති<br>සභාපති |
| නවාස් රාජබ්ඩීන් මහතා (2013 ජූලි දක්වා) | රාජබ්ඩීන් ඇන්ඩ් සන්ස් සමාගම<br>අපනයන සංවර්ධන මණ්ඩලය | සභාපති (2013 ජුනි දක්වා)<br>මණ්ඩල සාමාජික |
| ගාමිණී කොහොන මහතා (2013 ජූලි දක්වා) | පුලතිසි එක්ස්පෝට්ස් (පුද්ගලික) සමාගම | අධ්‍යක්ෂක |

වෙළඳපොළ වටිනාකම් මත සිදු කරන ලද සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු මත සිදු කල ගනුදෙනු හැර උක්ත ආයතන සමඟ සමාලෝචිත වර්ෂය තුළ දී වෙනත් කිසිදු ගනුදෙනුවක් සිදු කර නොමැත.

# විගණකාධිපති වාර්තාව

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } එෆ්ආර්(2)/අයි/අයිබීඑස්එල්/ 1/13/18

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2014 දෙසැම්බර් 29 දින

සභාපතිනිය,
ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය

**ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 2000 අංක 43 දරන ශ්‍රී ලංකා රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 8 (3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13 (7) (ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් මණ්ඩලයේ සභාපති වෙත 2014 සැප්තැම්බර් 15 දින නිකුත් කරන ලදී.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැළසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත්වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

# විගණකාධිපති වාර්තාව

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2012 වර්ෂයේ සිට ක්‍රියාත්මක වන පරිදි විශේෂයෙන් සඳහන් කරන ලද ව්‍යවසායයන් විසින් ප්‍රථම වතාවට අනුගමනය කළ යුතු ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් අනුව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 07 අනුව රජයේ සුරැකුම්පත්වල හා ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබූ රු.1,581,250,000 ක් වූ මූල්‍ය සාධනපත්‍ර, මූල්‍ය වත්කම් ලෙස හඳුනාගෙන ඊට අදාළ තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 16 අනුව, මණ්ඩලයේ රු.23,762,974 ක් වූ දේපළ පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය කර, එම ප්‍රත්‍යාගණන අගයන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

සමාලෝචිත වර්ෂය තුළදී රු.113,100 ක් වටිනා එක් පොතක්ද ඇතුළුව රු.214,007ක් වටිනා පොත්පත් හා ප්‍රකාශන මිලදී ගෙන තිබුණු අතර මණ්ඩලය විසින් 2005 සිට 2013 දක්වා එලෙස පොත් පත් හා ප්‍රකාශන මිලදී ගැනීම සඳහා රු.953,470 ක් වැය කර තිබුණි. පොත්වල වටිනාකම හා ස්වභාවය සැළකිල්ලට නොගෙන එම වියදම් අයභාර වියදම් ලෙස කපා හැර තිබුණු අතර ප්‍රාග්ධනීත කිරීමට කටයුතු කර නොතිබුණි. කෙසේ වුවත් ඉදිරියේදී රු.100,000 කට වඩා වැඩි වටිනාකමක් ඇති පොත් පමණක් ප්‍රාග්ධනීත කළ හැකි බව මණ්ඩලයේ සභාපති විසින් විගණනයට දන්වා තිබුණි.

### 2.3 නීති රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

විගණනයේදී පහත සඳහන් අනුකූල නොවීම් අවස්ථා නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | |
| (i) මුදල් රෙගුලාසි 454 හා 757 (I) | වට්ටෝරු භාණ්ඩ ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 396 (ඈ) | 2008 වර්ෂයේ සිට අවලංගු කරන ලද චෙක්පත් 13 ක් සඳහා ගෙවිය යුතු එකතුව රු.89,780 ක් සම්බන්ධව රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ආ) 2003 ජුනි 02 දිනැති අංක 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.14 පරිච්ඡේදය | පරිපාලන අත්පොතක් පිළියෙල කර තිබූ නමුත්, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙතින් අනුමත කර ගෙන නොතිබුණි. |

### 2.4 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කළමනාකරණ සේවා චක්‍රලේඛය ප්‍රකාරව, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල වැටුප් හා දීමනා නියම කිරීමට අදාලව ආයතන පිහිට වූ පනත්වල විවිධ ප්‍රතිපාදන තිබුණ ද, එම ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය නොමැතිව ක්‍රියාත්මක නොකළ යුතු වුවත්, එවැනි අනුමැතියකින් තොරව මණ්ඩලය විසින් 2012 වර්ෂයේ සිට මණ්ඩලයේ නිලධාරින්ගේ වැටුප් සියයට 25 කින් වැඩි කර තිබුණි. ඒ අනුව 2012 දී හා 2013 වර්ෂවල එසේ විධිමත් අනුමැතියකින් තොරව පිළිවෙලින් රු.2,600,438 ක් හා රු.5,221,448 ක් ගෙවා තිබුණි.

(ආ) මණ්ඩලය විසින් දිරි දීමනා යෝජනා ක්‍රමයක් සකස් කර මුදල් අමාත්‍යාංශය වෙත භාර දී තිබුණද, ඒ සඳහා අනුමැතිය ලැබීනොතිබුණු නමුත් සමාලෝචිත වර්ෂය තුළදී ආයතනයේ නිලධාරීන් 42 ක් සඳහා මසක වැටුප් පදනම් කරගෙන රු.1,951,246 ක දිරි දීමනා ගෙවා තිබුණි.

(ඇ) අනුමැතිය සඳහා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත්කර තිබූ පරිපාලන අත්පොතේ නියමයන්ට අනුව, සමාලෝචිත වර්ෂයේදී මණ්ඩලයේ නිලධාරීන් සඳහා නිවාඩු දින වැටුප් රු.599,941ක් ගෙවා තිබුණ ද, එම පරිපාලන අත්පොත සඳහා අනුමැතිය 2014 ඔක්තෝම්බර් 30 දින වන විටත් ලැබී නොතිබුණි.

# විගණකාධිපති වාර්තාව

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා මණ්ඩලයේ බදුවලට පෙර මූල්‍ය ප්‍රතිඵලය රු.148,207 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.238,211 ක් වූයෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේදී මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.90,004 ක හෙවත් සියයට 38 ක අඩුවීමක් දක්නට ලැබුණි. මණ්ඩලයේ සමස්ථ ආදායම රු.11,461,378 කින් වැඩි වී තිබුණද කාර්ය මණ්ඩල පිරිවැය හා වෘත්තීය ගාස්තු පිළිවෙලින් රු.9,662,751 කින් හා රු.1,184,222 කින් වැඩිවීම, මෙම අතිරික්තය අඩුවීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

### 3.2 විශ්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනට හා 2012 දෙසැම්බර් 31 දිනට පැවති කාරක ප්‍රාග්ධන අනුපාත පහත දැක්වේ.

| අනුපාත | 2013 | 2012 |
|---|---|---|
| ජංගම / ක්ෂණික | 139:1 | 120:1 |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට මූල්‍ය ප්‍රකාශන වල රු.1,782,818,419 ක් වූ ජංගම වත්කම් හෙළිදරව් කර තිබුණු අතර එම වටිනාකමින් සියයට 99 ක් හෙවත් රු.1,766,611,670 ක් 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 103 වන වගන්තිය ප්‍රකාරව පිහිටවා තිබූ, ''රක්ෂණ ඔප්පු දරන්නන්ගේ ආරක්ෂණ අරමුදලෙහි'' ආයෝජනයන් නියෝජනය විය.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්ය සාධනය

මණ්ඩලයේ 2013 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව, එක් එක් අංශය විසින් වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කළ පහත සඳහන් කාර්යයන් නිම කිරීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි.

(අ) නීති අංශය
මෙම අංශය යටතේ ශක්තිමත් රක්ෂණ ව්‍යවස්ථාමය රාමුවක් ඇති කිරීම අරමුණු කරගෙන, පහත සඳහන් කාර්යයන් නිම කිරීමට සැලසුම් කර ඇතත්, එම කාර්යයන් 2014 අප්‍රේල් 30 දින දක්වාත් අවසන් කර නොතිබුණි.

(i) රක්ෂණ පාලක විසින් 1987 දී නිකුත් කර ඇති රෙගුලාසි සංශෝධනය කිරීම.

(ii) මණ්ඩලයට ඇති අධීක්ෂණ හා විමර්ශන බලතල සම්බන්ධ නීති සංශෝධනය කිරීම.

(iii) හානි පාඩු ගලපන්නන් ලියාපදිංචි කිරීමේ විධිමත් නියාමන ක්‍රමවේදයක් සකස් කිරීම.

(iv) ඒ සම්බන්ධ කටයුතුවල නියුතු රක්ෂණ නියෝජිතයන්ගේ ලියාපදිංචිය නියාමනය කිරීම සඳහා විධිමත් ක්‍රමවේදයක් සකස් කිරීම.

(v) අවදානම් පාදක ප්‍රාග්ධනය ස්ථාපිත කිරීම සඳහා පහසුකම් සැපයීම පිළිබඳව විධිමත් ක්‍රමවේදයක් සකස් කිරීම.

(ආ) විමර්ශන අංශය
මේ යටතේ රක්ෂණ සහතික දරන්නන්ගේ හා අනාගත රක්ෂණ සහතික දරන්නන්ගේ විශ්වාසය හා කර්මාන්තයේ දියුණුව වැඩි කිරීමේ අරමුණින්,

(i) වර්ෂය තුළ ද විදේශීය අධිකරණ සීමා හා කර්මාන්තයේ අදහස් අධ්‍යයනය කිරීමෙන් වාර්තාවක් සැකසීම.

(ii) මණ්ඩලය විසින් විමර්ශන පහසුකම් සැපයිය යුතු බාහිර ආයතන හඳුනාගැනීම හා ඔවුන් සමඟ ගිවිසුම් වලට එළඹීම.

සැලසුම් කර තිබුණද, එක් බාහිර ආයතනයක් හඳුනා ගැනීම පමණක් සිදුකර තිබුණි.

(ඇ) අධීක්ෂණ අංශය
මේ යටතේ, කාර්යක්ෂම අධීක්ෂණ පද්ධතියක් හරහා ශ්‍රී ලංකා රක්ෂණ කර්මාන්තයේ ස්ථාවරත්වය හැසිරවීමේ අරමුණ ඇතිව,

(i) රක්ෂණ සමාගම්හි තෝරාගනු ලබන අංශ සඳහා ස්ථානීය පරීක්ෂණ 07 ක් සිදු කිරීම.

(ii) කළමණාකරණ තොරතුරු පද්ධතිය සකස් කිරීම.

(iii) රක්ෂණ සමාගම්හි මූල්‍ය අවදානම හා කාර්යසාධනය තක්සේරු කිරීම සඳහා අදාළ සමාගමේ මාසික වාර්තා අධීක්ෂණය, සමාලෝචනය හා විශ්ලේෂණය කිරීම.

සැලසුම් කර ඇතත්, ස්ථානීය පරීක්ෂණ 4ක් හා රක්ෂණ සමාගම් 4ක මාසික වාර්තා විශ්ලේෂණය පමණක් සමාලෝචිත වර්ෂය තුළදී සිදුකර තිබුණි.

# විගණකාධිපති වාර්තාව

(ඈ) මූල්‍ය හා පරිපාලන අංශය
මේ යටතේ, පහත සඳහන් කාර්යයන් නිම කිරීමට අපේක්ෂා කර තිබුණද, 2013 වර්ෂයේදී අදාළ කාර්යයන් නිම කිරීමට මණ්ඩලය අපෙහොසත් වී තිබුණි.

(i) සේවක සුභ සාධනය යටතේ වෛද්‍ය දීමනා ගෙවීමේ විධිමත් වැඩපිළිවෙළක් සැකසීම.

(ii) මණ්ඩලයේ පුහුණු වියදම් වඩා ඵලදායී කරගැනීම සඳහා ක්ෂේත්‍රයට අදාළ පුහුණු වැඩසටහන්වලට පමණක් නිලධාරීන් සහභාගී කරවීමට කටයුතු කිරීම.

(iii) කෙසේ වුවද සමාලෝචිත වර්ෂයේ දේශීය පුහුණුව සඳහා ප්‍රතිපාදනය කර තිබූ රු.2,250,000 කින් රු.1,535,494 ක් වියදම් කර තිබුණු අතර රක්ෂණ ක්ෂේත්‍රයට සෘජු දායකත්වයක් නොලැබෙන උසස් අධ්‍යාපන පාඨමාලා සහ සේවක සුභසාධනය සඳහා පිළිවෙලින් රු.636,000 ක් සහ රු.694,520 ක් දරා තිබුණි.

## 4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

2007 මාර්තු 15 දින සිට 2009 අගෝස්තු 05 දින දක්වා කාලපරිච්ඡේදයට අදාළ සාවද්‍ය ලෙස පරිහරණය කළ බවට හඳුනාගෙන තිබුණු රු. 107,800 ක බැංකු ගත නොකළ ආදායමක් ද ඇතුළුව සේවටයන් ඉවත්ව ගිය නිළධාරීනියකගෙන් අය විය යුතු රු.112,420 ක් වූ මුදල සමාලෝචිත වර්ෂයේ අවසන් දිනටද ලැබිය යුතු මුදලක් ලෙස දක්වා තිබුණද, නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

2007 මැයි 09 දින මිලදී ගන්නා ලද පිරිවැය රු.55,000 ක් වූ පරිගණක මොනිටරයක් සහ පිරිවැය රු.4,500 ක් වූ පරිගණක මුද්‍රණ යන්ත්‍රයක් සොයා ගත නොහැකි වත්කම් ලෙස ස්ථාවර වත්කම් ලේඛණයේ දක්වා තිබුණි.

## 4.4 ආර්ථික නොවූ ගණුදෙනු

මණ්ඩලය විසින් භාවිතයට නොගැනෙන දුරකථන 5 ක් සඳහා සමාලෝචිත වර්ෂය තුළදී, සේවා ගාස්තු හා ඊට අදාළ සියයට 20 දුරකථන බද්ද හා සෙස් බද්ද ඇතුළුව රු.53,400 ක් ගෙවා තිබුණි.

## 4.5 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2013 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ අනුමත සංඛ්‍යාව 44 ක් වුවද, තථ්‍ය සංඛ්‍යාව 42 ක් වීමෙන් පුරප්පාඩු 03 ක් පැවතුණි.

(ආ) අනුමත කාර්ය මණ්ඩලයේ වූ සහකාර අධ්‍යක්ෂ තනතුරු 03 ක් 2013 වර්ෂය ආරම්භයේ සිට පුරප්පාඩුව පැවතුණු අතර එම තනතුරු සමාලෝචිත වර්ෂයේද පිරවීමට කටයුතු කර නොතිබුණි.

## 5. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

## 5.1 අයවැය ලේඛනමය පාලනය

අයවැය ගත වියදම් හා තථ්‍ය වියදම් අතර සියයට 52 සිට සියයට 336 දක්වා වූ විචලනයන් නිරීක්ෂණය වුයෙන් අයවැය ලේඛනය ඵලදායී මුල්‍ය පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වු පද්ධති අඩුපාඩු ආයතනයේ සභාපතිවරයාගේ අවධානයට වරින් වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(i) අයවැය

(ii) කාර්ය මණ්ඩල පරිපාලනය

(iii) ස්ථාවර වත්කම්

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න

විගණකාධිපති (වැඩබලන)

# විගණකාධිපති විසින් මතුකළ කරුණුවලට මණ්ඩලයේ ප්‍රතිචාර දැක්වීම

| | විගණකාධිපති වාර්තාව | ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ ප්‍රතිචාර දැක්වීම |
|---|---|---|
| 2.2 | **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම** | |
| 2.2.1 | **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති** | |
| (අ) | 2012 වර්ෂයේ සිට ක්‍රියාත්මක වන පරිදි විශේෂයෙන් සඳහන් කරන ලද ව්‍යවසායයන් විසින් ප්‍රථම වතාවට අනුගමණය කළයුතු ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් අනුව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 1 (SLFRS 1) අදාළ වන්නේ ආයතනයක් ප්‍රථමවරට නව ගිණුම්කරණ ප්‍රමිතීන් අනුගමනය කරන අවස්ථාවේදී වන අතර ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය 2012 වසරේදී මෙම නව ගිණුම්කරණ ප්‍රමිත අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති අතර 2012 වසරේදී විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් අප ආයතනය සම්බන්ධයෙන් ''තත්ත්වාගණනය නොකළ'' මතයක් (unqualified opinion) ප්‍රකාශ කර ඇත.<br><br>ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 1 (LKAS 1) හි 38 ඡේදයට අනුකූල වෙමින් ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය 2013 වසර සඳහා පෙර වර්ෂයේ සංසන්දනාත්මක සංඛ්‍යා පමණක් අන්තර්ගත කරමින් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ බව කරුණාවෙන් සලකන්න. |
| (ආ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 07 අනුව රජයේ සුරැකුම්පත්වල හා ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබූ රු.1,581,250,000 ක් වූ මූල්‍ය සාධනපත්‍ර, මූල්‍ය වත්කම් ලෙස හඳුනාගෙන ඊට අදාළ තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | මේ සඳහා සෘජුවම අදාළ වන්නේ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 39 වන අතර ඒ අනුව මූල්‍ය වත්කම් ප්‍රධාන කොටස් 4කට වෙන්වේ. එකී ඛාණ්ඩ 4න් මණ්ඩලයේ ආයෝජන අයත්වන්නේ කල් පිරෙන තෙක් තබා ගන්නා ආයෝජන (Held to Maturity Investment) ඛාණ්ඩයට වන අතර එවන් ආයෝජන මූලිකවම අදාළ ගණුදෙනුව සිදුවන දින පැවති සාධාරණ අගයට (Fair Value) හඳුනාගත යුතුවේ. ඉන් පසුව එය ක්‍රමක්ෂය පිරිවැය (Amortized Cost) ක්‍රමයට සඵල පොලී අනුපාතිකය (Effective Interest Rate) පදනම් කරගෙන අගය කළ යුතු වේ. ඒ අනුව මණ්ඩලයේ මූල්‍ය වත්කම් එහි පිරිවැය හා උපචිත පොළිය පදනම් කරගෙන අගය කළ යුතුවේ.<br><br>මණ්ඩලය මෙහිදී පිරිවැයට අදාළ වත්කම් අගය කර උපචිත පොලී ප්‍රමාණය වෙනමම හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල හෙලි දරව් කර ඇති බැවින් විගණන මතය තත්වාගණනය කළ යුතු තරම් ප්‍රමාණාත්මක බලපෑමක් මූල්‍ය ප්‍රකාශනවලට සිදුවී නොමැති බව අපගේ පිළිගැනීමයි. |
| (ඇ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 අනුව, මණ්ඩලයේ රු.23,762,974 ක් වූ දේපළ පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය කර, එම ප්‍රත්‍යාගණන අගයන් මූල්‍ය ප්‍රකාශන වල දක්වා නොතිබුණි. | එකඟ වෙමු.<br><br>ඉදිරියේදී ආයතනයේ ක්‍රියාත්මක කිරීමට නියමිත ව්‍යවසාය සම්පත් සැලසුම්කරණ ක්‍රියාවලියේදී (Enterprise Resource Planning - ERP) අදාළ ප්‍රත්‍යාගණනයන් සිදුකිරීමට අපේක්ෂා කරමු. |
| 2.2.2 | **ගිණුම්කරණ අඩුපාඩු** | |
| | සමාලෝචිත වර්ෂය තුළදී රු.113,100 ක් වටිනා පොතක්ද ඇතුළුව රු.214,007 ක් වටිනා පොත්පත් හා ප්‍රකාශන මිලදී ගෙන තිබුණු අතර මණ්ඩලය විසින් 2005 සිට 2013 දක්වා එලෙස පොත්පත් හා ප්‍රකාශන මිලදී ගැනීම සඳහා රු.953,470 ක් වැයකර තිබුණි. පොත් වටිනාකම හා ස්වභාවය සැලකිල්ලට නොගෙන එම වියදම් අයභාර වියදම් ලෙස කපා හැර තිබුණු අතර ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කර නොතිබුණි. කෙසේ වුවත් ඉදිරියේදී රු.100,000 කට වඩා වැඩි වටිනාකමක් ඇති පොත් පමණක් ප්‍රාග්ධනිත කළහැකි බව මණ්ඩලයේ සභාපති විසින් විගණනයට දන්වා තිබුණි. | අප පුස්තකාලයට ගනු ලබන බොහෝ පොත් හා වාර්ථාවල (මහ බැංකු වාර්ථාව වැනි) ස්වභාවය සැලකිල්ලට ගැනීමේදී ඒවා ප්‍රාග්ධනිත කිරීම සුදුසු නොවේ. මේ සියළුම පොත් වට්ටෝරු ගතකර ඇත. කෙසේ වෙතත් ඉදිරියේදී රු. 100,000/- කට වැඩි වටිනාකමක් ඇති පොත් පමණක් ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කළ හැක. |
| 2.3 | **නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම** | |
| (අ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි** | |
| (i) | මුදල් රෙගුලාසි 454 හා 757 (1)<br>- වට්ටෝරු භාණ්ඩ ලේඛණයක් නඩත්තු කර නොතිබුණි. | වට්ටෝරු භාණ්ඩ නමින් ලේඛණයක් නොතිබුණද, මිලට ගන්නා සියළුම ද්‍රව්‍ය ලේඛණගත (GRN) කර ඇත. කෙසේ වෙතත් ඉදිරියේදී වට්ටෝරු භාණ්ඩ ලේඛණයක් නඩත්තු කිරීමට කටයුතු කරනු ලැබේ. |
| (ii) | මුදල් රෙගුලාසි 396 (ඈ)<br>2008 වර්ෂයේ සිට අවලංගු කරන ලද චෙක්පත් 13 ක් සඳහා ගෙවිය යුතු එකතුව රු.89,780 ක් සම්බන්ධව රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | එකඟ නොවෙමු.<br><br>මුදල් රෙගුලාසි 396 (ඈ) (iii) හි සඳහන් වන්නේ ඉදිරිපත් නොකළ චෙක්පත් තිබේ නම් එම මුදල වගකීමක් ලෙස ලෙජරයේ සඳහන් කළ යුතු බවයි.<br>කෙසේ වෙතත් අදාළ පාර්ශවයන්ට මේ සම්බන්ධයෙන් කිහිප වතාවක් දැනුම් දී ඇතත් උනන්දුවක් නොදක්වන බැවින් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන අදාළ මුදල කපා හැරීමට කටයුතු කරන්නෙමු. |

# විගණකාධිපති විසින් මතුකළ කරුණුවලට මණ්ඩලයේ ප්‍රතිචාර දැක්වීම

| | විගණකාධිපති වාර්තාව | ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ ප්‍රතිචාර දැක්වීම |
|---|---|---|
| **2.3** | **නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම** | |
| **(ආ)** | 2003 ජූනි 02 දිනැති අංක 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.14 පරිච්ඡේදය<br><br>පරිපාලන අත්පොතක් පිළියෙල කර තිබූ නමුත් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙතින් අනුමත කරගෙන නොතිබුණි. | එකඟ නොවෙමු.<br><br>පරිපාලන අත්පොත රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව දෙන ලද උපදෙස් මත අදාළ සංශෝධනයන් සිදුකොට දැනටමත් ක්‍රියාත්මක කරනු ලැබේ. |
| **2.4** | **ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගණුදෙනු** | |
| **(අ)** | කළමනාකරණ සේවා චක්‍රලේඛය ප්‍රකාරව, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල වැටුප් හා දීමනා නියම කිරීමට අදාළව ආයතන පිහිටවූ පනත් වල විවිධ ප්‍රතිපාදන තිබුණද, එම ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය නොමැතිව ක්‍රියාත්මක නොකළ යුතු වුවත්, එවැනි අනුමැතියකින් තොරව මණ්ඩලය විසින් 2012 වර්ෂයේ සිට මණ්ඩලයේ නිලධාරීන්ගේ වැටුප් සියයට 25 කින් වැඩිකර තිබුණි. ඒ අනුව 2012 දී හා 2013 වර්ෂවල එසේ අනුමැතිය නොමැතිව පිළිවෙලින් රු.2,600,438 ක් හා රු.5,221,448 ක් ගෙවා තිබුණි. | එකඟ නොවෙමු.<br><br>රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ගණයට නොවැටෙන, නියාමන ආයතනයක් (Regulator) වන අප මණ්ඩලය විසින් මෙකී ගෙවීම කරන ලද්දේ මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ අනුමැතිය හා අධ්‍යක්ෂ මණ්ඩලයේ පූර්ණ අනුමැතිය මත වේ.<br><br>2012 නොවැම්බර් මස 12 වන දින පැවතුණ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදී මෙම ප්‍රශ්නය විගණකාධිපති විසින් මතුකළ අවස්ථාවේදී අප විසින් කළ පැහැදිලි කිරීම් අනුව එකී කාරණය ඉවත් කර ගන්නා ලෙසට පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සභාපති විසින් විගණනයට උපදෙස් දුන් බවද කාරුණිකව සිහිපත් කරනු කැමැත්තෙමු. |
| **(ආ)** | මණ්ඩලය විසින් දිරි දීමනා යෝජනා ක්‍රමයක් සකස් කර මුදල් අමාත්‍යාංශය වෙත භාරදී තිබුණද, ඒ සඳහා අනුමැතිය ලැබී නොතිබුණු නමුත් සමාලෝචිත වර්ෂය තුළදී ආයතනයේ නිලධාරීන් 42 ක් සඳහා මසක වැටුප් පදනම් කරගෙන රු.1,951,246 ක දිරි දීමනා ගෙවා තිබුණි. | එකඟ නොවෙමු.<br><br>සමාලෝචිත වර්ෂය තුළදී අදාළ දිරි දීමනා ගෙවන ලද්දේ අමාත්‍යාංශ උපදෙස් මත සකස් කරන ලද කාර්යසාධනය ඇගැයීම් හා නිවාඩු සම්බන්ධ ප්‍රගතිය සලකා බැලීමෙන් අනතුරුවය.<br><br>මීට අමතරව 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ විධිවිධාන මත අධ්‍යක්ෂ මණ්ඩලයේ විධිමත් අනුමැතියද මේ සඳහා ලබාගෙන ඇත. |
| **(ඇ)** | අනුමැතිය සඳහා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කර තිබූ පරිපාලන අත්පොතේ නියමයන්ට අනුව, සමාලෝචිත වර්ෂයේදී මණ්ඩලයේ නිලධාරීන් සඳහා නිවාඩු දින වැටුප් ලෙස රු.599,941 ක් ගෙවා තිබුණද, එම පරිපාලන අත්පොත සඳහා අනුමැතිය 2014 ඔක්තෝම්බර් 30 දින වන විටත් ලැබී නොතිබුණි. | |
| **3.** | **මූල්‍ය සමාලෝචනය** | |
| **3.1** | **මූල්‍ය ප්‍රතිඵල** | |
| | ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා මණ්ඩලයේ බදුවලට පෙර මූල්‍ය ප්‍රතිඵලය රු.148,207 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.238,211 ක් වූයෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේදී මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.90,004 ක හෙවත් සියයට 38ක අඩුවීමක් දක්නට ලැබුණි. මණ්ඩලයේ සමස්ථ ආදායම රු.11,461,378 කින් වැඩිවී තිබුණද කාර්ය මණ්ඩල පිරිවැය හා වෘත්තීය ගාස්තු පිළිවෙලින් රු.9,662,751 කින් හා රු.1,184,222 කින් වැඩිවීම මෙම අතිරික්තය අඩුවීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි. | |

# විගණකාධිපති විසින් මතුකළ කරුණුවලට මණ්ඩලයේ ප්‍රතිචාර දැක්වීම

| | විගණකාධිපති වාර්තාව | ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ ප්‍රතිචාර දැක්වීම |
|---|---|---|
| 3.2 | **විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය** | |
| | ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනට හා 2012 දෙසැම්බර් 31 දිනට පැවති කාරක ප්‍රාග්ධන අනුපාත පහත දැක්වේ.<br><br>අනුපාත 2013 2012<br><br>ජංගම/ක්ෂණික 139:1 120:1<br><br>සමාලෝචිත වර්ෂය අවසාන වන විට මූල්‍ය ප්‍රකාශන වල රු.1,782,818,419 ක් වූ ජංගම වත්කම් හෙළිදරව් කර තිබුණු අතර එම වටිනාකමින් සියයට 99 ක් හෙවත් රු.1,766,611,670 ක් 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 103 වන වගන්තිය ප්‍රකාරව පිහිටවා තිබූ " රක්ෂණ ඔප්පු දරන්නන්ගේ ආරක්ෂණ අරමුදලෙහි" ආයෝජනයන් නියෝජනය විය. | |
| 4. | **මෙහෙයුම් සමාලෝචනය** | |
| 4.1 | **කාර්ය සාධනය** | |
| | මණ්ඩලයේ 2013 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව, එක් එක් අංශය විසින් වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කළ පහත සඳහන් කාර්යයන් නිම කිරීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි. | |
| (අ) | **නීති අංශය**<br>මෙම අංශය යටතේ ශක්තිමත් රක්ෂණ ව්‍යවස්ථාමය රාමුවක් ඇති කිරීම අරමුණු කරගෙන පහත සඳහන් කාර්යයන් නිම කිරීමට සැලසුම් කර ඇතත්, එම කාර්යයන් 2014 අප්‍රේල් 30 දින දක්වාත් අවසන් කර නොතිබුණි. | වාර්ථාවේ සඳහන් කර ඇති කාර්යයන්ගෙන් සම්පූර්ණයෙන්ම නිම කිරීමට නොහැකි වී ඇත්තේ රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතට සංශෝධනයන් හඳුනාගැනීම පමණකි. එම සංශෝධනයන්ද බොහෝ දුරට හඳුනාගෙන ඇති අතර මේ වසර අවසානයේ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියට ඉදිරිපත් කිරීමට නියමිතය. අනිකුත් කාර්යයන් වල ප්‍රගතිය පහත දැක්වේ. |
| | (i) රක්ෂණ පාලක විසින් 1987 දී නිකුත් කර ඇති රෙගුලාසි සංශෝධනය කිරීම. | (i) 1987 දී නිකුත් කර ඇති රෙගුලාසි සංශෝධනය කිරීම - අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇත. ඉදිරි කටයුතු මේ වසරේදී අවසන් කරනු ඇත. |
| | (ii) මණ්ඩලයට ඇති අධීක්ෂණ හා විමර්ශන බලතල සම්බන්ධ නීති සංශෝධනය කිරීම. | (ii) ඉහත ඡේදයේ සඳහන් පරිදිය. |
| | (iii) හානි පාඩු ගලපන්නන් ලියාපදිංචි කිරීමේ විධිමත් නියාමන ක්‍රමවේදයක් සකස් කිරීම. | (iii) හානි පාඩු ගලපන්නන් ලියාපදිංචි කිරීම - කටයුතු අවසන් කර මණ්ඩලයේ උපදෙස් මත මහජන අදහස් ලබාගැනීම සඳහා පුවත්පත් දැන්වීම් පලකොට ඇත. |
| | (iv) ඒ සම්බන්ධ කටයුතුවල නියුතු රක්ෂණ නියෝජිතයන්ගේ ලියාපදිංචිය නියාමනය කිරීම සඳහා විධිමත් ක්‍රමවේදයක් සකස් කිරීම. | (iv) රක්ෂණ නියෝජිතයන් ලියාපදිංචිය නියාමනය කිරීම - කාර්යය අවසන් වී ඇත. අදාළ ගැසට් නිවේදනයද 2014.05.10 දින නිකුත් කර ඇත. |
| | (v) අවදානම් පාදක ප්‍රාග්ධනය ස්ථාපිත කිරීම සඳහා පහසුකම් සැපයීම පිළිබඳව විධිමත් ක්‍රමවේදයක් සකස් කිරීම. | (v) අවදානම් පාදක ප්‍රාග්ධනය ස්ථාපිත කිරීම - ලෝක බැංකුව විසින් ආධාර සපයන ව්‍යාපෘතියකි. සියලු කටයුතු දැනට නිමවී නීති සකස් කිරීම සඳහා නීති කෙටුම්පත් සම්පාදක වෙත ඉදිරිපත් කර ඇත. |

# විගණකාධිපති විසින් මතුකළ කරුණුවලට මණ්ඩලයේ ප්‍රතිචාර දැක්වීම

| | විගණකාධිපති වාර්තාව | ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ ප්‍රතිචාර දැක්වීම |
|---|---|---|
| 4. | **මෙහෙයුම් සමාලෝචනය** | |
| 4.1 | **කාර්ය සාධනය** | |
| (ආ) | **විමර්ශන අංශය**<br>මේ යටතේ රක්ෂණ සහතික දරන්නන්ගේ හා අනාගත රක්ෂණ සහතික දරන්නන්ගේ විශ්වාසය හා කර්මාන්තයේ දියුණුව වැඩි කිරීමේ අරමුණින්, | |
| | (i) වර්ෂය තුළදී විදේශීය අධිකරණ සීමා හා කර්මාන්තයේ අදහස් අධ්‍යයනය කිරීමෙන් වාර්තාවක් සැකසීම. | අදාළ කාර්යය සැලසුම් කරන ලද්දේ ලෝක බැංකු තාක්ෂණ සහය ඇතිව විශේෂ ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කිරීමටය. එහෙත් එම ව්‍යාපෘතිය අනුමත නොවූ නිසා ක්‍රියාත්මක කළ නොහැකි විය. එය අපගේ පාලනයෙන් බැහැර වූවකි. |
| | (ii) මණ්ඩලය විසින් විමර්ශන පහසුකම් සැපයිය යුතු බාහිර ආයතන හඳුනාගැනීම හා ඔවුන් සමඟ ගිවිසුම් වලට එළඹීම. | |
| | සැලසුම් කර තිබුණද එක් බාහිර ආයතනයක් හඳුනා ගැනීම පමණක් සිදුකර තිබුණි. | |
| (ඇ) | **අධීක්ෂණ අංශය**<br>මේ යටතේ, කාර්යක්ෂම අධීක්ෂණ පද්ධතියක් හරහා ශ්‍රී ලංකා රක්ෂණ කර්මාන්තයේ ස්ථාවරත්වය හැසිරවීමේ අරමුණ ඇතිව, | |
| | (i) රක්ෂණ සමාගම්හි තෝරාගනු ලබන අංශ සඳහා ස්ථානීය පරීක්ෂණ 07 ක් සිදු කිරීම. | ස්ථානීය පරීක්ෂණ 7 න් 3 ක් ඉටුකළ නොහැකි වූයේ රක්ෂණ සමාගමක සිදුවූ වංචාවක් සම්බන්ධයෙන් සැලසුම් නොකරන ලද විශේෂ ස්ථානීය පරීක්ෂණයක් සඳහා අංශයේ සිටින සීමිත නිලධාරීන්ට වැඩි කාලයක් ගත කිරීමට සිදුවූ බැවිනි. අනපේක්ෂිත ලෙස සිදු වන මෙවැනි සිද්ධීන් නිසා සැලසුම් කරන ලද කාර්යයන් පසු දැමීමට සිදුවිය හැක. |
| | (ii) කළමණාකරණ තොරතුරු පද්ධතිය සකස් කිරීම. | |
| | (iii) රක්ෂණ සමාගම්හි මූල්‍ය අවදානම හා කාර්යසාධනය තක්සේරු කිරීම සඳහා අදාළ සමාගමේ මාසික වාර්තා අධීක්ෂණය, සමාලෝචනය හා විශ්ලේෂණය කිරීම. | සමාගමකින් මාසික වාර්තා ලබාගනුයේ කලින් සැලසුම් කොට නොව යම් සමාග මක ප්‍රගතිය පසුබා ඇති බව මණ්ඩලය තීරණය කළහොත් පමණී. මෙයට අමතරව අධීක්ෂණ අංශයේ නිලධාරීන් රක්ෂණ සමාගම් 21 කින් ලැබෙන කාර්තුමය වාර්ථා හා වාර්ෂික වාර්ථා සියල්ලද විශ්ලේෂණය කරනු ලැබේ. |
| | සැලසුම් කර ඇතත්, ස්ථානීය පරීක්ෂණ 4ක් හා රක්ෂණ සමාගම් 4ක මාසික වාර්තා විශ්ලේෂණය පමණක් සමාලෝචිත වර්ෂය තුළදී සිදුකර තිබුණි. | |
| (ඈ) | **මූල්‍ය හා පරිපාලන අංශය**<br>මේ යටතේ, පහත සඳහන් කාර්යයන් නිම කිරීමට අපේක්ෂා කර තිබුණද, 2013 වර්ෂයේදී අදාළ කාර්යයන් නිම කිරීමට මණ්ඩලය අපෙහොසත් වී තිබුණි. | |
| | (i) සේවක සුභ සාධනය යටතේ වෛද්‍ය දීමනා ගෙවීමේ විධිමත් වැඩපිළිවෙළක් සැකසීම. | වෛද්‍ය දීමනා ගෙවීම සම්බන්ධයෙන් විධිමත් වැඩපිළිවෙළක් දැනටමත් ක්‍රියාත්මක වේ. |
| | (ii) මණ්ඩලයේ පුහුණු වියදම් වඩා ඵලදායී කරගැනීම සඳහා ක්ෂේත්‍රයට අදාළ පුහුණු වැඩසටහන්වලට පමණක් නිලධාරීන් සහභාගී කරවීමට කටයුතු කිරීම. | ආයතනය විසින් නිලධාරීන් පුහුණු කිරීම සම්බන්ධයෙන් මීට පෙරද පැහැදිලි කර ඇති පරිදි අදාළ සියළුම පුහුණු පාඨමාලා රක්ෂණ ක්ෂේත්‍රයේ නියාමනයට සෘජුව දායක වන පාඨමාලා බව නැවතත් සඳහන් කරමු. |
| | (iii) කෙසේ වුවද සමාලෝචිත වර්ෂයේ දේශීය පුහුණුව සඳහා ප්‍රතිපාදනය කර තිබූ රු.2,250,000 කින් රු.1,535,494 ක් වියදම් කර තිබුණු අතර රක්ෂණ ක්ෂේත්‍රයට සෘජු දායකත්වයක් නොලැබෙන උසස් අධ්‍යාපන පාඨමාලා සහ සේවක සුභසාධනය සඳහා පිළිවෙලින් රු.636,000 ක් සහ රු.694,520 ක් දරා තිබුණි. | මණ්ඩලයේ කාර්ය සාධනය සඳහා අවශ්‍ය වනුයේ රක්ෂණ කර්මාන්තය ගැන පමණක් අවබෝධයක් ලැබීම නොවේ. නීති, මූල්‍ය, පිරිස් පාලනය , කළමනාකරණය, ජීව ගණක, සේවක අභිප්‍රේරණය, සන්නිවේදනය, ආත්ම විශ්වාසය ගොඩනැගීම හා නායකත්ව පුහුණුව යන සියලූම විෂයයන් ආයතනයේ කාර්ය සාධනයට සෘජු බලපෑමක් සිදුකෙරේ. |

# විගණකාධිපති විසින් මතුකළ කරුණුවලට මණ්ඩලයේ ප්‍රතිචාර දැක්වීම

| | විගණකාධිපති වාර්තාව | ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ ප්‍රතිචාර දැක්වීම |
|---|---|---|
| 4.2 | **කළමනාකරණ අකාර්යක්ෂමතා** | |
| | 2007 මාර්තු 15 දින සිට 2009 අගෝස්තු 05 දින දක්වා කාලපරිච්ඡේදයට අදාළ සාවද්‍ය ලෙස පරිහරණය කළ බවට හඳුනාගෙන තිබුණු රු. 107,800 ක් වූ බැංකු ගත නොකළ ආදායමක් ද ඇතුළුව සේවයෙන් ඉවත්ව ගිය නිලධාරිනියකගෙන් අය විය යුතු රු.112,420 ක් වූ මුදල සමාලෝචිත වර්ෂයේ අවසන් දිනටද ලැබිය යුතු මුදලක් ලෙස දක්වා තිබුණද, නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | එකඟ නොවෙමු.<br><br>මෙම කාරණය දැනට අධිකරණයේ ඇති නඩු නිමිත්තක් වේ. ඒ අනුව, අප මණ්ඩලය මැදිහත් වී විගණිත දිනයට පෙර නිරවුල් කිරීම කල නොහැකි බැවින් මෙය අපගේ පාලනයෙන් සම්පූර්ණයෙන් බැහැර කරුණක් බව සඳහන් කරමු. |
| 4.3 | **මෙහෙයුම් අකාර්යක්ෂමතා** | |
| | 2007 මැයි 09 දින මිලදී ගන්නා ලද පිරිවැය රු.55,000 ක් වූ පරිගණක මොනිටරයක් සහ පිරිවැය රු.4,500 ක් වූ පරිගණක මුද්‍රණ යන්ත්‍රයක් සොයා ගත නොහැකි වත්කම් ලෙස ස්ථාවර වත්කම් ලේඛණයේ දක්වා තිබුණි. | 2007 දී මිලදී ගෙන ඇති මෙම උපකරණ දෙක සොයා ගැනීමට වසර ගණනාවක් උත්සාහ කළද, එකී උත්සාහයන් ව්‍යර්ථ වී ඇත. මණ්ඩලයේ නිසි අනුමැතිය ලබා ගෙන මෙම වටිනාකම් ස්ථාවර වත්කම් ලේඛණයෙන් කපා හැරීමට මෙම වසර අගදී කටයුතු සිදු කරමු. |
| 4.4 | **ආර්ථික නොවූ ගණුදෙනු** | |
| | මණ්ඩලය විසින් භාවිතයට නොගැනෙන දුරකථන 5 ක් සඳහා සමාලෝචිත වර්ෂය තුළදී, සේවා ගාස්තු හා ඊට අදාළ සියයට 20 දුරකථන බද්ද හා සෙස් බද්ද ඇතුළුව රු.53,400 ක් ගෙවා තිබුණි. | මෙම දුරකථන 5 භාවිතයට නොගැනෙන දුරකථන ලෙස නම් කිරීමට එකඟ නොවෙමු. ඇමතුම් ලබා ගැනීම බොහෝ විට හුවමාරුව හරහා සිදු කෙරුණද, අදාළ අධ්‍යක්ෂවරුන්ට පිටතින් ලැබෙන ඇමතුම් බොහෝ විට ලැබෙනුයේ මෙම දුරකථන අංක හරහාය. |
| 4.5 | **කාර්ය මණ්ඩල පරිපාලනය** | |
| | පහත නිරීක්ෂණයන් කරනු ලැබේ. | |
| (අ)<br><br>(ආ) | 2013 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ අනුමත තනතුරු සංඛ්‍යාව 44ක් වුවද, තථ්‍ය සංඛ්‍යාව 42ක් වීමෙන් පුරප්පාඩු 03 ක් පැවතුණි.<br>අනුමත කාර්ය මණ්ඩලයේ වූ සහකාර අධ්‍යක්ෂ තනතුරු 03ක් 2013 වර්ෂය ආරම්භයේ සිට පුරප්පාඩුව පැවතුණු අතර එම තනතුරු සමාලෝචිත වර්ෂයේද පිරවීමට කටයුතු කර නොතිබුණි. | ඔබගේ නිරීක්ෂණය නිවැරදි නොවේ. 2013.12.31 දිනට මණ්ඩලයේ සහකාර අධ්‍යක්ෂක තනතුරු 2 ක පමණක් පුරප්පාඩුව පැවතුණි. ජීවගණක සහකාර අධ්‍යක්ෂක තනතුර පිරවීමට අවශ්‍යවනුයේ RBS ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම ආරම්භ කළ පසුවය. තනතුරු යටපත් කළහොත් එය නැවත ඇති කිරීම ඉතාමත් අසීරු කාර්යයක් බැවින් එය යටපත් නොකරන ලදී.<br>අනෙක් සහකාර අධ්‍යක්ෂක තනතුර පිරවීමට අයැදුම්පත් කැඳවා සම්මුඛ පරීක්ෂණ පැවැත්වුවද, සුදුසු පුද්ගලයෙකු තෝරාගත නොහැකි විය. ඉදිරියේදී එය පිරවීමට කටයුතු කරනු ලැබේ. |
| 5. | **ගිණුම් කටයුතුභාවය සහ යහ පාලනය** | |
| 5.1 | **අයවැය ලේඛණමය පාලනය** | |
| | අයවැය ගත වියදම් හා තථ්‍ය වියදම් අතර 52% සිට 336% දක්වා වූ විචලනයන් නිරීක්ෂණය වුයෙන් අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි. | ජීවගණක නිලධාරී (Actuary) වෙනුවෙන් දරන ලද වියදම අධීක්ෂණ අංශය යටතට නොගෙන එකී වියදම වෘත්තීය ගාස්තු යටතට ගැනීම හේතුවෙන් 336% විචලනයක් මතුවී ඇත. එමනිසා අධීක්ෂණ අංශයේ මෙම වියදම (රු.2,178,627/-) එම අංශයේ වියදමක් ලෙස නොගැනීම හේතුවෙන් මෙවැනි විචලනයක් පැන නැගී ඇත.<br>කෙසේ වෙතත් 2015 අයවැය ලේඛණය විචලතා අවම වන ආකාරයට සැකසීමට කටයුතු කරනු ලැබේ. |
| 6. | **පද්ධති හා පාලනයන්** | |
| | විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු ආයතනයේ සභාපතිවරයාගේ අවධානයට වරින් වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.<br><br>(i) අයවැය<br>(ii) කාර්ය මණ්ඩල පරිපාලනය<br>(iii) ස්ථාවර වත්කම් | අප විසින් නිවැරදි කළ යුතු ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් ඔබගේ උපදෙස් සැලකිල්ලට ගෙන විශේෂ අවධානය යොමු කරනු ලැබේ. |

# පරිශිෂ්ඨය I

2013 දෙසැම්බර් 31 දිනට 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය නියාමනය කිරීමේ පනත යටතේ ලියාපදිංචි වී ඇති රක්ෂණ සමාගම්

| අංකය | රක්ෂණ සමාගම | ව්‍යාපාර කටයුතු වර්ගය |
|---|---|---|
| 1 | ඒඅයිඒ ඉන්ෂුවරන්ස් ලංකා පීඑල්සී | දිගුකාලීන රක්ෂණය<br>සාමාන්‍ය රක්ෂණය |
| 2 | ඒඅයිජී ඉන්ෂුවරන්ස් ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 3 | ඇලියොන්ස් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 4 | ඇලියොන්ස් ලයිෆ් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය |
| 5 | අමානා තකාෆුල් පීඑල්සී | දිගුකාලීන රක්ෂණය<br>සාමාන්‍ය රක්ෂණය |
| 6 | ආර්පිකෝ ඉන්ෂුවරන්ස් ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය |
| 7 | ඒෂියන් එලායන්ස් ඉන්ෂුවරන්ස් පීඑල්සී | දිගුකාලීන රක්ෂණය<br>සාමාන්‍ය රක්ෂණය |
| 8 | සෙලින්කෝ ඉන්ෂුවරන්ස් පීඑල්සී | දිගුකාලීන රක්ෂණය<br>සාමාන්‍ය රක්ෂණය |
| 9 | *සෙලින්කෝ තකාෆුල් ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 10 | කොන්ටිනෙන්ටල් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 11 | කෝපරේටිව් ඉන්ෂුවරන්ස් කම්පනි ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය<br>සාමාන්‍ය රක්ෂණය |
| 12 | එච්එන්බී ඇෂුවරන්ස් පීඑල්සී | දිගුකාලීන රක්ෂණය<br>සාමාන්‍ය රක්ෂණය |
| 13 | ජනශක්ති ඉන්ෂුවරන්ස් පීඑල්සී | දිගුකාලීන රක්ෂණය<br>සාමාන්‍ය රක්ෂණය |
| 14 | ලයිෆ් ඉන්ෂුවරන්ස් කෝපරේෂන් (ලංකා) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය |
| 15 | එල්ඕඑල්සී ඉන්ෂුවරන්ස් කම්පනි ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය<br>සාමාන්‍ය රක්ෂණය |
| 16 | එම්බීඑස්එල් ඉන්ෂුවරන්ස් කම්පනි ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය<br>සාමාන්‍ය රක්ෂණය |
| 17 | ජාතික රක්ෂණ භාර අරමුදල | සාමාන්‍ය රක්ෂණය |
| 18 | ඔරියන්ට් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 19 | පීපල්ස් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 20 | සීමාසහිත සණස රක්ෂණ සමාගම | දිගුකාලීන රක්ෂණය<br>සාමාන්‍ය රක්ෂණය |
| 21 | ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය<br>සාමාන්‍ය රක්ෂණය |
| 22 | යූනියන් ඇෂුවරන්ස් පීඑල්සී | දිගුකාලීන රක්ෂණය<br>සාමාන්‍ය රක්ෂණය |

* 2009 අගෝස්තු 5 වැනි දා සිට සෙලින්කෝ තකාෆුල් ලිමිටඩ් රක්ෂණ ව්‍යාපාරයෙහි යෙදීම තහනම් කර ඇත.

# පරිශිෂ්ඨය II

2013 දෙසැම්බර් 31 දිනට 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය නියාමනය කිරීමේ පනත යටතේ ලියාපදිංචි වී ඇති රක්ෂණ තැරැව්කාර සමාගම්

| අංකය | රක්ෂණ තැරැව්කරු | ව්‍යාපාර කටයුතු වර්ගය |
|---|---|---|
| 1 | ඒඑම්ඩබ්ලිව් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය |
| 2 | ඒඩීඉසෙඩ් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 3 | එයිට්කන් ස්පෙන්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 4 | ඇල්ෆින්කෝ ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 5 | ඇලියෝන් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය |
| 6 | ඇක්විලයින් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 7 | ඇසටිඅයි ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 8 | ඇසට්ලයින් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ලිමිටඩ් | සාමාන්‍ය |
| 9 | බ්‍රිලියන්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් කම්පනි (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 10 | සියෙක්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ලිමිටඩ් | සාමාන්‍ය |
| 11 | සීලාන් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් කම්පනි (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය |
| 12 | සිනර්ජි ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය |
| 13 | සීඑෆ් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 14 | කලම්බුරේ ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 15 | කොමර්ෂල් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 16 | දයාසරණ ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 17 | ඩෙල්මේජ් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 18 | ඊඒපී - ආර්එම්එස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 19 | ඉක්විටි ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 20 | එසාජි කරිම්ජි ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 21 | ෆින්ලේ ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 22 | ෆෝසයිට් ඉන්ෂුවරන්ස් ඇන්ඩ් රීඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය |
| 23 | ජෝර්ජ් ස්ටුව(ර්)ට් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 24 | ග්ලෝබල් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ඇන්ඩ් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 25 | ග්‍රෑන්ඩ් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 26 | ගාඩියන් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය |
| 27 | ඉන්ඩස්ට්‍රියල් ඇන්ඩ් කොමර්ෂල් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 28 | ජේ ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ඇන්ඩ් කන්සල්ටන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 29 | ජේඑෆ් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය |
| 30 | කැලණි යුනි ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය |
| 31 | එල්එම් ඇන්ඩ් ඒ ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ඇන්ඩ් කන්සල්ටන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 32 | ලක් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 33 | ලයිෆ් ඇන්ඩ් ජෙනරල් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් සිලෝන් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 34 | මැක්වුඩ්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 35 | මැක්ස්වෙල් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ප්‍රයිවට් ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |

# පරිශිෂ්ඨය II

| | | |
|---|---|---|
| 36 | මර්කන්ටයිල් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය |
| 37 | නේෂන්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 38 | පයනියර් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය |
| 39 | ප්ලැසිඩ් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 40 | ප්‍රෝකෙයා ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 41 | ප්‍රොටෙක්ෂන් ඇන්ඩ් ඇෂුවරන්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 42 | ප්‍රොටෙක්ෂන් ඇන්ඩ් අට්මෝස්ට් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 43 | රෙඩ්මෝ ස්විස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය |
| 44 | රියලයන්ස් ඒ්ඒ්ජී ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 45 | රියලයන්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 46 | රින්කුන් ලංකා ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය |
| 47 | රෝපා ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 48 | සැම්සන් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය |
| 49 | සේනාරත්න ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 50 | සෙංකඩගල ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 51 | සදර්න් මර්චන්ට් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය |
| 52 | ස්ටැටර්ජික් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 53 | ට්‍රස්ට් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය |
| 54 | යූචන් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය |
| 55 | යුනයිටඩ් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය |
| 56 | වෙරාසිටි ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 57 | වික්ටර් එමානුවෙල් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 58 | වොලන්කා ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 59 | සෙනිත් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |

# පාරිභාෂික ශබ්ද මාලාව

**සමුච්චිත වීම**

එක් සමාගමක් සමඟ පවතින සැලකිය යුතු රක්ෂිත හෝ ප්‍රාරක්ෂිත අවදානම් සංඛ්‍යාවක් පාඩු ලබන සිදුවීමක් නිසා එක්වර පීඩාකාරී බවට පත්වන තත්ත්වයකි.

**අත්කර ගැනීමේ වියදම්**

අභිනව රක්ෂණ ගිවිසුම් අත්කර ගැනීම සහ දැනටමත් පවත්නා රක්ෂණ ගිවිසුම් අළුත්කිරීම (උදා ඃ- කොමිස් මුදල්) යන අවස්ථාවලදි වෙනස්වීම්වලට ලක්වන සහ එයට මූලික වශයෙන් සම්බන්ධතාවක් දක්වන සියළු වියදම්.

**ජීවගණකඥ**

රක්ෂණය, ආයෝජනය මූල්‍ය කළමනාකරණය සහ ප්‍රජා විද්‍යාව ආශ්‍රිත ගැටළුවලට සම්භාවිතා සහ සංඛ්‍යානමය සිද්ධාන්ත යොදා ගන්නා විශේෂඥයෙකි.

**පරිපාලන වියදම්**

දේපල, පිරියත හා උපකරණ සඳහා ක්ෂය ප්‍රතිපාදන සහ සේවක පිරිවැය සහිතව වාරික එකතු කිරීමේ දී ආයෝජන කළම්බ පරිපාලනයේ දී ජනනය වන පරිපාලන ස්වභාවයේ වියදම්.

**ආවේශ්‍යතා දැක්විය හැකි වත්කම්**

රක්ෂකයාගේ ව්‍යවස්ථාපිත නුබුන්වත්භාවය නිශ්චය කිරීමේ දී ඇතුළත් කරනු ලබන වත්කම්, මෙවැනි වත්කම් 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්ත නියාමන පනතෙහි නිශ්චිතව දක්වා තිබේ.

**වාර්ෂිකය**

යම් කිසි නිශ්චිත කාලසීමාවක් සඳහා වාර්ෂිකලාභියාගේ ආයු කාලය මුළුල්ලේ හෝ වාරමය වශයෙන් ආදායම් ප්‍රතිලාභ ගෙවන ජීවිත රක්ෂණයකි. විලම්භිත හා ක්ෂණිකව ක්‍රියාත්මක වන යනුවෙන් වන මූලික වශයෙන් වර්ග දෙකකට අයත් වාර්ෂික පවතියි. ගෙවීම් සිදුකිරීම යම්කිසි අනාගත කාලයකදී ආරම්භ වන්නේනම් එය විලම්භිත වාර්ෂිකය නම්වේ. ගිවිසුම ආරම්භ වන අවස්ථාවේදීම අදාල ගෙවීම් සිදුකිරීම අරඹන්නේනම් එය ක්ෂණික වාරිකය නම්වේ.

**ප්‍රතිලාභිය**

ඔප්පු හිමියාගේ මරණයක දී රක්ෂිත මුදල් සහ අනෙකුත් ප්‍රතිලාභ ලැබිය යුතු ආදායකයා ලෙස ඔප්පු හිමියා විසින් නම් කරනු ලබන පුද්ගලයා.

**ප්‍රතිරක්ෂිතයා**

ප්‍රතිරක්ෂණ සමාගමක සේවාදායකයෙක්. (ප්‍රාථමික රක්ෂණ සමාගම)

**හිමිකම් පෑම**

දේපල විනාශ වීම හෝ හානි වීම සහ ඒ ආශ්‍රිත මරණය හෝ තුවාල සිදුවීම, ආරෝග්‍යශාලා හෝ වෛද්‍ය බිල්පත් දැරීම. රක්ෂිතයාගේ මරණය හෝ ආබාධිතවීම, උපපාදන ඔප්පුවක් කල් පිරීම, විශ්‍රාමික වයසට පත්වීම යනා දී ආකාරවලට රක්ෂණයට බඳුන් වූ කාරණය සිදුවීම හේතු කරගෙන හෝ ඔප්පුවක් පවාරණය කිරීමේ දී රක්ෂණ ගිවිසුම පරිදි ගෙවිය යුතු මුදල.

**දරන ලද හිමිකම් පෑම**

වර්ෂය ආරම්භයේ දි සහ වර්ෂය අවසානයේ දී හිඟ තබා ඇති හිමිකම්පෑම් සඳහා වූ ප්‍රතිපාදන වෙනුවෙන් අවශ්‍ය අවස්ථාවල දී ගැලපීම් කළ පසු ගිණුම් වර්ෂයක් තුළ හිමිකම් පෑම සඳහා අවශය කටයුතු කිරීමට දරන වියදම සහිතව ගෙවන ලද මුළු හිමිකම් පෑම් වටිනාකම.

**දරන ලද නමුත් වාර්තා නොකරන ලද හිමිකම් පෑම්**

දේපල, වගකීම් සහ මූල්‍ය යන රක්ෂණ පිළිබඳව සිදුවී ඇති නමුත් රක්ෂකයා වෙත තවමත් වාර්තා කරනු ලැබ නැති අලාභ ආවරණය කිරීම සඳහා දැරීමට සිදුවනු ඇතැයි අපේක්ෂිත පිරිවැය නිරූපණය කරමින් වර්ෂය අවසානයේ දී ඇති කරනු ලබන සංචිතයකි.

**හිඟ සිටි හිමිකම් පෑම් සංචිතය සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතු**

සිදු වූ නමුත් වාර්තා කරනු ලැබ නොතිබූ හිමිකම් සහ ඒවා පිළිබඳව කටයුතු කිරීමේ දී දරන්නට සිදුවන පිරිවැය සහිතව ශේෂ පත්‍ර දිනය වන විට වී ඇති සිද්ධි වෙනුවෙනේ ඒවා ආවරණය කිරීම සඳහා දැරීමට සිදුවනු ඇතැයි අපේක්ෂිත පිරිවැය නිරූපණය කරමින් වර්ෂය අවසානයේ දී ඇති කරනු ලබන සංචිතයකි.

**හිඟ සිටි හිමිකම් පෑම් සංචිතය සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතු**

සිදු වූ නමුත් වාර්තා කරනු ලැබ නොතිබූ හිමිකම් සහ ඒවා පිළිබඳව කටයුතු කිරීමේ දී දරන්නට සිදුවන පිරිවැය සහිතව ශේෂ පත්‍ර දිනය වන විට වී ඇති සිද්ධි වෙනුවෙන් ඒවා ආවරණය කිරීමට දැරිය යුතු ඇස්තමේන්තුගත පිරිවැයෙන් එවැනි හිමිකම් පෑම් සඳහා මේ වන විටත් ගෙවා ඇති මුදල අඩු කළ පසු ලැබෙන අගය.

**සහභාග රක්ෂණය**

නිශ්චිත වාර මුදල් එකඟ වුණු අනුපාතයක් මත ගෙවීමේ පදනම මත අවදානම් ආවරණය සඳහා රක්ෂකයන් දෙදෙනකු හෝ කිහිප දෙනෙකු රක්ෂිතයා සමඟ ඇති කර ගන්නා තනි ගිවිසුමක්.

**කොමිස්**

රක්ෂකයාගේ නිෂ්පාදනයක් විකිණීම හෝ සේවාකරණය වෙනුවෙන් තැරැව්කරුවකුට හෝ රක්ෂණ නියෝජිතයකුට කරන ගෙවීමක්.

**විලම්භිත අත්කර ගැනීමේ පිරිවැය - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතු**

වාර්ෂික පදනමට ගිණුම්කරණයේ දී එක් ගිණුම් වර්ෂයක සිට ඊළඟ ගිණුම් වර්ෂයට ගෙන යා යුතු, අවදානම හා සම්බන්ධ ගිවිමුම්වල කල් ඉකුත් නොවූ කාලය සඳහා අදාළ වන අත්පත් කර ගැනීමේ පිරිවැය.

**ඉපැයූ වාරික**

ගිණුම් කාල පරිච්ඡේදයක ආරම්භයේ දී සහ අවසානයේ දී නොඉපැයූ වාරික ප්‍රතිපාදන වෙනුවෙන් සැලසුම් කළ ලිඛිත වාරික මුදල්.

**සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතු**

ගිනි, මුහුදු, උවදුරු මෝටර් වාහන හෝ මිශ්‍ර රක්ෂණ ව්‍යාපාර කටයුතු එකක් හෝ කිහිපයක් තනිව හෝ බද්දට පවත්වාගෙන යාම, ගිණුම් කාල පරිච්ඡේදයක් තුළ දී සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතු සම්බන්ධව ලද මුළු වාරික හෝ ලැබිය යුතු මුළු වාරික ප්‍රතිරක්ෂණ කටයුතු සඳහා ලැබිය යුතු වාරික ද සහිත අගය

**දළ වාරිකය**

වට්ටම්, ආපසු ගෙවීම් හා ප්‍රතිදාන අඩුකිරීමෙන් පසුව එහෙත් ඉඩ දෙන ලද ප්‍රතිරක්ෂණ සඳහා රක්ෂණකරුවකු විසින් ගෙවන ලද හෝ ගෙවිය යුතු වාරික කිසිවක් අඩුකිරීමට පෙර වූ වාරිකය.

**රක්ෂණ අවදානම**

රක්ෂණයට බඳුන් වූ සිද්ධිය වීම, හිමිකම් පෑම්වල වටිනාකම හෝ හිමිකම් ගෙවීම් සිදුවන කාලය පිළිබඳව පවතින අවිනිශ්චිතතා.

**රක්ෂකයා**

2007 අංක 07 දරන සමාගම් පනත යටතේ පොදු සමාගමක් ලෙස සංස්ථාපිත කර ඇති සහ 2000 අංක 143 දරන රක්ෂණ කර්මාන්ත නියාමන පනත යටතේ ලියාපදිංචි කරනු ලැබ ඇති සමාගමකි.

**දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාර කටයුතු**

මරණයක හෝ මනුෂ්‍ය ජීවිතයට බලපාන යම් අවිනිශ්චිත සිද්ධියක් වූ විට මුදල් ගෙවීම සඳහා සහතික කැරෙන ගිවිසුම ද ඇතුළුව මනුෂ්‍ය ජීවිතය පිළිබඳ රක්ෂණ ගිවිසුම්වලට සහ මනුෂ්‍ය ජීවිතය මත රඳා සිටිමින් යම් කාල පරිච්ඡේදයක් සඳහා වාරික ගෙවීමට යටත් ගිවිසුම්වලට එළැඹීමේ හෝ එවැනි ගිවිසුම් පවත්වාගෙන යාමේ ව්‍යාපාරයකි.

# පාරිභාෂික ශබ්ද මාලාව

**කල්පිරීම**
දීර්ඝකාලීන රක්ෂණ ඔප්පුවක් යටතේ එහි වගන්ති ප්‍රකාරව කාලය අවසන් වීමෙන් රක්ෂිත මුදල් ගෙවිය යුතු අවස්ථාව

**ශුද්ධ හිමිකම් පෑම් අනුපාතය හෝ ශුද්ධ අලාභ අනුපාතය**
රක්ෂකයන් විසින් ශුද්ධ ආදායම් (අදාළ ප්‍රතිරක්ෂණයෙන් අඩු කළ පසු) සම්බන්ධ ශුද්ධ අලාභ වියදම් නිරූපණය කිරීමට උපයෝගී කර ගනු ලබන සූත්‍රයකි.

(දරන ලද ශුද්ධ හිමිකම් පෑම් / ඉපැයූ ශුද්ධ වාරික ආදායම) x 100

**ශුද්ධ ඒකාබද්ධ අනුපාතය - ජීවිත නොවන**
ශුද්ධ අලාභ අනුපාතය සමඟ ශුද්ධ වියදම් අනුපාතය සම්බන්ධ කර රක්ෂකයාගේ මෙහෙයුම්වල ලාභදායීත්වය මෙයින් නිරූපණය වෙයි. මෙම ඒකාබද්ධ අනුපාතය ගණනය කිරීමේ දී ආයෝජන ආදායම් සැලකිල්ලට නොගැනෙයි.

(දරන ලද ශුද්ධ හිමිකම් පෑම් x 100 / ඉපැයූ ශුද්ධ වාරික ආදායම)    (වියදම් x 100 / ඉපැයූ ශුද්ධ වාරික ආදායම්)

**ශුද්ධ ඉපැයූ වාරික - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතු**
ප්‍රතිරක්ෂණ වාරික සහ නොඉපැයූ වාරිකවල වැඩිවීම සහ අඩුවීම සඳහා ගළපන ලද දළ ලිඛිත වාරික ආදායම

**ශුද්ධ වියදම් අනුපාතය - ජීවිත නොවන**
ආදායම් අත්පත් කර ගැනීමේ සහ පරිපාලන වියදම් (උදා :- කොමිස්, බදු, සේවක පරිවැය, අලෙවිකරණ සහ මෙහෙයුම් වියදම්) අදාළ කර ගැනීම සඳහා රක්ෂණ සමාගම් විසින් යොදා ගනු ලබන සූත්‍රයකි.

**ශුද්ධ අලාභ අනුපාතය - ජීවිත නොවන**
ශුද්ධ ඉපැයූ වාරිකවලට (අදාළ ප්‍රතිරක්ෂණ අඩු කළ පසු) දරන ලද ශුද්ධ හිමිකම් පෑම් අදාළ කර ගැනීම සඳහා රක්ෂණ සමාගම් විසින් යොදා ගනු ලබන සූත්‍රයකි.

**සහභාගීත්වය රහිතව ඔප්පුව - ජීවිත රක්ෂණ ව්‍යාපාර කටයුතු**
ජීවිත රක්ෂණ ව්‍යාපාරය කටයුතුවල දී ඔප්පු හිමියාට අදාළ ජීවිත රක්ෂණ අරමුදලේ අතිරික්තයට හිමිකම් ලැබීමට ගිවිසුම්මය අයිතියක් නොමැති රක්ෂණ ඔප්පු.

**ඔප්පුව**
රක්ෂණ ගිවිසුමක නියම හා කොන්දේසි ඇතුළත් කර ඇති ලියැවිල්ලකි.

**ඔප්පු හිමියා**
රක්ෂණකරු සමඟ අදාළ ගිවිසුමට පැමිණ අදාළ රක්ෂණ ඔප්පුවේ තත්කාලීන නෛතික හිමිකරුවන තැනැත්තා.

**ඔප්පු ණය**
ජීවිත රක්ෂණ ඔප්පුවක පවාරන අගය ඇපයට තබමින් ඔප්පු හිමියකු විසින් රක්ෂකයාගෙන් ගනු ලබන ණය මුදලකි. මෙම ණය මුදල සාමාන්‍යයෙන් ඔප්පුවේ වර්තමාන පවාරන වටිනාකමේ ප්‍රතිශතයක් සඳහා සීමාවන අතර එවැනි ණය මුදල් සඳහා පොලී අය කරනු ලැබේ.

**ප්‍රාථමික රක්ෂකයා**
රක්ෂණ වාරිකයක් වෙනුවෙන් අවදානම් බාර ගනු ලබන්නා වූ ද රක්ෂණ ඔප්පු හිමියා සමඟ සෘජු ගිවිසුම්ගත සම්බන්ධතාවක් පවත්වාගනු ලබන්නා වූ ද රක්ෂණ සමාගම් (තනි පුද්ගලයන්, ආයතන හෝ සංවිධාන)

**මෙහෙයුම් ලාභය**
ආයෝජන ආදායම, ශුද්ධ ප්‍රාග්ධන ලාභ සහ වෙනත් ආදායම් සැලකිල්ලට ගත් පසු සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතුවලින් උපයා ගන්නා ලද ලාභය

**ප්‍රතිරක්ෂණය**
එක් පාර්ශ්වයක් (ප්‍රතිරක්ෂකයා) විසින් කිසියම් ප්‍රතිෂ්ඨාවක් සමඟ අනෙකුත් පාර්ශ්වයක් (ප්‍රතිරක්ෂිතයා - ප්‍රාථමික රක්ෂණකරු එළැඹුණු රක්ෂණ ඔප්පුවක හෝ ඔප්පුවල වගකීම්වලින් කොටසක් හෝ මුළුමනින්ම හානිපූරණය කිරීමට ඇති කර ගනු ලබන එකඟතාවකි.

**ප්‍රතිරක්ෂණ කොමිස්**
ප්‍රතිරක්ෂකයාට ගෙවූ හෝ ගෙවිය යුතු වාරිකවලට අදාළව ලැබුණු හෝ ලැබිය යුතු කොමිස් මුදල්

**භාරගනු ලබන ප්‍රතිරක්ෂණ**
ප්‍රතිරක්ෂණ ගිවිසුමක් යටතේ අවදානම් භාර ගැනීම

**භාර දෙනු ලබන ප්‍රතිරක්ෂණ**
ප්‍රතිරක්ෂණ ගිවිසුමක් යටතේ අවදානම් ස්ථානගත කිරීම

**ප්‍රතිරක්ෂණ ලාභ කොමිස්**
ප්‍රතිරක්ෂිත ගිවිසුමක් යටතේ ප්‍රතිරක්ෂිතයා විසින් උපයන ලද ලාභය (ප්‍රතිරක්ෂණ ගිවිසුමෙහි නිර්වචනය කරනු ලැබ ඇති පරිදි) පාදක කරගෙන ප්‍රතිරක්ෂකයකුගෙන් ප්‍රාථමික රක්ෂිතයා ලද හෝ ලැබිය යුතු කොමිස් මුදල්.

**රඳවා ගැනීම**
භාරගනු ලැබ අවදානමින් රක්ෂණකරු / ප්‍රතිරක්ෂණකරු විසින් ප්‍රතිරක්ෂණය කරනු නොලබන / පවරනු නොලබන කොටස හෙවත් ස්වකීය ගිණුම වෙනුවෙන් රඳවාගත් ආදායම.

**නුබුන්වත් ආන්තිකය - ජීවිත**
2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්ත පනතෙහි වගන්ති අංක 26 ප්‍රකාරව පනවා ඇති 2002 නුබුන්වත් ආන්තිකය (දිගුකාලීන රක්ෂණය) පිළිබඳ රීතියෙන් නිර්වචනය කරනු ලැබ ඇති පරිදි දිගුකාලීන රක්ෂණ ව්‍යාපාර කටයුතුවල යෙදෙන රක්ෂකයකු විසින් පවත්වාගෙන යනු ලැබීමට අවශ්‍ය වත්කම්වල අගය සහ බැරකම්වල අගය යන සංඛ්‍යා දෙකෙහි වෙනස.

**නුබුන්වත් ආන්තිකය - ජීවිත නොවන (සාමාන්‍ය රක්ෂණය)**
2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්ත පනතෙහි වගන්ති අංක 26 ප්‍රකාරව පනවා ඇති 2004 නුබුන්වත් ආන්තිකය (සාමාන්‍ය රක්ෂණය) පිළිබඳව රීතියෙන් නිර්වචනය කර ඇති පරිදි සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතුවල යෙදෙන රක්ෂකයකු විසින් පවත්වාගෙන යාමට අවශ්‍ය කෙරෙන වත්කම්වල අගය සහ බැරකම්වල අගය සහ සංඛ්‍යාවන් දෙකෙහි වෙනස.

**පවාරණ අගය**
ජීවිත රක්ෂණයක් සම්බන්ධව එම රක්ෂණ ඔප්පුව කල්පිරීමට පෙර ඔප්පු හිමියකු ජීවිත රක්ෂණය අත්හිටුවීමේ දී රක්ෂකයා විසින් ඔප්පු හිමියාට ගෙවනු ලැබිය යුතු මුදල පවාරණ අගයක් ඇතිවීම සඳහා අවම වශයෙන් වසර 3ක් වත් අඛණ්ඩව එම ජීවිත රක්ෂණ ඔප්පුව ක්‍රියාත්මක පැවතිය යුතුය.

**ප්‍රාරක්ෂණ ලාභය**
ආයෝජන ආදායම සහ අනෙකුත් ආදායම් සැලකිල්ලට නොගෙන සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර ගනුදෙනු මඟින් උත්පාදනය කර ගනු ලබන තාක්ෂණික ලාභය.

**නොඉපැයූ වාරිකය**
ගෙවීමට නියමිත ඇතැයි ගිණුම්වලට මේ වන විටත් ඇතුළත් කරනු ලැබ ඇති නමුත් ශේෂ පත්‍රයේ දිනයෙන් අනතුරුව එළැඹෙන යම් අවදානම් කාල සීමාවකට අදාළ වාරික මුදල්වල කොටසක් මෙයින් නියෝජනය වෙයි.

**නොඉපැයූ වාරික සංචිතය**
දැනටමත් ක්‍රියාත්මකව පවතින රක්ෂණ ඔප්පු යටතේ අනාගතයේ දී උද්ගත විය හැකි හිමිකම් පෑම් සඳහා ප්‍රතිපාදනය කිරීම අරභයා සාමාන්‍ය රක්ෂණකරු විසින් පවත්වාගෙන යනු ලබන අරමුදලකි.

**කල් ඉකුත් නොවූ ආදායම් සංචිතය**
ශේෂ පත්‍ර දිනට පෙර ගිවිසුම් හමාර කළ නමුත් ශේෂ පත්‍ර දිනයෙන් පසුව ඇති විය හැකි හිමිකම් පෑම්, වන්දි සහ වියදම් සඳහා ඇස්තමේන්තු කළ අගයෙන් මේ දක්වා නොඉපැයූ වාරික වශයෙන් (කිසියම් විලම්භිත අත්පත් කර ගැනීමේ පිරිවැයක් ඇත්නම් එය අඩු කළ පසු) ප්‍රතිපාදනය කරන ලද අගය ඉක්මන ප්‍රමාණය

# පොදු තොරතුරු

## කාර්යාල ලිපිනය

11 වන මහල, නැගෙනහිර කුළුණ
ලෝක වෙළඳ මධ්‍යස්ථානය
කොළඹ 01
ශ්‍රී ලංකාව
දුරකථන : +94 11 2396184-9
ෆැක්ස් : +94 11 2396190
විද්‍යුත් ලිපිනය : info@ibsl.gov.lk
වෙබ් අඩවිය : www.ibsl.gov.lk

## නෛතික ස්වභාවය

2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතෙහි විගන්ති ප්‍රකාරව ශ්‍රී ලංකාව තුළ ස්ථාපනය කරනු ලැබ ඇති ව්‍යවස්ථාපිත මණ්ඩලයක් වන අතර එය 2001 පෙබරවාරි 23 දින රජයේ ගැසට් නිවේදන අංක 1172/27 මගින් බලය දී ඇති පරිදි 2001 මාර්තු 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි මෙහෙයුම් කටයුතු අරඹන ලදී.

## අධ්‍යක්ෂක මණ්ඩලයේ අරමුණ සහ වගකීම්

ශ්‍රී ලංකාව තුළ රක්ෂණ ව්‍යාපාර පවත්වාගෙන යාම අවංකව, වෘත්තීයමය වශයෙන් හා විචක්ෂණශීලීභාවයෙන් ඒවා පවත්වාගෙන යාම තුළින් ඔප්පු හිමියන්ගේ සහ අනාගත ඔප්පු හිමියන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම තහවුරු කිරීම.

## ගිණුම් වර්ෂය

ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා

## විගණකවරු

විගණකාධිපති

## බැංකුකරුවන්

ලංකා බැංකුව

## විගණන කමිටුව

එස්. ආර්. ආටිගල මහතා - සභාපති
සමන්ත කුමාරසිංහ මහතා
නලින් ආටිගල මහතා

IBSL
INSURANCE
BOARD OF SRI LANKA

11 වන මහල, නැගෙනහිර කුළුණ
ලෝක වෙළඳ මධ්‍යස්ථානය
කොළඹ 01
ශ්‍රී ලංකාව

දුරකථන : +94 11 2396184-9
ෆැක්ස් : +94 11 2396190
විද්‍යුත් ලිපිනය : info@ibsl.gov.lk
වෙබ් අඩවිය : www.ibsl.gov.lk

Designed & Printed by Ceylon Printers PLC